**ලංකා බැංකුව හා එහි පරිපාලිත සමාගම්වල - 2023**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත ලංකා බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ හා එහි පරිපාලිත සමාගම්වල ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 5 (1) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව 1992 මැයි 14 වන දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති මුදල් අමාත්‍යවරයාගේ නියෝගයක් මඟින් 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ සඳහන් විධිවිධානවලින් බැංකුව නිදහස් කර ඇත. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 සැම්බර් 31 දිනට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උපවගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා සමූහය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණ ඉදිරිපත් කිරීමක් සිදු වන ආකාරයට පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් නියෝජනය කරන්නේද යන්න අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමූහය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමූහය කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව සමූහය ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමේ ක්‍රියාවලිය (FSCP) සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රධාන කරුණු නිරීක්ෂණය විය. | | |
| අ | මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් බැංකුවට අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ක්‍රියා පටිපාටි අත්පොතක් නොමැත. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදී. මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමේ ක්‍රියා පටිපාටි අත්පොත සකස් කර ඇති අතර අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් පසු වසර අවසානයට පෙර ක්‍රියාත්මක කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන වසා දැමීමේ ක්‍රියාවලි අත්පොතක් තිබිය යුතුය. |
| ආ | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) යොදා ගැනීම හේතුවෙන් පැන නගින ගණනය කිරීම්/ තක්සේරු කිරීම් සම්බන්ධ විනිශ්චයන්/උපකල්පනයන් පිළිබඳ විධිමත් සහ සවිස්තරාත්මක ලියකියවිලි නොමැති බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදී. මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමේ ක්‍රියා පටිපාටි අත්පොත සකස් කර ඇති අතර අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් පසු වසර අවසානයට පෙර ක්‍රියාත්මක කරනු ඇත. | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යොදා ගැනීමට අදාළ විනිශ්චයන්/උපකල්පනයන් පිළිබඳ විධිමත් සහ සවිස්තරාත්මක ලියකියවිලි තිබීම අවශ්‍ය වේ. |
| ඇ | බැංකුව සතුව සංකීර්ණ, ඛණ්ඩනය වූ පොදු ලේජර පද්ධතියක් ඇති අතර, වෙන වෙනම (දේශීය බැංකු අංශය - DBU, විදේශ විනිමය බැංකු අංශය - FCBU, මාලදිවයින සහ අනෙකුත් විදේශීය ශාඛා) පොදු ලේජර හතරක් ඇත, ඒවා පැතුරුම්පත් (Excel) භාවිතයෙන් අතින් ඒකාබද්ධ කෙරෙන අතර අවසාන සංඛ්‍යා ලබා ගැනීමට ලෙජර් ශේෂයන් සඳහා අතින් සිදු කරනු ලබන ගැලපුම් විශාල සංඛ්‍යාවක් යොදනු ලබයි. | මූල්‍ය වාර්තාකරණයේ ස්වයංක්‍රීයකරණය සිදු කරමින් පවතින අතර සංකීර්ණත්වය සහ ඉහළ දත්ත පරිමාව හේතුවෙන් ස්වයංක්‍රීයකරණ කාර්යයට සැලකිය යුතු කාලයක් ගතවේ. මෙම වර්ෂය අවසානයට පෙර අවසන් කිරීමට ඉහළම උත්සාහයක් දරනු ඇත. එවිට අතින් සිදු කරනු ලබන ක්‍රියාවලිය පිළිබඳ පාලනය තවදුරටත් ශක්තිමත් වනු ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම අවශ්‍ය වේ. |
| ඈ | ශේෂ පත්‍ර සැසඳීම සහ සියලුම ශේෂයන් සඳහා සනාථ කිරීමේ ක්‍රියාවලිය සඳහා ලේඛනගත ප්‍රතිපත්තියක් බැංකුව සතුව නොමැත. සමහර ශේෂයන් සඳහා සැසඳුම් ක්‍රියාවලියක් ඇතත්, නිවැරදි මූල්‍ය ප්‍රකාශන | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදී. මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමේ ක්‍රියා පටිපාටි අත්පොත සකස් කර ඇති අතර අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් පසු | ශේෂ පත්‍ර සැසඳීම සහ සියලු ශේෂයන් සඳහා සනාථ කිරීමේ ක්‍රියාවලිය |

| | | | |
|---|---|---|---|
| | අයිතම (FSLI) යටතේ ඒවා වර්ගීකරණය කර තිබේද යන්න තහවුරු කරනවාට වඩා එම ක්‍රියාවලිය මගින් සංඛ්‍යාත්මක ශේෂයන් සැසඳීම මත වැඩි අවධානයක් යොමු කරයි. | වසර අවසානයට පෙර ක්‍රියාත්මක කරනු ඇත. | සඳහා ලේඛනගත ප්‍රතිපත්තියක් තිබීම අවශ්‍ය වේ. |
| ඉ | **ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය නොමැති වීම**<br>පවතින පද්ධතිවල ස්වයංක්‍රීයකරණය නොමැතිකම හේතුවෙන්, මූල්‍ය වාර්තාකරණ කණ්ඩායම අතින් සිදු කරනු ලබන ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු කාලයක් ගත කරයි. | මූල්‍ය වාර්තාකරණයේ ස්වයංක්‍රීයකරණය සිදු කරමින් පවතින අතර සංකීර්ණත්වය සහ ඉහළ දත්ත පරිමාව හේතුවෙන් ස්වයංක්‍රීයකරණ කාර්යයට සැලකිය යුතු කාලයක් ගතවේ. මෙම වර්ෂය අවසානයට පෙර අවසන් කිරීමට ඉහළම උත්සාහයක් දරනු ඇත. එවිට අතින් සිදු කරනු ලබන ක්‍රියාවලිය පිළිබඳ පාලනය තවදුරටත් ශක්තිමත් වනු ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම අවශ්‍ය වේ. |
| ඊ | **පොදු ලේජර ගිණුම් හිමිකාරිත්වය පිළිබඳ ලියකියවිලි නොමැති වීම**<br>බැංකුව සතුව පොදු ලේජර ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශන සටහන් හා හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් ලේඛනගත හිමිකරුවන්ගේ ලැයිස්තුවක් නොමැත. කළමනාකාරිත්වය විසින් අදාල සටහන්වල භාරකරුවන් (සකස් කරන්නා සහ අනුමත කරන්නා යන දෙදෙනාම) හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදී.<br>පොදු ලේජර හිමිකාරත්ව ප්‍රතිපත්තිය සකස් කරමින් පවතී.<br>2024.12.31 වන විට මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමේ ක්‍රියාවලි (FSCP) අත්පොත හඳුන්වාදීමත් සමඟ අදාළ සටහන්වල භාරකරු ඇතුළත් කරනු ඇත. | පොදු ලේජර හිමිකාරිත්ව ප්‍රතිපත්තියක් තිබිය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | 2023 දෙසැම්බර් 31 දිනට, නිරවුල් නොකරන ලද පහත දැක්වෙන දිගුකාලීන හිඟ පොලී සහන හිමිකම් ගිණුම් නිරීක්ෂණය විය. | **තැන්පතු:**<br><u>ජ්‍යෙෂ්ඨ පුරවැසි ලැබිය යුතු සහන ප්‍රතිපූරණය</u><br>මුදල් අමාත්‍යාංශය විසින් වරින් වර බැංකුව වෙත ලබා දෙන දිරි දිමනා පොලී මහ බැංකුව වෙතින් ලබා ගනිමින් සිටී.<br><u>විශේෂ තැන්පතු ගිණුම් සඳහා ලැබිය යුතු පොලී සහන</u><br>වරින් වර බැංකුව වෙත ලබා දෙන දිරි දීමනා ප්‍රතිපූරණය මුදල් අමාත්‍යාංශයෙන් අප දැනටමත් ලබා ගෙන ඇත.<br>**ණය:** | දිගුකාලීන පොලී සහන හිමිකම් ගිණුම් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |

| පොදු ලේජර ගිණුමේ විස්තරය | පොදු ලේජර කේතය | 2023.12.31 දිනට හිඟ පොලිය (රු.මිලියන | ලැබිය යුතු පොලීවල වයස් විශ්ලේෂණය (රු. මිලියන) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | මාස 03 ට අඩු | මාස 3-6 අතර | මාස 6 -12 අතර | වසර 1 - 2 අතර | වසර 2 ට වැඩි |
| තැන්පතු | | | | | | | |
| විශේෂ තැන්පතු ගිණුම් සඳහා ලැබිය යුතු පොලී සහන | 11310600 | 275.37 | 59.98 | 71.56 | 143.83 | - | - |
| ජ්‍යෙෂ්ඨ පුරවැසි ලැබිය යුතු සහන ප්‍රතිපූරණය | 11310566 | 24,349.44 | 0.83 | 224.62 | 2,053.38 | 15,048.97 | 7,021.65 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ණය | | | | | | | |
| එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා | 5150 1021 | 589.06 | 105.48 | 76.76 | 19.69 | 386.79 | 0.33 |
| දියවර දිරිය | 5150 1018 | 6.68 | 2.82 | 2.42 | 1.36 | - | - |
| වාණිජ පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය | 5150 1018 | මහ බැංකුව විසින් තහවුරු කළ යුතුය * | | | | 1,473.68* | |
| පොලී රහිත අධ්‍යාපන ණය | 5150 1018 | 276.98 | 276.98 | - | - | - | - |
| STaRR ව්‍යාපෘතිය | 5150 1018 | 0.27 | - | - | - | - | - |
| NCRCS | 5150 1006 | 14.12 | 3.70 | 10.42 | - | - | - |

* 2023.12.31 දිනට හිඟ ශේෂය

<u>එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය</u>

මුලදී ගෙවීම් තහවුරු කිරීම මුදල් අමාත්‍යාංශය විසින් සිදු කරන ලද අතර, ඔවුන්ගේ පද්ධතිය සමඟ හරස් පරීක්ෂාව සිදු කරන ලදී.

දැනට (2022 ඔක්තෝම්බර් මාසයෙන් පසු), අභ්‍යන්තර විගණන තහවුරු කිරීම ලැබීමෙන් පසු සියලුම හිමිකම් ඉදිරිපත් කරනු ලැබේ.

2022 ඔක්තෝබර් මාසයට පෙර අදාළ ඉහත පොලී සහනාධාර ගෙවීම් විධිමත් කිරීමට සාකච්ඡා කෙරෙමින් පවතී.

<u>**දියවර දිරිය**</u>

එම යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති අක්‍රීය ණය සම්බන්ධයෙන් පොලී සහනාධාරය ගෙවීම සම්බන්ධයෙන් නොවිසඳුණු කරුණක් පවතී. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය සමඟ කිහිප වතාවක් සාකච්ඡා පැවතුණි. නමුත් අද වන විටත් අමාත්‍යාංශය විසින් ගැටලුවට සාධාරණ විසඳුමක් ලබා දී නොමැත.

<u>**වාණිජ පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය**</u>

මෙම වර්ෂය තුළදී ඉතා ඉක්මනින් කාරණය විසඳීමට දැනටමත් කටයුතු යොදා ඇත.

<u>**පොලී රහිත අධ්‍යාපන ණය**</u>

පොලී සහනාධාර හිමිකම් විධිමත් කර ඇති අතර

| | | | |
|---|---|---|---|
| | | 2024 ජූලි දක්වා සහනාධාර ගෙවීම් ලැබී ඇත.<br><br><u>STaRR ව්‍යාපෘතිය</u><br>පොලී සහනාධාරය විධිමත් කර ඇති අතර 2024 පළමු කාර්තුව දක්වා සහනාධාර ගෙවීම් ලැබී ඇත.<br><br><u>NCRCS</u><br>පොලී සහනාධාරය විධිමත් කර ඇති අතර සහනාධාර ගෙවීම් 2023 දෙවන භාගය දක්වා ලැබී ඇත. | |
| ආ | මාලදිවයින ශාඛාවේ "අවිනිශ්චිත ගිණුම - එ.ජ.ඩො ණයගැතියන් - ගිණුම් අංක11310021" හි එ.ජ.ඩො 250,000 ක මුදලක් දීර්ඝ කාලයක් තිස්සේ කිසිදු අයකර ගැනීමකින් තොරව පවතින අතර මෙය 2018 වර්ෂයේ සිදු වූ වංචනික ගනුදෙනුවක් හේතුවෙන් සිදුවූවක් වේ. නඩුව තවමත් විභාග වෙමින් පවතී. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදී.<br>කාර්ය මණ්ඩල සාමාජිකයෙකු සම්බන්ධව සිදු වූ වංචනික ගනුදෙනුවක් හේතුවෙන් එ.ජ.ඩො 250,000 ක මුදලක් පවතී. මෙම කාරණය සම්බන්ධයෙන් වූ නඩුව තවමත් විභාග වෙමින් පවතී. මෙයට අදාළව බැංකුවේ මාලදිවයින ශාඛාව විසින් රක්ෂණ හිමිකම් පැමක් ලෙස එ.ජ.ඩො 45,000 ක් ආපසු ලබාගෙන ඇත. | අයකර ගැනීමේ ක්‍රියාවලිය පසුවිපරම් කිරීම අවශ්‍ය වේ. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිගුකාලීන හිඟ ගෙවිය යුතු ශේෂයන් පහත ගිණුම්වල පවතින අතර එම ශේෂයන් නිරවුල් කිරීමට සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මුළු හිඟ ශේෂයන් අඩු වුවද, 2023 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන හිඟ ශේෂයන් තවමත් නිරවුල් නොවී පවතී. විස්තර පහත පරිදි වේ; | **<u>එකතු කිරීම වෙත යවා ඇති අයකිරීම් වවුචර ලැබීම්</u>**<br>2024.09.30 දිනට මෙම පොදු ලේජර ශේෂය රු. 117,888,402 ක් දක්වා අඩු වී ඇත.<br>**<u>ව්‍යාජ චෙක්පත් සහ වංචා මත වෙන්කිරීම්</u>**<br>අයකරගත් රක්ෂණ හිමිකම් හෝ ගනුදෙනුකරුවන්ගෙන් අයකර ගැනීම හේතුවෙන් අදාළ වර්ෂයේ | අනෙකුත් වගකීම් ගිණුම්වල දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |

<table>
<tr><th>ගිණුමේ නම</th><th>පොදු ලේජර අංකය</th><th>වටිනාකම (රු.මිලියන)</th><th>වයස් විශ්ලේෂණය</th><th></th></tr>
<tr><td>එකතු කිරීම මත යැවූ අයකිරීම් වවුචර ලැබීම්</td><td>22310082</td><td>126.94</td><td>
<table>
<tr><th>ශේෂයන්</th><th>2023.12.31 දිනට ශේෂය (රු. මිලියන)</th><th>2022.12.31 දිනට ශේෂය (රු. මිලියන)</th></tr>
<tr><td>වසර 5 ට වඩා වැඩි</td><td>96.48</td><td>96.36</td></tr>
<tr><td>වසර 5-2 අතර</td><td>3.96</td><td>4.08</td></tr>
<tr><td>වසර 2-1 අතර</td><td>1.09</td><td>0.60</td></tr>
<tr><td>වසර 1 ට අඩු</td><td>25.40</td><td>92.84</td></tr>
<tr><td>එකතුව</td><td>126.93</td><td>193.88</td></tr>
</table>
</td><td>හඳුනාගත් අලාභ හා වංචා, සහ හිඟ ශේෂවල විචලනය සඳහා වෙන්කිරීම් සිදු කර ඇත. බැංකුව විසින් හිඟ ශේෂය අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබන අතර පොරොත්තු හිඟවලට හේතු එකතු කරනු ඇත.</td></tr>
<tr><td>ව්‍යාජ චෙක්පත් සහ වංචා මත සංචිත</td><td>22310122</td><td>1,609.74</td><td>
<table>
<tr><th>ශේෂයන්</th><th>2023.12.31 දිනට ශේෂය (රු. මිලියන)</th><th>2022.12.31 දිනට ශේෂය (රු. මිලියන)</th></tr>
<tr><td>වසර 5 ට වඩා වැඩි</td><td>1,001.92</td><td>512.06</td></tr>
<tr><td>වසර 5-2 අතර</td><td>62.31</td><td>1,258.52</td></tr>
<tr><td>වසර 2-1 අතර</td><td>476.30</td><td>417.00</td></tr>
<tr><td>වසර 1 ට අඩු</td><td>69.21</td><td>78.50</td></tr>
<tr><td>එකතුව</td><td>1,609.74</td><td>2.266.07</td></tr>
</table>
</td><td></td></tr>
<tr><td>එකතුව</td><td></td><td>1,736.68</td><td></td><td></td></tr>
</table>

### 1.6.3 අත්තිකාරම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i) | 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජයට සහ රජය සතු ව්‍යවසායන්ට අයත් මුළු හිඟ ණය සහ අත්තිකාරම් ශේෂය රු. මිලියන 938,825 ක් වූ අතර එය මුළු ණය සහ අත්තිකාරම්වලින් සියයට 38.2 ක් සහ බැංකුවේ මුළු වත්කම් වටිනාකමෙන් සියයට 21.28 ක් නියෝජනය කරයි. බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම් සහ මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස මෙම රජයේ ණය ප්‍රමාණය පසුගිය වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 7.7 කින් සහ සියයට 13.2 කින් සුළු වශයෙන් අඩු වී ඇත. | දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව, කාල සටහනක් සමඟ ශ්‍රී ලංකා රජයේ සහ රජය සතු ව්‍යවසායන්හි ණය ප්‍රමාණය (සෘජු) අඩු කිරීමට බැංකුව විසින් ආයතනික සැලැස්මෙහි ඉලක්ක පිහිටුවා ඇත.<br>පසුගිය කාලය තුළ ශ්‍රී ලංකා රජයේ සහ රජය සතු ව්‍යවසායන්හි සෘජු ණය ප්‍රමාණය අඩු කිරීමට බැංකුව පියවර ගෙන ඇති අතර 2024.06.30 දිනට ණය ප්‍රමාණය සියයට 34 ක් දක්වා අඩු විය.<br>ශ්‍රී ලංකා රජයේ සහ රජය සතු ව්‍යවසායන්හි ණය ප්‍රමාණය අඩු කිරීමට බැංකුව සෑම උත්සාහයක්ම ගනු ලැබේ. | ශ්‍රී ලංකා රජයේ සහ රජය සතු ව්‍යවසායන් හි ණය පහසුකම් අයකර ගැනීම සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (ii) | භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකා ගුවන් සේවය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා රජය (එ.ජ.ඩො පහසුකම), ජාතික ජල මණ්ඩලය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ගල් අඟුරු පුද්ගලික සමාගම සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව 2023 දෙසැම්බර් 31 දිනට ඉහළම රජය සතු ව්‍යවසායන් 10 ලෙස හඳුනා ගෙන ඇති අතර 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ශේෂය රු. මිලියන 890,125.58 ක් විය. එහි රු. මිලියන 868,321.60 ක් වූ හිඟ ප්‍රාග්ධනය කොටස සහ රු. මිලියන 21,803.98 ක් වූ හිඟ පොලිය ඇතුළත් විය. මෙය ශ්‍රී ලංකා රජයට සහ රජය සතු ව්‍යවසායයන්ට අයත් මුළු හිඟ ණය සහ අත්තිකාරම්වලින් සියයට 94.81 ක් නියෝජනය කරයි. එබැවින්, ශ්‍රී ලංකා රජය සහ රජය සතු ව්‍යවසායයන් ඇතුළත් මෙම ප්‍රධාන ගනුදෙනුකරුවන් දස දෙනා මත ප්‍රධාන වශයෙන් යැපීමක් පවතී. | ශ්‍රී ලංකා රජයේ සහ රජය සතු ව්‍යවසායන්හි ණය ප්‍රමාණය අඩු කිරීමට බැංකුව සෑම උත්සාහයක්ම ගනු ඇත. තවද, රජය සතු ව්‍යවසායන් සඳහා ලබා දී ඇති කාලීන ණය පහසුකම් ලබා දෙන අවස්ථාවේදී එකඟ වූ ආපසු ගෙවීමේ සැලැස්ම මත පදනම්ව ක්‍රමානුකූලව පියවයි.<br>2024.06.30 දිනට ඉහළම රජය සතු ව්‍යවසායන් 10 හි ණය ප්‍රමාණය මුදල රු. මිලියන 884,113.28 කි.<br><u>ශ්‍රී ලංකා රජය (එ.ජ.ඩො පහසුකම)</u><br>අක්වෙරළ බැංකු අංශය සමඟ වන හිඟය 2024.06.30 දින සිට ශුන්‍ය වේ.<br><u>ශ්‍රී ලංකා ගුවන් සේවය</u><br>අද දක්වා ශ්‍රී ලංකා ගුවන් | ණය අවදානම අඩු කිරීම සඳහා අයකර ගැනීමේ පසු විපරම් කිරීමට සහ සුදුසු සීමාවන් පවත්වා ගැනීම අවශ්‍ය වේ. |

| ආයතනය | 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු. මිලියන | සුරැකුම | සුරැකුම් වටිනාකම | |
|---|---|---|---|---|
| භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් (ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය මාරු කිරීමෙන් පසුව) | 435,060.95 | ණය ගිවිසුම | - | සේවයේ මාසික පොලීවල කිසිදු අයවිය යුතු මුදලක් නොමැත. 2024.02.14, 2024.04.15, 2024.06.03 සහ 2024.09.18 යන දිනයන්හිදී රජයේ භාණ්ඩාගාරය වෙත හිමිකම් ඉදිරිපත් කර ඇත. සියලුම ණය ආපසු ගෙවීම 2024.12.31 දක්වා හෝ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තෙක් අත්හිටුවා ඇත. දැනටමත් ඉදිරිපත් කර ඇති හිමිකම් පියවීමට හෝ එසේ නොමැතිනම් දීර්ඝ කරන ලද සහන ලිපිය සහ භාණ්ඩාගාර ඇපකරය ලබා දෙන ලෙස ඉල්ලමින් 2024.08.22 සහ 2024.09.10 යන දිනවලදී මහා භාණ්ඩාගාරය වෙත ලිපි යවා ඇත. |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 136,382.12 | භාණ්ඩාගාර ඇපකරය<br>ස්ථාවර තැන්පතු | රු. මිලියන 147,657.25<br>රු. මිලියන 2,552.71 | |
| ශ්‍රී ලංකා රජය (එ.ජ.ඩො පහසුකම) | 78,094.30 | සුරැකුම් රහිත | - | |
| ශ්‍රී ලංකා ගුවන් සේවය | 69,492.19 | භාණ්ඩාගාර ඇපකරය<br>සහන ලිපිය<br><br><br><br>ශ්‍රී ලංකා කේටරින් සමාගමේ සාමාන්‍ය කොටස් උකස් කිරීම | එ.ජ.ඩො මිලියන 5.0<br>එ.ජ.ඩො මිලියන 32.50<br>එ.ජ.ඩො මිලියන 42.50<br>එ.ජ.ඩො මිලියන 25.0<br>එ.ජ.ඩො මිලියන 186.0 | ශ්‍රී ලංකා ගුවන් සේවය විසින් ඔවුන්ගේ බැංකු අයිරා සීමාව වන එ.ජ.ඩො මිලියන 70.0 ක් ලැබිය යුතු අපනයන ලැබීම් සමඟ ණය චක්‍රීයකරණය කරයි. (revolve). |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 59,563.53 | භාණ්ඩාගාර හානි රක්ෂණය | රු. මිලියන 100,000 | |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 49,404.07 | භාණ්ඩාගාර ඇපකරය | 33,152.10<br>එ.ජ.ඩො මිලියන 107.49 | |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 19,088.88 | සුරැකුම් රහිත | - | |
| ලංකා විදුලිබල මණ්ඩලය | 15,969.27 | ණය ගිවිසුම | - | |
| ලංකා ගල් අඟුරු පුද්ගලික සමාගම | 15,689.56 | භාණ්ඩාගාර ඇපකරය | රු. මිලියන 4,780 | |
| රාජ්‍ය ඔෟෂධ නීතිගත සංස්ථාව | 11,380.71 | භාණ්ඩාගාර ඇපකරය | රු. මිලියන 49,500 | |
| **එකතුව** | **890,125.58** | | | |

(iii) පසුගිය වසර 5 ක කාලය තුළදී ඉහළම අක්‍රීය ගනුදෙනුකරුවන් (NPA) 10 දෙනා විශ්ලේෂණය කරන ලද අතර පහත නිරීක්ෂණ අනාවරණය විය.

| ගනුදෙනුකරුගේ නම | 2023/12/31 දිනට මුළු අක්‍රීය ණය ශේෂය (රු. මිලියන) |
|---|---|
| ශ්‍රී ඉක්විප්මන්ට් ෆයිනෑන්ස් ලිමිටඩ් | 5,465.70 |
| දොලියා ඉන්වෙස්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | 5,164.19 |
| මිහින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | 4,684.69 |
| ඩබ්ලිව් එම් මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් | 4,524.44 |
| කේ.ඩී ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 4,341.04 |
| සින්ටේසි ලිමිටඩ් | 2,981.21 |
| හුරිහෙල පතන (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,829.77 |
| අනුදන් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,644.01 |
| අල්මාර් ට්‍රේඩින් කම්පැනි ලිමිටඩ් | 2,513.85 |
| දේශිකා එම්බ්‍රොයිඩරි සොලුයුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,244.01 |
| **එකතුව** | **37,393.42** |

- 2023 දෙසැම්බර් 31 දිනට ඉහළම අක්‍රීය ගනුදෙනුකරුවන් 10 දෙනාගේ සමස්ථ ශේෂය රු. මිලියන 37,393.42 ක් වූ අතර පසුගිය වර්ෂය හා සසඳන විට රු.මිලියන 300.45 කින් හෙවත් සියයට 0.81 කින් වැඩි වී තිබුණි. එය 2023 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අදියර III හි දළ ණය සහ අත්තිකාරම්වලින් සියයට 11.99 ක් නියෝජනය කරයි.
- 2023 දෙසැම්බර් 31 දිනට පසුගිය වර්ෂ පහක කාලය තුළදී ඉහළම අක්‍රීය ගනුදෙනුකරුවන් 10 දෙනාගේ සමස්ථ ශේෂය සියයට 132.86 කින් හෙවත් රු. මිලියන 21,335.24 කින් වැඩි වී තිබුණි.

සටහන් කර ගන්නා ලදී.

2019 සිට 2021 දක්වා ඉහළම අක්‍රීය ණය 10 හි ප්‍රතිශතක වැඩිවීම අඩු වී ඇත. කෙසේ වෙතත්, ආර්ථික පසුබෑමේ ප්‍රතිවිපාක හේතුවෙන් 2022 දී එය විශාල ලෙස වැඩි වී ඇත.

බැංකුව විසින් ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 50 දෙනා අඛණ්ඩව පසු විපරම් සිදු කරන අතර කාර්තුමය සහකාර සාමාන්‍යාධිකාරී සමාලෝචනවලදී විසඳුම් ලබා දෙනු ලබයි.

ගනුදෙනුකරුවන්ගේ තත්ත්වය සහ වර්තමාන තත්ත්වය පහත පරිදි වේ;

- ශ්‍රී ඉක්විප්මන්ට් ෆයිනෑන්ස් ලිමිටඩ්, දොලියා ඉන්වෙස්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් - අදියර III යටතේ වර්ගීකරණය කර ඇත.
- මිහින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් - භාණ්ඩාගාර ඇපකරය මත හිමිකම් ගොනු කර ඇත.
- ඩබ්ලිව් එම් මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් - රු. මිලියන 60 ක මාසික අවශ්‍යතාවයට සාපේක්ෂව දැනට රු. මිලියන 45 - 47 ක් අයකර ගනිමින් සිටී. පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව, 2024.10.13 දිනට ප්‍රාග්ධන කොටස ලෙස රු. මිලියන 75 ක් සහ පොලී වශයෙන් රු. මිලියන 365 ක් අයකර ගෙන ඇත.
- සින්ටේසි ලිමිටඩ්, අල්මාර් ට්‍රේඩින් කම්පැනි ලිමිටඩ්, දේශිකා එම්බ්‍රොයිඩරි සොලුයුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් - නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර

අයකර ගැනීම් පසු විපරම් කිරීම සහ අනාගතයේ දී ණය ලබා දීමට පෙර සතුටුදායක ගනුදෙනුකරුවන්ගේ ණය ඇගයීම සහතික කිරීම අවශ්‍ය වේ.

| | | | |
|---|---|---|---|
| | | ඇති අතර නඩු විභාග වෙමින් පවතී.<br>• කේ.ඩී ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, හුරිහෙල පතන (ප්‍රයිවට්) ලිමිටඩ් - පුනර්ජීවන පැකේජය (Revival Package) ක්‍රියාත්මක කර ඇත.<br>• අනුදන් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - ණය පුනර්ජීවනය කිරීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා පවත්වයි. | |
| (iv) | 2023 සැප්තැම්බර් 30 දිනට ඉහළම අක්‍රීය ගනුදෙනුකරුවන් 10 දෙනාගේ (කණ්ඩායම් පදනම) නිරාවරණය සමාලෝචනය කිරීමේදී පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.<br>**ශ්‍රී ඉක්විප්මන්ට් ෆයිනෑන්ස් ලිමිටඩ්** | ණය යෝජනා ඇගයීම සඳහා මූලික තොරතුරු සෑම විටම ණය ගැනුම්කරුගෙන් ලබා ගනී. සාමූහික සංවිධායකවරයා ලෙස, ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව විසින් රහස්‍ය ගිවිසුමක් ලංකා බැංකුව වෙත යොමු කර ඇත.<br>ශ්‍රී ඉක්විප්මන්ට් ක්ෂුද්‍ර වෙළඳපොලවල් සඳහා ණය සේවාදායකයෙක් ලෙස සලකනු ලබන අතර මූල්‍ය ආයතනයක පරාමිතියට අනුකූල වේ සහ එවැනි මූල්‍ය ආයතනයක් සාමාන්‍ය ස්කන්ධ ප්‍රාග්ධනයට ණය යන දර්ශකවලට වඩා ඉහළ දර්ශක වාර්තා කරයි. ශ්‍රී ඉක්විප්මන්ට් ෆයිනෑන්ස් ලිමිටඩ්හි වෙළඳපල ප්‍රාග්ධනීකරණය එ.ජ.ඩො බිලියන 10 ක් විය. ණය පහසුකම ප්‍රදානය කිරීම සඳහා සමාගම තක්සේරු කරන අවස්ථාවේදී එය ඉන්දියාවේ එක් වාසි සහගත ව්‍යාපාරික සමාගම් සංගතයක් (lucrative business conglomerates) විය. ඉන්දීය සංචිත බැංකුව අනුමත බෙදාහැරී අනු සැලැස්මෙ සැලැස්මට සැලැස්මට අනුව, ලංකා බැංකුව අනුමත සුරක්ෂිත ECB (බාහිර වාණිජ ණය ගැනීම) ණය දෙන්නන්ගේ | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |
| 1 | සමාගම යටිතල පහසුකම් මූල්‍ය, උපදේශන හා සංවර්ධන, යටිතල පහසුකම් උපකරණ මූල්‍ය, විකල්ප ආයෝජන අරමුදල්, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර සමඟ සම්බන්ධ වී ඇත.<br><br>එ.ජ.ඩො මිලියන 110 ක ගෝලීය සීමාවක් සහිතව සෙයී ඉක්විප්මන්ට් වෙත ණය මුදල් සැපයීම සඳහා බැංකුව අනෙකුත් සාමූහික බැංකු (syndicate banks) 6 ක් සමඟ සහභාගී වී ඇත.<br><br>2018 ජූලි 30 දින බැංකුව විසින් එ.ජ.ඩො මිලියන 15 ක සාමූහික (syndicate) කාලීන ණය පහසුකමක් ශ්‍රී ඉක්විප්මන්ට් ෆයිනෑන්ස් ලිමිටඩ් වෙත ලබා දී තිබූ අතර 2021 දෙසැම්බර් 14 දින සිට මෙම ණය අක්‍රීය ණය කාණ්ඩය යටතේ පවතී.<br>2017 නොවැම්බර් 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් අංක 2.10 ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමූහික ණය පහසුකමේ සුරැකුම් ලේඛන සහ අනෙකුත් අදාළ ලියකියවිලි අත්සන් කිරීමේ බලය බැංකුව වෙනුවෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය) වෙත සහ සහකාර සාමාන්‍යාධිකාරී (අක්වෙරළ බැංකුකරණය) වෙත පවරා ඇතත්, 2017 දෙසැම්බර් 07 දිනැති පිරිනැමීමේ ලිපිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය) අත්සන නොමැතිව සහකාර සාමාන්‍යාධිකාරී (අක්වෙරළ බැංකුකරණය) සහ සම්බන්ධතා කළමනාකරු (අක්වෙරළ බැංකුකරණය) විසින් අත්සන් කර තිබුණි. තවද, 2017 සැප්තැම්බර් 25 දිනැති විද්‍යුත් තැපෑලෙන් රහස්‍ය ගිවිසුම ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව වෙත යොමු කරන අවස්ථාවේදී සුරැකුම් ලේඛන සහ වෙනත් අදාළ ලියකියවිලි අත්සන් කිරීම සඳහා ඉහත සඳහන් බලධාරී නියෝජිතයින් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොමැති බව නිරීක්ෂණය විය. ඒ වෙනුවෙන් සහ බැංකුව වෙනුවෙන් 2017 අගෝස්තු 23 දිනැති රහස්‍ය ගිවිසුමට සහ 2017 | | |

අගෝස්තු 22 දිනැති තොරතුරු සංදේශයට සහකාර සාමාන්‍යාධිකාරී (අක්වෙරළ බැංකුකරණය) විසින් තනිව අත්සන් කර තිබුණි. ඉහත රහස්‍ය ලේඛන තනිව අත්සන් කිරීම බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය දුර්වල කිරීමට හේතු වේ.

තවද, බැංකුව විසින් එම පහසුකම ලබාදීමට පෙර සමාගමේ මූල්‍ය තත්ත්වය සහ ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳව නිසි ඇගයීමක් සිදු කර නොතිබූ අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ සෘණාත්මක දර්ශක නොසලකා තිබුණි.

ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව (SCB) විසින් ලංකා බැංකුව වෙත යවන ලද තොරතුරු සංදේශයේ (IM) වැදගත් දැනුම්දීම යටතේ "පහසුකම සඳහා සහභාගී වීමට විභව ණය දෙන්නන්ට අවශ්‍ය සියලුම කැමැත්ත, අනුමැතිය හෝ අවසර ලබා ගැනීම විභව ණය දෙන්නන්ගේ වගකීම වන බව සහ මෙම පහසුකමට සහභාගී වීමෙන්, අනිවාර්ය නියමු සංවිධායකයා (Mandated Lead Arranger) මේ සම්බන්ධයෙන් විභව ණය දෙන්නන්ට කිසිදු සැලකිල්ලක් දැක්විය යුතු නැති බව විභව ණය දෙන්නන් පිළිගෙන ඇති බව සලකනු ලබන බව." සඳහන් කර ඇත. කෙසේ වෙතත්, අක්වෙරළ බැංකු අංශය විසින් ණය කමිටුවට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද කිසිදු සංදේශයක මෙම ප්‍රකාශය ඇතුළත් කර නොමැති බව නිරීක්ෂණය විය.

2018 ජූලි 24 දිනැති ණය කමිටු සංදේශයට අනුව, ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ ප්‍රමුඛ බැංකු කාර්යභාරය, අවදානම් අවම කිරීමේ සාධකයක් ලෙස සලකා අනෙකුත් බැංකු මෙම සම්මේලික ණය සඳහා සහභාගි වන බව ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් සඳහන් කර ඇත.

සම්මේලික ණය පහසුකම සඳහා සහභාගී වන විට, අනිවාර්ය නියමු සංවිධායක ලෙස ක්‍රියා කරන ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව මත පමණක් බැංකුව රඳා පැවතුනු බව පෙනී යයි.

2017 නොවැම්බර් 30 දිනැති අංක 2.10 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන අනුව, ගෙවිය යුතු කාලය වසර 05 ක් ලෙස දක්වා ඇත. සම්පූර්ණ ආපසු ගෙවීමේ කාලය පමණක් සඳහන් කරමින් මෙම පහසුකම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබූ අතර කිසිදු ආපසු ගෙවීමේ ව්‍යුහයක් සඳහන් කර නොතිබුණි. පසුව, 2022 සැප්තැම්බර් 30, 2023 මාර්තු 30 සහ 2023 සැප්තැම්බර් 30 යන දිනයන්හිදී එ.ජ.ඩො මිලියන 5.0 බැගින් වූ ගෙවීම් 03 ක් ලෙස 2018 අගෝස්තු 23 දිනැති අංක 1.2.05 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන මගින් ණය ආපසු ගෙවීමේ ව්‍යුහය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. ඒ අනුව, ණය මුදලේ ප්‍රාග්ධන කොටස ආපසු ගෙවීම සඳහා වසර 04 ක සහන කාලයක් ලබා දී ඇති බව නිරීක්ෂණය විය.

2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරු ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 5,830.25 වූ අතර එය මුළු ප්‍රාග්ධන කොටස සහ පොලී ශේෂය ලෙස පිළිවෙලින් රු. මිලියන 4,866.72 කින් සහ රු. මිලියන 963.53 කින් සමන්විත විය. පසුව, 2023 දෙසැම්බර් 15 සහ 2024 පෙබරවාරි 07 යන දිනවලදී සමාගමෙන් එ.ජ.ඩො 2,335,950.38 ක ගෙවීමක් ලැබී තිබුණි. 2024 මාර්තු 07 දින දක්වා ලද මුළු මුදල එ.ජ.ඩො 4,339,990.17 ක් විය.

කාණ්ඩයට අයත් වේ.

CIRP ක්‍රියාවලියට අනුව එ.ජ.ඩො මිලියන 2.35 ක් අයකර ගෙන ඇත.

යෝජනා සැලැස්ම පහත පරිදි වේ.

- විකල්ප පරිවර්තනය කළ හැකි ණයකර (Optional Convertible Debentures) නිකුත් කර ඇත - ඉංදීය රුපියල් මිලියන 349.7 (එ.ජ.ඩො මිලියන 4.19)
- ස්කන්ධ කොටස් - ඉංදීය රුපියල් මිලියන 11.3 (එ.ජ.ඩො මිලියන 0.13)
- ලැබිය යුතු මුළු මුදල - එ.ජ.ඩො මිලියන 4.66

ලංකා බැංකුව නියෝජනය කරමින් (ලංකා බැංකුව වෙනුවෙන් අක්වෙරළ බැංකු අංශය) ඉන්දීය සංචිත බැංකුවේ රැස්වීම්වලට / ණය හිමියන්ගේ කමිටු රැස්වීම්වලට සහ වෙනත් අදාළ කරුණුවලට සහභාගි වීමට බලයලත් නියෝජිතයකු ලෙස ජ්‍යෙෂ්ඨ උප සභාපති ණය (චෙන්නායි ශාඛාව) එස් රාමනුජම් මහතා අධ්‍යක්ෂවරු පත් කර ඇත.

| | | | |
|---|---|---|---|
| | සෑම අවස්ථාවකදී හිඟ ණය මුදල මත අවම වශයෙන් 1.15 වාරයක සුරැකුම් ආවරණයක් සැපයීමට ප්‍රමාණවත් “සුරක්ෂිත ලැබිය යුතු මුදල්” යන නිශ්චිත ලැබිය යුතු මුදල් උපකල්පනය කිරීම මගින් සුවිශේෂී පළමු ශ්‍රේණිගත සුරැකුම් පොලී ලබා දීමෙන් මෙම පහසුකම සුරක්ෂිත කර ඇත. ණය ගැනුම්කරු විසින් තම ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය සම්බන්ධයෙන් ලැබිය යුතු මුදල් සහ ණය ගැනුම්කරුගේ පොත්වල ඇති ප්‍රමිතිය, "ආරක්ෂිත ලැබිය යුතු මුදල්" යන්නෙන් අදහස් වේ. ණය පහසුකම ලබා දීමට පෙර සුරක්ෂිත ලැබිය යුතු මුදල් පිළිඳව බැංකුව විසින් කිසිදු ස්වාධීන සත්‍යාපනයක් හෝ වයස් විශ්ලේෂණයක් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.<br>මේ වන විට 2021 ඔක්තෝබර් 11 වැනි දින ඉන්දීය සංචිත බැංකුව විසින් බුන්වත්බව ප්‍රකාශ කිරීමත් සමඟ ඉන්දියාවේ බුන්වත්බව සහ බංකොලොත්භාවය පිළිබඳ මණ්ඩලය විසින් බුන්වත් නඩුවක් ගොනු කර ඇත. | | |
| 2 | **දොලියාදූ ඉන්වෙස්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්** (DIPL)<br><br>දොලියාදූ යනු මාලදිවයිනේ දෝලියාදූ දූපතේ "තරු 5" නිවාඩු නිකේතන ව්‍යාපෘතියක් වන අතර එය ජල විලාස් 65 ක් සහ වෙරළ විලාස් 35 ක්, අවන්හල් තුනක් සහ අනෙකුත් සියලුම විවේක පහසුකම් ඇතුළුව විලාස් 100 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි.<br>2010 ඔක්තෝබර් 27 වැනි දින බැංකුව විසින් මෙම ගනුදෙනුකරුට එකතුව එ.ජ.ඩො මිලියන 8 ක් වන එ.ජ.ඩොලර්වලින් නාමනය කරන ලද කාලීන ණය දෙකක් ලබා දී ඇති අතර එයට අක්වෙරළ බැංකු අංශයෙන් එ.ජ.ඩො මිලියන 5 ක් සහ බැංකුවේ මාලදිවයිනේ ශාඛාවෙන් එ.ජ.ඩො මිලියන 3 ක් ඇතුළත් වේ. පසුව, එම පහසුකම් පිළිවෙළින් 2012 ජූනි 29 සහ 2012 ජූනි 31 යන දිනවලදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. ඩොල්යාදූ දූපතේ වෙරළ විලාස් 35 ක්, ජල විලාස් 65 ක් සහ අවන්හල් තුනක් ඉදිකිරීම සඳහා මෙම ණය ප්‍රදානය කර තිබුණි. ඉන්දීය රාජ්‍ය බැංකුව (SBI) සහ මාලදිවයින් බැංකුව (BML) විසින් මෙම ව්‍යාපෘතියට මුලින් අරමුදල් සපයා තිබුණි. දැනටමත් SBI සහ BML වෙත උකස් කර ඇති ශවියානි අටොල් හි " දෝලියාදූ" දූපතේ හි ප්‍රධාන කල්බදු අයිතිය මත pari-passu උකසට එරෙහිව අමතර ණය පහසුකම් සඳහා සමාගම බැංකුව වෙත යොමු වී තිබුණි. ප්‍රධාන කල්බදු අයිතිය සහ DIPL හි සමූහ සමාගම වන AAA ඇන්ඩ් කම්පැනි හි අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගලික ඇපකරවලට එරෙහිව pari-passu උකසක් මත ණය දෙන්නන් විසින් මෙම පහසුකම් ප්‍රදානය කර තිබුණි.<br>2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරුගේ ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 5,536.98 ක් වූ අතර එය ගෙවිය යුතු මුළු ප්‍රාග්ධනය කොටස සහ පොලීය ලෙස පිළිවෙළින් රු. මිලියන 2,583.32 කින් සහ රු. මිලියන 2,953.66 කින් සමන්විත වේ.<br>ඉහළ ගිය ව්‍යාපෘති පිරිවැයට මුදල් යෙදවීම සඳහා ආයෝජකයෙකු/ණය දෙන්නෙකු සොයා ගැනීමට සමාගමට නොහැකි වූ අතර ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීමට සමාගමට නොහැකි විය. ව්‍යාපෘති ප්‍රවර්ධකයා ව්‍යාපෘතිය අතහැර දැමූ අතර | ඇපකරුවන්ගෙන් මුදල් අයකර ගැනීම සඳහා බැංකුව විසින් බලාත්මක කිරීමේ නඩුවක් සිවිල් අධිකරණයට ඉදිරිපත් කර ඇත. බලාත්මක කිරීමේ ක්‍රියාවලිය අතරතුර, BML සහ SBI මැදිහත් වන ලෙස ඉල්ලීම් කර ඇත. දැන් SBI විසින් දෝලියාදූ දූපත සඳහා නව තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, එම දූපත විකිණීම සඳහා උසාවිය ඉක්මනින්ම අත්පත් කර ගැනීම නියෝගයක් නිකුත් කරනු ඇත.<br>ඉන්දීය රාජ්‍ය බැංකුව (සහකාර උප සභාපති - ණය) විසින් ඊමේල්<br>පණිවිඩයක් මගින් පහත පරිදි වත්මන් තත්ත්වය යාවත්කාලීන කර ඇත.<br>අධිකරණ තීන්දුවට අනුව, SBI විසින් වෙන්දේසි දැන්වීම දේශීය පුවත්පතක් වන "මිහාරු" සහ වෙබ් අඩවියේ 2024.09.03 දින සිට 2024.10.15 දින දක්වා ප්‍රකාශයට පත් කරන ලද අතර SBI වෙබ් අඩවියේ දැන්වීම පළ කර ඇත. | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

සියලුම ණය දෙන්නන් ණය අයකර ගැනීම සඳහා ණය ගැණුම්කරුට එරෙහිව අයකර ගැනීමේ ක්‍රියාමාර්ගය ආරම්භ කර තිබුණි.

බැංකුව DIPL සහ පහසුකමේ ඇපකරුවන්ට එරෙහිව මාලදිවයින් සිවිල් අධිකරණයේ අංක 610/Cv-C/2016 යටතේ නඩුවක් ගොනු කර තිබුණි. 2016 ඔක්තෝබර් 27 වැනි දින අධිකරණය විසින් බැංකුවට පක්ෂව තීන්දුවක් ප්‍රකාශයට පත් කර තිබූ අතර අධිකරණ තීන්දුව දුන් දින සිට මාස 7 කින් ගෙවිය යුතු මුදල් ගෙවීමට නියෝග කළ තිබුණි. කෙසේ වෙතත්, එම කාලය තුළදී සම්පූර්ණ හිඟ මුදල ආපසු ගෙවීමට සමාගම අසමත් විය.

තීන්දුවට අනුව, සියලුම ණය දෙන්නන් වෙනුවෙන්, බැංකුව විසින් 2019 මාර්තු 21 වන දින එ.ජ.ඩො මිලියන 42.8 ක සංචිත මිලකට දූපතේ කල්බදු අයිතිය විකිණීමට ප්‍රකාශයට පත් කර තිබුණි. පසුව, 2020 මාර්තු මාසයේදී SBI විසින් දේපල එ.ජ.ඩො මිලියන 38.5 ක සංචිත මිලකට විකිණීමට ප්‍රකාශයට පත් කර තිබුණි. ප්‍රකාශන දෙකම සාර්ථක නොවීය. 2022 ජනවාරි 17 වන දින, SBI විසින් දූපත එ.ජ.ඩො මිලියන 33 ට විකිණීමට ප්‍රකාශයට පත් කර තිබූ අතර ලංසුකරුවෙකු නොමැතිව වෙන්දේසිය 2022 පෙබරවාරි 01 වන දින අවසන් කර තිබුණි. අවශේෂ වටිනාකම් පදනම මත එ.ජ.ඩො මිලියන 31.35 ක වටිනාකමින් වෙන්දේසිය ප්‍රකාශයට පත් කිරීමට SBI තීරණය කර තිබුණි. පළමු pari-passu උකස බැංකුවට ලබා දී තිබුණි.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2023 අගෝස්තු 31 දින (2023.08.31/13.8.01) පැවති රැස්වීමේදී පහත තීරණ ගෙන තිබුණි.

අ) හිඟ ප්‍රාග්ධන කොටසෙන් එ.ජ.ඩො 4,188,237.94 ක් (එ.ජ.ඩො 7,962,201.71 ක් වූ හිඟ ප්‍රාග්ධන කොටසෙන් සියයට 52.6 ක්) පහත පරිදි අයකර ගැනීමට
- අක්වෙරළ බැංකු අංශය - එ.ජ.ඩො 2,630,075.94
- බැංකුවේ මාලදිවයිනේ ශාඛාව - එ.ජ.ඩො 1,558,162.94

ආ) හිඟ ප්‍රාග්ධන කොටසෙන් එ.ජ.ඩො 3,773,963.77 ක් (එ.ජ.ඩො 7,962,201.71 ක් වූ හිඟ ප්‍රාග්ධන කොටසෙන් සියයට 47.4 ක්) පහත පරිදි ලියා හැරීමට
- අක්වෙරළ බැංකු අංශය - එ.ජ.ඩො 2,369,925.00
- බැංකුවේ මාලදිවයිනේ ශාඛාව - එ.ජ.ඩො 1,404,038.77

ඇ) 2023.08.09 දිනට එ.ජ.ඩො 7,711,822.64 ක් වූ උපචිත පොළිය සියයට 100 ක් පහත පරිදි අත්හැරීමට සහ පියවීමේ දිනය දක්වා තවදුරටත් උපචිත පොළිය අත්හැරීමට
- අක්වෙරළ බැංකු අංශය - එ.ජ.ඩො 4,866,249.97
- බැංකුවේ මාලදිවයිනේ ශාඛාව - එ.ජ.ඩො 2,845,572.67

ඈ) 2023.08.09 දිනට එ.ජ.ඩො 1,970,157.39 ක් වූ උපචිත දඩ පොලිය සියයට 100 ක් පහත පරිදි අත්හැරීමට සහ පියවීමේ දිනය දක්වා තවදුරටත් උපචිත දඩ පොලිය අත්හැරීමට
- අක්වෙරළ බැංකු අංශය - එ.ජ.ඩො 1,280,533.47
- බැංකුවේ මාලදිවයිනේ ශාඛාව - එ.ජ.ඩො 689,623.92

ඉ) නිල උපදෙස් චක්‍රලේඛ අංක 16/2018 හි සඳහන් කොන්දේසි නොසලකා හරිමින්, ඉහත (අ), (ආ), (ඇ), සහ (ඈ) යටතේ

විධිවිධාන සම්පූර්ණ සහ අවසාන පියවීමක් ලෙස සලකා බැලීමට සහ අක්වෙරළ බැංකු අංශයෙන් සහ බැංකුවේ මාලදිවයිනේ ශාඛාව වෙතින් ලබා දී ඇති ඉහත පහසුකම්වලට අදාළ DIPL සහ ඇපකරුවන්ගේ සියලු වගකීම් නිදහස් කිරීමට.

ඊ) පහත ලිපි නිකුත් කර නිරවුල් කිරීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට
- ණය ගැනුම්කරු (DIPL) සහ සම-ණය දෙන්නන් එනම් SBI සහ BML හෝ වෙනත් සම්බන්ධිත පාර්ශ්ව වෙත විරෝධතාවක් නොමැති බවට ලිපියක්
- ණය ගැනුම්කරුට සහ ඇපකරුවන්ට වගකීම් නිදහස් කිරීමේ ලිපියක්
- ණය ගැණුම්කරු, ඇපකරුවන් සහ බැංකුව අතර නිරවුල් කිරීමේ ගිවිසුම

ඉහත ගනුදෙනුව ණය ගැනුම්කරු හෝ යෝජිත ගැනුම්කරු විසින් 2023 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර සිදු නොකළහොත්, විරෝධතාවක් නොමැති බවට වන ලිපිය ශුන්‍ය සහ බල රහිත වේ. එබැවින්, බැංකුවේ මාලදිවයිනේ ශාඛාව විසින් 2024 ජනවාරි මස බලාත්මක කිරීමේ නඩුවක් සිවිල් අධිකරණයට ඉදිරිපත් කර තිබුණි. පළමු නඩු විභාගය 2024 පෙබරවාරි 07 වන දින පැවැත්විණි. එහිදී උකසට තබා ඇති දේපල තක්සේරු කිරීම සහ තක්සේරු කිරීම සඳහා තක්සේරුකරුවෙකු පත් කිරීම පිළිබඳව සාකච්ඡා කර තිබුණි.

| | | | |
|---|---|---|---|
| 3 | **දයා සමූහය**<br>**අ) දයා ඇපරල් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**<br>දයා ඇපරල් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් වියන ලද කලිසම්, කාන්තා ජීන්ස්, කොට කලිසම්, කලිසම් වැනි නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයේ නියැලී සිටී. බැංකුව විසින් 2004 සිට 2023 දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී රු. මිලියන 486.67 කට සමාන එ.ජ.ඩො කාලීන ණයක්, රු. මිලියන 153.20 කට බිල්පත් 03 ක් වට්ටම් කිරීමේ පහසුකමක්, රු. මිලියන 1, 063.71 ක් වූ උකස් කිරීමේ පහසුකම් (Hypothecation facilities) 113 ක් සහ රු. මිලියන 68.39 ක් වූ අයිරා පහසුකම් 02 ක් ප්‍රදානය කර තිබුණු අතර ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය සමතුලිත ලක්ෂ්‍යය වඩා බෙහෙවින් පහළ වීම හේතුවෙන් ඒවා 2019 සිට 2023 දක්වා කාලපරිච්ඡේදය තුළදී වරින් වර අක්‍රීය ණය කාණ්ඩයට මාරු කරන තිබුණි.<br>සමාගම 2021/2022 සහ 2022/2023 කාලපරිච්ඡේද සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. 2020/2021 වර්ෂය සඳහා සමාගමේ පවතින මූල්‍ය තොරතුරු අනුව, බදු පසු ලාභ අනුපාතය සියයට (28.7) ක්, ශුන්‍ය පොලී ආවරණ අනුපාතයක් සහ මුදල් චක්‍ර දින 103 සිට දින 278.1 දක්වා වැඩි වීමක් පෙන්නුම් කර තිබුණි.<br>සමාගමට සහ සමූහයේ අනෙකුත් සමාගම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට 2023 අප්‍රේල් 20 දින පැවති ණය කමිටුවේ රැස්වීමේදී තීරණය කළද, හෝටල් කර්මාන්තය ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ නව ලිනන් නිෂ්පාදන පෙළ සඳහා රෙදිපිළි සහ අනෙකුත් අමුද්‍රව්‍ය චීනයෙන් ආනයනය කිරීම සඳහා ණයවර ලිපි පහසුකම් ලබා දෙන ලෙස සමාගමේ අධ්‍යක්ෂවරයා විසින් 2023 ජූලි 31 දිනැති ලිපිය මගින් ඉල්ලා තිබුණි. 2023 ජූනි 27 දින අක්වෙරළ | සමාගම මූල්‍ය දුෂ්කරතා සමඟ ව්‍යාපාරය කරගෙන ගොස් ඇත. අපනයන ඇණවුම් නොමැතිකම හේතුවෙන්, 2023.03.09 දිනැති පිරිනැමීමේ ලිපියේ දක්වා ඇති නියමයන් සහ<br>කොන්දේසි පිළිපැදීමට සමාගමට නොහැකි වූ අතර, රුපියල් මුදල් ප්‍රවාහය බැංකුව වෙත යොමු කළ නොමැත. එබැවින්, නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට තීරණය කර ඇත.<br>නව ව්‍යාපාර සඳහා ණයවර ලිපි පහසුකම සඳහා වන ගනුදෙනුකරුගේ යෝජනාව ශක්‍ය නොවන බැවින් සහ ප්‍රවේශමෙන් කරන ලද ඇගයීමෙන් පසුව, ණය පහසුකම් අක්වෙරළ බැංකු අංශයෙන් අයකර ගැනීමේ ඒකකයට මාරු කිරීමට තීරණය කර ඇත. ගනුදෙනුකරුගේ ඉල්ලීම සහ සහල් මෝල් ක්‍රියාකාරිත්වය සැලකිල්ලට | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

බැංකු අංශයේ සිට අයකර ගැනීමේ ආයතනික අංශයට ණය පහසුකම් මාරු කර තිබුණු අතර පසුව කිසිදු ණය අයකර ගැනීමකින් හෝ බැංකුව විසින් ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ගවලින් තොරව 2023 අගෝස්තු 16 දින අයකර ගැනීමේ ආයතනික අංශයෙන් ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකයට එම ණය පහසුකම් මාරු කර තිබුණි.

2023 සැප්තැම්බර් 30 දිනට මුළු හිඟ ශේෂය රු. මිලියන 2,085.63 වූ අතර එය ප්‍රාග්ධනය කොටස සහ පොලී ශේෂය ලෙස පිළිවෙලින් රු. මිලියන 1,622.70 කින් සහ රු. මිලියන 462.93 කින් සමන්විත විය.

මුළු හිඟ මුදලින්, රු. මිලියන 2,085.63 ක් පිඹුරු අංක 19/2020 (7A.03R.22.00P) දරන තිරුක්කෝවිල් දේපල සහ අංක 1/1, හිඟුරාන පාර, අම්පාර, කැබලි අක්ෂර අංක 670 හි පිහිටි කැඩැස්තර සිතියම් අංක 2800/10 (04A.03R.05.00P) දරන අම්පාර දේපල යන නිශ්චල දේපල 02 කට එරෙහිව සුරක්ෂිත කර තිබුණු අතර එහි බලකල විකුණුම් වටිනාකම පිළිවෙලින් රු. මිලියන 200 ක් සහ රු. මිලියන 260 ක් විය. උකස් කරන ලද දේපලවල බලකල විකුණුම් වටිනාකම මුළු හිඟ මුදලින් සියයට 22.05 ක් පමණක් නියෝජනය කරයි.

ගනිමින්, 2023 අගෝස්තු 16 වැනි දින අයකර ගැනීමේ ආයතනික අංශයේ සිට ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය (BRRU) වෙත බැංකු ණය ගොනුව බැංකුව විසින් මාරු කර ඇත.

ණය ගොනුව BRRU වෙත මාරු කිරීමෙන් පසුව, දයා ගෲප් ලිමිටඩ්, දයා ඇපරල් එක්ස්පෝර්ට්ස් සහ ඔලිම්පස් කන්ට්‍රක්ෂන් වෙත ලබා දී ඇති පහසුකම් අර්ධ වශයෙන් අයකර ගැනීම සඳහා සමාගම විසින් රු. මිලියන 450.0 ක් තැන්පත් කර ඇත.

ඒ අනුව, ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය විසින් ඔලිම්පස් කන්ට්‍රක්ෂන් හි මුළු ණය ප්‍රමාණය රු. මිලියන 100.0 ක්, තවත් රු. මිලියන 100.0 ක් දයා ඇපරල් එක්ස්පෝර්ට්ස් හි මුළු ණය ප්‍රමාණයෙන් සහ ඉතිරිය රු. මිලියන 250.0 ක් දයා ගෲප් ලිමිටඩ් හි මුළු ණය ප්‍රමාණයෙන් අයකර ගෙන ඇත.

අමතර තොරතුරු සමඟ ශක්‍ය ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස සහ ක්‍රියාවලියේ පවතින යෝජිත යථා තත්ත්වයට පත් කරීමේ පැකේජය සුරක්ෂිත කිරීම සඳහා ප්‍රමාණවත් ස්පෘශ්‍ය සුරකුමක් ලබා දෙන ලෙස බැංකුව ඉල්ලා ඇත.

**ආ) බිම්පුත් ෆයිනෑන්ස් පීඑල්සී**

බිම්පුත් ෆයිනෑන්ස් පීඑල්සී ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයක නිරත විය.

2016-2022 කාලය තුළදී බැංකුව විසින් රු. මිලියන 278.33 ක කාලීන ණය 03 ක් ද, රු. මිලියන 141.93 ක පමා සහන (Moratorium) පරිවර්තිත ණය 06 ක් ද, රු. මිලියන 24.69 ක ප්‍රතිලේඛණගත - බී එක් ණයක් ද සහ රු. මිලියන 9,378.96 ක එක් අයිරා පහසුකමක් ද ප්‍රදානය කර තිබුණු අතර මේවා 2023 වර්ෂයේදී අක්‍රිය ණය කාණ්ඩයට මාරු කර ඇත.

පොලී ආදායම පහත වැටීමේ ප්‍රධාන හේතුව නිසා සමාගම සමාගමට වඩාත්ම ණය සඳහා සුදුසුකමක් නොතිබුණද, සමූහ සබඳතාව සැලකිල්ලට ගෙන බැංකුව විසින් මෙම සමාගමට ණය පහසුකම් ප්‍රදානය කිරීමට සලකා බලා ඇත. කෙසේ වෙතත්, පහසුකම් අක්‍රිය ණය කාණ්ඩයට මාරු කිරීමෙන් පසුව, බැංකුව එම පහසුකම්

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

| | |
|---|---|
| 2019/2020 මූල්‍ය වර්ෂය තුළදී රු. මිලියන 520 ක අලාභයක් දරා තිබුණි. ණය පහසුකම් ප්‍රදානය කරන අවස්ථාවේදී, සමාගමේ අවදානම් ශ්‍රේණිගත කිරීම BBB වූ අතර දැනට “D” කාණ්ඩය යටතේ ශ්‍රේණිගත කර ඇත.<br>ආයතනික ණය ප්‍රතිපත්ති අත්පොතේ 8.1.i සහ ii වගන්තියට අනුව, ණය ශ්‍රේණිගත කිරීම “B” සහ ඊට අඩු නම්, වාර්ෂිකව හෝ අර්ධ වාර්ෂිකව සියලුම ගනුදෙනුකරුවන් සඳහා සවිස්තරාත්මක ණය විශ්ලේෂණයක් සිදු කළ යුතු අතර, ත්‍රෛමාසික වර්ගීකරණ ක්‍රියාවලිය, කාර්තුමය වශයෙන් ගනුදෙනුකරුවන් බැහැදැකීම යනාදිය හරහා පවරා ඇති ගනුදෙනුකරුවන්ගේ ණය ගුණාත්මකභාවය තක්සේරු කළ යුතුය. කෙසේ වෙතත්, විගණන සමාලෝචනය සඳහා ගොනුවේ ගනුදෙනුකරුවන් බැහැදැකීමේ වාර්තා නොතිබුණි.<br>ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බිම්පුත් ෆයිනෑන්ස් සමාගම විසින් මූල්‍ය ව්‍යාපාර පනතේ විධිවිධාන අඛණ්ඩව උල්ලංඝණය කරන බව/ පටහැනිව කටයුතු කරන බව නිරීක්ෂණය කර ඇති අතර මූල්‍ය ව්‍යාපාර පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සඳහා දීර්ඝ කිරීම් කිහිපයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, අඛණ්ඩව අනුකූල නොවීම හේතුවෙන් 2023 සැප්තැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සමාගමට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර තිබුණි. ඉන් අනතුරුව මූල්‍ය ව්‍යාපාරවල නිරත වීමට සමාගමට අවසර නොලැබුණි.<br>තවද, කාර්යාල උපදෙස් චක්‍රලේඛ 340/2020 සහ කාර්යාල උපදෙස් චක්‍රලේඛ 29/2022 යටතේ ලබා දී ඇති පමා සහන පහසුකම් විධිමත් ලෙස ලේඛනගත කර නොමැති බව සහ රු.මිලියන 32.30 ක් වූ ප්‍රතිලේඛණගත ණය බී පහසුකම සඳහා අධ්‍යක්ෂවරයාගේ පුද්ගලික ඇපකරයක් අත්සන් කර නොමැති බව නිරීක්ෂණය විය.<br>ඉන් අනතුරුව, 2023 ඔක්තෝබර් 25 වැනි දින පැවති ණය කමිටු රැස්වීමේ අනුමැතිය මත පදනම්ව 2023 දෙසැම්බර් 27 වැනි දින අයකර ගැනීමේ ආයතනික දෙපාර්තමේන්තුව වෙත ණය ලිපිගොනු මාරු කර තිබුණි. කෙසේ වෙතත්, ණය අයකර ගැනීමේ කිසිදු ප්‍රගතියක් නොතිබුණු අතර සමාගමට එරෙහිව බැංකුව විසින් නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර නොතිබුණි.<br>2023 සැප්තැම්බර් 30 දිනට මුළු හිඟ ශේෂය රු. මිලියන 537.88 ක් වූ එය ප්‍රාග්ධනය කොටස සහ පොලී ශේෂය ලෙස පිළිවෙලින් රු. මිලියන 444.95 කින් සහ රු. මිලියන 92.93 කින් සමන්විත විය. සුරැකුම්පත් ලෙස කිසිදු නිශ්චල දේපලක් නොතිබුණු අතර සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ ඒකාබද්ධ සහ ඇපකර කිහිපයකට එරෙහිව මුළු හිඟ මුදල් සුරක්ෂිත කර තිබුණි. පමා සහන ණය පහක් (05) ද සුරැකුම් රහිත පදනම මත ප්‍රදානය කර තිබූ අතර අධ්‍යක්ෂ ඇපකරයක් මත එක් පමා සහන ණයක් ප්‍රදානය කර තිබුණි. එබැවින්, පවතින සුරැකුම්වල ප්‍රබලතාව නොමැතිකම හේතුවෙන් මුළු හිඟ මුදල් ආපසු අයකර ගැනීමේ හැකියාව සැක සහිත වේ. | අයකර ගැනීමට සියලු ක්‍රියාමාර්ග ගෙන ඇති අතර පහත පරිදි අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.<br>• 2024.06.12 දින පමා සහන පහසුකම් නැවත ස්ථාපිත කර ඇත.<br>• 2024.08.13 දින එන්තරවාසි ගනුදෙනුකරු වෙත යවා ඇත.<br>• අංක CHC/41/2024/CO දරන නඩුව අවසන් කිරීමට එරෙහිව හිමිකම් පෑම 2024.09.25 දින ගොනු කර ඇත.<br>• අධ්‍යක්ෂවරයා විසින් ලේඛනවලට අත්සන් කර නොමැති බැවින් අංක 88428657 දරන ප්‍රතිලේඛනගත බී ණය අධ්‍යක්ෂ ඇපකරය මගින් සුරක්ෂිත කර නොතිබුණද, සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග දිගටම කරගෙන යනු ඇත.<br>• අනෙකුත් පහසුකම් සඳහා වන නීතිමය ක්‍රියාමාර්ග නියමිත පරිදි ඉදිරියට ගෙන යාමට නියමිතය. |

**ඇ) බ්ලූ ඩයමන්ඩ් ජුවලරි වර්ල්ඩ්වයිඩ් පීඑල්සී**

බ්ලූ ඩයමන්ඩ් ජුවලරි වර්ල්ඩ්වයිඩ් පීඑල්සී දියමන්ති ආභරණ සහිත රන් ආභරණ නිෂ්පාදනය සහ අපනයනය කිරීමේ ව්‍යාපාරයේ නියැලී සිටී.

රු. මිලියන 35.93 ට සමාන එ.ජ.ඩො කාලීන ණය 01 ක් සහ රු.මිලියන 5.15 ට සමාන පමා සහන පරිවර්තිත එ.ජ.ඩො කාලීන ණය 01 ක් පිළිවෙලින් 2018 අගෝස්තු 17 දින සහ 2022 ජනවාරි 31 දින බැංකුව විසින් ප්‍රදානය කර තිබුණි. මේවා පිළිවෙලින් 2023 ජනවාරි 16 දින සහ 2023 ජුනි 30 දින සිට අක්‍රිය ණය කාණ්ඩය යටතේ පවතී.

එ.ජ.ඩො කාලීන ණය ප්‍රදානය කරන අවස්ථාවේදී, සමාගම දැනටමත් අනෙකුත් බැංකුවලින් රු.මිලියන 35.5 ක පහසුකම් ලබා ගෙන තිබූ අතර 2013 - 2018 කාලසීමාව තුළදී සැලකිය යුතු ආදායම් අඩුවීමක් අත්විඳ තිබුණි. එම කාලය තුළදී, සමාගම අඛණ්ඩව අලාභ ලබා ඇති අතර සමාගමේ ඍණාත්මක ඉපැයීම් හේතුවෙන් ණය සේවා ආවරණ අනුපාතය දුර්වල වී තිබුණි. තවද, සමාගමට සිදු වූ අඛණ්ඩ අලාභ හේතුවෙන්, ස්පර්ශ කළ හැකි ශුද්ධ වටිනාකම ද රු. මිලියන 174.9 ක් දක්වා අඩු වී තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2017 වාර්ෂික වාර්තාවට අනුව, අඩු ගෝලීය ඉල්ලුම පිළිබිඹු කරමින් මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ අපනයන ආදායම සියයට 17.4 කින් අඩු වී තිබුණි. විගණනය කරන ලද මූල්‍ය වාර්තාවලට අනුව, සමාගම 2016/2017 කාලය තුළදී ඍණ බදු පසු ලාභය (සියයට -261.6) සහ ඍණ පොලී ආවරණ අනුපාතය (සියයට -25) වැනි ඍණ මූල්‍ය අනුපාත පෙන්නුම් කර තිබුණි. 2017/2018 කාලපරිච්ඡේදය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තාවලට අනුව, වර්ෂය සඳහා අලාභය රු. මිලියන 23.11 ක් වූ අතර ජංගම අනුපාතය 4.91 සිට 3.48 දක්වා අඩු වී තබුණි. එබැවින්, එම අවස්ථාවේ දී සමාගමේ පැවති අහිතකර මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය සැලකිල්ලට ගැනීමෙන් තොරව බැංකුව විසින් මෙම ණය පහසුකම ප්‍රදානය කර තිබූ බව නිරීක්ෂණය විය.

ආයතනික ණය ප්‍රතිපත්ති අත්පොතේ 8.1.i සහ 8.1.ii වගන්ති අනුව, සියලුම ගනුදෙනුකරුවන් සඳහා වාර්ෂිකව හෝ අර්ධ වාර්ෂිකව සවිස්තරාත්මක-ණය විශ්ලේෂණයක් සිදු කළ යුතු අතර ණය ශ්‍රේණිගත කිරීම “B” සහ ඊට අඩු නම්, බැංකුව ණය ගුණාත්මකභාවය තක්සේරු කළ යුතුය. ත්‍රෛමාසික වර්ගීකරණ ක්‍රියාවලිය, කාර්තුමය වශයෙන් ගනුදෙනුකරුවන් බැහැදැකීම යනාදිය හරහා පවරා ඇති ගනුදෙනුකරුවන්ගේ ණය ගුණාත්මකභාවය තක්සේරු කළ යුතුය. කෙසේ වෙතත්, විගණන සමාලෝචනය සඳහා ගොනුවේ ගනුදෙනුකරුවන් බැහැදැකීමේ වාර්තා නොතිබුණි.

තවද, 2022/2023 වාර්ෂික වාර්තාවට අනුව, එම කාලය සඳහා වූ අලාභය රු. මිලියන 17.75 ක් වූ අතර සමුච්චිත අලාභය රු. මිලියන 61.46 ක් විය. තවද, 2021/2022 වසර හා සසඳන විට ජංගම අනුපාතය 2.75 සිට 1.94 දක්වා අඩු වී තිබුණි.

2023 නොවැම්බර් 20 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ඉල්ලා අස්වී ඇත.

බැංකුව විසින් රු. මිලියන 38.09 ට සමාන එ.ජ.ඩො කාලීන ණය 02 ක් සහ රු. මිලියන 5.15 ට සමාන පමා සහන පරිවර්තිත එ.ජ.ඩො කාලීන ණය 01 ක් පිළිවෙලින් 2018 අගෝස්තු 17, 2019 මැයි 03 සහ 2022 ජනවාරි 31 යන දිනවලදී ප්‍රදානය කර තිබුණි.

අධ්‍යක්ෂ පී එම් කේ ගමගේ මහත්මියගේ පුද්ගලික ඇපකරයට එරෙහිව රු. මිලියන 2.1 ට සමාන ඉතිරි එ.ජ.ඩො ණය 02 සුරක්ෂිත කර ඇති අතර ණය ගිවිසුමට එරෙහිව රු. මිලියන 5.33 ක පමා සහන ණය මුදල සුරක්ෂිත කර ඇත.

ව්‍යාපාරයේ හිමිකාරිත්වයේ ව්‍යුහය සැලකිල්ලට ගනිමින්, පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සමාගමේ නව කළමනාකාරීත්වය සමඟ වෙන වෙනම සාකච්ඡා කිරීමට තීරණය කර ඇත.

මෑතකාලීන කළමනාකරණ වෙනස්කම් තිබියදීත්, සමාගම තවමත් අයකර ගැනීමේ සැලැස්මක් ලබා දී නොමැත.

බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් ඉල්ලා සමාගමට අවසන් සිහි කැඳවීම් යවා ඇත.

එවැනි විධිවිධානයක් නොමැති විට, බැංකුව විසින් අවශ්‍ය පරිදි සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කරනු ඇත.

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරුගේ මුළු හිඟ ශේෂය රු. මිලියන 44.42 ක් වූ අතර එය ප්‍රාග්ධනය කොටස සහ පොලී ශේෂය ලෙස පිළිවෙලින් රු. මිලියන 41.08 කින් සහ රු. මිලියන 3.34 කින් සමන්විත විය.

මුළු හිඟ ශේෂයෙන්, කටුනායක අපනයන සැකසුම් කලාපයේ "කදිරානවත්ත" නම් ඉඩමෙන් ටී.කේ.ධනසේන එල්.එස්. විසින් සාදන ලද 2006 පෙබරවාරි 21 දිනැති පිඹුරු අංක 3804 හි දැක්වෙන 49 ඒ සහ 49 බී ලෙස සලකුණු කර ඇති ඉඩම්වල කල්බදු අයිතිය පැවරීමට එරෙහිව රු. මිලියන 39.09 ක් වූ ණය මුදල සුරක්ෂිත කර තිබුණි. එම දේපල සඳහා අවසන් තක්සේරුව 2018 පෙබරවාරි 07 වන දින සිදු කර තිබූ අතර අපේක්ෂිත විකුණුම් වටිනාකම රු. මිලියන 30 ක් විය. තක්සේරුව 2024 මාර්තු 12 දිනෙන් කල් ඉකුත් වී තිබුණි. විස්තීරණ රක්ෂණ ආවරණය අලුත් කිරීම සුරැකුම් ගොනුවේ නොතිබුණි. ඉතිරි හිඟ මුදල වූ රු. මිලියන 5.33 ක් ණය ගිවිසුමට එරෙහිව සුරක්ෂිත කර තිබුණි.

දැනට සමාගමට එරෙහිව බැංකුව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**ඈ) ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්**

ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ප්‍රධාන වශයෙන් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම මාර්ග ඉදිකිරීම් සහ ගොඩනැගිලි ඉදිකිරීමේ නිරත වේ. මීට අමතරව, ඔවුන් ජල සම්පාදන හා ජලාපවහන ව්‍යාපෘති, ඇස්ෆල්ට් කොන්ක්‍රීට් සැපයීම ආදියෙහි නිරත වේ.

බැංකුව විසින් රු. මිලියන 139 ක රුපියල් කාලීන ණය තුනක් (03), රු. මිලියන 86 ක ප්‍රතිලේඛණගත කළ රුපියල් ණය 03 ක්, රු.මිලියන 554.85 ක එ.ජ.ඩො කාලීන ණය මාලාවන් (චක්‍රීය) 15 ක්, රු. මිලියන 47.11 ක ඇපකර ලිපි 01 ක්, රු. මිලියන 648 ක ණයවර ලිපි 01 ක්, රු. මිලියන 648 ක බිල්පත් ප්‍රතිග්‍රහණ 01 ක් සහ රු. මිලියන 42.85 ක කල්බදු පහසුකම් 08 ක් 2014 සිට 2019 දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ප්‍රදානය කර තිබුණු අතර මේවා 2019 ඔක්තෝම්බර් 25 දින සිට අක්‍රීය ණය කාණ්ඩය යටතේ පැවතුනි.

සමාගමේ එ.ජ.ඩො මුදල් ප්‍රවාහ සීමාවන් සැලකිල්ලට ගනිමින්, එ.ජ.ඩො පහසුකම් කිහිප වතාවක් ප්‍රතිව්‍යුහගත කර තිබුණි.

එක් අක්‍රිය අයිරා පහසුකමක් 2019 මැයි 15 වන දින ප්රතිලේඛණගත කර ඇති අතර මෙය අධ්‍යක්ෂවරුන්ගේ ඒකාබද්ධ සහ ඇපකර කිහිපයකට එරෙහිව සුරක්ෂිත කර තිබුණි. ඒ අනුව, අක්‍රීය අයිරා පහසුකම ප්‍රතිලේඛණගත කිරීමේදී ශක්තිමත් සුරැකුම්පත් සලකා බලා නොතිබුණි. තවද, ඉහත කී ණය පහසුකම් ප්‍රතිලේඛණගත කරන අවස්ථාවේ දී, ණය සැලකිය යුතු ලෙස වැඩි වීම හේතුවෙන්, ණය ආරක්ෂණ ආවරණ අනුපාතය පිළිගත හැකි සම්මතයන්ට වඩා පහළ මට්ටමක පැවතුනි. තවද, 2019 මාර්තු 11 දිනැති ණය තොරතුරු කාර්යාංශ වාර්තාවට (CRIB) අනුව පීපල්ස් ලීසිං සමාගමෙන් ලබාගත් චක්‍ර පහසුකම් 04 ක් සඳහා සමාගමේ එක් අධ්‍යක්ෂවරයෙකු CRIB හි පෙන්නුම් කෙරුණි. සමාගමේ මූල්‍ය ශක්තිය ශක්තිමත් නොවන බව ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් 2019 මැයි 15 දින අදහස් දක්වා තිබුණි.

තවද, 2021 වසරේ සිට ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලින් සමාගමේ

එ.ජ.ඩො කාලීන ණය 15 ක් චක්‍රීය පහසුකම් නොවේ. ඇපකර ලිපි සීමාව රු.මිලියන 300 ක් (චක්‍රීය) වේ.

ඉන්වොයිස් අගයන් මත පදනම්ව යන්ත්‍රෝපකරණ උකස් ක්‍රියාත්මක කර ඇත. (ආනයන ණයවර ලිපි අනුමත සීමාව යටතේ ස්ථාපිත කර ඇති අතර අදාළ යන්ත්‍රෝපකරණ ආනයනය කිරීමෙන් පසු ඒවා බැංකුවට උකස් කර ඇත).

ණය ගොනුව BRRU වෙත මාරු කිරීමෙන් පසුව දයා ගෲප් ලිමිටඩ්, දයා ඇපරල් එක්ස්පෝර්ට්ස් සහ ඔලිම්පස් කන්ට්‍රක්ෂන් වෙත ලබා දී ඇති පහසුකම් අර්ධ වශයෙන් අයකර ගැනීම සඳහා රු.මිලියන 450.0 ක් සමාගම විසින් තැන්පත් කර තිබුණි.

ඒ අනුව, BRRU විසින් ඔලිම්පස් කන්ට්‍රක්ෂන් හි මුළු ණය නිරාවරණයෙන් රු. මිලියන 100.0 ක්, තවත් රු. මිලියන 100.0 ක් දයා ඇපරල් එක්ස්පෝර්ට්ස් හි මුළු ණය නිරාවරණයෙන් සහ ඉතිරිය රු. මිලියන 250.0 ක් දයා ගෲප්

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

මුදල් ප්‍රවාහයන් බැංකුව හරහා යොමු කර නොතිබුණු අතර, අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් සම්බන්ධයෙන් විශ්වාසනීය සාක්ෂි කිසිවක් ඉදිරිපත් කිරීමට ගනුදෙනුකරුට නොහැකි විය. 2023 අගෝස්තු 15 දිනැති අයකර ගැනීමේ ආයතනික අංශයේ සංදේශයට අනුව, සමාගමේ මූල්‍ය විනය සතුටුදායක නොවූ අතර ඓතිහාසික අරමුදල් හැසිරවීමේ පරිචය පාලනය කළ නොහැකි විය.

පවතින පහසුකම් සඳහා නිසි පියවීම් සැලැස්මක් නොතිබීම සැලකිල්ලට ගනිමින් ණය ලිපිගොනු 2021 ඔක්තෝබර් 22 දින අයකර ගැනීමේ ආයතනික අංශය වෙත මාරු කර තිබුණි. පසුව, උකස් කරන ලද යන්ත්‍රෝපකරණ සහ වාහන අයකර ගැනීමේ ආයතනික අංශය විසින් පිළිවෙලින් 2023 ජුනි 15, 2023 ජුනි 26 සහ 2023 අගෝස්තු 03 යන දිනවල පරීක්ෂා කර තිබූ අතර, සියලුම යන්ත්‍ර සූත්‍රවල සහ වාහනවල වටිනාකම වැරදි ලෙස ඇස්තමේන්තු කර තිබූ අතර සමහර යන්ත්‍ර සූත්‍ර පරීක්ෂා කරන අවස්ථාවේදී නොතිබුණි. තවද, එම යන්ත්‍රෝපකරණ සඳහා අලුත් රක්ෂණ ආවරණයක් බැංකුව විසින් ලබාගෙන නොතිබුණි. කෙසේ වෙතත්, ණය අයකර ගැනීමේ කිසිදු ප්‍රගතියක් දක්නට නොලැබුණු අතර 2019 ඔක්තෝම්බර් මාසයේ සිට සමාගමට එරෙහිව බැංකුව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ඉන් අනතුරුව, ව්‍යාපාරය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් කරන ලද ඉල්ලීමට අනුව 2023 අගෝස්තු 16 වන දින අයකර ගැනීමේ ආයතනික අංශයෙන් ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය (BRRU) වෙත ණය ලිපිගොනු මාරු කිරීම හේතුවෙන් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ඇනහිටිණි. බැංකුව වෙත නව යෝජනාවක් ඉදිරිපත් කිරීමට සමාගම වාචිකව එකඟ වී තිබූ අතර, ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ක්‍රියාවලිය සඳහා සලකා බැලීම සඳහා බැංකුව විසින් 2023 අගෝස්තු 16 වැනි දින අයකර ගැනීමේ ආයතනික අංශයෙන් ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය වෙත ණය ලිපිගොනු මාරු කර තිබුණි.

2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරුගේ ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 718.21 ක් වූ අතර එය ප්‍රාග්ධන කොටස සහ පොලී ශේෂය ලෙස පිළිවෙලින් රු.මිලියන 559.80 කින් සහ රු. මිලියන 158.41 කින් සමන්විත විය. රු. මිලියන 1,036.35 ක් වූ මුළු හිඟ මුදල යන්ත්‍රෝපකරණ, පුද්ගලික ඇපකර, ඒකාබද්ධ සහ ඇපකර කිහිපයක්, ප්‍රසිද්ධ මිලට ගත් සමාගම් කොටස් මත පැවරීම, ආයතනික ඇපකරය, වාහනවල බදු ගිවිසුම, සමාගමේ ප්‍රති හානි රක්ෂණය, විනිමය බිල්පත්, නැව්ගත කිරීමේ ලේඛන, බැංකුවේ ව්‍යුහාත්මක පාලනය යටතේ පවතින භාණ්ඩ සහ පිළිගත් භාවිතයන් (Usance) කෙටුම්පතට එරෙහිව සුරක්ෂිත කර තිබුණි.

ලිමිටඩ් හි මුළු ණය නිරාවරණයෙන් අයකර ගෙන ඇත.

අමතර තොරතුරු සමඟ ශක්‍ය ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස සහ ක්‍රියාවලියේ පවතින යෝජිත පුනර්ජීවන පැකේජය සුරක්ෂිත කිරීම සඳහා ප්‍රමාණවත් ස්පෘශ්‍ය සුරැකුමක් ලබා දෙන ලෙස බැංකුව ඉල්ලා ඇත.

**ඉ) දයා සමූහ (පුද්ගලික) සමාගම**

දයා සමූහ (පුද්ගලික) සමාගම යනු දයා සමූහයේ අනෙකුත් සමාගම්වල හිමිකාරිත්වය දරන සමාගම වන අතර සමාගම සමූහය තුළ සිටින සමාගම් සඳහා කළමනාකරණ සහ විධායක අධීක්ෂණ සහ උපදේශන සේවා සපයයි.

2017 සිට 2019 දක්වා කාලය තුළදී රු. මිලියන 1,297.79 ක එ.ජ.ඩො කාලීන ණය 02 ක්, රු. මිලියන 200 ක හාරකාර හෝල්ඩින් සමාගම වෙත අයකර වගකීම් පවරා ගනිමින් දයා ඇපරල් එක්ස්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් හි මූල්‍ය තත්ත්වය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ඉහත කී කාලීන ණය දෙක ප්‍රදානය කර ඇත. ඒ සමඟම, දයා

ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

කුවිතාන්සි ණය 03 ක් (එක් වරක් සහ සියල්ලටම) සහ අයිරා පහසුකම් 01 ක් බැංකුව විසින් ප්‍රදානය කර තිබූ අතර 2019 සිට 2022 දක්වා කාලය තුළදී මේවා අක්‍රීය ණය කාණ්ඩයට පවරා තිබුණි.

2017 ජූනි 23 වැනි දින එ.ජ.ඩො කාලීන ණය පහසුකම් ප්‍රදානය කරන අවස්ථාවේදී, 2017 ජනවාරි 13 දිනැති CRIB වාර්තාවට අනුව සමාගම සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු CRIB හි පෙන්නුම් කෙරුණි. තවද, බැංකුවේ ණය ප්‍රතිපත්තියට අනුව ජංගම අනුපාතය 1 හි පැවතිය යුතු වුවත් සමාගමේ ජංගම අනුපාතය/ද්‍රවශීලතාවය 0.7 ක් වූ අතර ණය ආරක්ෂණ ආවරණ අනුපාතය පිළිගත හැකි සම්මතයට වඩා අඩු විය. ණය ප්‍රදානය කරන අවස්ථාවේදී සමාගම හොඳින් ක්‍රියාත්මක නොවූ බව ඉන් සනාථ වේ.

සමාගම 2018 පෙබරවාරි 09 දින සිට වසරක කාලයක් සඳහා දියබෙදුම කටුකැලියාව සිංහ ලංකා රයිස් (ප්‍රයිවට්) ලිමිටඩ් පරිශ්‍රයේ පිහිටි ගබඩා දෙකක් බදුගෙන තිබූ අතර ඉහත කී ණය පහසුකම්වලින් ලද මුදලින් මිලදී ගත් වී තොග ගබඩා කිරීමට අදහස් කර තිබුණි. කෙසේ වෙතත්, 2018 අප්‍රේල් 20 දිනැති උතුරු මැද පළාතේ සහකාර මහා කළමනාකරුගේ ලිපියට අනුව, සිංහ ලංකා රයිස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ දයා සමූහ ව්‍යාපාරයේ කළමනාකාරීත්වය අතර ආරවුලක් පවතින බවත්, ඒ හේතුවෙන් සහල් මොලේ මෙහෙයුම්වලට බාධා එල්ල වී ඇති බවත් දන්වා තිබුණි. ඉන් අනතුරුව, බැංකුව විසින් ඉහත සඳහන් පරිශ්‍රවල වී තොග පරීක්ෂා කිරීම සිදු කරන ලද අතර, පවතින වී තොග වටිනාකම භාරකාර කුවිතාන්සි ණය(TR) පහසුකම්වල හිඟ ණය මුදල ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කර තිබුණි. එබැවින්, බැංකුව විසින් භාරකාර කුවිතාන්සි ණයවල(TR) පවතින තොග තත්ත්වය සහ එම අවස්ථාවේ දී ඒවායේ පියවීම් සැලැස්ම පිළිබඳව ලිඛිත තහවුරු කිරීමක් ඉල්ලා තිබුණි. තවද, 2018 ජනවාරි 30 දිනැති සංදේශයට අනුව, බැංකුව විසින් කිසිදු මාසික පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. ඉහත සංදේශයට අනුව, සහල් මෝල අත්පත් කර ගැනීම අසාර්ථක වුවහොත් එම සමාගමට තොග විකුණා බැංකුවලට ගෙවිය යුතු මුදල් පියවීමට හැකි බව සඳහන් කර තිබුණි. කෙසේ වෙතත්, සමාගම විසින් සහල් තොග විකිණීමෙන් රු. මිලියන 259.2 ක සම්පූර්ණ හිඟ පහසුකම්වලින් රු. මිලියන 59.2 ක් වටිනා භාරකාර කුවිතාන්සි ණය (TR) පහසුකම් පමණක් පියවා තිබුණි.

තවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2020 දෙසැම්බර් 30 න් පසුව බැංකුව වෙත ලැබී නොමැති බවත්, 2019 වසරේ සිට සමාගමේ මුදල් ප්‍රවාහය බැංකුව හරහා යොමු කර නොමැති බවත් නිරීක්ෂණය විය. ණය අයකර ගැනීමේ කිසිදු ප්‍රගතියක් නොමැති බව සහ බැංකුව විසින් සමාගමට එරෙහිව ක්‍රියාත්මක කරන ලද නීතිමය ක්‍රියාමාර්ග නිරීක්ෂණය නොවිය.

2023 සැප්තැම්බර් 30 දිනට මුළු හිඟ ශේෂය රු. මිලියන 1,619.96 ක් වූ අතර එය ප්‍රාග්ධනය කොටස සහ පොලී ශේෂය ලෙස පිළිවෙලින් රු. මිලියන 1,195.79 කින් සහ රු. මිලියන 424.17 කින් සමන්විත විය.

මුළු හිඟ මුදල්වලින්, රු. මිලියන 742.62 ක් ලයන් එස්.නේසරාජා එල්.එස්. විසින් සාදන ලද 2016 ඔක්තෝම්බර් 19 දිනැති පිඹුරු අංක SNR/2016/3145 හි දක්වා ඇති 3 වන කොටස ලෙස සලකුණු කර

ඇපරල් එක්ස්පෝර්ට් (පුද්ගලික) සමාගමෙහි හොඳ මූල්‍ය තත්ත්වය සමඟ අනාගත ගැනුම්කරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා දයා ගෲප් ලිමිටඩ් විසින් මෙම වැඩපිළිවෙළ යෝජනා කරන ඇත.

ණය ගොනුව ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය වෙත මාරු කිරීමෙන් පසුව, දයා ගෲප් ලිමිටඩ්, දයා ඇපරල් එක්ස්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් වෙත ලබා දී ඇති පහසුකම් අර්ධ වශයෙන් අයකර ගැනීම සඳහා සමාගම විසින් රු. මිලියන 450.0 ක් තැන්පත් කර තිබුණි.

ඒ අනුව, ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය විසින් ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් හි මුළු ණය ප්‍රමාණයෙන් රු. මිලියන 100.0 ක්, තවත් රු. මිලියන 100.0 ක් දයා ඇපරල් එක්ස්පෝට් හි මුළු ණය ප්‍රමාණයෙන් සහ ඉතිරිය රු. මිලියන 250.0 ක් දයා ගෲප් ලිමිටඩ් හි මුළු ණය ප්‍රමාණයෙන් අයකර තිබුණි.

අමතර තොරතුරු සමඟ ශක්‍ය ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස සහ ක්‍රියාවලියේ පවතින යෝජිත පුනර්ජීවන පැකේජය සුරක්ෂිත කිරීම සඳහා ප්‍රමාණවත් ස්පෘශ්‍ය සුරැකුමක් ලබා දෙන ලෙස බැංකුව ඉල්ලා ඇත.

ඇති අම්පාර නාගරික සභා සීමාව තුළ A3-R2-P10.80 ප්‍රමාණයෙන් සමන්විත අම්පාර වැව්ගම්පත්තුවේ H කලාපයේ පිහිටා ඇති ඉඩමේ කල්බදු අයිතිය සහ පොළිය පැවරීමට එරෙහිව සුරක්ෂිත කර තිබුණි. කෙසේ වෙතත්, දේපල තක්සේරු වාර්තාව සහ විස්තීරණ රක්ෂණ ආවරණය අලුත් කිරීම විගණන සමාලෝචනය සඳහා සුරැකුම් ගොනුවේ නොතිබුණි. ඉතිරි හිඟ මුදල වූ රු. මිලියන 877.34 ක් එහි අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගලික සහ ඒකාබද්ධ හා ඇපකර කිහිපයකට එරෙහිව සුරක්ෂිත කර තිබුණි. පසුව, ව්‍යාපාරය පුනර්ජීවනය කිරීම සහ තවදුරටත් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දයා සමූහ (පුද්ගලික) සමාගමේ ණය ලිපිගොනු 2023 පෙබරවාරි 27 වන දින බැංකුවේ ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය වෙත මාරු කර තිබුණි.

**4 මිහින් ලංකා (පුද්ගලික) සමාගම**

සමාගම ආරම්භයේ සිටම සැලකිය යුතු අලාභයන් හේතුවෙන් මූල්‍යමය සීමාවලට මුහුණ දී තිබූ අතර එය ශ්‍රී ලංකා රජයේ ආධාර මත ක්‍රියාත්මක විය. තවද, රජය විසින් 2015 වසරේ හඳුන්වා දුන් පුනර්ජීවන උපාය මාර්ගය සාර්ථක වී නොතිබුණි. පසුව, 2016 ඔක්තෝම්බර් මාසයේදී මෙහෙයුම් නවතා ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් වෙත සමාගමේ මෙහෙයුම් (මාර්ග සහ කල්බදු පදනම මත ඇති ඉතිරි ගුවන් යානා) ලබා දී තිබුණි. සමාගම දැනට අක්‍රියව සහ ඈවර කරමින් පවතී.

2015 සිට 2016 දක්වා කාලය තුළදී බැංකුව විසින් ණය 03 ක් සහ අයිරා පහසුකම් 01 ක් ප්‍රදානය කර තිබුණු අතර මේවා 2023 අප්‍රේල් 03 දින සිට අක්‍රීය ණය කාණ්ඩය යටතේ පැවතුණි.

2015 දෙසැම්බර් 10 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සාමාන්‍ය බර තබන ලද ප්‍රාථමික ණය අනුපාතය (AWPLR) + සියයට 2.5 ක වාර්ෂික පොලී අනුපාතයකට භාණ්ඩාගාර සහන ලිපියට එරෙහිව 2015 දෙසැම්බර් 31 දින රු. මිලියන 1,650 ක ණය පහසුකමක් (ණය පහසුකම අංක 78409763) බැංකුව විසින් ප්‍රදානය කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මුලින් අනුමත කරන ලද සාමාන්‍ය බර තබන ලද ප්‍රාථමික ණය අනුපාතය (AWPLR) + සියයට 3.0 ක වර්ෂික අනුපාතයෙන් සාමාන්‍ය බර තබන ලද ප්‍රාථමික ණය අනුපාතය (AWPLR)+ සියයට 2.5 ක වාර්ෂික අනුපාතය දක්වා පොලී අනුපාතය අඩු කිරීමට කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

අධ්‍යක්ෂවරුන් දෙදෙනකු ඒ වන විට විදේශගතව සිටින බැවින් ඔවුන් නොමැති වීම හේතුවෙන් සහ හදිසි අවශ්‍යතාවය සලකා බලා අපේක්ෂිත ලියකියවිලි මත මෙම ණය පහසුකම අනුමත කර තිබුණි. ඒ සඳහා 2015 දෙසැම්බර් 31 දින සහකාර මහා කළමනාකරු (ආයතනික සබඳතා) වෙතින් අනුමැතිය ලබා ගෙන තිබුණි.

සිදු කරන ලද ණය විශ්ලේෂණය මත පදනම්ව ඉදිරිපත් කරන ලද 2016 ඔක්තෝම්බර් 04 දිනැති ණය ඇගයුම් සංදේශයට අනුව, සමාගම 2011 වර්ෂයේ සිට අලාභ ලබා තිබුණි. සමාගම විසින් දරන ලද අඛණ්ඩ අලාභ හේතුවෙන් සමාලෝචිත කාල සීමාව තුළදී සමාගමේ ඍණ ශුද්ධ වටිනාකම වැඩි වී තිබුණි. ඍණාත්මක දළ ලාභයක්, කර්මාන්ත ප්‍රමිතීන් හා සසඳන විට බෙහෙවින් අඩු ණය ආරක්ෂණ ආවරණ අනුපාතයක්, කර්මාන්ත ප්‍රමිතීන්ට වඩා අඩු

බැංකුව විසින් 2022.12.29 දින මහා භාණ්ඩාගාරයේ සහන ලිපියට එරෙහිව නැවතත් හිමිකම් පෑම ඉදිරිපත් කර ඇති අතර, පසුව පිළිවෙළින් 2023.02.02, 2023.03.16 සහ 2023.10.06 යන දිනවල සිහිකැඳවීම් තුනක් යවා ඇත. පසුව මහා භාණ්ඩාගාරය විසින් සහන ලිපිවල වලංගු කාලය 2024 දෙසැම්බර් 31 දක්වා හෝ ඈවර කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තෙක් යන අවස්ථා දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාව දක්වා දීර්ඝ කර ඇත.

කෙසේ වෙතත්, දැනට ඉහත කී ණය පහසුකම් III වන අදියරේ වර්ගීකරණය කර ඇත. 2024 අප්‍රේල් 30 වන දිනට ගනුදෙනුකරුගේ ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 5,146.8 ක් වූ අතර එය ප්‍රාග්ධන කොටස හා පොලී ශේෂය ලෙස පිළිවෙළින් රු. මිලියන 3,135.0 කින් සහ රු. මිලියන 2,011.80 කින් සමන්විත විය. මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද සහන ලිපිවලට එරෙහිව රු. මිලියන 5,146.8 ක් වූ මුළු හිඟ මුදල සුරක්ෂිත කර ඇත.

2024.08.08 දිනැති ලිපිය මගින් මිහින් ලංකා (පුද්ගලික) සමාගම වෙත ප්‍රදානය කර ඇති

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

ජංගම අනුපාතයක් සහ සෘණ කෙටි කාලීන ණය - ස්කන්ධ ප්‍රාග්ධන අනුපාතයක් හා සෘණ මුළු ණය - ස්කන්ධ ප්‍රාග්ධන අනුපාතයක් සමාගමේ අතීත මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාලේඛන මගින් පෙන්නුම් කර තිබුණි.

සමාගමේ විගණක විසින් ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් සහ සමාගමට අඛණ්ඩ පැවැත්මෙන් ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් පෙන්නුම් කර තිබුණි.

මිහින් ලංකා සිය මෙහෙයුම් නතර කිරීමෙන් පසු ණය අංක 80022413 සහ 80139632 යටතේ එ.ජ.ඩො මිලියන 2.5 බැගින් වූ තවත් ණය පහසුකම් දෙකක් බැංකුව විසින් ප්‍රදානය කර තිබුණි. "අත්හිටුවීමේ දැන්වීම" අනුව 2016 ඔක්තෝම්බර් 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම මිහින් ලංකා ගුවන් ගමන් සහ සේවා අත්හිටුවන බව මිහින් ලංකා විසින් නිවේදනය කර තිබුණි. කෙසේ වෙතත්, එ.ජ.ඩො මිලියන 2.5 ක් වූ පළමු පහසුකම 2016 නොවැම්බර් 04 දින ප්‍රදානය කර තිබූ අතර ණය හිමියන්ගේ හිඟ මුදල් කොටසක් පියවීමට දෙවන පහසුකම 2016 දෙසැම්බර් 02 දින ප්‍රදානය කර තිබුණි. තවද, මිහින් ලංකා සමාගම ඈවර කර ශ්‍රී ලංකන් එයාර්ලයින් (පුද්ගලික) සමාගම යටතේ ක්‍රියාත්මක කරනු ඇති බව බැංකුව දැන සිටි අතර පහසුකම් අනුමත කිරීමේදී එය සලකා බලා තිබුණි. මීට අමතරව, ඉහත පහසුකම් දෙක ප්‍රදානය කිරීමේදී, කලින් ප්‍රදානය කර තිබූ රු. මිලියන 1,650 ක පහසුකමේ මුල් ණය කාල සීමාව වූ මාස 04, (2015 දෙසැම්බර් 31 සිට 2016 මාර්තු 31 දක්වා කාලය) මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද සහන ලිපියේ වලංගු කාලය දීර්ඝ කිරීමට අනුකූලව දීර්ඝ කර තිබුණි.

මෙම පහසුකම්වල මුල් ආපසු ගෙවීමේ කාලය මාස 03 - 10 (කෙටි කාලීන පදනම) වූ අතර එය අදාළ කාලීන ණය සඳහා ඇපයක් ලෙස නිකුත් කරන ලද සහන ලිපිවල කල් ඉකුත්වන දිනයට අනුකූල වේ. ඉන් අනතුරුව, මහා භාණ්ඩාගාරය විසින් සහන ලිපියේ වලංගු කාලය දීර්ඝ කිරීමෙන් පසුව ණය කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ආපසු ගෙවීමේ කාලය කිහිප වතාවක් දීර්ඝ කර තිබුණි. ආපසු ගෙවීමේ කාලසීමාව 2022 දෙසැම්බර් 31 දක්වා හෝ ඈවර කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තෙක් යන අවස්ථා දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාව දක්වා දීර්ඝ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 අප්‍රේල් 04 දින ඔවුන්ගේ අනුමැතිය ලබා දී තිබුණි. බැංකුව 2018 ජූලි 09 වැනි දින ඈවරකරු වෙත හිමිකම් පෑම ඉදිරිපත් කර තිබුණි. තවද, බැංකුව විසින් 2021 නොවැම්බර් 24 දින මහා භාණ්ඩාගාරයේ සහන ලිපිවලට එරෙහිව හිමිකම් පෑම දැනටමත් ඉදිරිපත් කර තිබූ අතර පසුව මහා භාණ්ඩාගාරය සහන ලිපිවල වලංගු කාලය 2022 දෙසැම්බර් 31 දක්වා හෝ ඈවර කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තෙක් යන අවස්ථා දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාව දක්වා පහත සඳහන් පරිදි දිර්ඝ කර තිබුණි.

පහසුකම් පියවීමේ වැඩපිළිවෙලක් පිළිබඳ සාකච්ඡා කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් සාකච්ඡාවක් ඉල්ලා ඇත.

තවද, 2024.08.29 දින භාණ්ඩාගාර ඇපකරය මත ඉදිරිපත් කර ඇති හිමිකම් පෑම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය වෙත සිහි කැඳවීමක් යවා ඇත.

ඈවරකරුගේ වාර්තාව සලකා බැලීම සඳහා උසාවියේ ඇති අවසන් කිරීමේ නඩුවේ (නඩු අංක 4/2018/CO) මීළඟ විභාග කිරීමේ දිනය 2024.11.29 දින වේ. ඈවරකරු ඔහුගේ වාර්තාව 2024.09.27 දින අධිකරණයට ඉදිරිපත් කර ඇත.

| සහන ලිපියේ අංකය | වටිනාකම | | නිකුත් කර දිනය | අලුත් කර දිනය | කල් ඉකුත්වන දිනය |
|---|---|---|---|---|---|
| | එ.ජ. ඩොම් ලියන | රු. මිලියන | | | |
| TO/REV/LC/495/8 | | 1,650 | 2015.07.28 | 2021.12.10 | 2022 දෙසැම්බර් 31 දක්වා හෝ ඇවර කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තෙක් යන අවස්ථා දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාව |
| TO/REV/LC/460/19 | 2.5 | | 2015.07.28 | | |
| TO/REV/LC/482/15 | 2.5 | | 2016.10.07 | | |

කෙසේ වෙතත්, ඉහත කී ණය පහසුකම් දැනට අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබුණි. 2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරු ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 4,753.62 ක් වූ අතර එය ප්‍රාග්ධන කොටස සහ පොලී ශේෂය පිළිවෙලින් රු. මිලියන 3,272.30 කින් සහ රු. මිලියන 1,481.32 කින් සමන්විත විය. රු. මිලියන 4,753.46 ක් වූ මුළු හිඟ ණය මුදල මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද සහන ලිපිවලට එරෙහිව සුරක්ෂිත කර තිබුණි. මුළු හිඟ මුදලින්, රු. මිලියන 0.16 ක් ජංගම ගිණුම් අංක 5843011 හි බැංකු අයිරා ශේෂය නියෝජනය කරයි.

5 **ඩබ්ලිව් එම් මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්**

සමාගම 1947 දී සංස්ථාපිත කරන ලද අතර එය පොල් සහ මිශ්‍ර අරක්කු නිෂ්පාදන පෙරීම සහ නිෂ්පාදනය කිරීම සහ එතනෝල් නිෂ්පාදනය කිරීම සම්බන්ධ වේ. 2016 සැප්තැම්බර් 07 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2016 ඔක්තෝම්බර් මාසයේදී ප්‍රදානය කරන ලද ණය පහසුකම්වල හිඟ ප්‍රාග්ධන කොටස සහ පොලිය ප්‍රාග්ධනිත කිරීම සඳහා බැංකුව විසින් පිළිවෙලින් රු. මිලියන 2,055 ක්, රු. මිලියන 240 ක්, රු. මිලියන 500 ක්, රු. මිලියන 32.58 ක් සහ රු. මිලියන 1,398.2 ක් වූ ප්‍රතිලේඛණගත ණය පහසුකම් පහක් බැංකුව විසන් ප්‍රදානය කර තිබුණි. මෙම පහසුකම් 2018 සිට අක්‍රීය ණය කාණ්ඩයේ පවතී.

පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම හරහා සිදු කරන ලද මහ බැංකු බැඳුම්කර වංචාව හේතුවෙන් 2016 වසරේදී පෑන් ඒෂියා බැංකුවේ හිඟ ශේෂ පියවීම සඳහා ප්‍රදානය කරන ලද මුල් ණය පැකේජය 2018 ජනවාරි මාසයේදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. ඉන්පසුව, 2018 ජනවාරි 01 වන දින සමාගමේ ජංගම ගිණුම් අත්හිටුවා තිබූ අතර 2018 පෙබරවාරි මාසයේදී සමාගමේ අධ්‍යක්ෂවරයා අත්අඩංගුවට ගෙන සුරාබදු දෙපාර්තමේන්තුව විසින් මත්පැන් නිෂ්පාදන බලපත්‍රය අවලංගු කරන තිබුණි. සමාගම 2018 අප්‍රේල් 27 දින මත්පැන් බලපත්‍රය නැවත ලබාගෙන 2018 මැයි මස මුලදී මත්පැන් නිෂ්පාදනය නැවත ආරම්භ කර තිබුණි. නැවතත් මිශ්‍ර කිරීමේ බලපත්‍රය සහ මත්පැන් නිෂ්පාදන බලපත්‍රය 2020 දී සුරාබදු දෙපාර්තමේන්තුව විසින් අවලංගු කරන ලදී.

2016 දී ආරම්භක ණය පහසුකම් ලබා දෙන අවස්ථාවේදී, බැංකුව මත්පැන් තොගය සුරැකුමක් ලෙස සැලකූ අතර පසුව, හිමිකම් පහසුවෙන් මාරු කළ හැකි සහ ඉක්මනින් වටිනාකම උපලබ්ධි කර ගත හැකි ඉස්තරම් රජයේ සුරැකුම්පතක් (a gilt edged government security) නොවන නිසා එය සුරැකුමක් ලෙස සැලකීමට නොහැකි

දැනට පවතින සුරැකුම්පත්වලට එරෙහිව මුළු ණය කළඹ ප්‍රතිලේඛණගත කිරීමට සහ එතනෝල් නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය වියළන නල බණ්ඩලයක් (යන්ත්‍ර සූත්‍රවල කොටසක්) ආනයනය කිරීම සඳහා එක් වරක් සහ සියලු පදනම මත නව ණයවර ලිපියක්/ බිල්පත් ප්‍රතිග්‍රහණයක්/ රු. මිලියන 110.0 ක ණය සීමාවේ ණය මාලාවක් ප්‍රදානය කිරීමට 2023.03.31 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණි. සමාගමේ ව්‍යාපාරය යථා තත්ත්වයට පත්කිරීම සැලකිල්ලට ගනිමින් මෙම පහසුකම අනුමත කර තිබූ අතර නව යන්ත්‍ර කොටසක් ආනයනය කර කල්කුඩා කර්මාන්ත ශාලාවේ සවි කරන තෙක් මාස 4ක සහන කාලයක් සහිතව ස්ථිර ප්‍රාග්ධන ගෙවීමේ ක්‍රමයට ආපසු ගෙවීම ව්‍යුහගත කර තිබූ අතර 2023 ජූනි මාසයේදී ප්‍රතිලේඛණගත

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

වීම හේතුවෙන් 2020 දී එය ඉවත් කරන ලදී.

සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන නොමැතිකම හේතුවෙන් 2019 වර්ෂයේ සිට සමාගම සඳහා අවදානම් ශ්‍රේණිගත කිරීම් සිදු කර නොතිබුණි. 2023 මැයි 31 හෝ ඊට පෙර 2021/2022 නවතම වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීමට සහ එසේම 2019/20, 2020/2021 සඳහා පසුගිය මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීමට සහ ඒ අනුව ශ්‍රේණිගත කිරීම් යාවත්කාලීන කිරීමට බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් 2023 මාර්තු 23 දින කොන්දේසියක් පනවා තිබුණි. කෙසේ වෙතත්, බැංකුව ඉහත මූල්‍ය ප්‍රකාශන ලබාගෙන නොතිබූ අතර ඒ අනුව අවදානම් ශ්‍රේණිගත කිරීම් යාවත්කාලීන කර නොතිබුණි. එසේ වුවද, බැංකුව එම කොන්දේසියට අනුකූල නොවී පැරණි අවදානම් ශ්‍රේණිගත කිරීම මත පදනම්ව පහසුකම් ප්‍රතිලේඛණගත කර තිබුණි. 2023/2024 ආයතනික ණය ප්‍රතිපත්ති අත්පොත හි 6.1.8 වගන්තියට අනුව, වෙළඳ ගනුදෙනුවලට අදාළව පිළිගත් ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු හිඟ උපලබ්ධි කරගත හැකි ලේඛණගත ණය (සාමාන්‍යයෙන් මාස තුනකට අඩු) ලබා හැකි අතර, සුරැකුමේ පිළිගත හැකි බව තහවුරු කිරීම සඳහා අවම වශයෙන් කාර්තුමය වශයෙන් බැංකුවේ සමාලෝචනයට යටත්ව ක්‍රියාත්මක කරන ලද බැඳුම්කරයක් මගින් බැංකුව වෙත පැවරීමට හැකිය. කෙසේ වෙතත්, පහසුකම් ප්‍රතිලේඛණගත කළ අවස්ථාවේදී සහ ඉන් පසුවද බැංකුව එම කොන්දේසියට අනුකූලව කටයුතු කර නොතිබුණි.

2023/2024 ආයතනික ණය ප්‍රතිපත්ති අත්පොත හි 6.3 වගන්තියට අනුව, "C" සහ ඊට පහළින් ශ්‍රේණිගත කර ඇති ගනුදෙනුකරුවන්ට සුරක්ෂිත නොකරන ලද පහසුකම් ලබා නොදිය යුතුය. "AAA - BB" යටතේ වර්ගීකරණය කර ඇති ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් පමණක් සුරක්ෂිත නොකරන ලද පහසුකම් සලකා බැලිය හැකිය. කෙසේ වෙතත්, යාවත්කාලීන කළ අවදානම් ශ්‍රේණිගත කිරීම් නොමැතිකම හේතුවෙන් එම කොන්දේසිය සමාගමට අදාළ කර ගැනීම අපහසු විය. තවද, 2023 මාර්තු 23 දින ප්‍රතිලේඛණගත කරන ලද පහසුකම පිළිබඳ ප්‍රධාන අවදානම් නිලධාරියාගේ අදහස් දැක්වීමට අනුව, මුදල් ප්‍රවාහයේ සාධාරණ කොටසක් බැංකුව හරහා යොමු කළ යුතුය. කෙසේ වෙතත්, ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවට සහ මහජන බැංකුවට ඔවුන්ගේ හිඟ මුදල් අය කර ගැනීම සඳහා බැංකුව හරහා මුදල් ප්‍රවාහ යොමු වීම වැළැක්වීමේ අධිකරණ නියෝගයක් ලබා ගත හැකි නිසා එම කොන්දේසිය බැහැර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි.

2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරුගේ මුළු අක්‍රීය ණය ශේෂය රු. මිලියන 4,435.24 ක් වූ අතර එය ප්‍රාග්ධනය කොටස සහ ගෙවිය යුතු පොලී ශේෂය ලෙස පිළිවෙලින් රු. මිලියන 4,225.75 කින් සහ රු. මිලියන 209.49 කින් සමන්විත විය.

රු. මිලියන 625 ක අපේක්ෂිත විකුණුම් වටිනාකමක් සහ රු. මිලියන 744.5 ක (2023/05/28 දින තක්සේරු සමාලෝචන මණ්ඩලය විසින්) වෙළඳපල වටිනාකමක් ඇති වැලිසර කොළඹ පාරේ අංක 309/5 සහ 309/5A හි පිහිටි නිශ්චල දේපලට (3A.3R.1.66P) එරෙහිව මුළු හිඟ මුදලින් රු. මිලියන 4,435 ක් සුරක්ෂිත කර තිබුණි. පහසුකම් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, අයහපත් කාලගුණික තත්ත්වයන් සහ ගනුදෙනුකරු විසින් පැහැදිලි කරන ලද වෙනත් හේතු නිසා යන්ත්‍රය පැමිණීම සහ කර්මාන්තශාලා පරිශ්‍රයට සවි කිරීම අනපේක්ෂිත ලෙස ප්‍රමාද විය. වියළන නල බණ්ඩලය 2024 පෙබරවාරි මාසයේ සිට ක්‍රියාත්මක වේ. දැනට අතුරු නිෂ්පාදන කුකුළු කර්මාන්තයට විකුණනු ලැබේ. කෙසේ වෙතත්, අපේක්ෂා කළ පරිදි එතනෝල් නිෂ්පාදනය අඛණ්ඩ පදනමින් ක්‍රියාත්මක නොවේ.

ප්‍රතිලේඛනගත ණය නිතිපතා සේවා කරණය කර නොතිබුණි. කෙසේ වෙතත්, සමාගම ඔවුන්ගේ ආදායම වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර දළ වශයෙන් සියයට 80 කට වැඩි මුදල් ප්‍රවාහයක් මේ වන විට බැංකුව හරහා යොමු කර තිබුණි.

සමාගමට 2022 සැප්තැම්බර් සිට මේ දක්වා ඔවුන්ගේ මාසික මුදල් ප්‍රවාහය ශුන්‍යයේ සිට රු. මිලියන 660.0 දක්වා ඉහළ නැංවිය හැකි විය. පසුගිය මාස හය ඇතුළත රු. මිලියන 660.0 ක මාසික සාමාන්‍ය මුදල් ප්‍රවාහයක් අපගේ ගිණුම වෙත යොමු කරනු ලැබුවද, බාධාවකින් තොරව ව්‍යාපාරය කරගෙන යාම සඳහා මත්පැන් බලපත්‍රය සුරක්ෂිත කර ගැනීම සඳහා ගෙවීම්වලින් සියයට 55 කට වඩා වැඩි ප්‍රමාණයක් නිෂ්පාදන බදු සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තු ගෙවීම් සඳහා භාවිතා කර තිබුණි. එබැවින්, ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයට දැනට අරමුදල් සපයනු ලබන්නේ ඔවුන්ගේ ව්‍යාපාරික මුදල් ප්‍රවාහයන් හරහා බැවින්,

| | | | |
|---|---|---|---|
| | තක්සේරු සමාලෝචන මණ්ඩලය විසින් නිශ්චය කර ඇති අපේක්ෂිත විකුණුම් වටිනාකමෙන් සියයට 60 ක සම්මත සම්මතයෙන් බැහැරව දේපලෙහි වෙළඳපල වටිනාකමෙන් සියයට 100 ක අත්තිකාරම් අනුපාතයක් සලකා බැලීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. උකස් කරන ලද දේපලවල අපේක්ෂිත විකුණුම් වටිනාකම මුළු හිඟ මුදලින් සියයට 14 ක් පමණක් නියෝජනය කරන බව නිරීක්ෂණය විය.<br>2024 මාර්තු 04 දිනට එකඟ වූ පරිදි පවතින හිඟ මුදල් පියවීමට සමාගම අවශ්‍ය වැඩපිළිවෙලක් ගෙන නොතිබුණි. | ඔවුන්ගේ විකුණුම් සැලකිය යුතු මට්ටමකට ගෙන එන තෙක් ප්‍රතිලේඛණගත ණය සඳහා අවම කොටස පමණක් අයකර ගැනීමට සමාගම ඉල්ලා ඇත. අපගේ ගිණුම් හරහා ලැබෙන විකුණුම් ආදායමෙන් සමාගම විසින් 2024 පෙබරවාරි වන විට රු. මිලියන 110.0 ක වරක් අක්‍රිය ණය පහසුකම් මාලාවක් (once off series of loan facility) පියවා ඇත.<br>දැනට, බැංකුව මසකට රු. මිලියන 45.0 ක් - රු.මිලියන 47.0 ක් අතර (ණය සඳහා මාසික අවශ්‍යතාවය රු. මිලියන 60.0 කි) අයකර ගනිමින් සිටින අතර 2024 දෙසැම්බර් වන විට අයකර ගැනීම් අවශ්‍ය මට්ටම දක්වා ඉහළ නැංවීමට සමාගම එකඟ විය. | |
| 6 | **කේ.ඩී ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම**<br>සමාගම ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් අංශයේ විශේෂයෙන්ම අධිවේගී මාර්ග, පාලම්, සිවිල් ඉදිකිරීම් සහ ජල සම්පාදන ව්‍යාපෘතිවල නිරත වේ. බැංකුව විසින් මෙම ගනුදෙනුකරුට සිය ව්‍යාපාරය කරගෙන යාමට ණය පහසුකම් ප්‍රදානය කර තිබූ අතර ඉන් පහසුකම් 10 ක් 2023 සැප්තැම්බර් 30 දිනට අක්‍රිය ණය ලෙස සටහන් කර තිබුණි.<br>කලින් කලට, බැංකුව විසින් අක්‍රිය ණය පහසුකම් ප්‍රතිලේඛණගත කර තිබූ අතර ගනුදෙනුකරු එකඟ වූ පරිදි හිඟ මුදල් ගෙවා නොතිබුණි. ඒ අනුව, සමාගමේ ණය ලිපිගොනු ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය වෙත මාරු කර තිබූ අතර මෙම එකකය ඔවුන්ගේ ව්‍යාපාර සමඟ ගැටලුකාරී ගනුදෙනුකරුවන් යථා තත්ත්වයට පත් කිරීම සඳහා ස්ථාපිත කර ඇත. එබැවින්, බැංකුව විසින් දැනට පවතින එකතුව රු. මිලියන 2,680.69 ක් වූ අක්‍රිය ණය පහසුකම් 88 ක් 2021 මාර්තු 18 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පදනම් වූ නව පුනර්ජීවන සැලැස්ම යටතේ ප්‍රතිලේඛණගත කර තිබුණි. ඒ අනුව, පුනර්ජීවන සැලැස්ම යටතේ (රු. මිලියන 6,540.3 ක ඍජු පහසුකම් සහ රු.මිලියන 7,000 ක වක්‍ර පහසුකම්) බැංකුව විසින් රු. මිලියන 13,540.3 ක පුනර්ජීවන පැකේජයක් (පවතින අක්‍රිය පහසුකම් සහ නව පහසුකම් ඇතුළත්ව) යෝජනා කර තිබුණි. තවද, බැංකුව විසින් පුනර්ජීවන සැලැස්ම යටතේ අංක 80204623 දරන එක් ණය මුදලකට අදාළ රු. මිලියන 20.39 ක පොලිය සහ අංක 66000201600061800 දරන කල්බදු පහසුකමට අදාළ රු. 310,150.63 ක අනාගත පොලිය කපා හැර තිබුණි. පසුව, 2023 ජූලි 11 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහනේ අංක 2.8 අනුව, | පෙර අක්‍රිය ණය ප්‍රතිලේඛනගත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා අවස්ථාවේදී, අත්තිකාරම් ප්‍රමාණය තීරණය කිරීමේදී බැංකුවේ පැනල් තක්සේරුකරු විසින් නිශ්චය කර ඇති සියලුම දේපලවල වෙළඳපල වටිනාකමට එරෙහිව සියයට 100 ක අත්තිකාරම් අනුපාතය, සලකා බැලීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත.<br>බැංකුව 2021 දී කේ.ඩී ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් පුනර්ජීවනය සඳහා සලකා බලා ඇති අතර 2021.03.21 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම මගින් පුනර්ජීවන පැකේජය අනුමත කර ඇත. පුනර්ජීවන පැකේජය යටතේ බැංකුව විසින් රු. මිලියන 2,740.0 ක | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

එකතුව රු. මිලියන 700 ක් වූ ණය 57 ක කල්පිරීමේ කාලය 2023 දෙසැම්බර් 31 දින දක්වා තවත් මාස නවයකින් දීර්ඝ කිරීම (මුළු දීර්ඝ කළ කාලය මාස 21 කි) සහ කේ.ඩී ර්බට් ඇන්ඩ් සන්ස් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම වෙත ප්‍රදානය කර ඇති ණයවල අවසාන වාරිකයේ ප්‍රාග්ධනය කොටස සහ පොලිය පියවීම සඳහා ගෙවීම් කාලසටහන සංශෝධනය කිරීම සහ දිර්ඝ කිරීම හා කල් දැමීම් ක්‍රියාත්මක කරන දිනය දක්වා ප්‍රමාද/දඩ පොලිය ඉවත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි.

කෙසේ වෙතත්, අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් අපේක්ෂිත පරිදි සිදුවී නොතිබූ අතර දැනට ඉහත කී ණය පහසුකම් අක්‍රිය ණය ලෙස වර්ගීකරණය කර තිබුණි. 2023 සැප්තැම්බර් 30 දිනට අක්‍රිය ණය පහසුකම්වල ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 4,239.55 ක් වූ අතර එය ගෙවිය යුතු ප්‍රාග්ධන කොටස සහ පොලිය ලෙස පිළිවෙලින් රු. මිලියන 3,538.75 කින් සහ රු. මිලියන 700.8 කින් සමන්විත වේ.

2021 වර්ෂය තුළදී දින කිහිපයක් ඇතුළත ලබාගත් තක්සේරු වාර්තාවලට අනුව අපේක්ෂිත විකුණුම් වටිනාකම රු. මිලියන 844.5 ක් වූ පන්නිපිටිය ගම්මානය, "මෙතාගනේ, මුතුගල සහ කොසුරේ" ගම්මාන, කොතලාවල, පැලැන්වත්ත ගම, කොළඹ 08, හෝමාගම, උඩහමුල්ල සහ මරදාන යන ස්ථානවල පිහිටි වාණිජ දේපළවලින් මුළු හිඟ මුදලින් රු. මිලියන 1,213 ක් සුරක්ෂිත කර තිබුණි. මුළු හිඟ මුදල උකස් කර ඇති දේපලවල අපේක්ෂිත විකුණුම් වටිනාකමෙන් සියයට 143.6 ක් නියෝජනය කරයි. මීට අමතරව, 2021 මැයි 31 දිනට ලබාගත් තක්සේරු වාර්තාවට අනුව, රු. මිලියන 2,096 ක අපේක්ෂිත විකුණුම් වටිනාකමක් ඇති වාහන සහ යන්ත්‍රෝපකරණවලට එරෙහිව රු. මිලියන 1,786.51 ක මුදලක් සුරක්ෂිත කර තිබුණි. මුළු හිඟ මුදල වාහන සහ යන්ත්‍රෝපකරණවල අපේක්ෂිත විකුණුම්වලින් සියයට 85.2 ක් නියෝජනය කරයි. මුළු අක්‍රිය ණය ශේෂයෙන් සියයට 29 ක් නියෝජනය කරන රු. මිලියන 1,240 ක ඉතිරි අක්‍රිය ණය ශේෂය පුද්ගලික සහ අධ්‍යක්ෂක ඇපකරවලට එරෙහිව සුරක්ෂිත කර තිබුණි.

හිඟ ප්‍රාග්ධන කොටස සහ රු. මිලියන 1,134.0 ක උපචිත පොලිය ප්‍රතිලේඛනගත කර ඇති අතර ප්‍රතිලේඛනගත කිරීම ක්‍රියාත්මක කරන දිනට මුළු උපචිත පොලියෙන් සියයට 1.08 ක් වූ රු. මිලියන 20.39 ක උපචිත පොලිය ඉවත් කර ඇත.

7 **සින්ටෙසි ලිමිටඩ්**

සමාගම ප්‍රධාන වශයෙන් ඇඟලුම් කර්මාන්තයේ නියැලී සිටී. මුලදී සින්ටෙසි සමාගම, බ්‍රැන්ඩික්ස් ලංකා සමාගමෙහි ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වූ අතර 2009 දී බ්‍රැන්ඩික්ස් ඔවුන්ගේ කොටස් හිමිකාරීත්වය ඉවත් කර ගෙන තිබුණි. බැංකුවේ වගකීම් ඉටු කිරීමට නොහැකි වීමත් සමඟ, සමාගම 2016 දී සිය මෙහෙයුම් නතර කිරීම තහවුරු කර තිබුණි.

2007 සිට 2017 දක්වා කාලය තුළදී අක්වෙරළ බැංකු අංශය විසින් එ.ජ.ඩො වලින් නාමනය කරන ලද කාලීන ණය සහ ප්‍රතිලේඛණගත පහසුකම් ඇතුළත්ව ණය පහසුකම් හයක් සහ තාවකාලික අයිරා පහසුකම් 02 ක් ප්‍රදානය කර තිබුණු අතර මේවා 2020 අගෝස්තු 04 වැනි දින අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම, පවතින ණය පහසුකම් ප්‍රතිලේඛණගත කිරීම හා ප්‍රතිව්‍යුහගත කිරීම, අයිරා පහසුකම් ණය පහසුකම් බවට පරිවර්තනය කිරීම, 2016 සිට ණය අක්‍රීය වූ දිනය දක්වා උපචිත පොලී/ දඩ පොලී

2017/03/01 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියට අනුව එ.ජ.ඩො මිලියන 6.752 ක ප්‍රතිලේඛණගත ණය යටතේ ප්‍රදානය කර ඇති පහසුකම් පහත පරිදි වේ.

i. කාලීන ණය - (මුලින් අනුමත මුදල වූ එ.ජ.ඩො මිලියන 1 ක් 2011.08.08 දින ප්‍රදානය කර ඇත.)
ii. කාලීන ණය - (මුලින් අනුමත මුදල වූ එ.ජ.ඩො මිලියන 1.7 ක් 2011.08.08 දින ප්‍රදානය කර ඇත.)

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

/ ප්‍රමාද ගෙවීමේ ගාස්තුව අත්හැරීම යනාදිය බැංකුව විසින් සිදු කර තිබුණි. කෙසේ වෙතත්, එම කාලය තුළ සමාගමේ මුළු ණය ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වී තිබූ අතර පහසුකම් ආපසු ගෙවීම අඩු වී තිබුණි.

පසුව, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 මාර්තු 01 දින (2017.03.01/2.15) පහත සඳහන් දෑ සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

- බැංකුව විසින් ගනුදෙනුකරුගෙන් ණය පැහැර හැරීමක් අත්විඳින අතරම වඩාත් ශක්තිමත් ඇපයක් සුරැකුමක් ලෙස තබා නොගෙන ණය ගිවිසුම සුරැකුමක් ලෙස තබා ගනිමින් පහත සඳහන් හිඟ පහසුකම් සඳහා එ.ජ.ඩො මිලියන 6.752 ක ප්‍රතිලේඛණගත ණයක් ලබා දීම.

  <u>පහසුකම්</u>

  □) කාලීන ණය – එ.ජ.ඩො මිලියන 3.1 (2007.10.02 දින ප්‍රදානය කර තිබුණි.)

  ii) කාලීන ණය – එ.ජ.ඩො මිලියන 0.324 (2009.03.23 දින ප්‍රදානය කර තිබුණි.)

  iii) කාලීන ණය - එ.ජ.ඩො මිලියන 1.3 (2011.08.08 දින ප්‍රදානය කර තිබුණි.)

  iv) ණයවර ලිපි (ලද විගස/කාලීන) / ප්‍රතිග්‍රහණය එ.ජ.ඩො මිලියන 4.0

  v) උකස් ඇපකර (4 ට ඉහළ උප සීමාව) - එ.ජ.ඩො මිලියන 4.0

  vi) අපනයන බිල්පත් සාකච්ඡා - එ.ජ.ඩො මිලියන 0.1

- උපචිත පොලී/දඩ පොලී අත්හැරීමට (2017.01.31 දිනට දළ වශයෙන් එ.ජ.ඩො 150,760 ක්) සහ ප්‍රතිලේඛණගත කාලීන ණය ප්‍රදානය කරන තෙක් කාලීන ණය, උකස් ඇපකර ණය, ඉන්වොයිස් වට්ටම් කිරීම් සහ අයිරා පහසුකම් උපචිත කිරීමට.

ගෙවිය යුතු ප්‍රාග්ධනය කොටස සහ පොලී ශේෂය පිළිවෙළින් රු. මිලියන 3,483.25 ක් සහ රු. මිලියන 323.16 ක් ඇතුළත්ව 2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරු ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 3,806.41 ක් විය. රු. මිලියන 630 ක අපේක්ෂිත විකුණුම් වටිනාකමක් ඇති රණාල, නවගමුව, ශ්‍රී සුමනතිස්ස මාවත, අංක 606 බී හි පිහිටි නිශ්චල දේපලට (9A.1R.17P) එරෙහිව එක් ණය මුදලකට අදාළ මුළු හිඟ මුදලින් රු. මිලියන 805.48 ක් සුරක්ෂිත කර තිබුණි. උකස් කරන ලද දේපලෙහි අපේක්ෂිත විකුණුම් වටිනාකම අනුරූප උකස් ණය වටිනාකමෙන් සියයට 78 ක් සහ මුළු හිඟ ණය ශේෂයෙන් සියයට 16.55 ක් නියෝජනය කරයි. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දේපල ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකිණීමට අනුමත කර තිබුණු (අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් අංක: 2021.03.04/8.1) අතර 2023 ජූනි 01 දින වෙන්දේසිය පවත්වා තිබුණි. දේපල බැංකුවට පවරා දී ඇත. දේපළ විකිණීම සඳහා නැවත ප්‍රචාරනය කරන ලද අතර ක්වොන්ටම් ක්ලෝතින් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් (බ්‍රැන්ඩික්ස් ලංකා ලිමිටඩ් හි ව්‍යාපාරයකි) වෙතින් එ.ජ.ඩො මිලියන 4.25 ක් වූ එක් ලංසුවක් පමණක් ලැබී තිබුණි. එකඟ වූ පියවීම් සැලැස්මට අනුව එ.ජ.ඩො මිලියන 2.5 ක මූලික එකඟ වූ අත්තිකාරම ගෙවීමට ලංසුකරුට දැනුම් දී තිබුණි. කෙසේ වෙතත්, HSBC හි අක්වෙරළ ගිණුම් හිමියෙකු වන ලංසුකරුට පාදක වූ ගනුදෙනුව ඔවුන්ගේ අපනයන ආදායමට කරනු ලබන බලපෑම නිසා

iii. කාලීන ණය - (මුලින් අනුමත මුදල වූ එ.ජ.ඩො මිලියන 1 ක් 2015.11.27 දින ප්‍රදානය කර ඇත.)

iv. උකස් ඇපකර ණය (Hypothecation loan) පහසුකම එ.ජ.ඩො මිලියන 4 ක ණයවර ලිපි පහසුකමේ උප සීමාව (මුලින් අනුමත මුදල එ.ජ.ඩො මිලියන 4 කි.)

v. ඉන්වොයිස් වට්ටම් කිරීමේ පහසුකම එ.ජ.ඩො මිලියන 4 ක උකස් ඇපකර ණය පහසුකමේ උප සීමාව (මුලින් අනුමත පහසුකම එ.ජ.ඩො 500,000/- කි.)

vi. උකස් ඇපකර ණය පහසුකම (මුලින් අනුමත සීමාව එ.ජ.ඩො 650,000 කි.)

vii. උකස් ඇපකර ණය පහසුකම (මුලින් අනුමත සීමාව එ.ජ.ඩො 150,000 කි.)

viii. පොරොත්තු අයිරා පහසුකම (මුලින් අනුමත සීමාව රු. මිලියන 26.58 කි)

ix. එ.ජ.ඩො 188,000 ක තාවකාලික අයිරා පහසුකම

විකුණන ලද දේපල ගෙවීමේ සැලැස්මට අනුව, 1 වන ගෙවීම ප්‍රමාද වුවද කිසිදු ප්‍රමාදයකින් තොරව දෙවන ගෙවීම ලැබුණි. පවරා ගත් දේපල විකිණීමෙන් ලද මුදල්වලින් රු. මිලියන 563.75 ක (ආසන්න වශයෙන්) අතිරික්තයක් තිබුණද, බැංකුවේ අත්පත් කරගත් දේපල බැහැර කිරීමේ ප්‍රතිපත්තියට සහ නීති උපදෙස්වලට අනුව, එම අතිරික්තය සුරක්ෂිත නොවූ පහසුකම් සඳහා අධිකරණ තීන්දුව ලැබෙන තෙක් අදාළ

එ.ජ.ඩො බැංකුව වෙත මාරු කිරීමට නොහැකි විය. එබැවින්, බැංකුව සහ ලංසුකරු විසින් ගනුදෙනුව එ.ජ.ඩො මිලියන 4.25 කට සමාන ශ්‍රී ලංකා රුපියලෙන් පියවීමට තීරණය කර තිබුණි.

2023 දෙසැම්බර් 05 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සින්ටෙසි ලිමිටඩ්හි එ.ජ.ඩො පහසුකම් රුපියල්වලින් අයකර ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි.

1. අර්පණය සලකා බලමින් සිටින බව බැංකුව දැනුම් දුන් වහාම ලංසුකරු විසින් එකඟ වූ මිලදී ගැනීමේ මිලෙන් සියයට 50 ට සමාන මුදලක් අත්තිකාරමක් ලෙස ගෙවිය යුතුය.
2. අදාළ බලධාරීන් විසින් අවශ්‍ය අනුමැතිය ලබා දුන් පසුව, ලංසුකරු විසින් බැංකුව විසින් තීරණය කරන ලද නියමිත කාල සීමාව තුළ ඉතිරි මිලදී ගැනීමේ මිල ගෙවා ගණුදෙනුව පියවිය යුතුය.

පසුව, ගෙවීම් සැලැස්ම 2023 ඔක්තෝබර් 18 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තබුණි. (අධ්‍යක්ෂ මණ්ඩල සටහන් අංක: 2023.10.18/7.2). ක්වොන්ටම් ක්ලෝතින් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් ලද අනුමත ගෙවීම් සැලැස්ම සහ ලැබීම් පහත දැක්වේ.

මුළු ලංසු වටිනාකම එ.ජ.ඩො මිලියන 4.25

| අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ගෙවීම් සැලැස්ම | | | තථ්‍ය ලැබීම් විස්තර |
|---|---|---|---|
| වහාම ගෙවිය යුතු මුදල | එ.ජ.ඩො මිලියන 2.5 | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් දින 7 ක් ඇතුළත | 2023.12.08 දින රු.මිලියන 825 ක් ලැබී ඇත. |
| මාස තුනකින් | එ.ජ.ඩො මිලියන 0.875 | පළමු ගෙවීමේ සිට මාස 3 ක් ඇතුළත | 2024.01.26 දින රු. මිලියන 281.75 ක් ලැබී ඇත. |
| මාස හයකින් | එ.ජ.ඩො මිලියන 0.875 | පළමු ගෙවීමේ සිට මාස 6 ක් ඇතුළත | ගෙවීමට නියමිතයි. |

පියවීම් සැලැස්මට අනුව, 1 වන සහ 2 වන ගෙවීම් යම් ප්‍රමාදයන් සමඟ බැංකුවට ලැබී තිබුණි. ලද මුදල්වලින් අදාළ හිඟ ණය මුදල පියවා තිබූ අතර ඉතිරි රු. මිලියන 283.75 ක් අවිනිශ්චිත ගිණුම ණය - රුපියල් (ලෙජර් කේතය: 22310014) වෙත මාරු කර තිබුණි.

2023 සැප්තැම්බර් 30 දිනට ඇති මුළු හිඟ මුදලින්, ලද විකුණුම් ආදායමෙන් ශේෂයක් පියවීමෙන් පසු 2024 පෙබරවාරි 29 දිනට රු. මිලියන 2,858.54 ක් හිඟව පැවතුනි. බැංකුවට තවත් රු. මිලියන 563.75 ක් (ලැබීමට නියමිත රු. මිලියන 280 ක් සහ ඉතිරි රු. මිලියන 283.75 ක් අවිනිශ්චිත ගිණුමේ ඇත) මුළු හිඟ මුදලින් පියවා ගත හැකි අතර එබැවින් බැංකුවට සිදුවිය හැකි අලාභය දළ වශයෙන් රු. මිලියන 2,294.79 ක් වනු ඇත.

තවද, පහත සඳහන් පහසුකම් සම්බන්ධයෙන් බැංකුව සින්ටෙසි අධිකරණයේ නැන්පත් කළ යුතුය.

අංක CHC152/2022MR දරන නඩුව (ඊළඟ නඩු විභාගය 2025.01.27 දින කැඳවීමට නියමිත වේ.) සඳහා තීන්දුව ප්‍රකාශයට පත් කරන තෙක් පවරා ගත් දේපල නැවත විකිණීමෙන් ලද අතිරික්ත අරමුදල් බැංකුව තුළ තබා ගැනීම සඳහා තහනම් නියෝගයක් (sequestration order) ලබා ගැනීමේ හැකියාව බැංකුව සොයා බලයි.

**බැංකුව විසින් ගොනු කරන ලද නඩු**

අංක CHC 151/2022/MR දරන නඩුව - මීළඟ නඩු විභාගය 2024.03.07 දින කැඳවීමට නියමිත වේ. (Steps and Moved)

අංක CHC 153/2022/MR දරන නඩුව - මීළඟ නඩු විභාග 2024.10.16 දින කැඳවීමට නියමිත වේ.

ලිමිටඩ් සහ ඇපකරුවන්ට එරෙහිව මුදල් අයකර ගැනීමේ නඩු පවරා තිබූ අතර නඩු විස්තර පහත පරිදි වේ.

1. එ.ජ.ඩො මිලියන 3.1 ක සහ එ.ජ.ඩො මිලියන 0.324 ක කාලීන ණය පහසුකම් - සමාගමට එරෙහිව අංක CHC151/2022/MR දරන නඩුව.
2. එ.ජ.ඩො මිලියන 6.752 ක ප්‍රතිලේඛණගත කළ කාලීන ණය - සමාගමට එරෙහිව අංක CHC152/2022/MR දරන නඩුව
3. එ.ජ.ඩො මිලියන 0.997 ක කාලීන ණය සහ එ.ජ.ඩො මිලියන 0.4 ක කාලීන ණය - සමාගමට සහ ඇපකරුට (කෞෂාල් දුමින්ද යහම්පත් මහතා) එරෙහිව අංක CHC153/2022/MR දරන නඩුව

| | | | |
|---|---|---|---|
| **8** | **අල්මාර් ට්‍රේඩින් කම්පැනි (පුද්ගලික) සමාගම සහ අල්මාර් ටීස් (පුද්ගලික) සමාගම**<br><br>**අ) අල්මාර් ට්‍රේඩින් කම්පැනි (පුද්ගලික) සමාගම**<br><br>සමාගම 1993 දී සංස්ථාපිත කර තිබූ අතර ප්‍රධාන වශයෙන් ස්වභාවික රබර් සෘජු අපනයනයෙහි නිරත වේ. 2015 සිට 2020 දක්වා කාලපරිච්ඡේදය තුළදී එ.ජ.ඩො මිලියන 5.5 ක කාලීන ණය 01 ක්, පිළිවෙලින් එ.ජ.ඩො මිලියන 1.5 ක සහ එ.ජ.ඩො මිලියන 0.15 ක ප්‍රතිලේඛණගත පහසුකම් 02 ක් සහ එ.ජ.ඩො මිලියන 1.819 ක කෙටි කාලීන පහසුකම් 01 ක් ඇතුළත් එ.ජ.ඩො වලින් නාමනය කරන ලද ණය පහසුකම් හතරක් බැංකුවේ ආයතනික අංශය විසින් ප්‍රදානය කර තිබුණි. මේවා පිළිවෙළින් 2021 අප්‍රේල් 30 සහ 2021 ඔක්තෝම්බර් 17 යන දිනවලදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කරන තිබුණි.<br><br>කෙටි කාලීන ණය පහසුකම් කාලීන ණය බවට පරිවර්තනය කිරීම, සහන කාලයක් ලබා දීම, ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම, ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රතිලේඛණගත කිරීම සහ 2015 සිට ණය අක්‍රීය වූ දිනය දක්වා ණය පමා සහන කාලයක් ලබා දීම බැංකුව විසින් සිදු කර තිබුණි.<br><br>අධික ලෙස බැංකු ණය ගැනීම්, කොටස් වෙළඳපොලේ ආයෝජනය කිරීම සහ වත්කම් මිලදී ගැනීම වැනි විවිධ ආයෝජන සඳහා අරමුදල් යෙදවීම, සමාගම යටතේ තම ව්‍යාපාර ක්‍රියාත්මක නොකිරීම, අල්මාර් ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් නම් ඔවුන්ගේ සහෝදර සමාගම හරහා රබර් වෙළඳ ව්‍යාපාරය පවත්වාගෙන යාම, එකඟ වූ පරිදි ඔවුන්ගේ දේපළ විකිණීම සහ එකඟ වූ පරිදි අමතර ප්‍රාග්ධනය රැස් කිරීමට නොහැකි වීම හේතුවෙන් 2011/12 මූල්‍ය වර්ෂයේ සිට විශාල අලාභ ලැබීම නිසා සමාගම එකඟ වූ පරිදි සැලකිය යුතු මුදල් ප්‍රවාහයක් බැංකුවට ප්‍රේෂණය කර නොතිබුණි.<br><br>2020 මාර්තු 31 වන දිනට සමාගමේ පවතින මූල්‍ය තොරතුරුවලට අනුව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, දේපල පිරියත හා උපකරණ සහ සමාගමෙහි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධ කරුණු මත පදනම්ව විගණකවරුන් අහිතකර මතයක් ප්‍රකාශ කර තිබුණි. තවද, 2011/12 මූල්‍ය වර්ෂයේ සිට සමාගම විශාල අලාභ ලබා තිබූ අතර එය 2013/14 සිට 2019/20 දක්වා සෘණ ශුද්ධ ලාභයේ සහ සෘණ ස්පර්ශ කළ හැකි ශුද්ධ වටිනාකමෙහි ක්‍රමානුකූලව වැඩි වීමක් පෙන්නුම් කර තිබුණි. තවද, 2013/14 සිට 2019/20 දක්වා කාලය තුළදී මුළු වත්කම් රු. මිලියන 2,692 ක සිට රු. මිලියන 759 ක් දක්වා සහ | බැංකුවේ ආයතනික ශාඛාව විසින් එ.ජ.ඩො මිලියන 5.5 ක කාලීන ණය 01 ක්, පිළිවෙලින් එ.ජ.ඩො මිලියන 1.5 ක් හා එ.ජ.ඩො මිලියන 0.15 ක් වූ ප්‍රතිලේඛණගත පහසුකම් 02 ක් සහ එ.ජ.ඩො මිලියන 1.819 ක කෙටි කාලීන පහසුකම් ඇතුළත් එ.ජ.ඩො වලින් නාමනය කරන ලද ණය පහසුකම් හතරක් ප්‍රදානය කර ඇත.<br><br>සමාගම මුහුණ දුන් මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, බැංකුව විසින් සහන කාලයක්, ණය පමා සහනයක්, ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීමක්, ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීමක් හා ප්‍රතිලේඛණගත කිරීමක් ලබා දී ඇත.<br><br>First way out (මුදල් ප්‍රවාහ පදනම) ඇගයීම මගින් බැංකුව ආයතනික ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, අල්මාර් ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි ආයතනික ඇපකරය, සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ ඒකාබද්ධ සහ ඇපකර කිහිපයක්, සමාගමේ වත්කම් පිළිබඳ සෘණාත්මක ඔඩපනය, ගනුදෙනුකරුගේ පාලනය යටතේ ඇති කොටස් මත වෙනස් වන උකස සහ ලේඛණගත ණය වැනි | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| සමාගමේ අවදානම් ශ්‍රේණිගත කිරීම 2014 සිට 2020 දක්වා “C” සිට “D” කාණ්ඩය දක්වා අඩු කර තිබුණි.<br>2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරුගේ මුළු හිඟ ශේෂය රු. මිලියන 2,476.83 ක් වූ අතර එය මුළු හිඟ ප්‍රාග්ධන කොටස සහ පොලී ශේෂය ලෙස පිළිවෙලින් රු. මිලියන 2,038.86 කින් සහ රු. මිලියන 437.97 කින් සමන්විත විය. අල්මාර් ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ආයතනික ඇපකරය, සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ ඒකාබද්ධ සහ ඇපකර කිහිපයක්, සමාගමේ වත්කම් පිළිබඳ සෘණාත්මක ඔඩපනය සහ ගනුදෙනුකරුගේ පාලනය යටතේ ඇති කොටස් මත වෙනස් වන උකසට එරෙහිව මුළු අක්‍රීය ණය ශේෂය සුරක්ෂිත කර තිබුණි.<br>ඒ අනුව, බැංකුව විසින් ඉහත ණය පහසුකම් සුරක්ෂිත නොවන ඇපකර පදනමක් මත අනුමත කර ප්‍රදානය කර තිබූ බව නිරීක්ෂණය වූ අතර බැංකුව මේ වන විට ණය පැහැර හැරීමේ ඉහළ අවදානමකට ලක් වී තිබුණි.<br>සියලුම අක්‍රීය ණය පහසුකම් සඳහා එන්තරවාසි 2022 දෙසැම්බර් 15 දින යවා තිබූ අතර නීතිමය ලියකියවිලි සඳහා උපදේශකවරයකු පත් කර තිබුණි. | බැංකුවට පිළිගත හැකි සුරැකුම්පත් සමඟ ණය පහසුකම් සුරක්ෂිත කිරීමට බැංකුවට හැකි විය.<br>සියලුම අක්‍රීය ණය පහසුකම් සඳහා එන්තරවාසි යවා ඇති අතර එ.ජ.ඩො මිලියන 5.5 ක පහසුකම සඳහා නඩු පවරා ඇත. අනෙකුත් ණය පහසුකම්වලට එරෙහිව ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග යටතේ නඩු පැවරීම සඳහා උපදේශකයකු පත් කර ඇත.<br>අනෙකුත් පහසුකම් වෙනුවෙන් නඩු ගොනු කිරීම සඳහා පැමිණිලි පිළියෙළ කරමින් සිටී.<br>ස්ථීර අයිරා පහසුකම සඳහා පරාටේ ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතුය. | |
| **ආ) අල්මාර් ටීස් (පුද්ගලික) සමාගම**<br>සමාගම 2005 දී සංස්ථාපිත කර තිබූ අතර ප්‍රධාන වශයෙන් තේ සෘජු අපනයනයේ නිරත වේ. 2012 සිට 2021 දක්වා කාලය තුළදී රු. මිලියන 400 ක එක් කාලීන ණයක්, රු. මිලියන 50 ක එක් ප්‍රතිලේඛණගත පහසුකමක්, රු. මිලියන 18.627 ක එක් පමා සහන ණයක්, රු. මිලියන 500 ක හා එ.ජ.ඩො 3,820 ක වැඩිදියුණු කිරීමේ ඇසුරුම් ණය පහසුකම් (චක්‍රීය) දෙකක් ඇතුළත් ණය පහසුකම් 05 ක් බැංකුව විසින් ප්‍රදානය කර තිබුණු අතර ඒවා 2021 අප්‍රේල් සිට 2022 දක්වා අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි.<br>ණය පමා සහන, පොලී සහන, ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම සහ ණය අක්‍රීය වූ දිනය දක්වා ගනුදෙනුකරු මත ඇති මූල්‍ය බර ලිහිල් කිරීමේ අරමුණින් ප්‍රතිලේඛණගත කිරීම ඇතුළත් සහන කිහිපයක් සමාගමට ලබා දීමට බැංකුව කටයුතු කර තිබුණි. සමූහයේ අනෙකුත් සමාගම් වෙත අරමුදල් යෙදවීම සහ ප්‍රමාණවත් මුදල් උත්පාදනය නොකිරීම හේතුවෙන් සමාගම එකඟ වූ පරිදි සැලකිය යුතු මුදල් ප්‍රවාහයක් බැංකුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.<br>සමාගමේ පවතින මූල්‍ය තොරතුරු අනුව, 2020 මාර්තු 31 දිනට විගණකවරයා විසින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ව්‍යාවනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර සමාගම 2016/17 සිට 2019/20 දක්වා සෘණ ශුද්ධ ලාභයේ සහ සෘණ ශුද්ධ කාරක ප්‍රාග්ධනයේ ක්‍රමානුකූල වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. 2015/16 සිට 2019/20 දක්වා කාලය තුළදී මුළු වත්කම් රු. මිලියන 2,184 ක සිට රු. මිලියන 1,546 ක් දක්වා අඩු වී තිබුණි. තවද, 2019/20 විගණිත මූල්‍ය ප්‍රකාශන මගින් ණය/ස්කන්ධ ප්‍රාග්ධනය, ණය සේවා ආවරණ අනුපාතය, පොලී ආවරණ අනුපාතය සහ කොටසක ඉපැයීම වැනි අනුපාතයන් සෘණ අගයන් දක්වා තිබුණි. එසේම සමාගමේ අවදානම් ශ්‍රේණිගත කිරීම 2012 සිට 2021 දක්වා “C” සිට “D” කාණ්ඩය | සමාගම රටේ ප්‍රමුඛතම තේ අපනයනකරුවෙක් විය. ව්‍යාපාරයේ මුදල් ප්‍රවාහය මත පදනම්ව කාරක ප්‍රාග්ධනය සඳහා අරමුදල් සැපයීම සඳහා බැංකුව විසින් ණය පහසුකම් සලකා බැලීම අසාමාන්‍ය දෙයක් නොවේ.<br>කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ණය පහසුකම් ලබා දීමේදී ප්‍රමුඛ අපනයනකරුවන්ගෙන් ඇපයක් බලාපොරොත්තු වීම යථාර්ථවාදී නොවේ.<br>සියලුම අක්‍රීය ණය පහසුකම් සඳහා එන්තරවාසි යවා ඇති අතර පහසුකම්වලට එරෙහිව ණය අයකර ගැනීමේ/මුදල් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග යටතේ නඩු පැවරීම සඳහා උපදේශකයකු පත් කර ඇත.<br>නඩු ගොනු කිරීම සඳහා පැමිණිලි පිළියෙළ කරමින් සිටී. | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | දක්වා අඩු වී තිබුණි.<br>2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරුගේ මුළු හිඟ ශේෂය රු. මිලියන 1,124.08 ක් වූ අතර එය ප්‍රාග්ධන කොටස සහ පොලී ශේෂය ලෙස පිළිවෙලින් රු. මිලියන 857.31 කින් සහ රු. මිලියන 266.77 කින් සමන්විත විය. කොටස් මත උකස, සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ ඒකාබද්ධ හා ඇපකර කිහිපයක් සහ අල්මාර් ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ආයතනික ඇපකරය මගින් මුළු අක්‍රීය ණය සුරක්ෂිත කර තිබුණි.<br>ඉතිරි කිරීමේ ගිණුම් අංක 2490849 හි 2023 සැප්තැම්බර් 30 දිනට බැංකුව විසින් රු. මිලියන 14.903 (එ.ජ.ඩො 1ක් රු.320 කි.) ට සමාන එ.ජ.ඩො 46,573.36 ක ආන්තිකයක් රඳවා ගෙන සිටි අතර එය බැංකුව විසින් අත්හිටුවා තිබුණි. සියලුම අක්‍රීය ණය පහසුකම් සඳහා එන්තරවාසි යවා තිබූ අතර නඩු ගොනු කිරීම සඳහා ලේඛන ඉදිරිපත් කර තිබුණි.<br>බැංකුව විසින් සුරක්ෂිත නොවන ඇපකර මත ඉහත ණය පහසුකම් අනුමත කර ප්‍රදානය කර තිබූ බව නිරීක්ෂණය විය. එමගින් ගනුදෙනුකරු ණය පහසුකම් ගෙවීම පැහැර හැර තිබුණි. | | |
| 9 | **සීඑම්එල් සමූහය**<br>**අ) සීඑම්එල් -එම්ටීඩී කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ්**<br>සීඑම්එල්-එම්ටීඩී කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් යනු මාර්ග, අධිවේගීමාර්ග, පාලම්, වරාය සංවර්ධනය සහ අනෙකුත් සිවිල් සහ සාමාන්‍ය කොන්ත්‍රාත්තු ඉදිකිරීමේ නියැලී සිටින සීමිත වගකීම් සහිත සමාගමකි.<br>බැංකුව විසින් 2011 - 2018 කාලය තුළදී එකතුව රු. මිලියන 693.18 ක් වූ ණය 15 ක්, රු. මිලියන 150 ක අයිරා පහසුකමක් සහ රු. මිලියන 21.15 ක කල්බදු පහසුකමක් ප්‍රදානය කර තිබූ අතර 2023 සැප්තැම්බර් 30 දිනට ඒවා අක්‍රීය ණය කාණ්ඩය යටතේ පැවතුනි. රු. මිලියන 168 ක ප්‍රධාන පහසුකම 2018 ජූනි 28 දින ප්‍රදානය කර තිබූ අතර 2019 මැයි 28 දින අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. අනෙකුත් පහසුකම් 2019 සිට 2021 දක්වා කාලය තුළදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. බැංකුව විසින් ණය අක්‍රීය වූ දිනය දක්වා අඛණ්ඩව කල්පිරීමේ කාලය දීර්ඝ කර තිබුණි.<br>2018 සිට 2019 දක්වා සමාගමේ අවදානම් ශ්‍රේණිගත කිරීම B සිට C කාණ්ඩය දක්වා අඩු වී තිබූ නමුත් රු. මිලියන 796.7 ක බිල්පත් වට්ටම් කිරීමේ පහසුකම් සම්බන්ධයෙන් කල්පිරෙන දිනයන් මාස දෙකේ සිට පහ දක්වා තවදුරටත් දීර්ඝ කිරීමට බැංකුව ණය කමිටුවේ අනුමැතිය ලබාගෙන තිබුණි.<br>ආයතනික ණය ප්‍රතිපත්ති අත්පොතෙහි 8.1.(i) සහ (ii) වගන්තියට අනුව, ණය ශ්‍රේණිගත කිරීම "B" සහ ඊට අඩු නම්, වාර්ෂිකව හෝ අර්ධ වාර්ෂිකව සියලුම ගනුදෙනුකරුවන් සඳහා සවිස්තරාත්මක ණය විශ්ලේෂණයක් සිදු කළ යුතු අතර ත්‍රෛමාසික වර්ගීකරණ ක්‍රියාවලිය, කාර්තුමය වශයෙන් ගනුදෙනුකරුවන් බැහැදැකීම යනාදිය හරහා පවරා ඇති ගනුදෙනුකරුවන්ගේ ණය ගුණාත්මකභාවය තක්සේරු කළ යුතුය. කෙසේ වෙතත්, විගණන සමාලෝචනය සඳහා ගනුදෙනුකරුවන් බැහැදැකීමේ වාර්තා නොතිබුණි. | පහසුකම් ප්‍රදානය කරන කාලය තුළදී සීඑම්එල්-එම්ටීඩී කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් ප්‍රමුඛතම ඉදිකිරීම් සමාගමක් වූ බැවින් බැංකුව විසින් සමාගම වෙත ණය පැකේජය සලකා බලා ඇත. කෙසේ වෙතත්, ආර්ථික පසුබෑම සමස්ත ඉදිකිරීම් කර්මාන්තයට අහිතකර ලෙස බලපෑ අතර, එබැවින් මෙම සමාගමට ලබා දී ඇති පහසුකම් අක්‍රීය ණය කාණ්ඩයට මාරු කරන ලදී.<br>සීඑම්එල්-එම්ටීඩී කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් ආයතනය මේ වන විට ඈවර කරමින් පවතින අතර බැංකුව විසින් අංක 32/2019 දරන නඩුව සඳහා 2023.08.10 දින හිමිකම් ඉදිරිපත් කර ඇත. අංක 32/2019 දරන නඩුවේ මීළඟ නඩු විභාගය 2024/11/21 දින කැඳවීමට නියමිත වේ. | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරුගේ මුළු හිඟ ශේෂය රු. මිලියන 1,601.48 ක් වූ අතර එය ප්‍රාග්ධන කොටස සහ පොලී ශේෂය ලෙස පිළිවෙළින් රු. මිලියන 860.35 කින් සහ රු. මිලියන 741.13 කින් සමන්විත විය. මුළු හිඟ මුදලින්, රු. මිලියන 1,583.26 ක් එම්ටීඩී වෝකර්ස් පීඑල්සී හි ආයතනික ඇපකරයට එරෙහිව සුරක්ෂිත කර තිබුණු අතර රු. මිලියන 18.22 ක කල්බදු පහසුකම කල්බදු වත්කම් මත උකසට එරෙහිව සුරක්ෂිත කර තිබුණි.

සමාගම කොළඹ වාණිජ මහාධිකරණයේ අංක HC (සිවිල්) 32/2019/Co දරන නඩුව යටතේ ඈවර කිරීමේ නියෝගයක් යටතේ පවතින අතර සමාගම විසින් ලබාගෙන ඇති මුළු වගකීම් සඳහා බැංකුව දැනටමත් හිමිකම් ගොනු කර තිබුණි. 2023 මැයි 10 වැනි දින ඉහත කාරණය සම්බන්ධයෙන් නව ඈවරකරුවකු පත් කර තිබූ අතර බැංකුව නව ඈවරකරු වෙත හිමිකම් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. සම්පත් බැංකුව විසින් කරන ලද අයදුම්පතක් සම්බන්ධයෙන් ඈවරකරුගේ බැඳීම් සඳහා ඉහත නඩුව 2024 මාර්තු 28 දිනට දින නියම කර තිබුණි.

**ආ) එම්ටීඩී වෝකර්ස් පීඑල්සී**

සමාගම සිවිල් හා යාන්ත්‍රික ඉංජිනේරු, සමුද්‍ර ඉංජිනේරු, බර සහ සැහැල්ලු යන්ත්‍ර සූත්‍ර වෙළඳාම, දේපළ වෙළඳාම් සහ බලශක්ති උත්පාදන කර්මාන්තවල ආයෝජන කළඹක් කළමනාකරණය කිරීමේ නිරත වේ.

බැංකුව විසින් 2016 ඔක්තෝබර් 26 වැනි දින සමූහයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රු. මිලියන 50 ක ස්ථිර අයිරා පහසුකමක් ප්‍රදානය කර තිබුණි. 2016 දෙසැම්බර් 01 දිනැති අයිරා ගිවිසුමේ සඳහන් විශේෂ කොන්දේසියට අනුව, අයිරා සීමාව 2019 ජුනි 13 (මාස 29) දක්වා මාසිකව රු. මිලියන 1.0 කින් අඩු කර තිබුණි. එබැවින්, මුළු සීමාව රු. මිලියන 21 දක්වා අඩු කර තිබුණි. තවද, පෙර අනුමැතියකින් තොරව ජංගම ගිණුම් අංක 79257442 සඳහා රු. මිලියන 6.59 ක තවත් තාවකාලික අයිරා පහසුකමක් ප්‍රදානය කර තිබුණි. මුළු හිඟ මුදල්වලින්, රු.මිලියන 21 ක් අයිරා ගිවිසුමට එරෙහිව සුරක්ෂිත කර තිබූ අතර අනෙක් අයිරා පහසුකම සුරැකුම් රහිත පදනම මත විය. ඒ අනුව, ශක්තිමත් ඇපකරවලට එරෙහිව පහසුකම් සුරක්ෂිත කර නොතිබූ බැවින් හිඟ ශේෂය නැවත අයකර ගැනීමේ හැකියාව සැක සහිතය.

සවිස්තරාත්මක ණය විශ්ලේෂණයක් සිදු කර නොමැති අතර විගණන සමාලෝචනය සඳහා ගනුදෙනුකරු බැහැදැකීමේ වාර්තා නොතිබුණි.

පිරිනැමීමේ ලිපියේ විශේෂ කොන්දේසි අංක (d) අනුව, සමාගමේ විගණනය කරන ලද ශේෂ පත්‍ර සහ සමාගමට කලින් කලට ලැබිය හැකි වෙනත් අදාළ මූල්‍ය තොරතුරු සහ මාසික කළමනාකරණ ගිණුම් සඳහා වන විගණකයන්ගේ රහස්‍ය වාර්තාවල පිටපත් ඉදිරිපත් කිරීමට ගනුදෙනුකරුට නොහැකි විය.

2022 නොවැම්බර් 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල සංදේශයට අනුව, වෝකර්ස් ෂිප්යාඩ් ලිමිටඩ්, නදර්න් පවර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කලම්බෝ ෆෝට් හෙරිටේජ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් හි එම්ටීඩී වෝකර්ස් පීඑල්සී සතු කොටස්වලින් සියයට 100 ක් එම්ටීඩී කැපිටල් බර්හාඩ් වෙත එ.ජ.ඩො 19,098,760.83 ක මිළදී ගැනීමේ

එම්ටීඩී වෝකර්ස් පීඑල්සී ඉංජිනේරු සහ යටිතල පහසුකම් කර්මාන්තයේ පුරෝගාමියෙකු වූ අතර පහසුකම් ප්‍රදානය කරන විට ශ්‍රී ලංකාවේ පැරණිතම සමාගමක් විය. කාරක ප්‍රාග්ධන ගැටළු සමඟ පහසුකම් අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇත.

සමාගම දැනට ඈවර කිරීම යටතේ පවතී.

ඈවරකරුවකු පත් කළ පසු බැංකුව විසින් හිමිකම් ඉදිරිපත් කරනු ඇත. මීළඟ නඩු විභාගය 2024.10.30 දින කැඳවීමට නියමිත වේ.

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

| | | |
|---|---|---|
| ප්‍රතිෂ්ඨාවකට පැවරීමට එරෙහිව ගොනු කර තිබූ අංක HC. සිවිල් 143/2019/MR දරන නඩුව දිගටම කරගෙන යාමට නිර්දේශ කර තිබුණි. | | |
| **ඇ) වෝකර්ස් ඉක්විප්මන්ට් ලිමටඩ්**<br>වෝකර්ස් ඉක්විප්මන්ට් ලිමටඩ් යනු එම්ටීඩී වෝකර්ස් පීඑල්සී හි පරිපාලිත සමාගමක් වන අතර යටිතල පහසුකම් සංවර්ධන ආධාරක ව්‍යාපාරයක් ලෙස 2015 දී සංස්ථාපිත කර තිබුණි. යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ නිෂ්පාදන ආනයනය, බෙදා හැරීම සහ නඩත්තු කිරීම සඳහා සම්බන්ධ වේ.<br>2016 සිට 2018 දක්වා කාලය තුළදී රු. මිලියන 200 ක සීමාවක් සහිත උකස් ඇපකර ණය (චක්‍රීය) පහසුකමක්, රු. මිලියන 25 ක අයිරා පහසුකම් සීමාවක් සහ රු. මිලියන 40.57 ක බිල්පත් ප්‍රතිග්‍රහණයකිරීමේ පහසුකම් වැනි ණය පහසුකම් පැකේජයක් බැංකුව විසින් ප්‍රදානය කර තිබුණු අතර ඒවා 2023 සැප්තැම්බර් 30 දිනට අක්‍රීය ණය කාණ්ඩය යටතේ පැවතුනි. මෙම පහසුකම් 2018 සිට 2022 දක්වා කාලය තුළදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. අක්‍රීය ණය වෙත මාරු කළ දිනය දක්වා කල් පිරෙන දින දීර්ඝ කිරීම් බැංකුව විසින් ප්‍රදානය කර තිබුණි.<br>2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරු ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 287.73 ක් වූ අතර එය මුළු හිඟ ප්‍රාග්ධන කොටස සහ පොලී ශේෂය ලෙස පිළිවෙලින් රු.මිලියන 136.35 කින් සහ රු.මිලියන 151.38 කින් සමන්විත විය.<br>සීඑම්එල්-එම්ටීඩී වෝකර්ස් පීඑල්සී හි ආයතනික ඇපකරයට එරෙහිව මුළු හිඟ ශේෂයෙන් රු. මිලියන 75.56 ක් පමණක් සුරක්ෂිත කර තිබූ අතර ඉතිරි රු. මිලියන 212.17 ක් සුරැකුම් රහිත පදනම මත ප්‍රදානය කර තිබුණි. හිඟ ශේෂයේ විශාල කොටසක් සුරක්ෂිත කර නොතිබූ අතර ඉතිරි ශේෂය දුර්වල ඇපකරවලට එරෙහිව සුරක්ෂිත කර තිබූ බැවින් හිඟ මුදල් ආපසු අයකර ගැනීමේ හැකියාව සැක සහිතය.<br>සවිස්තරාත්මක ණය විශ්ලේෂණයක් සිදු කර නොතිබුණු අතර විගණන සමාලෝචනය සඳහා ගනුදෙනුකරු බැහැදැකීමේ වාර්තා නොතිබුණි.<br>පිරිනැමීමේ ලිපියේ ඇති විශේෂ කොන්දේසි අංක (d) අනුව, 2018 න් පසු සමාගමේ විගණනය කරන ලද ශේෂ පත්‍ර, අනෙකුත් අදාළ මූල්‍ය තොරතුරු සහ මාසික කළමනාකරණ ගිණුම් සඳහා වන විගණකයන්ගේ රහස්‍ය වාර්තාවල පිටපත් ඉදිරිපත් කිරීමට ගනුදෙනුකරුට නොහැකි විය.<br>අක්‍රීය ණය කාණ්ඩයට මාරු කළ දිනට පසුව මෙම පහසුකම් සඳහා කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වෝකර්ස් ඉක්විප්මන්ට් ලිමටඩ් යටිතල පහසුකම් ආධාරක සේවාවක නිරත වූ අතර පහසුකම් ප්‍රදානය කරන අවස්ථාවේදී කීර්තිමත් සන්නාම නාමයන් සහිත වරලත් හිමිකම් තිබුණි. ප්‍රධාන වශයෙන් රටේ පැවති අයහපත් ආර්ථිකය හේතුවෙන් ණය පහසුකම් අක්‍රීය ණය කාණ්ඩය මාරු කර තිබුණි.<br>බැංකුව 2024.03.11 දින එන්තරවාසියක් යවා ඇති අතර නීතිමය ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යන ලෙස නීති අංශයට උපදෙස් ලබා දී ඇත. | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |
| **ඇ) වෝකර්ස් සන්ස් ඇන්ඩ් කම්පැනි ඉංජිනියරින් (පුද්ගලික) සමාගම**<br>රට තුළ ඉංජිනේරු ව්‍යාපෘති හැසිරවීමට සහ ක්‍රියාත්මක කිරීමට සමාගම 1992 දී සංස්ථාපිත කර තිබුණි. සමාගම එම්ටීඩී වෝකර්ස් පීඑල්සී හි පරිපාලිත සමාගමකි.<br>2016 සිට 2018 දක්වා කාලය තුළදී එ.ජ.ඩො වලින් නාමනය කරන | බැංකුව වෝකර්ස් සන්ස් ඇන්ඩ් කම්පැනි ඉංජිනියරින් (පුද්ගලික) සමාගම සඳහා ණය පැකේජ සලකා බලන අවස්ථාවේදීල එය ප්‍රධාන වශයෙන් තේ කර්මාන්ත ශාලා | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

ලද ණය 33 ක් සහ අයිරා පහසුකම් දෙකක් බැංකුව විසින් ප්‍රදානය කර තිබුණු අතර ඒවා 2023 සැප්තැම්බර් 30 දිනට අක්‍රීය ණය කාණ්ඩය යටතේ පැවතුනි. මෙම පහසුකම් 2019 වර්ෂය තුළදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි.

අක්‍රීය ණය වෙත මාරු කළ දිනය දක්වා අඛණ්ඩව කල් පිරෙන දින දීර්ඝ කිරීම් බැංකුව විසින් ප්‍රදානය කර තිබුණි. "දින දීර්ඝ කිරීම් මුදල් ප්‍රවාහය සමඟ නොගැලපී තිබූ අතර එම දීර්ඝ කිරීම් හොඳ යෝජනාවක් නොවීය" යන ප්‍රධාන අවදානම් නිලධාරියාගේ ප්‍රකාශය නොතකා, එ.ජ.ඩො මිලියන 1.42 ක එ.ජ.ඩො වලින් නාමනය කරන ලද ණයවල ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීමට සහ රු. මිලියන 100 ක අයිරා පහසුකමේ කල් පිරෙන කාලය දීර්ඝ කිරීමට බැංකුවේ ණය කමිටුවේ අනුමැතිය ලබාගෙන තිබුණි.

2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරු ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 1,119.03 ක් වූ අතර එය මුළු ප්‍රාග්ධන කොටස සහ පොලී ශේෂය ලෙස පිළිවෙලින් රු. මිලියන 544.92 කින් සහ රු. මිලියන 574.11 කින් සමන්විත විය.

මුළු හිඟ මුදලින්, රු. මිලියන 1,103.35 ක මුදලක් එම්ටීඩී වෝකර්ස් පීඑල්සී හි ආයතනික ඇපකරයට එරෙහිව සුරක්ෂිත කළ තිබුණු අතර රු. මිලියන 15.68 ක අනෙකුත් පහසුකම් සුරැකුම් රහිත පදනම මත ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, ශක්තිමත් ඇපකරවලට එරෙහිව පහසුකම් සුරක්ෂිත කර නොතිබූ බැවින් හිඟ ශේෂය ආපසු අයකර ගැනීමේ හැකියාව සැක සහිතය.

සවිස්තරාත්මක ණය විශ්ලේෂණයක් සිදු කර නොතිබූ අතර විගණන සමාලෝචනය සඳහා ගනුදෙනුකරු බැහැදැකීමේ වාර්තා නොතිබුණි.

පිරිනැමීමේ ලිපියේ ඇති විශේෂ කොන්දේසි අංක (d) අනුව, 2017 න් පසුව සමාගමේ විගණනය කරන ලද ශේෂ පත්‍ර, අනෙකුත් අදාළ මූල්‍ය තොරතුරු සහ මාසික කළමනාකරණ ගිණුම් සඳහා වන විගණකයන්ගේ රහස්‍ය වාර්තාවල පිටපත් ඉදිරිපත් කිරීමට ගනුදෙනුකරුට නොහැකි විය.

අංක: CHC 95/2018/CO දරන ඈවර කිරීමේ නඩු අයදුම්පත වාණිජ මහාධිකරණය විසින් 2022 පෙබරවාරි 24 වන විට නිෂ්ප්‍රභා කර තිබූ අතර එම නියෝගයට එරෙහිව පෙත්සම්කරු විසින් පූරවන ලද අංක: SC/HC/LA/21/2022 දරන අභියාචනය කිරීමට අවසරය ඉල්ලීමේ අයදුම්පත්‍රය 2022 මැයි 19 වැනි දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ද නිෂ්ප්‍රභා කර තිබුණි. ඉන් පසුව, 2024 මාර්තු 07 දින දක්වා ගනු ලැබූ කිසිදු අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයක් නිරීක්ෂණය නොවීය.

ඉදිකිරීම්, මොනෝරේල් වාහක පද්ධතිය සැපයීම සහ ස්ථාපනය කිරීම ආදිය සිදු කළ ප්‍රමුඛ ඉංජිනේරු සමාගමකි. මෙය එම්ටීඩී වෝකස් පීඑල්සී හි අනුබද්ධිත ආයතනයකි. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් රටේ පවතින අයහපත් ආර්ථිකය හේතුවෙන් එම පහසුකම් අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇත. බැංකුව 2024.03.12 දින ඉල්ලීම් ලිපියක් යවා නීතිමය ක්‍රියාමාර්ගය ඉදිරියට ගෙන යන ලෙස නීති ඒකකයට උපදෙස් දුන්නේය.

**ඉ) නදර්න් පවර් කම්පැනි (පුද්ගලික) සමාගම**

සමාගම එම්ටීඩී වෝකර්ස් පීඑල්සී හි පරිපාලිත සමාගමක් වන අතර වුන්නාකම් හි බලාගාරය ක්‍රියාත්මක කිරීමේ නිරත විය. එහි ක්‍රියාකාරිත්වය අතරතුර, ප්‍රදේශයේ ජල මූලාශ්‍ර දූෂණය වීම හේතුවෙන් බලාගාරයට නඩු රැසකට මුහුණ දීමට සිදු විය.

2015 – 2020 කාලය තුළදී රු. මිලියන 263.52 ක ණයවර ලිපි (චක්‍රීය) පහසුකමක් සහ රු.මිලියන 10.82 ක අයිරා පහසුකම් බැංකුවේ ආයතනික අංශය විසින් මෙම සමාගම වෙත ප්‍රදානය කර තිබුණි. ඒවා 2023 සැප්තැම්බර් 30 දිනට අක්‍රීය ණය කාණ්ඩය යටතේ පැවතුනි. මෙම පහසුකම් 2019 – 2022 කාලසීමාව තුළදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. අක්‍රීය ණය කාණ්ඩයට මාරු

2009 සිට නදර්න් පවර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයෙකු විය. අධිකරණ නියෝගයක් හේතුවෙන් බලාගාරයේ මෙහෙයුම් අත්හිටුවා ඇත. විපතට පත් වූ නිවැසියන්ට රු. මිලියන 20 ක වන්දියක් ගෙවන ලෙසත් මෙහෙයුම් දිගටම කරගෙන යාමටත් සමාගමට

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

කළ දිනය දක්වා අඛණ්ඩව කල් පිරෙන දින දීර්ඝ කිරීම් බැංකුව විසින් ප්‍රදානය කර තිබුණි.

2023 සැප්තැම්බර් 30 වන දිනට ගනුදෙනුකරු ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 517.98 ක් වූ අතර එය හිඟ ප්‍රාග්ධන කොටස සහ පොලිය ලෙස පිළිවෙලින් රු. මිලියන 232.28 කින් සහ රු. මිලියන 285.70 කින් සමන්විත විය.

මුළු හිඟ මුදලින්, රු. මිලියන 493.30 ක මුදලක් එම්ටීඩී වෝකර්ස් පීඑල්සී හි ආයතනික ඇපකරයට එරෙහිව සුරක්ෂිත කළ තිබුණු අතර ඉතිරි ශේෂය වූ රු. මිලයන 24.68 ක් සුරැකුම් රහිත පදනම මත ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, ශක්තිමත් ඇපකරවලට එරෙහිව පහසුකම් සුරක්ෂිත කර නොතිබූ බැවින් හිඟ ශේෂය ආපසු අයකර ගැනීමේ හැකියාව සැක සහිතය.

සවිස්තරාත්මක ණය විශ්ලේෂණයක් සිදු කර නොතිබූ අතර 2014 අගෝස්තු 22 න් පසුව විගණන සමාලෝචනය සඳහා ගනුදෙනුකරු බැහැදැකීමේ වාර්තා නොතිබුණි.

2019 සැප්තැම්බර් 02 දිනැති ණය කමිටු සංදේශයට අනුව, නදර්න් පවර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් එරෙහිව ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට අනුමැතිය ලබා දී තිබුණි.

කෙසේ වෙතත්, සමාලෝචනය සිදු කරන ලද 2024 මාර්තු 06 වන දින දක්වා සමාගමට එරෙහිව ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර ඒ වෙනුවට, බැංකුවේ අයකර ගැනීමේ ආයතනික අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු සහ අයකර ගැනීමේ ආයතනික අංශයේ ප්‍රධාන නීති නිලධාරී අතර සමහර ලිපි හුවමාරු විය.

ශ්‍රේෂ්ඨාධිකරණය 2019.04.04 දින නියෝග කර ඇත. පහසුකම් අක්‍රීය ණය අංශයට මාරු කර තිබූ බැවින්, බැංකුව සමාගමට එරෙහිව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. පැමිණිල්ල කෙටුම්පත් කර ඇති අතර ඉදිරියේදී නඩු පවරනු ඇත.

**ඊ) වෝකර්ස් කලම්බෝ ෂිප්යාඩ් (පුද්ගලික) සමාගම**

වෝකර්ස් කලම්බෝ ෂිප්යාඩ් (පුද්ගලික) සමාගම යනු ගුණාත්මකභාවය, විශ්වසනීයත්වය සහ ජාතික හා ජාත්‍යන්තර ගනුදෙනුකරුවන් සඳහා ඉක්මන් කාර්ය පූරණ කාලයක් අවධාරණය කරමින් turnkey නැව් / යාත්‍රා අළුත්වැඩියා කිරීමේ, පුළුල් වර්ණාවලියක් සහිත නැව් සහ යාත්‍රා ගොඩනැගීමේ සහ ඉන්දියානු සාගර නැව් මාර්ගයේ ගමන් කරන නැව් සහ යාත්‍රාවලට අනෙකුත් නාවික ඉංජිනේරු සේවාවන් සැපයීමේ නිරත පූර්ණ ඒකාබද්ධ නැව් අංගන සමාගමකි.

2016 වර්ෂයේදී බැංකුව රු. මිලියන 16 ක කල්බදු පහසුකම් දෙකක් ප්‍රදානය කර තිබුණු අතර එය 2023 සැප්තැම්බර් 30 දිනට අක්‍රීය ණය කාණ්ඩය යටතේ පැවතුනි. මෙම පහසුකම් 2020 වර්ෂයේදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණු අතර 2021 වර්ෂයේදී අයකර ගැනීමේ ආයතනික අංශය වෙත මාරු කර තිබුණි.

2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරු ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 10.00 ක් වූ අතර එය මුළු ප්‍රාග්ධන කොටස සහ පොලී ශේෂය ලෙස පිළිවෙලින් රු. මිලියන 8.66 කින් සහ රු.මිලියන 1.34 කින් සමන්විත විය.

මුළු හිඟ මුදලින්, රු. මිලියන 9.98 ක් කල්බදු වත්කම් මත පැවරීමට එරෙහිව සුරක්ෂිත කර තිබුණි.

අංක 29/2020 දරන නිල උපදෙස් චක්‍රලේඛයේ 20 වැනි වගන්තියට අනුව, කල්බදු පහසුකම පවතින කාලය තුළදී, ශාඛා කළමණාකරු හෝ ශාඛා කළමණාකරුගේ බලයලත් නිලධාරියෙකු වෙනත්

ණය සුදුසුකම් සහ වෝකර්ස් සමූහය සමඟ ඇති සබඳතාව සැලකිල්ලට ගනිමින් බැංකුව විසින් වෝකර්ස් කලම්බෝ ෂිප්යාඩ් (පුද්ගලික) සමාගම වෙත පහසුකම් ප්‍රදානය කර ඇත.

අයකර ගැනීමේ ක්‍රියාමාර්ග නිසි පරිදි ආරම්භ කර ඇති අතර බැංකුව විසින් 2023.09.11 දින තහනම් නියෝගය (Seizing order) නිකුත් කර ඇත.

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

| | | | |
|---|---|---|---|
| | වගකිවයුතු නිලධාරියෙකු සමගින්, කල්බදු දී ඇති සෑම වත්කමක්ම කාර්තුමය වශයෙන් පරීක්ෂා කළ යුතුය. තවද, කල්බදු පහසුකම් අනුමත කිරීම සඳහා වන සංදේශයේ විශේෂ කොන්දේසිවල වගන්ති අංක 15.2 අනුව, පහසුකම ඉතා සමීපව නිරීක්ෂණය කළ යුතු අතර මිලදී ගත් දින සිට සතියක් ඇතුළත සිදු කළ යුතු මූලික පරීක්ෂණයෙන් පසු අවම වශයෙන් මාස තුනකට වරක් පරීක්ෂා කළ යුතුය. කෙසේ වෙතත්, කාර්තුමය පරීක්ෂණ වාර්තා විගණන සමාලෝචනය සඳහා ගොනුවේ නොතිබුණි. 2024 මාර්තු 04 දිනැති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අයකර ගැනීමේ ආයතනික අංශය) වෙත කරන ලද සංදේශයට අනුව, රු. මිලියන 4.33 ක් වූ හිඟ මුදලකට එරෙහිව කල්බදු පහසුකමක සම්පූර්ණ සහ අවසාන පියවීම ලෙස රු. මිලියන 4.24 ක් පිළිගැනීමට අනුමැතිය ඉල්ලා තිබුණි. අනෙකුත් කල්බදු පහසුකම් පියවීමට නියමිතය. | | |
| **10** | **ට්‍රයි ස්ටාර් ඇපරල් එක්ස්පෝර්ට්ස් (පුද්ගලික) සමාගම**<br>1997 සිට 2007 දක්වා කාලය තුළදී එ.ජ.ඩො සම්මේලික ණය පහසුකම් 02 ක් (ලංකා බැංකුව සියයට 40 ක්, මහජන බැංකුව සියයට 20 ක්, හැටන් නැෂනල් බැංකුව සියයට 26.68 ක් සහ සම්පත් බැංකුව සියයට 13.32 කින් සමන්විත බැංකු සමූහයක් සමග), උකස් ඇපකර උප ණය 75 ක් සහ අයිරා පහසුකම් 01 ක් ට්‍රයි ස්ටාර් ඇපරල් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත බැංකුවේ අක්වෙරළ බැංකු අංශය විසින් ප්‍රදානය කර තිබුණු අතර ඒවා 2007 සිට 2012 දක්වා කාලය තුළදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි.<br>ට්‍රයි ස්ටාර් ඇපරල් එක්ස්පෝර්ට්ස් (පුද්ගලික) සමාගම වෙත ප්‍රදානය කරන ලද මුල් සම්මේලික ණය මුදල එ.ජ.ඩො මිලියන 7.5 ක් වූ අතර එය ලන්ඩන් අන්තර් බැංකු පොලී අනුපාතය -එ.ජ.ඩො (US LIBOR) මාස 6 + සියයට 3.75 ක පොලී අනුපාතයකට වාරික 36 කින් ආපසු ගෙවිය යුතුය. හැටන් නැෂනල් බැංකුව, ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව සහ සම්පත් බැංකුව විසින් මෙහෙයවන ලද අතර, ලංකා බැංකුවේ සහභාගීත්වය එ.ජ.ඩො මිලියන 2.5 ක් විය. පසුව මාස 6 ක සහන කාලයක් සහිතව වාරික 60 කින් ණය ආපසු ගෙවීම සඳහා සමාගම අභියාචනා කර තිබුණි. කෙසේ වෙතත්, සම්මේලික ණය දෙන්නන් විසින් සහන කාලයක් නොමැතිව අවම වශයෙන් වසරකට සියයට 9.5 ක පොලී අනුපාතයක් සමග එය ලන්ඩන් අන්තර් බැංකු පොලී අනුපාතය -එ.ජ.ඩො (US LIBOR) මාස 6 + සියයට 3.75 ක පොලී අනුපාතයකට ණය ආපසු ගෙවීමේ කාලය මාස 48 දක්වා දීර්ඝ කර තිබුණි. ජාතික සංවර්ධන බැංකුවේ, ඩීඑෆ්සීසී බැංකුවේ සහ මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි සියලුම හිඟ මුදල් පොලී සමඟ ගෙවීමට, සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ හිඟ මුදල් ගෙවීමට සහ මහජන බැංකුවේ කල් ඉකුත් වූ මුදල් පියවීමට මෙම ණය මුදල ප්‍රදානය කර තිබුණි.<br>අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත පොලී අනුපාතිකය අවම වශයෙන් වසරකට සියයට 9.5 ක පොලී අනුපාතයක් සමග ලන්ඩන් අන්තර් බැංකු පොලී අනුපාතය -එ.ජ.ඩො (US LIBOR) මාස 6 + සියයට 3.75 ක් වූ අතර එම කාලය තුළදී බැංකුව විසින් වාර්ෂිකව සියයට 8 ක ස්ථාවර අනුපාතයක් පවත්වාගෙන තිබුණි. | ට්‍රයි ස්ටාර් ඇපරල් එක්ස්පෝර්ට්ස් (පුද්ගලික) සමාගම ආයෝජන මණ්ඩලයේ අනුමැතිය යටතේ ක්‍රියාත්මක වූ ප්‍රමුඛතම ඇඟලුම් අපනයන සමාගමකි. නිසි ඇගයීමකින් පසු පහසුකම් ප්‍රදානය කරන ලද අතර පසුව ඒවා 1998 දී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇත.<br>නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම සහ පාර්ටේ අයිතීන් ක්‍රියාත්මක කිරීම මගින් එක් එක් සහ සෑම පහසුකම් සඳහා අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන තිබුණි.<br>රත්මලාන, නෙළුම්පුර, මාලිගාව පාර, 2 වැනි පටුමග, අංක 02 හි පිහිටි දේපළ සඳහා නියමිත වෙන්දේසිය එම පරිශ්‍රයේ පදිංචි අනවසර පුද්ගලයකු විසින් කරන ලද ඉල්ලීමක් මත තාවකාලිකව අත්හිටුවා ඇත. එකී කාරණය අවසන් වීමෙන් පසු පාර්ටේ ක්‍රියාමාර්ගය අඛණ්ඩ අනුගමනය කිරීමට නියමිතය. | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

පසුව, ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව පහත සඳහන් හේතූන් මත සම්මේලික පහසුකමට සහභාගී නොවීමට තීරණය කළ අතර එම කොටස සඳහා මහජන බැංකුව දායක විය.

1. ට්‍රයි ස්ටාර් ඇපරල් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි කොටස් හිමියෙකු/සහයෝගිතාකරුවෙකු වන එස්ආර් ජෙන්ට් පීඑල්සී හි අනාගතය සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවය.
2. ට්‍රයි ස්ටාර් "බී" කාණ්ඩයේ කර්මාන්තශාලා කළමනාකරණය පිළිබඳ විශ්වාසයක් නොමැතිකම.
3. සුරැකුම් ලියකියවිලි සම්බන්ධයෙන් අසතුටුදායක තත්ත්වය.

එ.ජ.ඩො මිලියන 1.52 ක සම්මේලික ණය I, සින්නක්කර දේපල 8 ක උකසට එරෙහිව සුරක්ෂිත කර තිබූ අතර, එ.ජ.ඩො මිලියන 0.96 ක සම්මේලික ණය II, කල්බදු දේපල 8 කට එරෙහිව සුරක්ෂිත කර තිබුණි.

සම්මේලික ණය ප්‍රදානය කරන අවස්ථාවේදී පහත සඳහන් උකස් බැඳුම්කර තුනක් ක්‍රියාත්මක කර තිබූ අතර විස්තර පහත පරිදි වේ.

| සුරැකුම් වර්ගය | බැඳුම්කර වටිනාකම (එ.ජ.ඩො මිලියන) | දේපලෙහි ශුද්ධ පොත් වටිනාකම එ.ජ.ඩො වලින් (එ.ජ.ඩො = රු. 58) |
|---|---|---|
| සින්නක්කර දේපල (දේපල 8 ක්) | 3.6 | 2.68 |
| කල්බදු දේපල (දේපල 8) | 2.1 | 1.36 |
| යන්ත්‍රෝපකරණ | 1.3 | 4.29 |
| **එකතුව** | **7.5** | **8.33** |

ණය ප්‍රදානය කරන අවස්ථාවේදී, සම්පත් බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව විසින් සුරැකුම් තත්ත්වය ප්‍රමාණවත් නොවන බව පෙන්වා දී තවත් සුරැකුම්පත් රැගෙන එන ලෙස සමාගමෙන් ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, සමාගම විසින් සපයන ලද අමතර සුරැකුම්පත් නොතිබුණු අතර ඇපකරවල පොත් වටිනාකමෙන් සියයට 100 කට එරෙහිව පහසුකම් ප්‍රදානය කර තිබුණි.

2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරු ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 3,426.98 ක් වූ අතර එය හිඟ ප්‍රාග්ධන කොටස සහ පොලී ශේෂය ලෙස පිළිවෙලින් රු. මිලියන 833.30 කින් සහ රු. මිලියන 2,593.68 කින් සමන්විත විය.

උකස් දේපල 16 ක් අතරින්, සින්නක්කර දේපල 3 ක් සහ කල්බදු දේපල 1 ක් බැංකුව විසින් විකුණා තිබුණි. තවද, නිරෝධායන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා සින්නක්කර දේපල 04 ක් 2020 දෙසැම්බර් 14 සහ 2021 පෙබරවාරි 16 යන දිනයන්හිදී ශ්‍රී ලංකා යුද හමුදාව වෙත තාවකාලිකව භාර දී තිබුණි. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සහ ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් කරන ලද ඉල්ලීම් අනුව

දේපල දෙක තාවකාලිකව පවරා දීම සඳහා පිළිවෙළින් 2020 දෙසැම්බර් 03 දින (අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් අංක 2020.12.03/11.5.02) සහ 2021 මාර්තු 18 දින (අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් අංක 2021.03.18/9.8.01) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආවරණ අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, සමූහයේ අනෙකුත් බැංකු විසින් ඉතිරි දේපල දෙක තාවකාලික පදනමින් පවරා දීමට තම අදහස දන්වා තිබූ අතර සම්පත් බැංකුව පහත සඳහන් කොන්දේසිවලට යටත්ව තම අදහස දන්වා තිබුණි.

1. අමාත්‍ය මණ්ඩල අනුමැතිය සමඟ රජයෙන් විධිමත් පිළිගත හැකි ඉල්ලීමක්.
2. විදුලිය, ජලය, ආරක්ෂාව ආදී සියලුම පොදු කාර්ය වියදම්, ප්‍රාග්ධන වියදම්/ ප්‍රතිසංස්කරණ පිරිවැය අදාළ රජයේ අධිකාරිය විසින් දැරිය යුතුය. සමූහයේ බැංකු ඒ සඳහා වගකිව යුතු නොවේ.
3. නිරෝධායන මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා විෂය දේපළ භාරදීම සම්බන්ධයෙන් සමූහයේ බැංකුවට නීතිමය අවාසියක් ඇතිවීම වළක්වා ගැනීම සඳහා විධිමත් ලියකියවිලි.
4. සන්තකයේ අයිතිය අදාළ අධිකාරියට පැවරීම නිශ්චිත කාලයක් සඳහා විය යුතු අතර එම කාලයෙන් පසු දේපළ නැවත ලංකා බැංකුවට භාර දිය යුතුය.
5. රජය විසින් අත්පත් කර ගැනීමට නියමිත දේපලවලදී, අපගෙන් සහ සමූහයේ අනෙකුත් බැංකුවලින් වෙන වෙනම කැමැත්තක් ලබා ගත යුතු අතර, වටිනාකම ඇවර කිරීමේ මිලට වඩා අඩු නොවිය යුතු අතර එකඟ වූ ප්‍රතිශතය අනුව එය සමූහයේ බැංකු අතර බෙදා ගත යුතුය.
6. ට්‍රයි ස්ටාර් ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් ණය ඇවර කිරීම සඳහා අනාගත ගැණුම්කරුවෙකු සිටී නම්, දේපල බැහැර කිරීමේ අයිතිය සමූහයේ බැංකුවලට වෙන් කිරීම.

හදිසි අවශ්‍යතාවය සලකා බලා, සම්පත් බැංකුවේ ඉහත කොන්දේසිය සැලකිල්ලට නොගෙන 2021 පෙබරවාරි 16 වැනි දින සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතිය ඇතිව ඉතිරි දේපළ දෙක බැංකුව විසින් භාර දී තිබුණි.

තවද, ශ්‍රී ලංකා යුද හමුදාවට තාවකාලිකව පවරා දී ඇති දේපළ සම්බන්ධයෙන් බැංකුව විසින් පහත සඳහන් වියදම් දැනටමත් අවශෝෂණය කරගෙන තිබූ බව නිරීක්ෂණය විය.

| දේපල විස්තර | අවශෝෂණය කරන ලද පිරිවැය (රු.) |
|---|---|
| අංක 88, කොටස 22/23, මාලිගාව පාර, තෙලවල | 6,000,159.90 |
| අංක 30, මාලිගාව පාර, තෙලවල. | 14,211,527.50 |
| අංක 154, ශ්‍රී රාහුල මාවත, කටුබැද්ද, මොරටුව. | 3,081,936.43 |
| අංක 29/5, කන්දවල මාවත, රත්මලාන. | 5,912,865.10 |

| | |
|---|---|
| ට්‍රයි ස්ටාර් බුත්තල - කල්බදු දේපල | 11,230,165.55 |
| ට්‍රයි ස්ටාර් ගල්ගමුව - කල්බදු දේපල | 10,585,409.82 |

සම්මේලික පහසුකමට එරෙහිව උකස් කර ඇති වෙනත් සින්නක්කර දේපලක පදිංචි අනවසර පුද්ගලයෙකු විසින් කරන ලද අයදුම්පත්‍රය මත සමූහයේ බැංකු සහ වෙන්දේසිකරු වළක්වාලමින් අංක DSP/106/24 දරන නඩුව යටතේ කොළඹ දිසා අධිකරණය විසින් වාරණ නියෝගයක් නිකුත් කර තිබුණි.

කල්බදු දේපල 8 අතරින්, එක් දේපලක් දැනටමත් විකුණා තිබූ අතර ඉතිරි දේපල 7 හි වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.

| දේපල විස්තර | වර්තමාන තත්ත්වය | විස්තරය |
|---|---|---|
| පොලාන්දිගම, ගල්ගමුව | නැවත විකිණීම සිදු කරමින් පවතී. | - |
| මෙගහවෙල, බුත්තල | නැවත විකිණීම සඳහා ප්‍රචාරණය කිරීමට නියමිතය. | - |
| කුලියාපිටිය, ඔරුලියද්ද, පොල්ගහවෙල | වෙන්දේසි කර නොමැත. | කල්බදු ගිවිසුම 2022 මැයි 02 දිනෙන් කල් ඉකුත් විය. |
| කුම්බුකුලාව, පොල්පිතිගම | වෙන්දේසි කර නොමැත. | කල්බදු ගිවිසුම ලබා ගත නොහැක. |
| නිකරමුල්ල, යාපහුව | වෙන්දේසි කර නොමැත. | කල්බදු ගිවිසුම 2027 මැයි 29 දිනෙන් කල් ඉකුත් වේ. |
| මාගල්ලේගම, නිකවැරටිය | වෙන්දේසි කර නොමැත. | කල්බදු ගිවිසුම 2027 ජූලි 15 දිනෙන් කල් ඉකුත් වේ |
| ඔබදවැල්ල, බණ්ඩාරවෙල | වෙන්දේසි කර නොමැත. | කල්බදු ගිවිසුම 2048 ඔක්තෝබර් 09 දිනෙන් කල් ඉකුත් වේ. |

ඉහත සුරැකුම්පත්වලට අමතරව, බැංකුව විසින් සපයන ලද අයිරා පහසුකමට එරෙහිව සමාගම විසින් තෙලවල, මාලිගාව පාර, අංක 30 (1A-2R-32P) හි පිහිටි තවත් සින්නක්කර දේපලක් උකස් කර තිබූ අතර එම දේපල ද නිරෝධායන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා 2020 නොවැම්බර් 10 දින ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත තාවකාලිකව භාර දී තිබුණි.

පාර්ලිමේන්තු කටයුතු සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති අතිරේක ලේකම් විසින් 2024 පෙබරවාරි 22 දිනැති ලංකා බැංකුවේ සාමාන්‍යාධිකාරීවරයා වෙත යොමු කරන ලද ලිපියෙන් පහත කරුණු බැංකුව වෙත දන්වා තිබුණි.

*"ආරක්ෂක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා යුද හමුදාව විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගනිමින්, මෙම ගොඩනැගිලිවල ස්ථාපිත කර ඇති හමුදා ඒකක වෙනත් ස්ථානයකට ගෙන යාමේ දුෂ්කරතා සහ ස්ථානය නඩත්තු කිරීමේ ප්‍රායෝගික යෝග්‍යතාවය සැලකිල්ලට ගනිමින්, මෙම ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති හමුදා ඒකකවලට අදාළ ඉඩම සහ දේපළ තවදුරටත් භුක්ති විඳීමට සිදුවේ. හමුදාවේ පරිහරණය සඳහා දේපළ හා ඉඩම් පවරා ගත යුතු බවත් ඒ සඳහා අවශ්‍ය අරමුදල් භාණ්ඩාගාරයෙන් වාරික වශයෙන් ගෙවීමට ඉඩ දිය යුතු බවත් ගරු ජනාධිපතිතුමා උපදෙස් දී ඇත."*

කෙසේ වෙතත්, 2024 මාර්තු 13 වන දින දක්වා කිසිදු අරමුදල් සැලැස්මක් පිළිබඳව භාණ්ඩාගාරය දැනුම් දී නොතිබුණි. එබැවින්, උකස් කර ඇති දේපල විකිණීමෙන් ණය ආපසු අයකර ගැනීම සැක සහිතය.

අතිරේක වෙනස් වන උකස් ඇපකර බැඳුම්කරයේ සහ උකස් ඇපකර ණය ගිවිසුමේ සුරැකුමට එරෙහිව ප්‍රදානය කර තිබූ සම්මේලික ණය පහසුකම් සඳහා බැංකුව 2018 පෙබරවාරි 20 දින ඇවරකරු වෙත අංක HC සිවිල් 52/2016/CO දරන නඩුව යටතේ හිමිකම් පෑම ඉදිරිපත් කර තිබුණි. ඕෂන් ලොජිස්ටික්ස් ලිමිටඩ් නම් සමාගමක් විසින් ලද ඇවරකිරීමේ නඩුවෙක් ගොනු කර තිබුණි සමාගමේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ පුද්ගලික ඇපකරය මෙම පහසුකමේ අනෙකුත් සුරැකුම විය.

(v) එකම වර්ෂයකදී ණය ලබා දුන් ගනුදෙනුකරුවන් එම වර්ෂයෙදීම අක්‍රිය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. (ප්‍රතිලේඛණගත පහසුකම් හැර). මෙම ගණයට වැටෙන ඉහළම ගනුදෙනුකරුවන් 10 දෙනාගේ විශ්ලේෂණයට අනුව, 2023 වර්ෂය තුළදී එම පාරිභෝගිකයන් 10 දෙනාට රු. මිලියන 514.92 ක් ලබා දී තිබූ අතර රු. මිලියන 456.45 ක් හෙවත් ප්‍රදානය කළ මුදලින් සියයට 88.64 ක් එම වර්ෂයේදීම අක්‍රිය ණය කාණ්ඩයට මාරු කර තිබුණි.

| | | 2023 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|---|
| අංකය | ගනුදෙනුකරුගේ නම | ණය ගණන | 2023 වර්ෂය තුළදී ලබා දී ඇති මුළු මුදල (රු. මිලියන) | 2023.12.31 දිනට හිඟ මුළු මුදල (රු. මිලියන) |
| 1 | හිඟුරාන ඩිස්ටිලරීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 10 | 157.00 | 182.30 |
| 2 | හිඟුරාන ඇග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ් | 2 | 100.00 | 06.19 |
| 3 | ඉලෙක්ට්‍රෝ මෙටල් ප්‍රෙසින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1 | 50.00 | 50.21 |
| 4 | වර්ල්ඩ්වයිඩ් කොමොඩිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 8 | 71.71 | 43.19 |

පාලන යාන්ත්‍රණයක් ලෙස, ණය ලබා දී මාස 06 ක් ඇතුළත අක්‍රිය ණය වෙත මාරු කර ඇති පහසුකම් පිළිබඳව ණය කමිටුව වෙත සංදේශයක් ඉදිරිපත් කරන අතර, මෙම පහසුකම් නිත්‍ය අංශය තුළ තබා ගැනීමට අපොහොසත් වීමට හේතු සහ ඒවා අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග විමසමින් අදාළ ශාඛා වෙත ලිපි යවනු ලබයි. ගනුදෙනුකරුවන් සඳහා ගෙන ඇති අයකර ගැනීමේ ක්‍රියාමාර්ගවල වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.

| **ගනුදෙනුකරුගේ නම** | **කළමනාකරණයේ ප්‍රතිචාරය** |
|---|---|
| හිඟුරාන ඩිස්ටිලරීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පහසුකම් BRRU අංශයේ පවතී. |
| හිඟුරාන ඇග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ් | පහසුකම් BRRU අංශයේ පවතී. |

අදාළ ගනුදෙනුකරුවන්ට ණය ප්‍රදානය කිරීමට පෙර බැංකුව විසින් සතුටුදායක ගනුදෙනුකරුවන් ඇගයීම් සිදු කර ඇති බවට සහතික වීම අවශ්‍ය වේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 5 | ලක් සින්නමොන් ප්ලාන්ටර්ස් ඇන්ඩ් ඒක්ස්පොටර්ස් | 5 | 31.98 | 28.93 | ඉලෙක්ට්‍රෝ මෙටල් ප්‍රෙසින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දැනට හිඟ වාරික 2 ක් සමඟ සමාගම මෙම පහසුකමට ගෙවීම් කරයි. |
| 6 | සන්ක්‍රෙස්ට් ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 4 | 36.60 | 23.19 | | |
| 7 | කේ එච් සී සඳරුවන් මහතා | 2 | 4.50 | 5.72 | | |
| 8 | නිව් අම්රා රයිස් මිල් | 1 | 52.50 | 5.69 | | |
| 9 | ඩී ආර් හේවාකුට්ටිගේ මහතා | 1 | 5.00 | 5.55 | වර්ල්ඩ්වයිඩ් කොමොඩිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සමාගම දැනටමත් අපනයන ලැබීම් මගින් රු. 24,462,217.37 ක් පියවා ඇත. |
| 10 | වික්‍රමාරච්චි ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1 | 5.64 | 5.48 | | |
| | | | | | ලක් සින්නමොන් ප්ලාන්ටර්ස් ඇන්ඩ් ඒක්ස්පොටර්ස් | අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට නියමිතය. |
| | | | | | කේ එච් සී සඳරුවන් මහතා | එන්තරවාසිය 2024.04.01 දින යවා ඇත. |
| | | | | | නිව් අම්රා රයිස් මිල් | ප්‍රතිලේඛණ ගත කිරීමක් සඳහා සාකච්ඡා කරමින් පවතී. |
| | | | | | ඩී ආර් හේවාකුට්ටිගේ මහතා | *2024.01.10* දින පහසුකම සම්පූර්ණයෙන් නිරවුල් කර ඇත. |
| | | | | | වික්‍රමාරච්චි ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පහසුකම විධිමත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (vi) | පසුගිය වර්ෂ පහක කාලය තුළදී බැංකුව විසින් විවිධ ක්ෂේත්‍ර සඳහා ලබා දී ඇති ණය මත අක්‍රීය ණය අනුපාතය ගණනය කිරීම විශ්ලේෂණය කිරීමේදී, නිෂ්පාදන, සංචාරක සහ ඉදිකිරීම් යන | බැංකුව මුහුණ දුන් පෙර නොවූ විරූ සිදුවීම් හේතුවෙන් පසුගිය වර්ෂ පහ තුළදී සමස්ත | අක්‍රීය ණය ආපසු අයකර |

අංශවල අක්‍රීය ණය අනුපාතයන් පසුගිය වර්ෂ පහක කාලය තුළදී ක්‍රමානුකූලව වැඩි වී ඇති බවත් තවමත් සැලකිය යුතු අනුපාතයන් වාර්තා කරන බවත් නිරීක්ෂණය විය.

| අංශය | අක්‍රීය ණය අනුපාතය (%) | | | | |
|---|---|---|---|---|---|
| | **2023** | **2022** | **2021** | **2020** | **2019** |
| නිෂ්පාදන | 20.29 | 23.44 | 18.73 | 20.13 | 17.14 |
| සංචාරක | 11.69 | 7.85 | 3.49 | 3.93 | 5.06 |
| ඉදිකිරීම් | 18.19 | 16.87 | 11.72 | 13.40 | 13.23 |

බැංකුවේ අක්‍රීය ණය අනුපාතය වැඩි වී ඇත. ඒ අනුව, නිෂ්පාදන සහ සංචාරක කර්මාන්තයන් ආර්ථික පසුබෑමේ අහිතකර බලපෑම් නිසා වැඩිපුරම පීඩාවට පත් වූ කර්මාන්ත වන අතර තවමත් යථා තත්ත්වයට පත්වෙමින් පවතී. මෙම තත්ත්වය අදාළ අංශවල අක්‍රීය ණය අනුපාත ඉහළ යාමට හේතු වේ.

පවතින තත්ත්වය අනුව විවිධ අයකර ගැනීමේ උපාය මාර්ග හඳුන්වා දී ඇත. තවද, එක් එක් පහසුකම ප්‍රදානය කිරීමට පෙර නිසි ණය ඇගයීමක් සිදු කරනු ලැබේ. ණය කළඹ නිතිපතා සමාලෝචනය කිරීම, අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම, අක්‍රීය ණය සමාලෝචන කමිටු මට්ටමින් සැලකිල්ලට ගනු ලැබේ.

ගැනීම සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.

(vii) **ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකයේ තෝරාගත් ණය පිළිබඳ විගණන සමාලෝචනය**

**අ. රුහුණු සංවර්ධන කොන්ත්‍රාත්කරුවන් සහ ඉංජිනේරු (පුද්ගලික) සමාගම**

රුහුණු සංවර්ධන කොන්ත්‍රාත්කරුවන් සහ ඉංජිනේරු (පුද්ගලික) සමාගම ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් අංශයේ විශේෂයෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ මාර්ග ඉදිකිරීම සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යටතේ මලාපවහන පහසුකම් සංවර්ධනය කිරීමෙහි නිරත වේ.

ව්‍යාපාර පුනර්ජීවනය කිරීමේ උපාය මාර්ගය යටතේ බැංකුව රු. මිලියන 4,155 ක නිරාවරණ මුදලක් අනුමත කර තිබූ අතර බැංකුවේ පැනල් තක්සේරුකරු විසින් තක්සේරු කළ මුළු වෙළඳපල වටිනාකම රු. මිලියන 1,160 ක් වූ නිශ්චල දේපල 08 ක් සමාගම විසින් ඉදිරිපත් කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද සංදේශයේ සඳහන් ඇප ආවරණ විශ්ලේෂණයට අනුව, සුරක්ෂිත නොවූ නිරාවරණය රු. මිලියන 2,903.9 ක් වූ අතර එය සමාගමේ මුළු නිරාවරණයෙන් සියයට 70 ක් නියෝජනය කරයි. සමාගමේ ව්‍යාපාර පුනර්ජීවන ප්‍රතිලේඛණගත පැකේජය සඳහා 2021 අප්‍රේල් 01 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. පසුව, සමාගම විසින් ඇපකර ලිපි සීමාව රු. බිලියන 1 සිට රු. බිලියන 2 දක්වා වැඩි කරන ලෙස ඉල්ලා සිටි අතර ඉන්වොයිස් වට්ටම් කිරීමේ (චක්‍රීය) සීමාව රු. මිලියන 200 සිට රු. මිලියන 400 දක්වා වැඩි කර තිබුණි. ඒ අනුව, එම ඉල්ලීම් 2021 සැප්තැම්බර් 16 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්,

ප්‍රියන්ත මලිඳුවපතිරණ මහතා රුහුණු සංවර්ධන කොන්ත්‍රාත්කරුවන් සහ ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ එකම අධ්‍යක්ෂවරයා වේ. ඔහුගේ වයස අවුරුදු 53 ක් වය අතර යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවන බව පෙනේ. නමුත් ඔහුගේ දරුවන් ව්‍යාපාර මෙහෙයුම් සැලැස්මට පත් කිරීමට සලකා බලා ඔවුන්ගේ අනුප්‍රාප්තික සැලැස්ම ඉදිරිපත් කරන ලෙස අපි දැනටමත් සමාගමට දන්වා ඇත.

2025 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර නව අධ්‍යක්ෂවරුන් පත් කිරීමට සමාගම එකඟ වූ අතර ඉහත සඳහන් කර ඇති භාර ගැනීමක් (undertaking) ලබාගෙන ඇත.

පසුගිය වසරවල වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදය හේතුවෙන්, සමාගමට ඔවුන්ගේ කොන්ත්‍රාත්තු අවශ්‍ය

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

සමාගමේ ණය ප්‍රමාණය රු. මිලියන 5,355 ක් දක්වා වැඩි වී තිබූ අතර, බැංකුව විසින් රු. මිලියන 85 ක උපචිත පොළිය සහ පර්යන්ත ප්‍රතිලාභයක් ලෙස ප්‍රතිලේඛනගත කරන දිනය දක්වා තව දුරටත් උපචිත පොළිය ඉවත් කර තිබුණි. තවද, සියලු පහසුකම් සඳහා එකතු කර ඇති රු මිලියන 31.11 ක් වූ පවතින දඩ පොලිය සියයට 100 ක් සහ යෝජිත ප්‍රතිලේඛනගත කරන දිනය දක්වා තවත් එකතු කළ යුතු දඩ පොලිය ඉවත් කර තිබුණි.

තවද, 2023 ජූලි 11 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් අංක 210 ප්‍රකාරව, සමාගමට ලබා දී ඇති සියලුම ණයවල අවසාන වාරිකයේ ප්‍රාග්ධන කොටස සහ පොලිය පියවීම සඳහා ගෙවීමේ කාලසටහන සංශෝධනය කරමින් ණය කල්පිරීමේ කාලය තවත් මාස නවයකින් දීර්ඝ කිරීමට, 2023 දෙසැම්බර් මාසය දක්වා ණයවල සියලුම හිඟ මුදල් හා අනාගත වාරික කල් දැමීමට සහ දීර්ඝ කිරීම හා කල් දැමීම ක්‍රියාත්මක කරන දිනය දක්වා වන ප්‍රමාද/දඩ පොලී ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආවරණ අනුමැතිය ලබා දී තිබුණි.

2023 දෙසැම්බර් 31 දිනට හිඟ ප්‍රාග්ධන කොටස සහ පොලිය පිළිවෙලින් රු. මිලියන 1, 552 ක් සහ රු. මිලියන 404.66 ක් ඇතුළත් මුළු අක්‍රිය ණය ශේෂය රු. මිලියන 1,956.66 ක් විය. අක්‍රිය ණය ශේෂයෙන් රු. මිලියන 822.14 ක් එනම් සමාගමේ මුළු ණය මුදලෙන් සියයට 42.02 ක් ශක්තිමත්බවින් අඩු පුද්ගලික ඇපකරයට එරෙහිව එය ප්‍රදානය කර තිබුණි.

ඉහත පහසුකම් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අවධාරණය විය.

- සමාගම තනි අධ්‍යක්ෂ සමාගමක් වන අතර අනුප්‍රාප්තික සැලැස්මක් ක්‍රියාත්මක නොවේ.
- සමාගමේ ප්‍රධාන මූල්‍ය අගයක් ලෙස 2018/2019 වර්ෂය තුළදී රු. මිලියන 267.259 ක ශුද්ධ අලාභයක් වාර්තා කර තිබූ අතර 2019 මාර්තු 31 දිනට සමාගමේ මුළු වගකීම් එහි මුළු වත්කමින් රු. මිලියන 764.203 ක් ඉක්මවා තිබුණි. තවද, පසුගිය වසරවලදී සමාගම දිගින් දිගටම පාඩු වාර්තා කර තිබුණි. මෙම සාධක සමාගමට සිය ව්‍යාපාරය කරගෙන යාමට ඇති හැකියාව සහ පහසුකම් ගෙවීමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් මතු කර ඇත.
- 2019/20 මෑත කාල සීමාව වෙනුවට 2018/2019 විගණිත මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව ණය විශ්ලේෂණය සිදු කර තිබුණි.
- පිරිනැමීමේ ලිපියට අනුව, "පවතින දේපල සඳහා යාවත්කාලීන කළ තක්සේරුවක් කැඳවිය යුතුය." කෙසේ වෙතත්, දේපල බහුතරයක් සඳහා නව තක්සේරුවක් ලබාගෙන නොතිබුණි.
- සියලුම කල්බදු පහසුකම් නවයේ රක්ෂණ ඔප්පු 2023 පෙබරවාරි 10 දින කල්පිරී තිබූ අතර විගණිත දිනය වූ 2023 නොවැම්බර් 08 දිනට රක්ෂණ අලුත් කිරීම් සුරැකුම් ලිපිගොනුවල නොතිබුණි.

පහත සඳහන් උකස් නිශ්වල දේපලවල රක්‍ෂණ ඔප්පු පරිණත වී තිබූ අතර විගණිත දිනය වූ 2023 නොවැම්බර් 08 දිනට රක්ෂණ අලුත් කිරීම් සුරැකුම් ලිපිගොනුවල නොතිබුණි. විස්තර පහත දැක්වේ.

පරිදි සිදු කිරීමට නොහැකි විය. සීමිත ව්‍යාපෘතිවලින් නව කොන්ත්‍රාත්තු ලබා ගැනීමේ දැඩි තරඟකාරිත්වය හේතුවෙන්, සමාගමට සුළු ආදායමක් උපයා ගැනීමට හැකි විය. මේ වන විට මෙම තත්ත්වය ක්‍රමයෙන් වැඩි වෙමින් පවතී. 2015-19 කාලය තුළදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් ව්‍යාපෘති පිරිනමා නොමැති අතර සමාගමේ පිරිවැටුම විශාල ලෙස අඩු වී ඇත. එබැවින්, සමාගම අලාභ ලැබූ අතර සියලු පහසුකම් අක්‍රිය ණය අංශයට මාරු කර ඇත.

සමාගම දැනට විදේශ අරමුදල් සපයන සූරියකන්ද - රක්වාන මාර්ග ව්‍යාපෘතිය හසුරුවන අතර නැගෙනහිර පළාතේ එක් මාර්ග ව්‍යාපෘතියක් ප්‍රදානය කර ඇත. පුනර්ජීවන කාලය තුළදී රු. බිලියන 5.0 කට වඩා වැඩි මුදල් ප්‍රවාහයක් සමාගම බැංකුව වෙත යොමු කර ඇති අතර රු. බිලියන 3.2 ක් පමණ (කෙටිකාලීන ණය සහ ප්‍රතිලේඛණගත කර ඇති පහසුකම් යන දෙකම) සහ රු. මිලියන 220.0 ක පමණ පොලියක් අයකර ගෙන ඇත. පවතින මුදල් ප්‍රවාහයන් ප්‍රතිලේඛණගත කර ඇති පහසුකම් ආපසු ගෙවීමට ප්‍රමාණවත් නොවේ.

පසුගිය මාස කිහිපය තුළදී සමාගම ලංසු තැබීමේ ක්‍රියාවලිය හරහා අරමුදල් සපයන ව්‍යාපෘති කිහිපයක් ලබා ගැනීමට උත්සාහ කළ නමුත් ව්‍යාපෘති ලබා ගැනීමට නොහැකි විය.

ඉදිකිරීම් කර්මාන්තයේ පහත වැටීමේ ප්‍රවණතාවය හේතුවෙන්, සමාගම 2019/2020 දී සියලුම ව්‍යාපාර

| දේපල විස්තරය | පැවති රක්ෂණ ඔප්පුවේ කල් පිරුණු දිනය |
|---|---|
| $P_1$ - ප්‍රතිලේඛණගත ණය A-1 | 2022.08.03 |
| $P_2$ - ප්‍රතිලේඛණගත ණය A-2 සහ ණය මාලාවක් | 2022.08.03 |
| $P_4$ - ප්‍රතිලේඛණගත ණය A-4 | 2022.08.10 |
| $P_5$ - ප්‍රතිලේඛණගත ණය A-5 | 2022.08.10 |
| $P_6$ - ප්‍රතිලේඛණගත ණය A-6 | 2022.08.10 |
| $P_7$ – ණය මාලාවක් සහ කාලීන ණය | 2022.06.21 |
| $P_8$ - ණය මාලාවක් | 2020.06.18 |

- විගණිත දිනය වූ 2023 නොවැම්බර් 08 දින දක්වා 2022/2023 වර්ෂය සඳහා උකස් කර ඇති මෝටර් වාහන, යන්ත්‍රෝපකරණ සහ දේපළවල රක්ෂණ අලුත් කිරීම් ලබාගෙන නොතිබුණි.
- 2022.05.10 දිනැති CRIB වාර්තාවට අනුව, සමාගම සහ අධ්‍යක්ෂක යන දෙදෙනාම මුලින්ම ණය ප්‍රදානය කරන ලද අවස්ථාවේදී CRIB හි පෙන්නුම් කර තිබුනද (එනම් 2010 වසරේ) එහි බලපෑම බැංකුව විසින් නොසලකා හැර තිබුණි.

මෙමෙහෙයුම් නවතා දමා ඇත. එබැවින්, ඔවුන් ඇගයීම් කරන අවස්ථාවේදී සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර නොමැත.

2022/2023 විගණිත මූල්‍ය ප්‍රකාශන ලබාගෙන ඇති අතර 2024 නොවැම්බර් හෝ ඊට පෙර 2023/2024 විගණිත මූල්‍ය ප්‍රකාශන ලබා දීමට සමාගම එකඟ විය. භාර ගැනීමක් ලබාගෙන ඇත.

2023/2024 කාලය තුළදී සියලු දේපල නැවත තක්සේරු කර යාවත්කාලීන කර ඇත.

හවුටන්, මල්පුඩනැල්ල, මිහිඳුම්වැලි තේ කර්මාන්තශාලාවල යන්ත්‍රෝපකරණ සහ වාහන තක්සේරු කිරීම මේ දක්වා අලුත් කර ඇත.

කල්බදු පහසුකම් නවයේ රක්ෂණ ඔප්පු අලුත් කර ඇත.

සියලුම දේපලවල රක්ෂණ ඔප්පු අලුත් කර ඇති අතර දේපල 2 ක රක්ෂණ ඔප්පු අලුත් කිරීම් තවමත් ලැබීමට ඇත. ණය ගැනුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ලිපියට අනුව එම දේපල අතහැර දමා ඇති තත්ත්වයේ පවතින අතර රක්ෂණ වටිනාකම තක්සේරු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

තවද, බැංකුව විසින් දේපල 8 කින් දේපල 6 ක් සඳහා ගිනි රක්ෂණ ආවරණය ලබාගෙන ඇත.

ව්‍යාපාර පුනර්ජීවන ප්‍රතිපත්තියට අනුව, CRIB හි අහිතකර ලෙස පෙන්නුම් කෙරෙන ගනුදෙනුකරුවන්ට නව පහසුකම් ලබා දීමට BRRU ට අවසර ඇත. එසේම BRRU ණය අනුමත කිරීමේ සංදේශවල මේ සම්බන්ධයෙන් පැහැදිලිව සඳහන් කර ඇති අතර අදාළ අනුමත කිරීමේ

අධිකාරියෙන් අනුමැතිය ලබාගෙන ඇත.

**ආ. කොමුති ඉංජිනියරින් සර්විසස් (පුද්ගලික) සමාගම**

සමාගම 1991 දී සංස්ථාපිත කිරීමේ සිට ඉදිකිරීම් සහ සිවිල් ඉංජිනේරු කටයුතුවල නියැලී සිටී. තවද, සමාගම ඔවුන්ගේ අභ්‍යන්තර භාවිතය සඳහා "තාර" නිෂ්පාදනය කරන අතර ඇතැම් අවස්ථාවන්වලදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත අලෙවි කරයි. සමාගමේ ණය ගොනුව 2020 සැප්තැම්බර් 30 වන දින ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය වෙත මාරු කර තිබූ අතර අක්‍රීය ණය පහසුකම් ප්‍රතිලේඛනගත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය 2021 මැයි 06 දින ලබාගෙන තිබුණි. ප්‍රතිලේඛනගත කරන ලද පැකේජය 2021 ඔක්තෝබර් 12 දින ක්‍රියාත්මක කර තිබුණි. සමාගම සහ අධ්‍යක්ෂවරුන් ණය තොරතුරු කාර්යාංශ වාර්තාවෙහි පෙන්නුම් කෙරුණද, බැංකුවේ ව්‍යාපාර පුනර්ජීවන ප්‍රතිපත්තිය අනුගමනය කිරීමෙන්, ණය පහසුකම් ප්‍රදානය කර තිබුණි.

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

උපචිත පොළිය රු. මිලියන 32 ක්, සියලු පහසුකම් සඳහා එකතු කර ඇති රු. මිලියන 20.51 ක පවතින දඩ පොලිය සියයට 100 ක් සහ යෝජිත ප්‍රතිලේඛණගත කරනු ලබන දිනය දක්වා තවදුරටත් එකතු කරනු ලබන දඩ පොලී ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි.

2023 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන කොටස රු. මිලියන 625 ක් සහ පොලිය රු. මිලියන 141.68 ක් ඇතුළත් මුළු අක්‍රීය ණය ශේෂය රු.මිලියන 766.68 ක් විය. මුළු අක්‍රීය ණය ශේෂයෙන්, රු. මිලියන 489.15 ක් හෙවත් මුළු අක්‍රීය ණය ශේෂයෙන් සියයට 63.8 ක් ශක්තිමත් බවින් අඩු සුරක්ෂිතභාවයක් ඇති අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගලික ඇපකරයක් මගින් සුරක්ෂිත කර තිබුණි.

ඉහත පහසුකම් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අවධාරණය විය.

- ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ප්‍රතිලේඛණගත පැකේජය ක්‍රියාත්මක කරන අවස්ථාවේදී, 2021 මාර්තු 26 දිනැති ණය තොරතුරු කාර්යාංශ වාර්තාවට අනුව, සමාගමට සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සඳහා අනෙකුත් බැංකුවල සැලකිය යුතු හිඟ ණය ශේෂයන් තිබුණි. විස්තර පහත පරිදි වේ.

**වත්මන් ශේෂය**

රු.

| | | ණය ගැනුම්කරු | ඇපකරු |
|---|---|---|---|
| සමාගම | | 152,335,590 | - |
| අධ්‍යක්ෂක එන්.සී.කෝරලගේ | - | - | 176,264,107 |
| අධ්‍යක්ෂක අයි.එම්.කෝරලගේ | - | - | 17,468,422 |

- පිරිනැමීමේ ලිපියේ නියම කර ඇති විශේෂ කොන්දේසිවල 5 වන කරුණට අනුව, බිල්පත් වට්ටම් කිරීමේ පහසුකම හැර වෙනත්

නව පහසුකම් ලබා ගැනීම නව ව්‍යාපෘති සඳහා පමණක් විය යුතුය. එසේ වුවද, සමාගම විසින් සිදු කරනු ලබන මාර්ග ව්‍යාපෘතියේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා රු. මිලියන 200 ක දැනටමත් අනුමත බිල්පත් වට්ටම් කිරීමේ පහසුකමෙන් (චක්‍රීය) රු. මිලියන 45 ක මුදලක් අවභිර කිරීම මගින් බැංකුවේ ණය කමිටුව විසින් අධ්‍යක්ෂකගේ පුද්ගලික ඇපකරයට එරෙහිව සමාගමට මාස 3 ක කාලයක් සඳහා රු. මිලියන 45 ක කෙටි කාලීන ණයක් අනුමත කර තිබුණි.

- පිරිනැමීමේ ලිපියේ නියම කර ඇති විශේෂ කොන්දේසි අනුව, 2021/2022 මූල්‍ය වර්ෂය අවසන් වීමට පෙර සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 5 දක්වා වැඩි කළ යුතුය. කෙසේ වෙතත්, 2021/2022 විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 2.1 ක් ලෙස වාර්තා විය.
- තවද, පිරිනැමීමේ ලිපියේ විශේෂ කොන්දේසිවල, " නව තක්සේරු කිරීම් සහ අනෙකුත් පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් නව පහසුකම් නිකුත් කිරීම සිදු කළ යුතුය" ලෙස සඳහන් වේ. ප්‍රතිලේඛනගත ණය A3 ට එරෙහිව නිශ්චල දේපල දෙකක් උකස් කර ඇතත් (පිඹුරු පත් අංක 2101 හි දැක්වෙන 1A කොටස සහ පිඹුරු පත් අංක 1712 හි දැක්වෙන A කොටස), පිඹුරු පත් අංක 1712 හි දැක්වෙන A කොටස සඳහා මෑත කාලීනව ලබා ගත් තක්සේරුවක් ඇති අතර පිඹුරු පත් අංක 2101 හි දැක්වෙන 1A කොටස සඳහා මෑත කාලීනව ලබා ගත් තක්සේරුවක් නොමැති බව නිරීක්ෂණය විය. ඊට අමතරව, ප්‍රතිලේඛනගත ණය A1, බලාගාරය, යන්ත්‍රෝපකරණ, උපකරණ සහ වාහන මගින් සුරක්ෂිත කර තිබුණි. කෙසේ වෙතත්, 2019 මාර්තු 02 දිනැති අවසන් වරට ගත් තක්සේරු වාර්තාව හැර උකස් කරන ලද බලාගාරය, යන්ත්‍රෝපකරණ, උපකරණ සහ වාහන සඳහා නව තක්සේරුවක් බැංකුව විසින් ලබා ගෙන නොතිබුණි.
- දින 30 ක කාලයක් සඳහා A1 දේපළට එරෙහිව බැංකුව තාවකාලික ආවරණ සටහනක් ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, විගණිත දිනය වූ 2024 ජනවාරි 22 දිනට සුරැකුම් ගොනුවේ උකස් දේපළ දෙකෙහිම රක්ෂණ ඔප්පු සහ එහි අලුත් කිරීමේ ලේඛන නොතිබුණි.
- කල්බදු පහසුකම අනුමත කිරීම පිළිබඳ සංදේශයේ විශේෂ කොන්දේසි අනුව, කල්බදු වත්කම මිලදී ගත් දින සිට සතියක් ඇතුළත සිදු කළ යුතු මූලික පරීක්ෂාවෙන් පසු අවම වශයෙන් මාස 3 කට වරක් කල්බදු වත්කම පරීක්ෂා කළ යුතුය. කෙසේ වෙතත්, කල්බදු පහසුකම් තුනෙහිම පශ්චාත් පරීක්ෂණ වාර්තා ලිපිගොනුවල නොතිබුණි.
- තවද, දැනට පවතින සියලුම කල්බදු පහසුකම් සඳහා කල්බදු කාල සීමාවේ පළමු වසරෙන් පසුව රක්ෂණ අලුත් කිරීමක් ලබාගෙන නොතිබුණි.
- විගණන සමාලෝචනයේදී, අංක 2403 දරන උකස් බැඳුම්කරය කොමුති ඉංජිනියරින් (පුද්ගලික) සමාගමෙහි සුරැකුම් ලිපිගොනුවල නොතිබූ බවත් 2024 පෙබරවාරි 07 වැනි දින

ආයතනික සහ අක්වෙරළ බැංකු අංශයේ ජොෂ්ඨ නීති නිලධාරීට ලද ලිපියට අනුව, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එය අස්ථානගත වී ඇති බවට තහවුරු වී ඇති බවත් නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| **ඇ. ටෙෂාන් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්**<br>ටෙෂාන් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්, ශ්‍රී ලංකා ටෙලිකොම්/ මොබිටෙල්, ඩයලොග් හි ෆයිබර් සවිකිරීම, වයරින් කිරීම, කේබල් සම්බන්ධතාවය, නඩත්තු කටයුතු සහ විදුලි සංදේශ කර්මාන්තයට අවශ්‍ය කණු, අනෙකුත් කොටස් හා උපාංග නිෂ්පාදන කිරීමේ කටයුතුවල නිරත වේ. ලැන්මාර්ක් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්, ඔටෙල් ට්‍රාන්ස්ෆෝමර් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ සෙන්රි බයෝ පැකේජින් ඇන්ඩ් මෙඩිකෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්, ටෙෂාන් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් යටතට වැටෙන සමාගම් සමූහය වේ. ණය පහසුකම් මුලින් මෙට්රොපොලිටන් ශාඛාව විසින් ප්‍රදානය කර තිබුණු අතර පසුව දැනට පවතින අක්‍රීය ණය පහසුකම්වල ණය ලිපිගොනු ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය වෙත පැවරීම සඳහා ශාඛාව විසින් ණය කමිටුවෙන් අනුමැතිය ලබාගෙන තිබුණි. නව පුනර්ජීවන උපාය මාර්ගයක් යටතේ ව්‍යාපාර පුනර්ජීවනය කිරීමට පවතින අක්‍රීය ණය පහසුකම් ප්‍රතිලේඛණගත කිරීම සඳහා 2021 දෙසැම්බර් 02 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එහි අනුමැතිය ලබාගෙන තිබුණි. ඒ අනුව, පුනර්ජීවන උපාය මාර්ගයක් යටතේ බැංකුව විසින් රු. මිලියන 1,413.34 ක පුනර්ජීවන පැකේජයක් යෝජනා කර තිබුණි. (පවත්නා අක්‍රීය ණය පහසුකම් සහ නව පහසුකම් ඇතුළත්ව). එහි ප්‍රතිඵලයක් ලෙස, පර්යන්ත ප්‍රතිලාභයක් ලෙස රු. මිලියන 19.27 ක උපචිත පොලියක් (උපචිත පොළියෙන් සියයට 20 ක්), ප්‍රතිලේඛනගත කරනු ලබන දිනය දක්වා තවදුරටත් උපචිත පොළිය, සියලු පහසුකම් සඳහා එකතු කර ඇති රු. මිලියන 1.63 ක දැනට පවතින දඩ පොලියෙන් සියයට 100 ක් සහ යෝජිත ප්‍රතිලේඛනගත කරනු ලබන දිනය දක්වා තවදුරටත් එකතු කරනු ලබන දඩ පොලීය බැංකුව විසින් කපා හැර තිබුණි.<br>2023 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන කොටස රු. මිලියන 733.19 ක් සහ පොලිය රු. මිලියන 157.37 ක් ඇතුළත් මුළු අක්‍රීය ණය ශේෂය රු.මිලියන 890.56 ක් විය. මුළු අක්‍රීය ණය ශේෂයෙන්, රු. මිලියන 540.0 ක් හෙවත් මුළු අක්‍රීය ණය ශේෂයෙන් සියයට 60.52 ක් අඩු ශක්තිමත් සුරක්ෂිතභාවයක් ඇති අධ්‍යක්ෂවරුන්ගේ ඇපකරයක් මගින් සුරක්ෂිත කර තිබුණි. | පුනර්ජීවන කාලය තුළදී, රු. මිලියන 294 ක පොරොන්දු නෝට්ටු සහ රු. මිලියන 251 ක සෘජු ගිණුම් මාරු කිරීම් ලෙස රු. මිලියන 545.9 ක මුළු මුදල් ප්‍රවාහයක් යොමු කර ඇත.<br>පසුගිය මාස 05 තුළදී මුදල් ප්‍රවාහය විශාල ලෙස අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුව වෙත යොමු කරන ලද මුදල් ප්‍රවාහය අඩු වී ඇති අතර මාසික බැඳීම් සපුරාලීමට ප්‍රමාණවත් නොවීය. | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |
| **ඈ. ආර්.එන් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්**<br>ආර්.එන් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් 1996 දී සංස්ථාපිත කරන ලද අතර පුද්ගලික අංශයේ ව්‍යාපෘති සහ විදේශ අරමුදල් සපයන රාජ්‍ය අංශයේ ව්‍යාපෘති කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ප්‍රමුඛ පෙළේ ඉංජිනේරු සහ ඉදිකිරීම් කටයුතුවල නිරත වේ.<br>සමාගමට ලබා දී තිබූ පහසුකම් 2008 දී අක්‍රීය ණය කාණ්ඩයට වැටී තිබුණි. පසුව, ණය ලිපිගොනු අයකර ගැනීමේ දෙපාර්තමේන්තුවට මාරු කර පහසුකම් ප්‍රතිලේඛණගත කර තිබුණි. සියලුම පහසුකම් නැවත නිත්‍ය අංශයට මාරු කර තිබූ අතර මෙම ණය ලිපිගොනු | ආයතනික ණය දෙපාර්තමේන්තුවේ සිට ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය වෙත ණය ලිපිගොනු මාරු කරන අවස්ථාවේදී, සමාගමට ලබා දී ඇති පහසුකම් දැනටමත් අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| ආයතනික ශාඛාව වෙත භාර දී තිබුණි. පසුව, එම පහසුකම් නැවතත් අක්‍රීය ණය කාණ්ඩය යටතට වැටී තිබූ අතර, බැංකුව විසින් සමාගමේ ණය ලිපිගොනු ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ඒකකය වෙත මාරු කර තිබුණි. 2021 පෙබරවාරි 18 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නව පුනර්ජීවන සැලැස්ම යටතේ එම පහසුකම් ප්‍රතිලේඛණගත කර තිබුණි. සමාගමේ රු. මිලියන 3,154.54 ක ණය ප්‍රමාණයක් හෙවත් සමස්ත සමාගම් ණය මුදලින් සියයට 31.22 ක් නිශ්චල දේපල 07 ක උකස් කිරීම්වලට එරෙහිව සුරක්ෂිත කර තිබූ අතර, එහි මුළු වටිනාකම රු. මිලියන 985 ක් වූ තුන්වන පාර්ශ්වයකට අයත් දේපළ 04 ක් ඇතුළත් විය.<br>2023 දෙසැම්බර් 31 වැනි දිනට ප්‍රාග්ධන කොටස රු. මිලියන 1,258.6 ක් සහ පොලිය රු. මිලියන 283.2 ක් ඇතුළත් මුළු අක්‍රීය ණය ශේෂය රු. මිලියන 1,541.80 ක් විය. මුළු අක්‍රීය ණය ශේෂයෙන් රු. මිලියන 469.05 ක් හෙවත් සියයට 30.42 ක් පුද්ගලික ඇපකරයට එරෙහිව ප්‍රදානය කර තිබුණි. | නිශ්චල දේපල 07 න් දේපල 03 ක් ආර්.එන් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සතු වන අතර දේපල 02 ක් සමාගම් අධ්‍යක්ෂවරුන් සතු වේ.<br>අනෙකුත් දේපල 02 ක් එකම අධ්‍යක්ෂවරුන් සිටින ඔවුන්ගේ සහෝදර සමාගම වන හෙළදිව හොටෙල්ස් ඇන්ඩ් රිසෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සතු වේ.<br>අදාළ නියෝජිත අධිකාරියේ අනුමැතිය ඇතිව ආර්.එන් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ලබා දී ඇති පහසුකම් සුරක්ෂිත කිරීම සඳහා ඉහත සියලු දේපල උකස් කර තිබුණි. | |
| **ඉ. සෙනාරෝ මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්**<br>සමාගම ලියාපදිංචි නොකළ මෝටර් රථ ආනයනය හා විකිණීම, යතුරුපැදි එකලස් කිරීම සහ මාර්ග ආධාර සේවාවල නිරත වේ. 2012 දී කොට්ටාව ශාඛාව විසින් සමාගම කැන්වස් කරන ලද අතර පසුව, පහසුකම් වැඩි කිරීම සඳහා සමාගමේ ණය ලිපිගොනු 2013 දී ආයතනික ශාඛාව වෙත මාරු කර තිබුණි. සමාගම හොඳින් ක්‍රියා කිරීමට අපොහොසත් වී තිබූ අතර එකඟ වූ පරිදි බැංකුවේ හිඟ මුදල් පියවා නොතිබුණි. එබැවින්, අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සිදු කිරීම සඳහා 2017 දී ණය ලිපිගොනු අයකර ගැනීමේ ආයතනික අංශය වෙත මාරු කර තිබුණි. මේ අතර, සමාගම විසින් 2018 වර්ෂය දක්වා ආයතනික ශාඛාවේ පවත්වාගෙන ගිය සමහර අක්‍රීය ණය පහසුකම් අයකර ගැනීමේ ආයතනික අංශය වෙත මාරු කිරීමට පෙර පියවා තිබුණි. ඉන් අනතුරුව, 2021 අප්‍රේල් 12 වැනි දින පැවති ණය කමිටු රැස්වීමේදී ලබා ගත් අනුමැතිය සහිතව ගනුදෙනුකරුගේ ණය ලිපිගොනු ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය වෙත පැවරීමට බැංකුව තීරණය කර තිබුණි.<br>2023 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන කොටස රු. මිලියන 866.23 ක් සහ පොලිය රු. මිලියන 176.49 ක් ඇතුළත් මුළු අක්‍රීය ණය ශේෂය රු. මිලියන 1,042.72 ක් විය. අක්‍රීය ණය ශේෂයෙන් රු. මිලියන 609.54 ක් හෙවත් සියයට 58 ක් අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගලික ඇපකරය සමඟ සුරක්ෂිත කර තිබූ අතර නිශ්චල දේපලවලට වඩා මෙම ඇපකරයේ ශක්තිමත්භාවය අඩු විය.<br>පවත්නා අක්‍රීය ණය පහසුකම් ප්‍රතිලේඛණගත කිරීමට සහ රු. මිලියන 1,409.7 ක් වූ යෝජිත පුනර්ජීවන පැකේජය සමඟ නව පුනර්ජීවන උපාය මාර්ගය යටතේ ව්‍යාපාරය පුනර්ජීවනය කිරීමට 2022 ජනවාරි 20 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය බැංකුව විසින් ලබා ගෙන තිබුණි. යෝජනාවට අනුව, උපචිත පොළිය රු. මිලියන 155 ක් (පවත්නා කාලීන ණය සඳහා උපචිත පොලියෙන් සියයට 25 ක් සහ උකස් ඇපකර ණය සඳහා | පසුගිය දෙවසර තුළ රටේ පැවති අයහපත් ආර්ථික තත්ත්වය තුළ පවා දේශීය වටිනාකම් එකතු කිරීම් සහිත යතුරුපැදි එකලස් කිරීමේ නව ව්‍යාපෘතිය 2023 මාර්තු මාසයේදී සමාගම විසින් ආරම්භ කර ඇත.<br>2023 වර්ෂයේ ආරම්භක මාස හයක මෙහෙයුම් කාලය තුළදී සමාගම පහත සන්ධිස්ථාන අත්කර ගෙන ඇත.<br>2023 දී කීර්තිමත් පොදුරාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික විශිෂ්ටතා සම්මාන උළෙලේදී සෙනාරෝ සමාගම නැගී එන හොඳම ව්‍යවසාය ලෙස පිළිගැනීමට ලක් විය.<br>යතුරුපැදි 1,870 ක් CKD ආකෘතියෙන් ගබඩාවට ලැබී ඇති අතර ඒකක 1,505 ක් සඳහා එකලස් කිරීමේ ක්‍රියාවලිය අවසන් කර ඇත.<br>දිවයින පුරා අලෙවි නියෝජිතයින් 41 දෙනෙකු පත් කර ඇති අතර 2024 වර්ෂය අවසන් වන විට අලෙවි ප්‍රදේශය අලෙවි නියෝජිතයින් 100 ක් දක්වා සහ විකුණුම් ඒකක 100 ක් දක්වා වැඩි | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| උපචිත පොලියෙන් සියයට 50 ක්) සහ පර්යන්ත ප්‍රතිලාභයක් ලෙස ප්‍රතිලේඛනගත කරනු ලබන දිනය දක්වා තවදුරටත් උපචිත පොලිය ඉවත් කර තිබුණි. තවද, සියලුම ණය පහසුකම් සඳහා එකතු කර ඇති රු. මිලියන 25.98 ක දැනට පවතින දඬ පොලියෙන් සියයට 100 ක් සහ යෝජිත ප්‍රතිලේඛනගත කරනු ලබන දිනය දක්වා එකතු කරනු ලබන දඬ පොලිය ඉවත් කර තිබුණි.<br>සමාගම විසින් නිශ්චල දේපල පහක් උකස් කර තිබූ අතර පැනල් තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද එහි මුළු වෙළඳපල වටිනාකම රු. මිලියන 674.7 ක් විය. සමාගමේ සෘජු ණය ප්‍රමාණය රු. මිලියන 1,329.7 ක් වූ අතර සෘජු ණය වලින් සියයට 50.74 ක් නිශ්චල දේපල වටිනාකමට එරෙහිව සුරක්ෂිත කර තිබුණි. වක්‍ර ණය ප්‍රමාණය රු. මිලියන 80.0 ක් වූ අතර එය ඒකාබද්ධ සහ පුද්ගලික ඇපකර කිහිපයකට එරෙහිව සුරක්ෂිත කර තිබුණි.<br>ඉහත සඳහන් පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් අවධාරණය කර ඇති ප්‍රධාන කරුණු පහත දැක්වේ.<br>සංදේශයට අනුව, අවදානම් ශ්‍රේණිගත කිරීම 50 ට අඩු, සෘණ ස්පර්ශ කළ හැකි ශුද්ධ වටිනාකම, සෘණ ණය/ ස්කන්ධ ප්‍රාග්ධනය සහ 1.5 ට අඩු ණය සේවා ආවරණ අනුපාතය වැනි ණය ප්‍රතිපත්තියෙන් සෘණ විචලනයන් නිරීක්ෂණය විය. | කිරීමට සමාගම සැලසුම් කර ඇත.<br>සෘජු පහසුකම්වලින් සියයට 43.4 ක් ප්‍රධාන වාණිජ දේපළ වන නිශ්චල දේපළවලින් ආවරණය වේ. කෙසේ වෙතත්, දේපළ දෙකක් හැර පැනල් තක්සේරුකරු විසින් ලබා දෙන ලද නිශ්චල දේපලවල වෙළඳපල වටිනාකමෙන් වත්කම් මත ඉපැයුම් සියයට 90 කට වඩා වැඩි අගයක් ගනී.<br>මණ්ඩලයේ අනුමත ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ප්‍රතිපත්තියට අනුව, අහිතකර මූල්‍ය අනුපාත ඇති ගනුදෙනුකරුවන් සඳහා අදාළ අනුමැතිය සහිතව පහසුකම් සලකා බැලිය හැක.<br>කෙසේ වෙතත්, ව්‍යාපාර ව්‍යාප්තියත් සමඟ අපේක්ෂිත මුදල් ප්‍රවාහ උත්පාදනයක් තුළින් අනාගතයේ දී මූල්‍ය අනුපාත වැඩිදියුණු වේයැයි අපේක්ෂා කෙරේ. | |
| **ඊ. ඇක්සෝර්න් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්**<br>සමාගම ප්‍රධාන වශයෙන් ප්ලාස්ටික් බෝතල් පියන් සහ බෝතල් නිෂ්පාදනයෙහි නිරත වේ. පවතින ණයවල ණය ලිපිගොනු බදුල්ල ශාඛාවෙන් ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය වෙත මාරු කර තිබුණි. පවතින අක්‍රීය ණය පහසුකම් ප්‍රතිලේඛණගත කිරීමට සහ නව පුනර්ජීවන උපාය මාර්ගයක් යටතේ ව්‍යාපාරය පුනර්ජීවනය කිරීමට 2023 ඔක්තෝම්බර් 02 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එහි අනුමැතිය බැංකුව විසින් ලබාගෙන තිබූ අතර පවතින අක්‍රීය ණය පහසුකම් හා නව පහසුකම් ඇතුළත් රු. මිලියන 2,199.7 ක (සෘජු නිරාවරණය) පුනර්ජීවන පැකේජයක් යෝජනා කර තිබුණි.<br>සමාගමට ණය ලබා දෙන විට, සමාගම අඛණ්ඩව අලාභ වාර්තා කර තිබූ අතර 2022/2023 මූල්‍ය වර්ෂය සඳහා රු.මිලියන 465 ක සැලකිය යුතු අලාභයක් වාර්තා කර තිබුණි. කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2021/2022 මූල්‍ය වර්ෂය දක්වා ස්පර්ශ කළ හැකි ශුද්ධ වටිනාකම (Tangible Net Worth - TNW) සෘණ රු. මිලියන 933.8 ක් වූ අතර 2022/2023 මූල්‍ය වර්ෂයේදී එය රු. මිලියන 4,294 ක් දක්වා වැඩි කර තිබුණි. එම හදිසි වැඩිවීමට හේතුව අධ්‍යක්ෂ මණ්ඩල සංදේශයේ සාධාරණීකරණය කර නොතිබුණු අතර එම නිසා, හදිසි වැඩිවීමට හේතුව හෙළිදරව් වී නොතිබුණි.<br>පැනල් තක්සේරුකරු විසින් තක්සේරු කර ඇති මුළු වෙළඳපල වටිනාකම රු. මිලියන 2,374 ක් වූ සමාගමේ නිශ්චල දේපල හතරක් | 2022/23 මූල්‍ය වාර්තාවලට අනුව, සමාගම 2022/2023 වර්ෂයේදී ඔවුන්ගේ වත්කම් නැවත තක්සේරු කර ඇත. එබැවින්, සමාගමේ ස්පර්ශ කළ හැකි ශුද්ධ වටිනාකම (TNW) රු. බිලියන 4.294 ක් දක්වා අඩු වී ඇත. නමුත් සමාගමේ කළමනාකරණ ගිණුම්වල 2022/23 වර්ෂයේ ස්පර්ශ කළ හැකි ශුද්ධ වටිනාකම (TNW) හි තථ්‍ය අගය පෙන්නුම් කරන අතර මෙම දෝෂය නිවැරදි කිරීමට සමාගමට දන්වා ඇත. | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

උකස් කිරීම මගින් මෙම පුනර්ජීවන පැකේජය සුරක්ෂිත කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට මුළු අක්‍රීය ණය ශේෂය රු. මිලියන 1,649.68 ක් විය.

**උ. ලංකා කෘෂි නිෂ්පාදන කළමනාකරණ සංස්ථා (පුද්ගලික) සමාගම**

සමාගම ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ආයතනික ශාඛාවෙන් රු. මිලියන 500 ක පහසුකමක් ඉල්ලා ඇතත්, ගනුදෙනුකරුගේ ණය ඉතිහාසය සලකා බැලීමෙන් ශාඛාව එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඉන් පසුව, අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ආයතනික ශාඛාව රු. මිලියන 100 ක් සමාගමට ප්‍රදානය කර තිබුණි. මෙම පහසුකම නොපියවූ සහ ක්‍රියාකාරී අංශයේ පැවතුනි.

මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ඒකකය වෙත ණය පහසුකම් මාරුකිරීමට ගනුදෙනුකරු ඉල්ලා තිබුණි. ඒ අනුව, 2023 සැප්තැම්බර් 20 වැනි දින පැවති රැස්වීමේදී ණය කමිටුව ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ඒකකය වෙත ණය ගොනු මාරු කිරීමට අනුමැතිය ලබා දී තිබුණි.

2023 ඔක්තෝබර් 05 දින ලබාගත් ණය තොරතුරු කාර්යාංශ වාර්තාවට අනුව, සමාගම බැංකුවේ පහසුකම් සඳහා නිත්‍ය ගනුදෙනුකරුවකු ලෙස පෙන්නුම් කෙරුණි. කෙසේ වෙතත්, තවත් සමහර බැංකුවල පහසුකම් අක්‍රීය ණය කාණ්ඩයට අයත් විය. කෙසේ වෙතත්, ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ප්‍රතිපත්තියට අනුව, සම්පූර්ණ ණය ප්‍රමාණය රු. මිලියන 100 ඉක්මවන (කණ්ඩායම් ණය) සහ ඌන ක්‍රියාකාරී හෝ අක්‍රීය ණය කාණ්ඩයට අයත් ගනුදෙනුකරුවන් ණය කමිටුවෙන් අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ආයතනික ඒකකය වෙත මාරු කරනු ලැබේ. පවතින ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ නව පහසුකම් පුළුල් කිරීම මගින් මෙම ගනුදෙනුකරුවන් කළමනාකරණය කිරීම ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ඒකකයේ කාර්යභාරය වේ. සමාගම නිත්‍ය අංශයේ සිටියදී ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ඒකක වෙත ණය පහසුකම් මාරු කිරීමෙන් බැංකුව පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ප්‍රතිපත්තියෙන් බැහැර වී ඇති බව නිරීක්ෂණය විය.

මෙම සමාගම දේශපාලන වශයෙන් නිරාවරණය වූ පුද්ගල කාණ්ඩයට වැටෙන අතර ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන උපාය මාර්ගය යටතේ සමාගම් ණය සඳහා ණය කමිටුව රු. මිලියන 970 ක් අනුමත කර තිබුණි. තවද, කාර්යාලීය උපදෙස් චක්‍රලේඛ අංක: 12/2021 හි 8.3 වගන්තියට අනුව, "දේශපාලන වශයෙන් නිරාවරණය වූ පුද්ගල කාණ්ඩයට (PEPs) සමඟ සම්බන්ධතා සෑම විටම ඉහළ අවදානමක් ඇති සබඳතා ලෙස සැලකිය යුතුය". කෙසේ වෙතත්, ණය පැකේජය සියයට 100 ක සුරක්ෂිත නොවූ පදනමක් මත සමාගමෙන් ශුන්‍ය දායකත්වයක් සහිතව අනුමත කර තිබුණි.

සමාගමේ ණය ඉතිහාසය විශ්ලේෂණයට අනුව, ආපසු ගෙවීමේ හැකියාව, ප්‍රාග්ධනීකරණය, ඇපකරවල ගුණත්වය සහ ක්ෂේත්‍රයේ මූලිකාංග මට්ටම (Sector fundamentals level) දුර්වල තත්ත්වයක පැවතුණි.

අනුමත ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ප්‍රතිපත්තියට අනුව, ණය තොරතුරු කාර්යාංශ වාර්තාවෙහි අහිතකර ලෙස පෙන්නුම් කර තිබුනද ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ඒකකයට ගනුදෙනුකරුන් සඳහා නව පහසුකම් ලබා දිය හැක. එසේම ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ඒකකය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් දේශපාලන වශයෙන් නිරාවරණය වූ පුද්ගල කාණ්ඩයට අනුමැතිය ලබාගෙන ඇත.

2024.02.28 දින පැවති ණය කමිටු රැස්වීමේ අනුමැතිය ඇතිව එම ගනුදෙනුකරුට පහසුකම් සලසා දී ඇත.

2024.07.04 දින පැවති ණය කමිටු රැස්වීමේ අනුමැතිය ඇතිව අයකර ගැනීමේ ආයතනික අංශය වෙත පහසුකම් මාරු කර තිබුණි.

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

(viii) **නවලෝක සමූහය**

**අ. නවලෝක ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

2004 - 2019 කාලසීමාව තුළදී ණය 02 ක සහ අයිරා පහසුකම් 02 ක ණය පහසුකම් සමාගමට ප්‍රදානය කර තිබුණු අතර ඒවා 2019 ජූනි 27 දින සිට අක්‍රීය ණය කාණ්ඩය යටතේ පවතුනි. 2019 ජූනි 27 වන දින රු. මිලියන 174.1 ක සහ රු. මිලියන 25.5 ක ප්‍රතිලේඛණගත පහසුකම් දෙකක් ප්‍රදානය කර තිබුණි. ඉහත පහසුකම් අක්‍රීය ණය කාණ්ඩය යටතේ තිබියදී, තවත් පහසුකම් 5 ක් (ණයවර ලිපි - රු. මිලියන 30 ක්, ප්‍රතිග්‍රහණය - රු. මිලියන 30 ක්, ණය මාලාව - රු. මිලියන 30 ක්, අයිරාව - රු. මිලියන 17.5 ක් සහ ඇපකර ලිපි - රු. මිලියන 2.5 ක්) කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මූලනය කිරීම සඳහා 2019 සැප්තැම්බර් 20 දින බැංකුව විසින් ප්‍රදානය කර තිබුණි. 2006 සිට මේ දක්වා ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම, පවතින ණය පහසුකම් ප්‍රතිලේඛණගත කිරීම හා ප්‍රතිව්‍යුහගත කිරීම, අයිරාව ණය පහසුකම් බවට පරිවර්තනය කිරීම සමාගම විසින් අත්විඳ තිබුණි. කෙසේ වෙතත්, එම කාලය තුළදී සමාගමේ මුළු ණය ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වී තිබූ අතර පහසුකම් ආපසු ගෙවීම අඩු වී තිබුණි. සමාගමේ අවදානම් ශ්‍රේණිගත කිරීම 2008 සිට 2019 දක්වා 2E සිට B කාණ්ඩය දක්වා අඩු වී තිබුණි.

ආයතනික ණය ප්‍රතිපත්ති අත්පොතෙහි 8.1.i සහ ii වගන්තියට අනුව, ණය ශ්‍රේණිගත කිරීම "B" සහ ඊට අඩු නම්, වාර්ෂිකව හෝ අර්ධ වාර්ෂිකව සියලුම ගනුදෙනුකරුවන් සඳහා සවිස්තරාත්මක ණය විශ්ලේෂණයක් සිදු කළ යුතු අතර, ත්‍රෛමාසික වර්ගීකරණ ක්‍රියාවලිය, ත්‍රෛමාසික ගනුදෙනුකරුවන් බැහැදැකීම යනාදිය හරහා පවරා ඇති ගනුදෙනුකරුවන්ගේ ණය ගුණාත්මකභාවය තක්සේරු කළ යුතුය. කෙසේ වෙතත්, 2022 නොවැම්බර් 15 න් පසුව ගනුදෙනුකරුවන් බැහැදැකීමේ වාර්තා නොතිබුණි.

එකඟ වූ පරිදි යෝජිත ප්‍රතිලේඛණගත කරන ලද පැකේජය ක්‍රියාත්මක කරන අවස්ථාවේදී ගනුදෙනුකරුට ව්‍යාපාරික මුදල් ප්‍රවාහයන් බැංකුවේ ගිණුම හරහා යොමු කිරීමට/උපචිත පොළියේ කිසියම් හිඟයක් ආපසු ගෙවීමට නොහැකි විය. 2015/16 මූල්‍ය වර්ෂයේ සිට ව්‍යාපාරය පහත වැටී තිබූ අතර කොවිඩ් 19 වසංගතයෙන් ව්‍යාපාරය තවදුරටත් බලපෑමට ලක් විය. එම නිසා ව්‍යාපාරය තවදුරටත් පහත වැටී තිබුණි.

2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරු ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 315.41 ක් වූ අතර එය ගෙවිය යුතු මුළු ප්‍රාග්ධන කොටස සහ පොලිය ලෙස පිළිවෙලින් රු. මිලියන 196.05 කින් සහ රු. මිලියන 119.36 කින් සමන්විත විය.

අපේක්ෂිත විකුණුම් වටිනාකම රු. මිලියන 400 ක් වූ පැලියගොඩ, මීගමුව පාර, අංක 30/10 හි පිහිටි නිශ්චල දේපළට (1A.1R.24.34P) එරෙහිව මුළු හිඟ මුදලින් රු. මිලියන 217.1 ක් සුරක් අපේක්ෂිත විකුණුම් වටිනාකමෙන් සියයට 54.275 නියෝජනය කරයි. කෙසේ වෙතත්, එම දේපල නවලෝක පයිලින් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කර තිබූ පහසුකම සඳහා උකස් කර තිබුණි. තවද, සමාගමට එරෙහිව බැංකුව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

නවලෝක ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ලබා දී තිබූ මුළු ණය පැකේජය 2019 දී ප්‍රතිලේඛණගත කර ඇත.

රු. මිලියන 40.2 ක් වූ කාලීන ණය පහසුකම් සහ රු. මිලියන 87.7 ක් වූ අයිරා පහසුකම් දෙකක් සමඟ රු. මිලියන 46.2 ක් වූ ආනයන මූල්‍ය පහසුකම්වල ප්‍රාග්ධන කොටස ආවරණය කිරීම සඳහා රු. මිලියන 174.1 ක් වූ ප්‍රතිලේඛණගත A ණය ප්‍රදානය කර ඇත.

ප්‍රතිලේඛණගත A ණය සහ ණය යන දෙකම, ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම පිළිබඳ කාර්යාල උපදෙස් චක්‍රලේඛ 60/2021 හි මාර්ගෝපදේශයන්ට අනුකූලව, ප්‍රතිලේඛණගත නියමයන් සම්පූර්ණ වන තෙක් අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇත.

කෙසේ වෙතත්, මුදල් ප්‍රවාහ සීමාවන් හේතුවෙන් එකඟ වූ පරිදි ප්‍රතිලේඛණගත කරන ලද ණය පහසුකම් පියවීමට සමාගමට නොහැකි විය. මීට අමතරව, කොවිඩ්19 වසංගතය සහ පසුව රට තුළ ඇති වූ ආර්ථික පසුබෑම ව්‍යාපාරයට අහිතකර ලෙස බලපා ඇත. ප්‍රතිලේඛණගත B ණය රු. මිලියන 2.96 ක් දක්වා අඩු කර ගැනීමට සමාගම හැකි වී ඇත. නමුත් ප්‍රතිලේඛණගත A ණය අඩු කිරීමට නොහැකි විය.

අයකර ගැනීමේ ක්‍රියාමාර්ගවල කොටසක් ලෙස, සිහි කැඳවීමේ ඊමේල්, ලිපි යවා ඇති අතර සමාගම සමඟ රැස්වීම් පවත්වා ඇත. කෙසේ වෙතත්, ඔවුන් සමාදාන පියවීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීමට අපොහොසත්

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

විය. එහි ප්‍රතිඵලයක් ලෙස, පිළිගත හැකි අයකර ගැනීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, ණය පහසුකම් සමීපව අධීක්ෂණය කිරීමට සහ සමාගමට එරෙහිව අයකර ගැනීමේ/නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට 2024.09.06 දින ණය ලිපිගොනු අයකර ගැනීමේ ආයතනික දෙපාර්තමේන්තුව වෙත මාරු කර ඇත.

**ආ. නවලෝක ෆයිලින් (ප්‍රයිවට්) ලිමිටඩ්**

2015 - 2023 කාලසීමාව තුළදී කාලීන ණය 09 ක, චක්‍රීය පහසුකම් 13 ක, අයිරා පහසුකම් 01 ක සහ ඇපකර ලිපි 01 ක ණය පහසුකම් ප්‍රදානය කර තිබූ අතර ඒවා 2022 ඔක්තෝම්බර් මාසයේ සිට 2023 මැයි දක්වා කාලය තුළදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. රුපියල් මිලියන 1,082.5ක ප්‍රධාන ප්‍රතිව්‍යුහගත පහසුකම් 4 ක් 2021 දෙසැම්බර් 31 වන දින ප්‍රදානය කර තිබූ අතර 2023 මැයි 02 සහ 05 යන දිනවලදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම, පවතින ණය පහසුකම් ප්‍රතිලේඛණගත කිරීම හා ප්‍රතිව්‍යුහගත කිරීම, රු. මිලියන 0.5 ක ප්‍රමාද ගාස්තුව ඉවත් කිරීම, සහන කාලයන් ලබා දීම සහ අඩු පොලී අනුපාත ලබා දීම සමාගම විසින් වර්තමානය දක්වා අත්විඳ තිබුණි.

ආයතනික ණය ප්‍රතිපත්ති අත්පොතේ 8.4.4.ii.(c) වගන්තියට අනුව, ගනුදෙනුකරුගේ අවධානම් ශ්‍රේණිගත කිරීම "C" සහ "D" නම්, එවැනි ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් ලබා දීම අධෛර්යමත් කළ යුතුය. එවැනි ගනුදෙනුකරුවන් සඳහා පහසුකම් ප්‍රතිව්‍යුහගත කරන්නේ නම්, නිසි සාධාරණීකරණයන් සමඟ අනුමැතිය සඳහා ඊළඟ ඉහළ අධිකාරිය වෙත යොමු කිරීම අවශ්‍ය වේ. 2022 දී සමාගමට අවධානම් ශ්‍රේණිගත කිරීම “D” ලෙස ලැබී තිබූ අතර, රු. මිලියන 1,840.1ක් වූ පවත්නා මුළු ණය මුදල අක්‍රීය ණය කාණ්ඩය යටතේ තිබියදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියක් ලබා නොගෙන බැංකුව විසින් 2023 ඔක්තෝම්බර් මාසයේදී අනුමත සීමාව තුළ රු. මිලියන 45.7 ක අත්තිකාරම් ගෙවීමේ ඇපකරයක් නිකුත් කර තිබුණි. ආයතනික ණය ප්‍රතිපත්ති අත්පොතෙහි 3.6 වගන්තියට අනුව “C” සහ ඊට පහළින් ශ්‍රේණිගත කර ඇති ගනුදෙනුකරුවන්ට සුරක්ෂිත නොවූ පහසුකම් ප්‍රදානය නොකළ යුතු වුවද, බැංකුව එම මාර්ගෝපදේශයට අනුගත නොවී සමාගමට ඉහත සඳහන් පහසුකම ලබා දීමට සලකා තිබුණි.

ආයතනික ණය ප්‍රතිපත්ති අත්පොතෙහි 8.1.i සහ ii වගන්තියට අනුව, ණය ශ්‍රේණිගත කිරීම “B” සහ ඊට අඩු නම්, වාර්ෂිකව හෝ අර්ධ වාර්ෂිකව සියලුම ගනුදෙනුකරුවන් සඳහා සවිස්තරාත්මක ණය විශ්ලේෂණයක් සිදු කළ යුතු අතර, ත්‍රෛමාසික වර්ගීකරණ ක්‍රියාවලිය, ත්‍රෛමාසික ගනුදෙනුකරුවන් බැහැදැකීම යනාදිය හරහා පවරා ඇති ගනුදෙනුකරුවන්ගේ ණය ගුණාත්මකභාවය තක්සේරු

නවලෝක ෆයිලින් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ලබා දී ඇති මුළු ණය පැකේජය සමාගමේ මුදල් ප්‍රවාහයට සමපාත වන පරිදි ප්‍රතිව්‍යුහගතකරණය කර ඇත. කෙසේ වෙතත්, කොවිඩ් 19 වසංගතය සහ රට තුළ අත්විඳින ලද ආර්ථික පසුබෑම හේතුවෙන්, සමාගමට ඔවුන්ට ලබා දී ඇති ණය පහසුකම් ගෙවීම් කිරීමට නොහැකි විය. පසුව, සමාගමේ ඉල්ලීම මත ණය පමා සහනයක් ලබා දී තිබුණි. එසේ තිබියදීත්, සමාගම අඛණ්ඩ අර්බුධයක නිරත වූ අතර, ණය පහසුකම් අක්‍රීය ණය අංශයට මාරු කර ඇත.

මීට අමතරව, බැංකුව විසින් රු. මිලිනය 500.0 ක් වූ පවතින ඇපකර සීමාවක් තුළ රු. මිලියන 45.7 ක අත්තිකාරම් ගෙවීම් ඇපකරයක් 2023.10.12 දින පැවති රැස්වීමේදී ණය කමිටුවෙන් ලද අනුමැතිය ඇතිව සමාගමට නිකුත් කර ඇත. මෙම ඇපකරය 2024.07.10 දිනට අවලංගු කර ඇත.

අයකර ගැනීමේ ක්‍රියාමාර්ගවල කොටසක් ලෙස, සිහි කැඳවීමේ ඊමේල්, ලිපි යවා ඇති අතර සමාගම සමඟ රැස්වීම් පවත්වා ඇත. කෙසේ වෙතත්, ඔවුන් සමාදාන පියවීමේ සැලැස්මක්

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

කළ යුතුය. කෙසේ වෙතත්, 2022 නොවැම්බර් 15 න් පසුව ගනුදෙනුකරුවන් බැහැදැකීමේ වාර්තා නොතිබුණි.

සමාගමේ පවතින මූල්‍ය වාර්තාවලට අනුව, විගණකවරුන් පහත සඳහන් හේතුන් මත කරුණක් අවධාරණය කර ඇත.

"*2007* අංක *7* දරන සමාගම් පනතේ *220* අනුව, අඛණ්ඩ ප්‍රාග්ධන අලාභ ලැබීම හේතුවෙන් ශුද්ධ වත්කම් ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකට වඩා අඩු වී ඇත."

සමාගම දිගින් දිගටම අලාභ ලැබූ අතර ඍණාත්මක ශුද්ධ වටිනාකමකට හේතු වී තිබූ අතර බැංකුවේ පිළිගත් නිර්ණායකවලට වඩා අඩු වූ සමස්ත මූල්‍ය කාර්ය සාධනය අසතුටුදායක වේ. සමාගම යන්ත්‍රෝපකරණ සහ උපකරණ උකසට තබා විශාල වශයෙන් ණය ලබාගෙන තිබුණි.

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ව්‍යාපාරයට බලපෑම් එල්ල වී තිබූ අතර මුදල් ප්‍රවාහයන් පහත වැටී තිබුණි.

2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරුවන් ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 2,393.26 ක් වූ අතර එහි ගෙවිය යුතු මුළු ප්‍රාග්ධන කොටස සහ පොලිය පිළිවෙලින් රු. මිලියන 1,903.15 ක් සහ රු. මිලියන 490.06 ක් විය.

මුළු හිඟ මුදලෙන්, සියයට 64.27ක් හෙවත් රු. මිලියන 1,538.07 ක් නිශ්චල දේපල, තෙවන පාර්ශ්ව දේපල හා යන්ත්‍ර සූත්‍ර උකස්කිරීමට එරෙහිව සුරක්ෂිත කර තිබුණි. සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගලික ඇපකරය සහ අනෙකුත් සුරැකුම් මත ඉතිරි මුදල ප්‍රදානය කර තිබුණි. තවද, සමාගමට එරෙහිව බැංකුව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, පිළිගත හැකි අයකර ගැනීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, ණය පහසුකම් සමීපව අධීක්ෂණය කිරීමට සහ සමාගමට එරෙහිව අයකර ගැනීමේ/නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට 2024.09.06 දින ණය ලිපිගොනු අයකර ගැනීමේ ආයතනික දෙපාර්තමේන්තුව වෙත මාරු කර ඇත.

**ඇ. නවලෝක පොලිසැක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

2018 සිට 2022 දක්වා කාලය තුළදී ණය 03 ක් සහ අයිරා පහසුකම් 04 ක් ලෙස ප්‍රතිලේඛණගත කරන ලද ණය පහසුකම් ප්‍රදානය කර තිබූ අතර ඒවා 2023 අප්‍රේල් 03 දින සිට අක්‍රීය ණය කාණ්ඩය යටතේ පවතුනි. රු. මිලියන 96.5 ක එක් පහසුකමක් 2018 අප්‍රේල් 02 දින ප්‍රදානය කර තිබූ අතර 2023 අප්‍රේල් 03 වැනි දින අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. රු. මිලියන 37.04 ක් වූ අනෙකුත් ණය පහසුකම් දෙක 2021 සැප්තැම්බර් සහ 2022 දී ලබා දුන් පමා සහනයකට පරිවර්තනය කරන ලද පහසුකම් වේ.

ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම, ආපසු ගෙවීමේ විරාමයන්, පවතින ණය පහසුකම් ප්‍රතිලේඛණගත කිරීම හා ප්‍රතිව්‍යුහගත කිරීම, පමා සහන පහසුකම් ලබා දීම හා පමා සහන පහසුකම්වලට පරිවර්තනය කිරීම, ප්‍රමාද වූ ගෙවීමේ ගාස්තුව අත්හැරීම, අඩු පොලී අනුපාතයක් ලබා දීම සමාගම විසින් වර්තමානය දක්වා අත්විඳ තිබුණි.

2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරු ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 125.68 ක් වූ අතර එහි ගෙවිය යුතු මුළු ප්‍රාග්ධන කොටස සහ පොලිය පිළිවෙලින් රු. මිලියන 110.94 ක් සහ රු. මිලියන 14.74 ක් විය. සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ ඒකාබද්ධ හා ඇපකර කිහිපයක් සහ ණය ගිවිසුමට එරෙහිව සියලුම හිඟ පහසුකම් සුරක්ෂිත කර තිබුණි.

ආයතනික ණය ප්‍රතිපත්ති අත්පොතෙහි 8.1.i සහ ii වගන්තියට අනුව, සවිස්තරාත්මක ණය විශ්ලේෂණයක් සිදු කර නොතිබූ අතර

අමුද්‍රව්‍යවල මිල ඉහළ යාම සහ චීනයෙන් ආනයනය කරන ලද අඩු වියදම් නිෂ්පාදනවල තරඟකාරිත්වය ඉහළ යාම හේතුවෙන් සමාගම මෑතදී සැලකිය යුතු අභියෝගවලට මුහුණ දී තිබේ. මෙම සාධක සමාගමේ පිරිවැටුම සහ කාරක ප්‍රාග්ධන තත්ත්වය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත.

සමාගමට ලබා දී ඇති සියලුම කාලීන ණය සහ අයිරා සීමාව 2023 අප්‍රේල් මාසයේ සිට අක්‍රීය ණය අංශයට මාරු කර ඇත.

සමාගම් කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කිහිපයක් සිදු කළද, නවලෝක පොලිසැක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත පිළිගත හැකි පුනර්ජීවන සැලැස්මක් ඉදිරිපත් කිරීමට නොහැකි විය. අයකර ගැනීමේ ක්‍රියාමාර්ගවල

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

| | | | |
|---|---|---|---|
| | ගනුදෙනුකරුවන් බැහැදැකීමේ වාර්තා නොතිබුණි. සමාගම අඛණ්ඩ අලාභ වාර්තා කර තිබූ අතර ජංගම අනුපාතය එකකට වඩා අඩු මට්ටමක පවතී. තවද, දිර්ඝ කාලීන ආයෝජන සඳහා කෙටි කාලීන අරමුදල් භාවිතා කිරීම සහ සමුච්චිත පාඩු පියවා ගැනීම වැනි කළමනාකරණ තීරණයන් හේතුවෙන් දිර්ඝ කාලීන කාරක ප්‍රාග්ධන දුෂ්කරතා සමාගම විසින් අත්විඳ තිබුණි. තවද, සමාගමට එරෙහිව බැංකුව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කොටසක් ලෙස, සිහි කැඳවීමේ ඊමේල්, ලිපි යවා ඇති අතර රැස්වීම් පවත්වා ඇත. නමුත්, සමාගම සමාදාන පියවීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, පිළිගත හැකි අයකර ගැනීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, ණය පහසුකම් සමීපව අධීක්ෂණය කිරීමට සහ සමාගමට එරෙහිව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට 2024.09.06 දින ණය ලිපිගොනු අයකර ගැනීමේ ආයතනික දෙපාර්තමේන්තුව වෙත මාරු කර ඇත. | |
| (ix) | **නවලෝක හෝල්ඩිංග්ස්**<br>**අ. නවලෝක ස්ටීල් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම**<br>2021 ජූලි 26 වැනි දින පහසුකම් 03 ක ණය පහසුකම් ප්‍රතිලේඛණගත කර තිබුණි. අක්‍රිය ණය පහසුකම් ප්‍රතිලේඛණගත කිරීම, ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම, පමා සහන කාලයක් ලබා දීම සහ අඩු පොලී අනුපාත පිරිනැමීම සමාගම විසින් මේ දක්වා අත්විඳ තිබුණි. තවද, සමාගමේ මුළු ණය ක්‍රමයෙන් වැඩි වී තිබූ අතර කාල සීමාව තුළදී පහසුකම් ආපසු ගෙවීම අඩු වී තිබුණි.<br>2023 සැප්තැම්බර් 30 දිනට ගනුදෙනුකරු ගෙවිය යුතු මුළු හිඟ ශේෂය රු. මිලියන 1,433.50 ක් වූ අතර එහි ගෙවිය යුතු මුළු ප්‍රාග්ධන කොටස සහ පොලිය පිළිවෙලින් රු. මිලියන 1,113.19 ක් සහ රු. මිලියන 320.31 විය.<br>මුළු හිඟ මුදලෙන්, සියයට 55.6 ක් හෙවත් රු. මිලියන 797.60 ක් තුන්වන පාර්ශ්ව වානිජ දේපළක ප්‍රාථමික උකසට එරෙහිව සුරක්ෂිත කර තිබූ අතර ඉතිරි සියයට 44.4 ක ප්‍රමාණය ආපසු අයකර ගැනීමේ හැකියාව අතින් අඩු ශක්තිමත් සුරක්ෂිතභාවයක් ඇති සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගලික ඇපකරයකට එරෙහිව සුරක්ෂිත කර තිබුණි. සමාගම දිගින් දිගටම අලාභ ලැබීම හේතුවෙන් සෘණ ශුද්ධ වටිනාකමක් වාර්තා වී තිබුණි. සමාගමේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය අසතුටුදායක වූ අතර එය බැංකුවේ පිළිගත් නිර්ණායකවලට වඩා පහළින් පැවතුනි. අභ්‍යන්තර පාලන ගැටලු සහ කොවිඩ් 19 වසංගතයේ බලපෑම හේතුවෙන් ව්‍යාපාරය පහත වැටී තිබුණි.<br>මාසික පදනමින් (2023 ජූලි මාසයෙන් පසු) ණය/තොග/විකුණුම් ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම, කාර්තුමය පදනමින් කළමනාකරණ ගිණුම් ලබා ගැනීම, සමාගම අපේක්ෂිත මූල්‍ය ප්‍රතිඵල කරා ගමන් කරන්නේ දැයි සොයා බැලීම, අරමුදල්වල අවසාන භාවිතය අධීක්ෂණය කිරීම, විකුණුම් හා එකතු කිරීමේ හා නිවැරදි කිරීමේ යාන්ත්‍රණය සඳහා සමාගම ප්‍රමාණවත් පාලනයක් සහ නිසි අධීක්ෂණ | 2021 ජූනි මාසයේ සිට 2022 මැද භාගය දක්වා මුදල් ප්‍රවාහයෙන් සියයට 80 – 90 ක් පමණ බැංකුව වෙත යොමු කර ඇත. අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා සීමාවක් තිබුණද, සමාගම අඩු පරිමාණයෙන් ව්‍යාපාරය දිගටම කරගෙන ගොස් ඇත. මාසික මුදල් ප්‍රවාහය රු. මිලියන 70ක් යොමු කර ඇති අතර 2022 ජූනි දක්වා කිසිදු හිඟයකින් තොරව ප්‍රතිලේඛණගත ණය ගෙවීම් සිදු කර ඇත.<br>2023 සැප්තැම්බර් 30 දිනට රු. මිලියන 1,387 ක් වූ මුළු හිඟ අක්‍රිය අත්තිකාරම්වලින්, ගනුදෙනුකරු විසින් ලබා දෙන ලද තුන්වන පාර්ශ්ව දේපල උකසකට එරෙහිව රු. මිලියන 1,160 ක් ප්‍රතිව්‍යුහගත කර ඇත. තවද, අංක. 87708853 දරන රු. මිලියන 226 ක පහසුකමක් හර්ෂිත් ධර්මදාස මහතාගේ සහ එච්.කේ. ජයන්ත ධර්මදාස මහතාගේ (අධ්‍යක්ෂක) ඇපකරවලට එරෙහිව ප්‍රතිව්‍යුහගත කර ඇත.<br>බැංකුව විසින් 2023.03.28 සහ | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර ඇති බවට වග බලා ගැනීම, ව්‍යාපාරයේ මුදල් ප්‍රවාහයෙන් සියයට 75 ක් බැංකුව හරහා යොමු කිරීම සහ වරින් වර පරීක්ෂණ සිදු කිරීම වැනි ණය ප්‍රතිලේඛණගත කිරීමේදී පිරිනැමීමේ ලිපියේ සඳහන් කොන්දේසි සපුරාලීමට ගනුදෙනුකරුට සහ බැංකුවට නොහැකි විය. තවද, 2024 පෙබරවාරි මාසය දක්වා සමාගමට එරෙහිව බැංකුව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2023.11.23 යන දිනවල සමාගම වෙත ගොස් ඇති අතර, දිනකට එක් වැඩ මුරයක් පමණක් ක්‍රියාත්මක වන බැවින් ඔවුන්ගේ ව්‍යාපාර මෙහෙයුම් ඉතා සීමිත බවත්, සමාගමේ මුදල් ප්‍රවාහ ගැටළු සහ ඉදිකිරීම් කර්මාන්තයේ හා නිවාස ඉදිකිරීම් අවශ්‍යතාවල මන්දගාමී ස්වභාවය මෙන්ම සමාගමේ වත්මන් ආර්ථික තත්වයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන ව්‍යාපාරයට දැඩි බලපෑම් එල්ල වීම හේතුවෙන් බැංකුව විසින් ප්‍රදානය කර ඇති සියලුම කාරක ප්‍රාග්ධන පහසුකම් බොහෝ විට සීමා කර ඇති බවත්, මිලදී ගැනීමේ හැකියාව සහ සාමාන්‍ය ජනතාවගේ අමතර වියදම් සීමා වී ඇති බවත් වැඩ ප්‍රවාහයේ යන්ත්‍රෝපකරණ ද පැරණි සහ යල් පැන ගිය ඒවා බවත් නිරීක්ෂණය විය.

බැංකුව විසින් පළමු එන්තරවාසිය 2023 අගෝස්තු 25 දින සමාගම වෙත යවා ඇත. නැවත සියලු පහසුකම් ප්‍රතිලේඛණගත කරන ලෙස සහ ඉතිරි ණයවර ලිපි පහසුකම් භාවිතා කිරීමට ඉඩ දෙන ලෙස සමාගම බැංකුව වෙතින් ඉල්ලීමක් කර ඇත. ප්‍රතිලේඛණගත කිරීමට පෙර තම නිෂ්පාදන සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම පිළිබඳ නිසි විශ්ලේෂණයක් සමඟ ව්‍යාපාරය පුනර්ජීවනය කිරීම සඳහා පුළුල් ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස බැංකුව ඔවුන්ගෙන් ඉල්ලා ඇත.

මෙම කාරණය සභාපති, ජයන්ත ධර්මදාස මහතා සමඟ කිහිප වතාවක්ම සාකච්ඡා කර අමතර සුරැකුමක් සහ බැංකුවට විශ්වාසවන්ත පාර්ශවයක්

| | | | |
|---|---|---|---|
| | | විසින් පවත්වනු ලබන වෙළඳපල විශ්ලේෂණයකින් අනුග්‍රහය දක්වන නිසි ව්‍යාපාර සැලැස්මක් අවශ්‍ය බව දන්වා ඇත. සමාගම එම තොරතුරු සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් සිටී. සමාගම විසින් මෙම සමාගම පිළිබඳ බැංකුවේ ගැටළු විසඳීමට හැකි මාර්ග කිහිපයක් උත්සාහ කරමින් සිටින නිසා ජයන්ත ධර්මදාස මහතා මෙම සමාගමේ ඉදිරි ගමන සඳහා විසඳුමක් ඉදිරිපත් කිරීමට එකඟ විය. නවලෝක හෝල්ඩිංග්ස් බැංකුව සමඟ දශක හයක් පුරා පවතින දිගුකාලීන සබඳතාව, වත්මන් ආර්ථික තත්ත්වයන් සහ විනිමය අනුපාතිකයේ වෙනස්වීම් සමාගමේ වත්මන් තත්ත්වය කෙරෙහි විශාල බලපෑමක් ඇති කිරීම සැලකිල්ලට ගනිමින්, අපි සමාගමට ක්‍රියාකාරී විසඳුමක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දී ඇත. ඉදිරි මාස දෙක ඇතුළත අපට එවැන්නක් නොලැබේන්නේ නම්, එම පහසුකම් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට බැංකුව කටයුතු කරනු ඇත. | |
| (x) | **පර්ල් සිටි හෝටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කර ඇති පහසුකම්**<br>මෙම හෝටලය 2003 වසරේ සිට කොල්ලුපිටියේ තරු තුන පන්තියේ හෝටලයක් ලෙස ක්‍රියාත්මක වේ. එ.ජ.ඩො මිලියන 7.5 ක්, රු. මිලියන 4,024.42 ක්, එ.ජ.ඩො මිලියන 2.26 ක් සහ රු.මිලියන 2,266.31 ක් වූ පිළිවෙලින් එක් (1) එ.ජ.ඩො කාලීන ණය පහසුකමක්, රුපියල් වලින් නාමනය කරන ලද කාලීන ණය පහසුකම් හතරක් (4) , එක් (1) එ.ජ.ඩො පමා සහන ණය පහසුකමක් සහ පමා සහන ණය පහසුකමක් හතරක් (4) ප්‍රදානය කර තිබුණි. පර්ල් ග්‍රෑන්ඩ් ටවර් හි ව්‍යාපෘති පිරිවැයෙන් කොටසක් මූල්‍යකරණය කිරීම, සම්පත් බැංකුවේ පවත්නා වගකීම් පියවීම සහ හෝටල් ඉදිකිරීම් ආශ්‍රිත ද්‍රව්‍ය ආනයනය/දේශීය මිලදී ගැනීම සඳහා මෙම පහසුකම් ප්‍රදානය කර තිබුණි. සියලුම ණය 10 හි අවසාන ගෙවීම් 2022 වර්ෂයේදී සිදු කළ යුතු වුවද, 2024 දෙසැම්බර් දක්වා ණය | සම්පත් බැංකුව විසින් හෝටල් ව්‍යාපෘතිය සඳහා මුලදී මූල්‍ය පහසුකම් ලබා දී ඇත. සම්පත් බැංකුව විසින් හෝටල් ව්‍යාපෘතිය සඳහා තවදුරටත් මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම ප්‍රතික්ෂේප කිරීම නිසා මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා සමාගම 2017 දී බැංකුව වෙත පැමිණි අතර ඒ වන විට සම්පත් බැංකුවේ වගකීම් රු. මිලියන 1,184.4 ක් විය.<br>ව්‍යාපෘතියේ විශාලත්වය සැලකිල්ලට ගනිමින් බැංකුව විසින් අදියර වශයෙන් | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

සඳහා පමා සහනයක් ලබා දී ඇති බැවින් ඒවා අක්‍රීය ණය කාණ්ඩය යටතේ නොතිබුණි.

ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 6,000 කින් වැඩි වීම නිසා සම්පත් බැංකුව ණය පහසුකම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් සම්පත් බැංකුවේ පවත්නා වගකීම පියවීම ඇතුළත්ව පර්ල් ග්‍රෑන්ඩ් ටවර් ව්‍යාපෘති පිරිවැයෙන් කොටසක් මූල්‍යකරණය කිරීම සඳහා එ.ජ.ඩො මිලියන 7.5 ක මුල් ණය පහසුකමක් ප්‍රදානය කර තිබුණි. තවද, අංක 985 දරන ලියාපදිංචි නොකළ බදු ගිවිසුමක් මත පර්ල් ග්‍රෑන්ඩ් ටවර් හෝටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් ඉදිකිරීම සඳහා පර්ල් සිටි හෝටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත මුලදී පහසුකම් ප්‍රදානය කර තිබුණි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් අංක 2021.04.01/2.7 අනුව, ප්‍රාග්ධනය ඉහළ නංවන තුරු මෙම සමාගමට තවත් පහසුකම් ලබා නොදීමට යටත්ව ස්ථාපිත ණයවර ලිපිය විශ්‍රාම ගැනීම සඳහා කාලීන ණයක් ලබාදීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් අංක 2021.07.01/2.14 අනුව, සමාගම විසින් ප්‍රාග්ධනය ඉහළ නංවන නොතිබීම සහ කල් ඉකුත් වූ ප්‍රදානය කරන ලද දේශීය ණයවර ලිපි පහසුකම්, ස්කන්ධ දායකත්වය සැපයීමට නොහැකි වීම, බැංකුව ව්‍යාපෘති පිරිවැයට වඩා වැඩි ණයක් ලබා දීම, ඉහළ ස්කන්ධ ප්‍රාග්ධනයට ණය අනුපාතය, අවිනිශ්චිත අනාගත මුදල් ප්‍රවාහ යනාදි 2021 මැයි 25 දිනැති ප්‍රධාන අවදානම් නිලධාරියාගේ සංදේශයේ දක්වා ඇති අහිතකර අදහස් තිබියදී, අධයක්ෂ මණ්ඩලය විසින් පර්ල් සිටි හෝටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත පහත සඳහන් දෑ අනුමත කර තිබුණි.

i) ණයෙහි ස්කන්ධ දායකත්වය සැපයීමේ නොහැකියාව සැලකිල්ලට ගනිමින් දැනටමත් ස්ථාපිත කර ඇති ණයවර ලිපි විශ්‍රාම ගැන්වීම සඳහා අනුමත රු. මිලියන 255 ක ණය මුදල රු. මිලියන 297 ක් දක්වා වැඩි කිරීම.
ii) 2021 අප්‍රේල් 01 දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද කොන්දේසිවලින් බැහැරවීම සහ සමාගමේ සියයට 15 ක ස්කන්ධ දායකත්වය නොමැතිව ණය මුදල ලබා දීම. (ආසන්න වශයෙන් රු. මිලියන 42 - ණය/ස්කන්ධ ප්‍රාග්ධන අනුපාතය 85:15 විය යුතුය).

මේ වන විට ව්‍යාපෘතිය කිසිදු වාණිජ කටයුත්තක් කිරීමට හැකියාවක් නොමැති අසම්පූර්ණ ගොඩනැගිල්ලක් ලෙස පවතී. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2017 ජූනි 15 දින ආරම්භ කර 2019 දෙසැම්බර් 31 දින නිම කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. මූලික ඇස්තමේන්තුගත මුළු ව්‍යාපෘති පිරිවැය රු. බිලියන 12.5 ක් වූ අතර එය 2023 දී රු. බිලියන 15.9 දක්වා සංශෝධනය වී තිබුණි. බැංකුව විසින් රු. බිලියන 8.5 ක හෙවත් ඇස්තමේන්තුගත මුළු ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 68 ක දායකත්වයක් ලබා දී තිබුණි.

තවද, 2021 නොවැම්බර් 15 වන දින පැවති රැස්වීමේදී, ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය විධිමත් කිරීමට සහ ව්‍යාපෘතියේ සමීප අධීක්ෂණ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට දක්ෂ සහ පක්ෂපාතී ප්‍රමාණ සමීක්ෂණයකින් පැවතීමේ අවශ්‍යතාවය Q Serve සමාගම විසින් අවධාරණය කර තිබුණි. කෙසේ වෙතත්, 2023 මැයි 08 සහ 2023 අගෝස්තු 10 යන දිනයන් හිදී සිදුකරන ලද ගනුදෙනුකරුගේ

ව්‍යාපෘතිය සඳහා මුදල් යෙදවීමට තීරණය කර ඇත. ඒ අනුව, අදියර I හි පිරිවැය රු.මිලියන 6,739.49 ක් වූ අතර අදියරේ II හි පිරිවැය රු. මිලියන 5,596.8 ක් විය.

2017 දෙසැම්බර් මාසයේදී හෝටල් ව්‍යාපෘතියේ ශක්‍යතාව සැලකිල්ලට ගනිමින් (පර්ල් සිටි හෝටල් හි පවතින ව්‍යාපාර මූල්‍ය වාර්තා මත පදනම් නොවී) බැංකුව විසින් රු. මිලියන 3,368.3 ක සහ එ.ජ.ඩො මිලියන 7.5 ක කාලීන ණය දෙකක් ලබා දී ඇත.

පර්ල් සිටි හෝටලය සතු ඉඩමක හෝටල් ව්‍යාපෘතිය ඉදිකර ඇත. එබැවින්, සමාගම මත පරාටේ ක්‍රියාත්මක කිරීමේ අයිතිය ලබා ගැනීම සඳහා බැංකුව විසින් පර්ල් සිටි නමින් හෝටලය ඉදිකිරීමට පහසුකම් ප්‍රදානය කර ඇත.

පර්ල් සිටි හෝටලය සහ පර්ල් ග්‍රෑන්ඩ් ටවර් හෝටලය අතර බදු ගිවිසුම හරහා ආපසු ගෙවීම සහතික කරනු ඇත. (පවත්නා නීතිමය පසුබිම අනුව, බදු ගිවිසුම් ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවේ).

IHG ගිවිසුම අත්සන් කිරීමෙන් පසු, රු. මිලියන 5,596.84 ක අතිරේක පිරිවැයක් සමඟ ප්‍රවර්ධකයින් විසින් හෝටලයේ II අදියර සම්පූර්ණ කිරීමට මූල්‍ය පහසුකම් ඉල්ලා ඇති අතර බැංකුව විසින් මුලින් එකඟ වූ 50.1:49.9 ක ණය - ස්කන්ධ ප්‍රාග්ධනය සමඟ රු. මිලියන 2,966.3 ක් ප්‍රදානය කර ඇත.

දැනට සමාගම විසින් ගොඩනැගිල්ලේ අපරිභාගය (super structure) සම්පූර්ණයෙන්ම නිම කර

වැඩබිම් පරීක්ෂණ වාර්තා නොමැති වීම හේතුවෙන් හෝටලයේ ඉදිකිරීම්වල ප්‍රගතිය බැංකුව විසින් සමීපව නිරීක්ෂණය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

රු.මිලියන 22.885 ක උපචිත දඩ පොලිය ඉවත් කිරීම සහ පමා සහන පහසුකම් හා 2022 ජූලි සිට 2024 දෙසැම්බර් දක්වා පමා සහන කාලයක් ප්‍රදානය කිරීම බැංකුව විසින් සිදු කර තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ මුළු හිඟ ණය ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වී තිබුණි.

තවද, 2017 වර්ෂයේදී මූලික ණය ප්‍රදානය කිරීමේ අදියරේදී, සමාගමේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය අසතුටුදායක මට්ටමක පැවති අතර ණය ලබා දීමට පෙර ශාඛාව විසින් ගනුදෙනුකරුගේ විකුණුම්, ආයෝජන, දිගුකාලීන ණය සහ ආපසු ගෙවීමේ හැකියාව ගැඹුරින් ඇගයීමට ලක් කර නොතිබුණි. සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශනවලින් 2016/17, 2017/18 සහ 2020/21 වසරවල සැලකිය යුතු ශුද්ධ අලාභයන් වාර්තා කර තිබුණි. කොවිඩ් 19 වසංගත තත්ත්වයත්, එකල පැවති ආර්ථික අර්බුදයත් සමඟ සංචාරක කර්මාන්තයේ ආදායම් උත්පාදනය සැලකිය යුතු ලෙස අඩුවීම හේතුවෙන් මෙම පාඩුව සිදුවී තිබුණි. සමාගමේ දිගුකාලීන ණය, දිගුකාලීන ණය/ස්කන්ධ ප්‍රාග්ධන අනුපාතය, මුළු ණය/ ස්කන්ධ ප්‍රාග්ධන අනුපාතය සහ පොලී ආවරණය මෙම කාලය පුරාවටම අසතුටුදායක විය.

තවද, උත්තෝලනය, අවම විකුණුම්, අවම ශුද්ධ ලාභය/විකුණුම්, ණය සේවා ආවරණය, පොලී සේවාකරණ ආවරණ අනුපාතය, උපරිම කාලසීමාව, අත්තිකාරම් අනුපාතය සහ හිමිකම් රක්ෂණය ලබා ගැනීම සම්බන්ධයෙන් බැංකුවේ ණය ප්‍රතිපත්තියෙන් බැහැරවීම් නිරීක්ෂණය විය.

2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු අක්‍රීය ණය ශේෂය රු. මිලියන 13,365.15 ක් වූ අතර එහි ගෙවිය යුතු ප්‍රාග්ධන කොටස සහ පොලිය පිළිවෙළින් රු. මිලියන 11,540.67 ක් සහ රු. මිලියන 1,824.48 ක් විය.

අපේක්ෂිත විකුණුම් වටිනාකම රු. මිලියන 15,000 ක් සහ වෙළඳපොළ වටිනාකම රු. මිලියන 17,500 ක් (2023/04/06 දිනැති තක්සේරු සමාලෝචන පැනලය අනුව) වූ කොල්ලුපිටිය, බෞද්ධාලෝක මාවත, එඩ්වඩ් පටුමග, මිල්ලගිරිය, අංක 39 හි පිහිටි නිශ්චල දේපලට එරෙහිව මුළු හිඟ මුදල් සුරක්ෂිත කර තිබුණි.

ඇත. තවද, යාන්ත්‍රික, විදුලි හා ජලනල සවි කිරීම් සහ දොර ජනෙල් වැඩ ඇතුළු ක්ෂේත්‍ර ප්‍රමාණාත්මක වශයෙන් නිම කර ඇත.

ඒ අනුව, හෝටල් ව්‍යාපෘතියේ වර්තමාන සමස්ත තත්ත්වය (මහාචාර්ය චිත්‍රා වෙඩික්කාර විසින් සපයන ලද Q Serve තහවුරු කිරීම මත පදනම්ව) සියයට 83.4කි. (2023 දී සංශෝධිත මුළු ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 15,676.25 ක් වූ අතර සිදු කරන ලද වැඩවල පිරිවැය රු. මිලියන 13,074.74 ක් විය.)

2022 දී, ප්‍රවර්ධකයා ඔවුන්ගේ පවතින හෝටලය වන පර්ල් ග්‍රෑන්ඩ් හෝටලය රු. මිලියන 1,650 කට රත්න සමූහයට විකිණීමෙන් ස්කන්ධ පරතරය (equity infusion gap) සපුරාලීමට උත්සාහ කර ඇත.

කෙසේ වෙතත්, සමාගමට හෝටල් ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට නොහැකි වූ අතර ප්‍රවර්ධකයා විසින් ව්‍යාපෘතිය නිම කිරීම සඳහා බැංකු ආධාර නොකඩවා ඉල්ලා සිටි අතර ප්‍රවර්ධකයින්ගෙන් තවදුරටත් ස්කන්ධ දායක මුදල් නොලැබීම පිළිබඳව අවධාරණය කර ඇත.

පාස්කු ඉරිදා සිට පොලී සමුච්චය වීම සහ හෝටල් ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති විදේශ විනිමය ණය අවප්‍රමාණය වීම හේතුවෙන් ණය රු. බිලියන 13.47 ක් දක්වා ඉහළ ගොස් ඇත.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු විනිමය අනුපාතික අවප්‍රමාණය වීම සහ පොලී සමුච්චය වීම හේතුවෙන් සේවාලාභියාට සීමා සහිත පාලනයක් ඇති වීම හේතුවෙන් රු. බිලියන 7.8 ක මූලික ණය ලබා දීම රු.

බිලියන 5.7 කින් වැඩි වී ඇත.

සාකච්ඡා කිහිපයකට පසුව, ව්‍යාපෘතියේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා රු. මිලියන 500 ක මුදලක් (upfront amount) ලබා දීමට ප්‍රවර්ධකයා එකඟ වී ඇත.

මේ අතර, සමාගම ව්‍යාපෘතිය සඳහා ශක්‍ය ආයෝජකයින් ඇගයීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර 2024 දෙසැම්බර් දක්වා පමා සහනය ලබා දී ඇත. සමාගමට අනුව, මේ ආකාරයේ අර්ධ වශයෙන් නිම කරන ලද ව්‍යාපෘතියක් සඳහා ශක්‍ය ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම අභියෝගාත්මක වේ.

(xi) **ලාෆ්ස් ගෑස් පීඑල්සී වෙත ප්‍රදානය කර ඇති පහසුකම්**

සමාගම ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) ආනයනය, ගබඩා කිරීම, පිරවීම, බෙදාහැරීම සහ විකිණීමේ පහළ ව්‍යාපාරික මෙහෙයුම්වලට සම්බන්ධ වේ. බැංකුව විසින් රු. මිලියන 2,994 ක්, රු. මිලියන 131.36 ක් සහ රු. මිලියන 1,415.64 ක් වූ පිළිවෙලින් කාලීන ණය පහසුකම් තුනක්, උප ණය පහසුකම් දෙකක් සහ උකස් ඇපකර ණය පහසුකම් හතරක් ලබා දී තිබුණි. අනෙකුත් වාණිජ බැංකුවල කෙටි කාලීන වගකීම් පියවීමට, පවතින උකස් ඇපකර ණයවල හිඟ ප්‍රාග්ධන කොටස ප්‍රතිව්‍යුහගත කිරීමට, ආනයන සඳහා සහ පමා සහනය සඳහා පහසුකම් ලබා දී තිබුණි. ලංකා බැංකුව ප්‍රථම වරට 2018 සැප්තැම්බර් මාසයේදී පහසුකම් ප්‍රදානය කර තිබූ අතර 2020 දී පහසුකම් මුලින් ප්‍රතිලේඛණගත කර 2021 ජූනි මාසයේදී ප්‍රතිව්‍යුහගත කර තිබුණි. 2023 පෙබරවාරි මාසයේ සිට පහසුකම් අක්‍රීය ණය කාණ්ඩය යටතේ වර්ගීකරණය කර තිබුණි.

2017/18 සිට 2020/21 දක්වා සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල වාර්තා වූ සැලකිය යුතු ශුද්ධ අලාභයන් තුළින් 2018 වර්ෂයේ නව පහසුකම් ප්‍රදානය කරන අවස්ථාවේදී සමාගමේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය අසතුටුදායක බව පෙන්නුම් කෙරුණි. කොවිඩ් වසංගතයට පෙර පවා සමාගමේ ආදායමෙන් ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවූ අධික මූල්‍ය පිරිවැය මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. අධික ණය ගැනීම් සහ අඛණ්ඩ අලාභ හේතුවෙන් 2017-2021 කාලය පුරාවට සමාගමේ උත්තෝලනය ඉහළ ගොස් තිබුණි. එසේම සමාගමේ ජංගම අනුපාතය එම කාල සීමාව සඳහා සම්මත අවශ්‍යතාවයට වඩා පහළින් දැක්වුණි. මෙම අහිතකර මූල්‍ය දර්ශක සලකා බැලීමේදී, බැංකුව විසින් මෙම පහසුකම් ලබාදීමට පෙර සමාගමේ ආපසු ගෙවීමේ හැකියාව සහ සමස්ත මූල්‍ය තත්ත්වය නිසි ලෙස ඇගයීමට ලක් කර නොමැති බව සනාථ විය.

සංදේශයේ පෙන්වා දී ඇති අහිතකර සාධක සැලකිල්ලට ගැනීමෙන්

1. රජය විසින් ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) මිල පාලනය කිරීම හේතුවෙන් සමාගමේ ව්‍යාපාරික මුදල් ප්‍රවාහයට බලපෑම් එල්ල විය. 2021 ඔක්තෝම්බර් මාසයේ සිට, බලධාරීන් විසින් කරනු ලබන නියාමන පාලනයකින් තොරව වෙළඳපල බලවේග මගින් පමණක් ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) හි පාරිභෝගික මිල තීරණය කරයි.
2. දෙවන මාර්ගය සලකා බැලීමට පෙර බැංකුව ව්‍යාපාරික මුදල් ප්‍රවාහයෙන් අක්‍රීය ණය පහසුකම් අයකර ගැනීමේ ක්‍රියාවලියක නිරත විය. අවශ්‍ය අතිරේක මුදල් ප්‍රවාහය යොමු කිරීම මගින් ගනුදෙනුකරු අක්‍රීය ණය පියවීමට ධනාත්මකව අනුගත විය.
3. 2022 වසර අවසානයේදී, සමාගමේ හිඟ අක්‍රීය ණය රු. මිලියන 3,480.36 ක් වූ අතර සමාගමට 2024 මැයි

අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

තොරව 2018 අගෝස්තු 29 වැනි දින රු. මිලියන 1,200 ක සහ රු. මිලියන 800 ක කාලීන ණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. බැංකුවට අරමුදල්වල අවසන් භාවිතය තහවුරු කිරීමට නොහැකි වූ අතර සමාගමේ ප්‍රාග්ධන පිරිවැය අඩු කිරීම සඳහා එහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ප්‍රතිව්‍යුහගත කිරීමට හැටන් නැෂනල් බැංකුවේ සහ ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ කෙටිකාලීන වගකීම් පියවීම සඳහා සමාගම විසින් අරමුදල් භාවිතා කර තිබුණි.

ස්කන්ධ ප්‍රාග්ධනයට ණය අනුපාතය, අවදානම් ශ්‍රේණිගත කිරීම සහ දේපළ සම්බන්ධයෙන් අත්තිකාරම් අනුපාතිකය අපේක්ෂිත මට්ටම පවත්වා ගැනීමට නොහැකි වීම හේතුවෙන් බැංකුවේ ණය ප්‍රතිපත්තිය සමඟ බැහැරවීම් නිරීක්ෂණය විය. තවද, ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් අසතුටුදායක මූල්‍ය තත්ත්වය, ණය ගෙවීම් සඳහා අමතර මුදල් ප්‍රවාහයක් උත්පාදනය කිරීමේ ක්‍රමයක් නොමැති වීම, සියයට 60 ක උකස් ආවරණයක් පැවතීම හා ඉතිරි ශේෂය සෘණ ඔඩපනයකින් (pledge) ආවරණය කිරීම සහ එකම සෘණ ඔඩපනය මගින් වෙනත් බැංකුවලින් ණයට ගැනීම වැනි අවාසිදායක අදහස් ඉදිරිපත් කර ඇත.

ප්‍රධාන අවධානම් නිලධාරියා විසින් 2021 ජූනි 10 දිනැති ඔහුගේ සංදේශයේ සඳහන් කර ඇති විශේෂ කොන්දේසිවලට සමාගම අනුකූල නොවිය. එනම්, ආයතනික ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ගිණුම හරහා මුදල් ප්‍රවාහයෙන් 1/3 ක් යොමු කිරීමෙන් තොරව මුදල් ප්‍රවාහයෙන් සියයට 6.6 ක් පමණක් යොමු කිරීම, එක් එක් කාර්තුව සඳහා පුරෝකථනය කරන ලද විකුණුම් සැලැස්ම හා ලාභදායීතා ප්‍රකාශය ඉදිරිපත් නොකිරීම, ණයගැති ප්‍රකාශන, වයස් විශ්ලේෂණය සමඟ ලැබිය යුතු මුදල්, මාසික නිෂ්පාදනය, එක් එක් කාර්තුව සඳහා විකුණුම් හා තොග ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීම යනාදිය වේ.

බැංකුව උපචිත පොලියෙන් සියයට 40 ක පොලී නිදහස් කිරීමක් ලබා දී තිබූ අතර, පමා සහන පහසුකම් සහ 2021 සිට 2024 දෙසැම්බර් දක්වා පමා සහන කාලයක් ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ මුළු ණය නිරාවරණය ක්‍රමයෙන් වැඩි වී තිබුණි.

2023 දෙසැම්බර් 31 දිනට ගනුදෙනුකරුගේ මුළු අක්‍රීය ණය ශේෂය රු. මිලියන 3,100.29 ක් වූ අතර එහි ගෙවිය යුතු ප්‍රාග්ධන කොටස සහ පොලිය පිළිවෙළින් රු.මිලියන 2,691.15 ක් සහ රු. මිලියන 409.14 ක් විය.

බම්බලපිටිය, රීඩ් මාවත, කුමාරතුංග මුනිදාස මාවතේ පිහිටි (0A-1R-0.05P) සහ හැව්ලොක් නගරය, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවතේ පිහිටි (A0-R0-P35.21) අපේක්ෂිත විකුණුම් වටිනාකම පිළිවෙළින් රු. මිලියන 650 ක් (2022/03/08 දිනැති තක්සේරු සමාලෝචන පැනලය අනුව වෙළඳපොළ වටිනාකම රු. මිලියන 720 කි.) සහ රු. මිලියන 510 ක් (2022/10/04 දිනැති තක්සේරු සමාලෝචන පැනලය අනුව වෙළඳපොළ වටිනාකම රු. මිලියන 600 කි.) වූ නිශ්චල දේපළවලට එරෙහිව හිඟ මුළු මුදලින් රු.මිලියන 1,487.87 ක් සුරක්ෂිත කර තිබුණි. යෝජිත ණය පහසුකම් සුරක්ෂිත කිරීම සඳහා බැංකුවට උකස් කරන ලද දේපල සඳහා පැනල් වන විට මුළු අක්‍රීය ණය පියවා ගත හැකි විය.

4. 2023/24 මූල්‍ය වර්ෂය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාගම රු. මිලියන 22, 475.78 ක ආදායමක් උපයා ඇති අතර (ආදායම් වර්ධනය සියයට 21.3 කි.) රු. මිලියන 463.6 ක ලාභයක් වාර්තා කර ඇත. (බදු පසු ලාභය සියයට 2.1 කි.)

   අවධානම් ශ්‍රේණිගත කිරීම : BB (2023)
5. සුරකුම්පත්

   දේපලවල වෙළඳපොළ වටිනාකම 2022: කාල සීමාව තුළ ඉඩම් වටිනාකම වැඩි වී ඇත. තක්සේරු සමාලෝචන පැනලය: රු. මිලියන 1,320.0 පැනල් තක්සේරුකරු: රු. මිලියන 1,344.8. මාබිම දේපල පිළිබඳ සෘණාත්මක ඔඩපනය, ලාෆ්ස් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි ආයතනික ඇපකරය, ලේඛණගත ණය සහ ණය පැකේජය සඳහා ලබා ගත හැකි වෙනත් අදාළ සුරැකුම්පත්.
6. සමාගම කිසිදු ප්‍රමාදයකින් තොරව සෑම කාර්තුවකටම වයස් විශ්ලේෂණ සමඟ ණයගැති/තොග, මාසික ආදායම් ප්‍රකාශනයන් සහ අතුරු ගිණුම් ඉදිරිපත් කර ඇත.

   වෙනත් බැංකුවල ණය පවතින බැවින්, ගිණුම් හරහා සමානුපාතිකව මුදල් ප්‍රවාහ යොමු කිරීමට සමාගම එකඟ වූ අතර එයට වර්තමානයේදී අනුකූල වී ඇත. 2024.10.09 වන දිනට සමාගමේ පවතින සියලුම

| | | |
|---|---|---|
| | තක්සේරුකරු විසින් තබන ලද වෙළඳපල වටිනාකමෙන් සියයට 100 ක අත්තිකාරම් අනුපාතයක් සලකා බැලීමට 2018 අගෝස්තු 29 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, අනෙකුත් පහසුකම් කිසිදු නිශ්චල දේපලකින් ආවරණය වී නොතිබුණි<br>මේ වන විට, හිතකර වෙළඳපල තත්ත්වය හේතුවෙන් සමාගමට අලාභ ආවරණය කර ගැනීමට හැකි වී තිබූ අතර, 2024 ඔක්තෝබර් 09 වන දිනට පවතින සියලුම පහසුකම් නිත්‍ය අංශයට මාරු කර තිබුණි. | පහසුකම් නිත්‍ය අංශයේ පවතින අතර, හිඟ මුදල් වාර්තා වී නොමැති අතර පියවීම් සතුටුදායක වේ.<br>7. හිතකර වෙළඳපල තත්ත්වයන් යටතේ, සමාගමට තම නිෂ්පාදන ලාභදායී මිලකට අලෙවි කිරීමට අවස්ථාව ඇති අතර එමගින් එහි ආදායම් උත්පාදනය සහ ලාභය ශක්තිමත් වනු ඇත. අවසානයේ එය සතුටුදායක ආකාරයෙන් ණය පහසුකම් පියවීම සහතික කරනු ඇත.<br>8. සම්බන්ධතා කණ්ඩායම විසින් සමාගමට ලබා දී ඇති පහසුකම් සහ ඒවා නියමිත වේලාවට පියවීම දැඩි ලෙස නිරීක්ෂණය කරයි. |
| (xii) | **ඉස්ලාමීය බැංකු ඒකකය මගින් ප්‍රදානය කර ඇති ණය**<br><br>2023.12.31 දිනට ඒකකයේ මුළු ණය ප්‍රමාණයේ වටිනාකම රු. මිලියන 1451.45 ක් වූ අතර ඉන් රු. මිලියන 669.62 ක් හෙවත් සියයට 46.13 ක් අක්‍රීය ණය ලෙස වාර්තා කර තිබුණි. 2019 සිට 2023 දක්වා පසුගිය වසර පහක කාලය තුළදී ඒකකයේ මුළු ණය ප්‍රමාණයෙන් අක්‍රීය ණය අනුපාතය පිළිවෙළින් සියයට 15.20 ක්, සියයට 37.61 ක්, සියයට 59.76 ක්, සියයට 45.36 ක් සහ සියයට 46.13ක් ලෙස ඉහළ අගයන් වාර්තා කර තිබුණි.<br>2023 දෙසැම්බර් 31 දිනට මුළු අක්‍රීය ණය ප්‍රමාණයෙන්, රු. මිලියන 656.81 ක් හෙවත් සියයට 45.25 ක් ඒකකයේ ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 10 දෙනා විසින් ආවරණය කරන ලද අතර ඉහළම එක් අක්‍රීය ගනුදෙනුකරුවකු ලෙස ශ්‍රේණිගත කළ සමාගමට රු. මිලියන 327.71 ක් හෙවත් ඒකකයේ සම්පූර්ණ අක්‍රීය ණය ප්‍රමාණයෙන් සියයට 48.94 ක අක්‍රීය ණය ශේෂයක් පැවතුනි. | අක්‍රීය ණය අනුපාතය 2024 සැප්තැම්බර් 30 දිනට සියයට 15.5 ක් දක්වා අඩු විය.<br>ඉස්ලාමීය බැංකු ඒකකය විසින් ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 10 දෙනා මත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. | අයකර ගැනීම් පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

**1.7 , රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | 1938 අංක 53 ලංකා බැංකු ආඥාපනත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලන නියෝග පිළිබඳ 3(2)(i) විධානය | 2023 වර්ෂය තුළදී ලංකා බැංකු ආඥාපනත සහ ආයතනික යහපාලන නියෝගවලට අනුව අවම අධ්‍යක්ෂවරුන් 6 දෙනෙකුගේ අවශ්‍යතාවයට බැංකුව අනුකූල වී නොතිබුණි. විස්තර පහත පරිදි වේ; | ලංකා බැංකුවේ ආඥාපනත සංශෝධනය කිරීමේ වර්තමාන තත්ත්වය:<br>2024.05.25 දිනැති රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් විසින් නීති කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලද ලිපියට අනුව, | ලංකා බැංකු ආඥාපන තේ සහ ආයතනික යහපාලන නියෝගවල අවශ්‍යතාවය ට අනුකූල |

| | | | | |
|---|---|---|---|---|
| | | **කාලපරිච්ඡේදය** — **අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින් ගණන**<br>2023.01.01 — 5<br>2023.01.02-2023.01.12 — 4<br>2023.01.13-2023.01.17 — 3<br>2023.01.18-2023.03.30 — 4<br>2023.03.31-2023.04.20 — 5<br>2023.04.21-2023.05.03 — 4<br>2023.05.04-2023.12.03 — 5 | 2024.05.03 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා නීතිමය කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවන අදහස් සමඟ 2023.12.08 වැනි දින ලංකා බැංකුවේ සභාපති විසින් එවන ලද අදහස් ඉදිරිපත් කරන ලෙස ඔහු නීති කටයුතු පිළිබඳ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් දී ඇත. | වීමට නිර්දේශ කෙරේ. |
| (ii) | 2021 අංක 13 දරන බැංකු පනත් නියෝගයේ ඡේද අංක 5.3 | නියෝගය අනුව, ණය ගැණුම්කරුවෙකුට බැංකුව සමඟ අයිරා සීමාවන් සහිත ජංගම ගිණුම් කිහිපයක් තිබේ නම්, සමස්ත අනුමත සීමාවන් සහ එවැනි සියලුම ගිණුම්වල දෛනික සමුච්චිත හිඟ ශේෂය අයිරා වර්ගීකරණය සඳහා සලකා බැලිය යුතුය. කෙසේ වෙතත්, බැංකුවේ වර්තමාන භාවිතය මෙම අවශ්‍යතාවයට අනුකූල නොවේ. | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් විසින් නිකුත් කරන ලද අවසාන කළමනාකාරීත්ව ලිපියෙන් මෙම කරුණ ඉවත් කර ඇත. | අනාගතයේදී අදාළ රෙගුලාසියට අනුකූල වීම අවශ්‍ය වේ. |
| (iii) | 2006 අංක 6 දරන මූල්‍ය වාර්තාකරණ ගනුදෙනු පනතේ විධිවිධාන | පනතේ විධිවිධානවලට අනුකූල වීමට බැංකුව අපොහොසත් වීම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව 2023 නොවැම්බර් 07 වැනි දින රු. 6,000,000 ක දඩයක් නියම කර තිබුණි. | පනතේ විධිවිධානවලට අනුකූල වීමට බැංකුව අපොහොසත් වීම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව 2023 නොවැම්බර් 07 වැනි දින රු. 6,000,000/- ක දඩයක් නියම කර ඇත.<br>• දේශපාලන වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින් සමඟ ව්‍යාපාරික සබඳතා සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව අනුමැතිය ලබා නොගැනීම හෝ කාලීනව ලබා නොගැනීම.<br>• නම් කරන ලද පුද්ගලයින් සම්බන්ධයෙන් ක්ෂණික ඇවිරීමේ (freezing) ක්‍රියාමාර්ග සහ වෙනත් අතිරේක ක්‍රියාමාර්ග නොගැනීම. | අදාළ රෙගුලාසියට අනුකූල වීම අවශ්‍ය වේ. |

තවද, පනතේ විධිවිධානවලට අනුකූල වීමට බැංකුව අපොහොසත් වූ බැවින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 නොවැම්බර් 07 දිනැති අනුකූලතා සත්‍යාපනයක් නිකුත් කර ඇත.

- නියමිත සීමාවේ අගයට වඩා වැඩි ගනුදෙනු වාර්තා නොකිරීම.
- අත්හිටුවීමේ නියෝග සහ දීර්ඝ කිරීමේ නියෝග නොපිළිපැදීම.
- ගනුදෙනුකරුවෙකු සමඟ ව්‍යාපාරික සබඳතාවයේ කාලය පුරාවටම සිදු කරන ලද ගණුදෙනු පිළිබඳ අඛණ්ඩ සන්නිරීක්ෂණයක් සිදු නොකිරීම.
- නිසි අවධානම් පාලන සහ අවම කිරීමේ පියවර ක්‍රියාත්මක නොකිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය බුද්ධි ඒකකය, විසින් නිකුත් කරන ලද දේශපාලන වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින් සම්බන්ධ මාර්ගෝපදේශවලට අනුකූල වීම ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් පූර්වාරක්ෂණ ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇත.

1. ක්‍රියා පටිපාටි අත්පොත් ඇතුළත්ව අනුගමනය කළ යුතු සියලුම අවශ්‍යතා සහ ක්‍රියා පටිපාටි විස්තර කරමින් දේශපාලන වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින් මාර්ගෝපදේශවල 2023 අංක 01 දරන කාර්යාල උපදෙස් චක්‍රලේඛයට අතිරේකයක් නිකුත් කර ඇත.
2. සියලුම පළාත් ආවරණය වන පරිදි අනුකූලතා පුහුණු අංශය හරහා පෙරටුගාමී කාර්ය මණ්ඩලය, ශාඛා කළමනාකරුවන්, ප්‍රදේශ කළමනාකරුවන්, මෙහෙයුම් කළමනාකරුවන් ඇතුළත් අදාළ සියලුම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම.
3. දේශපාලන වශයෙන්

නිරාවරණය වූ පුද්ගලයින්ගේ අනුමැතිය ලබා ගත නොහැකි නව ගිණුම් විවෘත කිරීමට සීමාවක් එකතු කර ඇත.

4. පහසුවෙන් භාවිතා කිරීම සඳහා දේශපාලන වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින් අනුමත කිරීම්වල මෘදු පිටපත් දත්ත කළමනාකරණ පද්ධතිය (ගනුදෙනුකරුවන් ලියාපදිංචිය, ගිණුම් විවෘත කිරීම සහ බැංකුවේ ලේඛන කළමනාකරණ පද්ධතිය) තුළ තබා ගැනීමට වෙනම ස්ථානයක් හඳුන්වා දී ඇත.
5. දත්ත කළමනාකරණ පද්ධතියෙහි ඊකියා කාණ්ඩ මෙන්ම මූලික බැංකුකරණ පද්ධතිය සමාලෝචනය කර මූල්‍ය බුද්ධි ඒකකය විසින් බෙදාගත් දේශපාලන වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින් ආශ්‍රිත ඊකියා කාණ්ඩ සමඟ එකතු කර ඇත.
6. සේවා නියුක්තිය හරහා දේශපාලන වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින් හඳුනාගැනීම ස්වයංක්‍රීය කිරීමට සහ ගනුදෙනුකරුවන් ලියාපදිංචියේදී දත්ත කළමනාකරණ පද්ධතියෙහි දේශපාලන වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින් අනුමත කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීමට සංවර්ධනය කරමින් පවතී.

දේශපාලන වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින්ගේ ගිණුම් අධීක්ෂණ ක්‍රියාවලිය සංවර්ධනය කරන ලද අතර එම කාර්යයන් සඳහා අනුකූලතාව, ශාඛා මෙහෙයුම් සහ ආයතනික කණ්ඩායම් නම් කර ඇත.

| | | | | |
|---|---|---|---|---|
| (iv) | බැංකුව සමඟ අභ්‍යාසලාභින් අත්සන් කරන ලද පුහුණු ගිවිසුමේ අංක 8.3 | මෙම වගන්තිය අනුව, ගිවිසුමේ අවසන් දිනට පෙර අභ්‍යාසලාභියකු තම ඊකියාව අවසන් කළහොත්, ඔහු/ඇය පුහුණු | වාර්තා කරන ලද අභ්‍යාසලාභීන් 11 දෙනා ඔවුන්ගේ පුහුණු ගිවිසුම අවසන් වීමට පෙර අවසන් කර ඇත. කෙසේ වෙතත්, බැංකුව | අදාළ රෙගුලාසියට අනුකූල වීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | දරන වගන්තිය | කිරීමේ පිරිවැය සහ බැංකුව විසින් දරනු ලබන අනෙකුත් වියදම් ලෙස තම ගිවිසුමට අදාළ මුදලක් ගෙවිය යුතුය. කෙසේ වෙතත්, රු. මිලියන 1.95 ක බැඳුම්කර වටිනාකම අයකර ගැනීමෙන් තොරව බැංකුව විසින් 2011 සිට 2020 දක්වා කාලය තුළදී අභ්‍යාසලාභීන් 11 දෙනෙකුට අදාළ පුහුණු ගිවිසුම් අවසන් කර තිබුණු බව නිරීක්ෂණය විය. | ඔවුන්ගේ ඉල්ලා අස්වීමේ ඉල්ලීම් සැලකිල්ලට නොගත් අතර, ඔවුන්ගේ පුහුණු බැඳුම්කර බැඳීම් සම්පූර්ණයෙන් නිරවුල් කරන තෙක් කිසිදු සේවා ලිපියක් හෝ නිදහස් කිරීමේ ලිපියක් නිකුත් නොකළ අතර ඔවුන්ගේ ඉල්ලා අස්වීම සම්පූර්ණ කර ඇති බව පිළිගෙන නොමැත. | |
| (v) | 2019 ඔක්තෝබර් 15 වැනි දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංශෝධිත 2014 ලංකා බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතෙහි 1.2.1 (ඇ) වගන්තිය | යෝජනාවන් සඳහා ඉල්ලුම් කිරීම (RFP) හි 3 වැනි වගන්තියට අනුව, “බැංකුවට අවශ්‍ය පරිදි ශාඛා 200 කදී පෝලිම් කළමනාකරණ පද්ධතිය (QMS) සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා විකුණුම්කරුවෙකු තෝරා ගැනීමට ලංකා බැංකුවට හැකියාව ලබා දීම සඳහා පමණක් මෙම යෝජනාවන් සඳහා ඉල්ලුම් කිරීම (RFP) සකස් කර ඇති බව සහ ඉහත සඳහන් යන්ත්‍ර සංඛ්‍යාව ඇඟවුම් කරන ලද යන්ත්‍ර සංඛ්‍යාවක් වන අතර තථ්‍ය සංඛ්‍යාව සඳහන් කර ඇති සංඛ්‍යාවෙන් සියයට 25 ක් දක්වා වෙනස් විය හැකි බව” බැංකුව පැහැදිලිව සඳහන් කර තිබුණි. කෙසේ වෙතත්, පෝලිම් කළමනාකරණ විසඳුම වසර 07 කට පෙර තෝරාගත් ශාඛා හතරක් සඳහා පමණක් යන්ත්‍ර සවි කර තිබූ අතර මේ දක්වා ශාඛා 200 න් ඉතිරි ශාඛා සඳහා මෙම පද්ධතිය සවි කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියේ අවශ්‍යතාවය සියයට 98 කින් අඩු විය. ඒ අනුව බැංකුව ශාඛා 200 ක අවශ්‍යතාවය ශාඛා 04 ක් දක්වා අඩුකර එම වගන්තියට පටහැනිව කටයුතු කර තිබුණි. ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල විෂය පථය අඩුවීම හේතුවෙන්, "සුදුසුකම් ඇති උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීමට සාධාරණ, සමාන සහ උපරිම අවස්ථාව සලසා දීම" යන එම වගන්තියේ දක්වා ඇති | නියමු ව්‍යාපෘතියක් ලෙස පෝලිම් කළමනාකරණ පද්ධතිය (QMS) ශාඛා 4 ක ස්ථාපනය කර ඇත. නියමු ව්‍යාපෘතියේ කාර්ය සාධනය මත පදනම්ව, බැංකුව කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදී. | මාර්ගෝපදේශයට අනුකූල වීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රසම්පාදනයේ මූලික අරමුණු උල්ලංඝනය කර තිබුණි. | | |
| (vi) | 2018 ඔක්තෝබර් 22 දිනැති තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටු රැස්වීම් සටහන අනුව. | ඉහත ව්‍යාපෘතිය පිරිනමන විට බැංකුව සමාගම සමඟ වාර්ෂික නඩත්තු ගිවිසුමකට එළැඹ වී නොතිබුණි. විධිමත් වාර්ෂික නඩත්තු ගිවිසුමක් නොතිබීම හේතුවෙන්, නියමු ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු බැංකුව මුහුණ දුන් ගැටළු සඳහා සමාගම නිසි ප්‍රතිචාර දක්වා නොමැති බව නිරීක්ෂණය විය. | මෙය නියමු ව්‍යාපෘතියක් බැවින් බැංකුව වාර්ෂික නඩත්තු ගිවිසුමකට එළැඹ වී නොතිබුණි. නියමු ව්‍යාපෘතිය අසාර්ථක විය. | අදාළ රෙගුලාසියට අනුකූල වීම අවශ්‍ය වේ. |
| (vii) | 2019 ඔක්තෝබර් 15 වැනි දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංශෝධිත 2014 ලංකා බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතෙහි 4.2.2 වගන්තිය | වගන්තියට අනුව, එක් එක් ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන කාලසටහන බැංකුව විසින් සකස් කර නොතිබුණි.<br>උදා :- පෝලිම් කළමනාකරණ විසඳුම් ප්‍රසම්පාදනය. | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් අංක 2014.11.18/1.2.08 ("වෙනස" පරිවර්තන ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ) අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විශේෂ ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ලෙස මෙම ප්‍රසම්පාදනය සිදු කර ඇත. | අදාළ රෙගුලාසියට අනුකූල වීම අවශ්‍ය වේ. |
| (viii) | 2019 ඔක්තෝබර් 15 වැනි දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංශෝධිත 2014 ලංකා බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතෙහි 4.2.1 (අ, ආ, ඇ, සහ ඈ) වගන්තිය | බැංකුවේ ප්‍රසම්පාදන කමිටුව පහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල වී නොතිබුණි.<br>- ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.<br>- අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂා කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්.<br>- විස්තරාත්මකව සකස් කරන ලද එළඹෙන වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්.<br>- මාස හයකට වඩා වැඩි නොවන කාල පරතරයන් සහිත නිතිපතා යාවත්කාලීන කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම. | කෙසේ වෙතත්, 2024 සිට 2026 දක්වා වසර 03 ක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත. | අදාළ රෙගුලාසියට අනුකූල වීම අවශ්‍ය වේ. |
| (ix) | 2019 ඔක්තෝබර් 15 වැනි දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංශෝධිත 2014 ලංකා බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතෙහි 8.1.1 (අ) වගන්තිය | වගන්තියට අනුව, බැංකුව විසින් වෙනත් ලංසුවල අන්තර්ගතය හෙළි නොකර තම ලංසුවේ ඇති විශේෂිත අඩුපාඩු පෙන්වා දෙමින්, සාර්ථක නොවීම සඳහා හේතු පිළිබඳව අගතියට පත් ලංසුකරුවන්ට දැනුම් දිය යුතුය. කෙසේ වෙතත්, එම වගන්තියට අනුව තෝරා නොගත් අනෙකුත් ලංසුකරුවන්ට බැංකුව | සටහන් කර ගෙන ඇත.<br>විශේෂ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ “වෙනස” ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මිලදී ගැනීම්/ව්‍යාපෘති ප්‍රසම්පාදනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. | අදාළ රෙගුලාසියට අනුකූල වීම අවශ්‍ය වේ. |

දැනුම් දී නොමැති බව නිරීක්ෂණය විය.

උදා :- පෝලිම් කළමනාකරණ විසඳුම් ප්‍රසම්පාදනය.

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තහවුරු කිරීම්වලට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු බදු වගකීම රු. මිලියන 5,802 ක් විය. කෙසේ වෙතත්, තක්සේරු කිරීම්වලට එරෙහිව අභියාචනා විභාග කිරීමේ ක්‍රියාවලියේ පවතින බැවින්, 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැංකුව විසින් රු. මිලියන 2,650 ක ප්‍රතිපාදනයක් පමණක් සලසා තිබුණි. | බැංකුවේ වාර්තාවලට අනුව, තක්සේරු කිරීම්වලට අදාළ බදු වගකීම රු. 2,638,002,412 ක් වූ අතර එය වාර්තාවේ සඳහන් කර ඇති රු. 5,802,010,266 සමඟ වෙනස් වේ. තථ්‍ය බදු වගකීම අනුව, කිසියම් දඩ මුදලක් හැර බැංකුව විසින් මේ දක්වා රු. 2,656,424,862 ක ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල සලසා ඇත. කෙසේ වෙතත්, අපගේ වාර්තා මත පදනම්ව පහත විෂමතා හඳුනාගෙන ඇත.<br>• 2019/2020 තක්සේරු වර්ෂය සඳහා මූල්‍ය සේවා මත වැට් බද්ද සඳහා නව තක්සේරුවක් 2022 දෙසැම්බර් 28 දින නිකුත් කර ඇති අතර 2017/2018 තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය නිකුත් කර ඇත. ඒ අනුව, 2017/2018 තක්සේරු වර්ෂය සඳහා රු. 1,636,147,809 ක් වූ අංක 7501718002 දරන තක්සේරුව සහ 2019/2020 තක්සේරු වර්ෂය සඳහා රු. 858,721,507 ක් වූ අංක 7501920001 දරන තක්සේරුව බැහැර කිරීමකින් තොරව ගෙවිය යුතු බදු සඳහා තක්සේරු දෙකක් නොසැලකිලිමත් ලෙස සලකා බැලූ බව දක්නට ලැබේ.<br>• තවද, බැංකු වාර්තාවලට අනුව, 2017/2018 තක්සේරු වර්ෂය සඳහා බදු වගකීමක් නොමැති අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් RAMIS හි වාර්තා ගැලපිය යුතුය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් ලැබිය යුතු රඳවා ගැනීමේ බදු සම්බන්ධයෙන් 2019/2020 තක්සේරු වර්ෂය සඳහා බදු අභියාචනා කොමිෂන් සභාවේ තීරණය ලැබීමට නියමිතය. එපමණක් නොව, 2020/2021 තක්සේරු වර්ෂය සඳහා රු. 779,681,406 ක් වූ ආදායම් බදු වගකීම අඩු කරන ලද අතර හිඟ ශේෂය රු. 404,319,230 ක් ලෙස වෙනස් කර යුතුය.<br>• අංක NBTFS/BFSU/2020/632 දරන ආපසු ගෙවීමේ (refund) තක්සේරුව සලකා බලන විට 2017/2018 තක්සේරු වර්ෂය සඳහා හඳුනාගත් මූල්‍ය සේවා බදු වගකීම් මත ජාතිය ගොඩනැගීමේ බද්ද රු. 9,264,519 ක් විය යුතුය. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් ප්‍රතිපාදන සැලසීම අවශ්‍ය වේ. |

## 1.9 තොරතුරු තාක්ෂණ පොදු පාලන ක්‍රම

### 1.9.1.1 තොරතුරු තාක්ෂණ පොදු පාලන ක්‍රමවල අඩුපාඩු

<table>
<tr><th></th><th>විගණන නිරීක්ෂණය</th><th>කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(i)</td><td>ICBS හි "පෙළ", ස්මාර්ට් ප්‍රේෂණ පද්ධතියේ "පරිශීලක නාමය", වෙළඳ මූල්‍ය පද්ධතිය, MCS Outward පද්ධතිය, IFRS පද්ධතිය හා IRMS පද්ධතිය සහ Sky Lease පද්ධතියේ "නිලධාරී හැඳුනුම්පත" මත පදනම්ව ඇතැම් පරිශීලක ගිණුම් ද්විගුණනය කර මූල්‍ය වර්ෂය තුළදී සක්‍රීයව පැවතුණි.</td><td>නිවැරදි කර ඇත.</td><td>වැළැක්වීමේ පියවර යෙදීම අවශ්‍ය වේ.</td></tr>
<tr><td>(ii)</td><td>ICBS, Sky Lease, MCS Outward සහ MCS Inward පද්ධතිවල ඉල්ලා අස්වූ/මාරු කරන ලද/විශ්‍රාමික සේවකයින්ගේ පරිශීලක ගිණුම් කාලීනව අක්‍රිය කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියා පටිපාටි නොමැති වීම සහ එය ව්‍යාපාර ගනුදෙනු සඳහා වගකීම් වෙන් කිරීමේදී සැලකිය යුතු ගැටළුවලට හේතු විය හැක.</td><td>නිවැරදි කර ඇත.</td><td>වැළැක්වීමේ පියවර යෙදීම අවශ්‍ය වේ.</td></tr>
<tr><td>(iii)</td><td>ජාලය තුළ සහ ඉන් පිටත සම්ප්‍රේෂණය වන දත්ත කළමනාකරණය කිරීමට සහ රහස්‍ය දත්ත සමාගම තුළ සහ ඉන් පිටත අනවසර පාර්ශ්ව වෙත සම්ප්‍රේෂණය නොකෙරෙන බව සහතික කිරීමට ස්වයංක්‍රීය යාන්ත්‍රණයක් ලෙස දත්ත තත්‍ය කාලීනව නිරීක්ෂණය කිරීමට බැංකුව විසින් දත්ත හානිවීම වැළැක්වීමේ (DLP) විසඳුමක් භාවිතා නොකරයි.</td><td>දත්ත හානිවීම වැළැක්වීමේ (DLP) නියෝජිතයා එළිදැක්වීම සම්පූර්ණ කර ඇත.<br>ඊමේල් ඒකාබද්ධ කිරීම සිදු කරමින් පවතී.<br>සම්පූර්ණ කිරීම සඳහා ඉලක්කගත දිනය: 2024/12/31</td><td>දත්ත හානිවීම වැළැක්වීමේ (DLP) විසඳුම තිබිය යුතුය.</td></tr>
<tr><td>(iv)</td><td>බැංකුව විසින් පහත දැක්වෙන දත්ත සමුදාය කළමනාකරණ පද්ධති අනුවාදයන් භාවිතා කරන අතර, එය අවසාන ආධාරක (End of Support)) සහතික කොන්දේසිවල පවතී. ඒ සඳහා සේවා සපයන්නාගෙන් ආරක්ෂක යාවත්කාලීන කිරීම්/ පැච්වස් කිසිවක් නොලැබේ.<br>අනුවාදය දැනටමත් සම්මත ආධාරක අවසානයේ (End of standard support) පවතින බැවින්, මුල් උපකරණ නිෂ්පාදකයාට (Original Equipment Manufacturer) දුර්වලතා සහ ආරක්ෂක තර්ජන සඳහා කිසිදු ආරක්ෂක යාවත්කාලීන කිරීම්/පැච්වස් සැපයීමට නොහැකි වනු ඇත. එම නිසා ද්වේෂසහගත ප්‍රහාරකයින් හෝ අනවසරයෙන් ඇතුල්වන්නන් විසින් ප්‍රයෝජනයට ගත හැකි දුර්වලතා විවෘතව පැවතිය හැකිය.<br>
<table>
<tr><th>තොරතුරු තාක්ෂණ යෙදුම</th><th>අනුවාදය</th><th>අවසාන ආධාරක දිනය (වර්ෂය/ මාසය/ දිනය)</th></tr>
<tr><td>Finacle Treasury, Sky Lease, Prime4, අන්තර්ජාල බැංකුකරණය,</td><td>Oracle 11g</td><td>2020/12/31</td></tr>
</table>
</td><td>• Finacle Treasury<br>Finacle Treasury විසඳුම වැඩිදියුණු කිරීම සිදු කරමින් පවතී.<br>සම්පූර්ණ කිරීම සඳහා ඉලක්කගත දිනය: 2025/06/30<br><br>• Sky Lease<br>වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇති අතර, එය දැනට පරිශීලක පිලිගැනීමේ පරීක්ෂණ (UAT) අදියරේ පවතී.<br>සම්පූර්ණ කිරීම සඳහා ඉලක්කගත දිනය: 2024/12/31<br>• Prime 4<br>වත්මන් පද්ධතිය එහි නවතම අනුවාදයට වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන්</td><td>හැකි ඉක්මනින් වැඩිදියුණු කිරීම් සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ.</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| IFRS,<br>IRMS සහ<br>MCS Inward | | | | කළමනාකාරිත්වය සහ විකුණුම්කරු යන දෙපාර්ශවය සාකච්ඡා ආරම්භ කර ඇත. 2025 වර්ෂය අවසන් වන විට කාර්යය අවසන් වනු ඇත.<br>• **අන්තර්ජාල බැංකුකරණය**<br>දැනට අපි අන්තර්ජාල සහ ජංගම බැංකුකරණ පද්ධතිය සඳහා නව විසඳුමක් තෝරාගැනීමේ ක්‍රියාවලියක යෙදී සිටී. එබැවින්, නව විසඳුම ක්‍රියාත්මක කිරීමෙන් පසු වත්මන් ක්‍රමය අවසන් වනු ඇත.<br>**සම්පූර්ණ කිරීම සඳහා ඉලක්කගත දිනය:** 2024/12/15 (ශාඛා මොඩියුලය සඳහා)<br>• **IFRS/IRMS**<br>අපි විකුණුම්කරුට දන්වා ඇති අතර දත්ත සමුදාය (DB) අනුවාදය Oracle 19c වෙත වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇත.<br>• **MCS Inward**<br>Oracle 19c වෙත වැඩිදියුණු කරනු ඇත. මෙම කාර්යය 2024 දෙසැම්බර් අවසන් වන විට අවසන් කරනු ඇත.<br>• **MCS Outward**<br>MS SQL 2016, MS SQL 2019 වෙත 2024 දෙසැම්බර් අවසන් වන විට වැඩිදියුණු කරනු ඇත.<br>• **HCM**<br>දත්ත සමුදා සංක්‍රමණ ක්‍රියාවලිය විකුණුම්කරු සමඟ සිදු කරමින් පවතී.<br>**සම්පූර්ණ කිරීම සඳහා ඉලක්කගත දිනය:** 2024/12/31<br>• **Notiva** |
| MCS Outward | MS SQL 2016 | 2021/07/13 | | |
| HCM | | | | |
| Notiva | Oracle 12c | 2022/07/31 | | |

| | | | |
|---|---|---|---|
| | | තාක්ෂණ තොගය සහ එහි අනුකූලතා Metrix තහවුරු කිරීමෙන් පසුව Oracle දත්ත සමුදා අනුවාදය (19C) සංක්‍රමණය කිරීමට සැලසුම් කර ඇත.<br>**සම්පූර්ණ කිරීම සඳහා ඉලක්කගත දිනය:** 2025.06.30 | |
| (v) | **යල් පැන ගිය මෙහෙයුම් පද්ධති - Sky Lease, Prime4 සහ Finacle Treasury පද්ධති**<br>බැංකුව විසින් පහත දැක්වෙන මෙහෙයුම් පද්ධති අනුවාදයන් භාවිතා කරන අතර, එය අවසාන ආධාරක (End of Support) සහතික කොන්දේසිවල පවතී. ඒ සඳහා සේවා සපයන්නාගෙන් ආරක්ෂක යාවත්කාලීන කිරීම්/ පැච්වස් කිසිවක් නොලැබේ.<br>අනුවාදය දැනටමත් සම්මත ආධාරක අවසානයේ (End of standard support) පවතින බැවින්, මුල් උපකරණ නිෂ්පාදකයාට දුර්වලතා සහ ආරක්ෂක තර්ජන සඳහා කිසිදු ආරක්ෂක යාවත්කාලීන කිරීම්/පැච්වස් සැපයීමට නොහැකි වනු ඇත. එම නිසා ද්වේෂසහගත ප්‍රහාරකයින් හෝ අනවසරයෙන් ඇතුල්වන්නන් විසින් ප්‍රයෝජනයට ගත හැකි දුර්වලතා විවෘතව පැවතිය හැකිය. | • **Sky Lease**<br>වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇති අතර, එය දැනට පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ (UAT) අදියරේ පවතී.<br>**සම්පූර්ණ කිරීම සඳහා ඉලක්කගත දිනය::** 2024/12/31<br>• **Prime 4**<br>වත්මන් පද්ධතිය එහි නවතම අනුවාදයට වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය සහ විකුණුම්කරු යන දෙපාර්ශවය සාකච්ඡා ආරම්භ කර ඇත. 2025 වර්ෂය අවසන් වන විට කාර්යය අවසන් වනු ඇත. | හැකි ඉක්මනින් වැඩිදියුණු කිරීම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය වේ. |

| **පද්ධතිය** | **අනුවාදය** | **අවසාන ආධාරක දිනය (වර්ෂය/ මාසය/ දිනය)** |
|---|---|---|
| Sky Lease | Oracle Linux 5.6 | 2022/07/06 |
| Prime4 | Windows Server 2008 R2 | 2020/01/14 |

### 1.9.2 මාලදිවයිනේ ගෙවීම් පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | මාලදිවයිනේ ගෙවීම් පද්ධති සංවර්ධන (MPSD) ව්‍යාපෘතිය මාලදිවයිනේ ක්ෂණික ගෙවීම් පද්ධතියක් ස්ථාපිත කිරීමේ අරමුණින් මාලදිවයිනේ මූල්‍ය අධිකාරිය (MMA) විසින් ආරම්භ කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පසු මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් සමාගමක් තෝරාගෙන තිබුණි. පිරිනැමීමේ ලිපිය නිකුත් කර මාස 06 කට පසු 2022 ජූලි | සටහන් කර ගන්නා ලදී. පිරිනැමීමේ ලිපිය එපික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2021.12.14 දින පිළිගෙන ඇත. පිරිනැමීමේ ලිපියේ වගන්තිවලට අනුව ඉහත පිළිගැනීම සමඟ | ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට අනුගත වීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| | 05 වැනි දින බැංකුව සමාගම සමඟ ගිවිසුමකට එළඹී තිබුණි. | බැංකුව සහ එපික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් අතර නීතිමය ගිවිසුමක් නිර්මාණය කර ඇත. මාලදිවයිනේ මුල්‍ය අධිකාරිය (MMA) විසින් කලින් කලට මූලික විෂය පථයට සහ නීති දෙපාර්තමේන්තුව ඇතුළත් බැංකුවේ සහ විකුණුම්කරු වන එපික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් හි අභ්‍යන්තර ක්‍රියාදාමයන් වෙත කරන ලද වෙනස්කම් සහ ඊට අදාළ ව්‍යාපාරික අංශයේ අදහස් දැක්වීම් හේතුවෙන්, ගිවිසුම ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. කෙසේ වෙතත්, නියාමකයාගේ (MMA) හදිසි අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පිරිනැමීමේ ලිපිය භාර ගැනීමෙන් පසු ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. |
| (ii) | ලංසු ලේඛනයේ කොන්ත්‍රාත් දත්ත (VII කොටස) අනුව, මිලදී ගැනීමේ ඇණවුම නිකුත් කළ දින සිට මාස 02 ක් ඇතුළත මෘදුකාංග ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කළ යුතුය. කෙසේ වෙතත්, ලංසුකරු විසින් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර බැංකුවට ලබා දුන් ව්‍යාපෘති සැලැස්මට අනුව, මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට දින 156 (ආසන්න වශයෙන් මාස 05 ක්) ගත වනු ඇති බව සඳහන් විය. | විකුණුම්කරු විසින් ලංසු ලේඛනය සමඟ දින 59 ක කාල සීමාවක් සහිත ව්‍යාපෘති සැලැස්මක් ඉදිරිපත් කර ඇතත්, කොවිඩ් 19 බලපෑම සහ මාලදිවයිනේ මුල්‍ය අධිකාරිය විසින් ව්‍යාපෘති විෂය පථයට සිදු කරන ලද විවිධ වෙනස්කම් හේතුවෙන් බැංකුව විකුණුම්කරු සමඟ ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද විය. එබැවින්, 2022.07.05 දින ගිවිසුම් අත්සන් කිරීමේදී දින 156 ක කාලසීමාවක් සහිතව මාලදිවයිනේ මුල්‍ය අධිකාරිය හි යාවත්කාලීන අවශ්‍යතාවය සපුරාලීම සඳහා විකුණුම්කරු විසින් සංශෝධිත ව්‍යාපෘති සැලැස්මක් ඉදිරිපත් කර ඇත. |

| | | |
|---|---|---|
| (iii) | ලංසු ලේඛනයේ කොන්ත්‍රාත් දත්ත (VII වගන්තිය) අනුව, කාර්ය සාධන සුරැකුම් මුදල කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10 ක් විය යුතු අතර සමාගම විසින් බැංකුව වෙත ඉදිරිපත් කරන ලද කාර්ය සාධන සුරැකුම 2023 අප්‍රේල් 10 දිනෙන් අවසන් වී තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව, කාර්ය සාධන සුරැකුම කල් ඉකුත් වී මාස 17 කට වැඩි කාලයක් ගතවී ඇතත් බැංකුව අලුත් කාර්ය සාධන සුරැකුමක් ලබාගෙන නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. බැංකුව විසින් විකුණුම්කරුට වරින් වර සිහි කැඳවීම් යවා ඇත. ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු විකුණුම්කරු මුළු ගෙවීම ඉල්ලා සිටියද, ගෙවීම් සන්ධිස්ථානයට අනුව බැංකුව මුළු කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 30 ක් පමණක් ගෙවා තිබුණි. |
| (iv) | එපික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට එරෙහිව වෙනත් ක්ෂේත්‍රවලට සම්බන්ධ විමර්ශනයක් හේතුවෙන්, ව්‍යාපෘති සංවර්ධනය සඳහා මෙම සමාගම තෝරා ගැනීම සම්බන්ධයෙන් බැංකුව 2021 ඔක්තොම්බර් 29 දිනැති ලිපියක් මගින් ශ්‍රී ලංකා තොරතුරු සන්නාවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) වෙතින් උපදෙස් ඉල්ලා තිබුණි. ඒ අනුව, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලන ලෙස ශ්‍රී ලංකා තොරතුරු සන්නාවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් 2021 නොවැම්බර් 16 දිනැති ලිපිය මගින් ප්‍රතිචාර දක්වා තිබුණි. කෙසේ වෙතත්, ඒ අනුව බැංකුව විසින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලා ඇති බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. |
| (v) | ලංසු ලේඛනයේ කොන්ත්‍රාත් කොන්දේසිවල 23 වැනි වගන්තිය (VI වගන්තිය) අනුව, නිෂ්පාදනයට හෝ අත්පත් කර ගැනීමට, ප්‍රවාහනයට, ගබඩා කිරීමට සහ බෙදා හැරීමට ආනුෂංගික අලාභ හෝ හානිවලට එරෙහිව කොන්ත්‍රාත්තුව යටතේ සපයනු ලබන භාණ්ඩ සම්පූර්ණයෙන්ම රක්ෂණය කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම එවැනි රක්ෂණ ආවරණයක් ලබාගෙන නොමැති බවත් බැංකුව ඒ පිළිබඳව පසු විපරම් කර නොමැති බවත් නිරීක්ෂණය විය. | සටහන් කර ගන්නා ලදී. |
| (vi) | තවද, 2014 බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතෙහි 8.1.1 (අ) වගන්තියට අනුව, අනෙකුත් ලංසුවල අන්තර්ගතය හෙළි නොකර තම ලංසුවෙහි ඇති නිශ්චිත අඩුපාඩු පෙන්වා දෙමින්, සාර්ථක නොවීම සඳහා හේතු පිළිබඳව අගතියට පත් ලංසුකරුට බැංකුව දැනුම් දිය යුතුය. කෙසේ වෙතත්, සැලකිල්ලට නොගත් අනෙකුත් ලංසුකරුවන්ට බැංකුව ඉහත පරිදි දැනුම් දී නොමැති බව නිරීක්ෂණය විය. | සටහන් කර ගන්නා ලදී. |

| | | |
|---|---|---|
| (vii) | 2022 අගෝස්තු 18 දිනැති අංක MIS/2022/1678 දරන ලිපියට අනුව, මාලදිවයිනේ මුල්‍ය අධිකාරිය (MMA) විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ව්‍යාපෘතියේ යෙදුම් ක්‍රමලේඛන අතුරුමුහුණත් (Application Programming Interfaces -API) සංවර්ධනය 2022 සැප්තැම්බර් 20 වන විට සම්පූර්ණ කර තිබිය යුතුය. කෙසේ වෙතත්, මාලදිවයිනේ මුල්‍ය අධිකාරිය (MMA) විසින් ලබා දුන් කාලසීමාව සපුරාලීමට බැංකුවට නොහැකි වූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව මාලදිවයිනේ මුල්‍ය අධිකාරිය (MMA) හි උපදෙස්වල ව්‍යාපෘතියේ යෙදුම් ක්‍රමලේඛන අතුරුමුහුණත් (API) අවශ්‍යතාවයට අනුකූල නොවීම හේතුවෙන් 2022 ඔක්තෝබර් 06 දිනැති අංක MIS/2022/2153 දරන නිවේදනයට අනුව පරිපාලන දඩයක් ලෙස මාලදිවයින් රුපියල් 95,000 (95,000x23.348=රු. 2,218,060) ක් 2022 නොවැම්බර් 06 දින ගෙවා තිබුණි. | නිවැරදි කර ඇත. 2023.11.08 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබා ගෙන ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

**2.2**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 26,694 ක ලාභයක් වූ අතර ඊට අනුරූප පසුගිය වර්ෂයේ ලාභය රු. මිලියන 31,972 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 5,278 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

**2.3 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

| විස්තර | විචල්‍ය මුදල වැඩි වීම/ (අඩු වීම( (රු .මිලියන) | විචලනය % | විචල්‍යතාවයට හේතුව |
|---|---|---|---|
| පොලී ආදායම | 68,530 | 15 | සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළදී, බැංකුවේ ණය සහ අත්තිකාරම් කළඹ සුළු අඩුවීමක් අත්විඳින ලද අතර පොලී අනුපාතවල සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි. මෙම ප්‍රවණතා තිබියදීත්, බැංකුව ණය සහ අත්තිකාරම්වලින් ලබාගත් පොලී ආදායමේ වැඩි වීමක් වාර්තා කර ඇත. පමා සහන කාල සීමාව ඉකුත්වීම මෙම ඉහළ යාමට මූලික වශයෙන් දායක වී ඇත.<br>රජය සතු මූල්‍ය ආයතනයක් ලෙස, අපගේ ණය කළඹේ සැලකිය යුතු කොටසක් මෙම පමා සහනයන්ට යටත් විය. මෙම සහන ක්‍රියාමාර්ගවල අවසන් වීම පොලී ආදායමේ පුනර්ජීවනයට හේතු වී ඇත.<br>ණය ශේෂවල සමස්ත හැකිලීමක් තිබුණද, උකස් තැරැව්කාර සේවා සහ ක්‍රෙඩිට් කාඩ් පහසුකම් වැනි ඉහළ පොලී සහිත නිෂ්පාදනවල ශේෂවල වර්ධනයක් බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත. මෙම කාලය සඳහා පොලී ආදායම ඉහළ නැංවීමට මෙම සාධක සාමූහිකව දායක විය. |

| | | | |
|---|---|---|---|
| පොලී වියදම | 103,689 | 31.4 | බැංකුවේ පොලී වියදම ප්‍රධාන වශයෙන් ස්ථාවර තැන්පතු හිමියන්ට කරන ගෙවීම් වලින් සමන්විත වේ. වසර පුරා පොලී අනුපාතවල අඩුවීමක් තිබියදීත්, මූලික වශයෙන් පහත සඳහන් කරුණු හේතුවෙන් බැංකුව පොලී වියදම්වල වැඩි වීමක් අත්විඳ ඇත.<br>2022 දෙවන කාර්තුවේ අවසාන භාගයේදී, බැංකුව දින 100 සිට 400 දක්වා කාලසීමාවන් සහිත නව ස්ථාවර තැන්පතු නිෂ්පාදන හඳුන්වා දුන් අතර, ගනුදෙනුකරුවන්ට සැලකිය යුතු ඉහළ පොලී අනුපාත පිරිනමා ඇත. අපගේ ගනුදෙනුකරුවන්ගෙන් බහුතරයක් දින 300 සහ 400 කාල සීමාවන් සහිත ස්ථාවර තැන්පතු සඳහා තෝරාගෙන ඇත. මෙම තැන්පතු ආශ්‍රිත පොලී වියදම් 2022 මූල්‍ය වාර්තාවලට මෙන්ම 2023 මූල්‍ය වාර්තාවලටද බලපා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙය බැංකුවේ පොලී වියදම් ඉහළ යාමට හේතු වී ඇත. |
| ණය හා වෙනත් අලාභ සඳහා හානිකරණ ගාස්තු/(ආපසු හැරවීම) | (92,061) | (105.6) | දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව, ශ්‍රී ලංකා රජය විසින් විදේශ මුදලින් නාමනය කරන ලද ණය ශ්‍රී ලංකා රුපියල් ණය බවට පරිවර්තනය කිරීමට කටයුතු කර ඇත. 2023 දී, බැංකුව සිය විදේශ මුදල් බැංකු ඒකකය (FCBU) එ.ජ.ඩො වලින් නාමනය කරන ලද ණය රුපියල් ණය බවට පරිවර්තනය කිරීමට රජය සමඟ ගිවිසුමකට එළඹ වී ඇත. මෙම පරිවර්තනය මෙම ණය සඳහා කලින් කරන ලද ප්‍රතිපාදන සැලකිය යුතු ලෙස ආපසු හැරවීමට හේතු වී ඇත.<br>මෙම ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස සහ පසුව සිදු කරන ලද පරිවර්තනයේ ප්‍රතිඵලයක් ලෙස, වත්මන් වර්ෂය සඳහා වන හානිකරණ ගාස්තුව ආපසු හැරවීමක් බැංකුව විසින් හඳුනාගෙන ඇත. මෙම ගැලපීම අඩු වූ ණය අවදානම පිළිබිඹු කරන අතර රජයේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ මූලපිරීමෙන් පසුව ණය කළඹේ යාවත්කාලීන කළ තක්සේරුව සමඟ සමපාත වේ. |
| ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම් | (21,743) | (132.7) | 2022 සිට 2023 දක්වා ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායමේ සැලකිය යුතු අඩුවීම සඳහා පහත සාධක කිහිපය හේතු විය හැකිය.<br>1. වෙළඳාමෙන් ශුද්ධ ලාභ/(පාඩු) : වෙනත් මෙහෙයුම් ආදායමට ඇතුළත් වන වෙළඳාමෙන් ශුද්ධ ලාභ/(අලාභ) වල සැලකිය යුතු අඩුවීමක් සිදු විය. විනිමය අනුපාත පහත වැටීම සහ එය විදේශ මුදල්වල අගය අඩු වීමට හේතු වීම මෙම අඩුවීමට මූලික වශයෙන් හේතු විය.<br>2. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමින් (Fair Value Through Profit or Loss) යුත් මූල්‍ය උපකරණවලින් ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභ/(අලාභ) : ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය උපකරණවලින් ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභ/(අලාභ) අඩුවීමක් දක්නට ලැබිණි. වර්ෂය තුළදී ස්කන්ධ කොටස් සහ ඒකක භාරවල වෙළඳපල වටිනාකම අඩුවීම මෙම පහත වැටීමට හේතු විය.<br>3. ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම : මූලික වශයෙන් 2023 වර්ෂයේදී සිදු වූ ප්‍රතිඇගයීම් අලාභ හේතුවෙන් ශුද්ධ අනෙකුත් මෙහෙයුම් ආදායම් කාණ්ඩය ද පහත වැටීමක් අත්විඳ ඇත. |

## 2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂය සඳහා බැංකුවේ ඇතැම් වැදගත් අනුපාත පහත දැක්වේ.

| විස්තර | කර්මාන්තයේ අනුපාතය * | බැංකුව 2023 | බැංකුව 2022 |
|---|---|---|---|
| **කාර්ය සාධන අනුපාත** | | | |
| ස්කන්ධය මත ප්‍රතිලාභ ( (ROE) | 10.9 | 10.6 | 14.1 |
| වත්කම් මත ප්‍රතිලාභ ( (ROA) | 1.0 | 0.9 | 0.8 |
| පොලී ආන්තිකය | 3.1 | 2.1 | 3.1 |
| **වත්කම්වල ගුණාත්මක අනුපාතය** | | | |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත** | | | |
| ස්ථර 1 ප්‍රාග්ධනය (අවම සියයට 10 ) | 13.1 | 12.41 | 12.4 |
| මුළු ප්‍රාග්ධනය (අවම සියයට 14 ) | 16.7 | 15.38 | 15.4 |
| ව්‍යවස්ථාපිත අනුපාත (අවම අවශ්‍යතාව සියයට 20) | | | |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය (දේශීය) | 33.8 | 42.8 | 21.2 |

* ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද වාර්ෂික තොරතුරුවලින් කර්මාන්තයේ අනුපාත උපුටා ගෙන ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

**විගණන නිරීක්ෂණය**

(i) අවදානම් මට්ටමේ වර්ගීකරණය සමඟ 2022 සහ 2023 වර්ෂ තුළදී සිදු වූ තථ්‍ය පාඩු සහ පාඩු සඳහා ප්‍රතිපාදන පහත පරිදි වේ;

| පාඩු සිදුවීම | 2023 වර්ෂය කපා හරින ලද / ප්‍රතිපාදන සලසා ඇති මුදල | 2023 වර්ෂය මුළු පාඩු සිදුවීමෙන් ප්‍රතිශතය (%) | 2022 වර්ෂය කපා හරින ලද / ප්‍රතිපාදන සලසා ඇති මුදල | 2022 වර්ෂය මුළු පාඩු සිදුවීමෙන් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| ව්‍යාපාර කඩාකප්පල් වීම සහ පද්ධති අසාර්ථකත්වයන් | 11,983,450 | 14.12 | 607,041 | 0.07 |
| ගනුදෙනුකරුවන්, නිෂ්පාදන සහ ව්‍යාපාර පිරිවයන් | 51,796,510 | 61.03 | 7,962,567 | 0.98 |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

වාර්තා වී ඇති අලාභ සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර අදාළ පොදු ලෙජර ගිණුම්වල සටහන් කර ඇති කපා හැරීම් අදාළ කමිටුවල නිර්දේශ මත සිදු කර ඇත.වාර්තා කරන ලද සමහර පාඩු/ප්‍රතිපාදන විමර්ශන වාර්තා අවසන් කිරීම සහ රක්ෂණ හිමිකම් අවසන් කිරීම මත යටත් වේ. යම් පාඩුවක් කපා හැරීමෙන් පසුව පවා බැංකුව තවමත්

**නිර්දේශය**

අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි දැඩි ලෙස පිළිපැදීම අවශ්‍ය වන අතර ඒවායේ අනුකූලතාවය නිරීක්ෂණය කිරීමට යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

| | | | | |
|---|---|---|---|---|
| ක්‍රියාත්මක කිරීම, භාරදීම සහ ක්‍රියාවලි කළමනාකරණය | 13,024,994 | 15.35 | 730,758,809 | 89.86 |
| බාහිර වංචාව | 7,115,068 | 8.38 | 6,149,982 | 0.76 |
| අභ්‍යන්තර වංචාව | 945,598 | 1.11 | 67,776,684 | 8.33 |
| **එකතුව** | **84,865,620** | | **813,255,083** | |

ඉහත විස්තරවලට අනුව 2023 වර්ෂයේදී මුළු තථ්‍ය පාඩු සහ පාඩු සඳහා ප්‍රතිපාදන අඩු වී තිබුණු අතර, 2022 දී සිදු කරන ලද වංචනික මාරුකිරීම් සහ මහාධිකරණ නඩු සඳහා අමතර ප්‍රතිපාදන සැලසීම් මෙම වර්ෂයේ සිදු නොකිරීම ඊට හේතු වී ඇත. ව්‍යාපාර කඩාකප්පල් වීම් හා පද්ධති අසාර්ථකත්වයන්, ගනුදෙනුකරුවන්, නිෂ්පාදන හා ව්‍යාපාර පරිචයන්ගෙන් ලද පාඩු පසුගිය වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය තුළදී සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණි. වොල්ට්‍රාන්ස් ස්පා - ඉතාලිය හි අංක 9575777 දරන යුරෝ ගිණුම මත තාවකාලික අයිරා පොලියක් ලෙස එකතු කරන ලද යුරෝ 125,000 ක් ආපසු ගෙවීම සඳහා රු. මිලියන 44.806 ක ප්‍රධාන ප්‍රතිපාදනයක් සලසා තිබුණු අතර එය ගනුදෙනුකරුවන්, නිෂ්පාදන සහ ව්‍යාපාර පරිචයන් යන පාඩු සිදුවීම යටතේ වර්ගීකරණය කර තිබුණි. වොල්ට්‍රාන්ස් ස්පා 2009 වසරේ සිට බැංකුවේ ප්‍රේෂණ හවුල්කරුවෙකු වන අතර ඉතාලියේ එකම සක්‍රීය හුවමාරු සමාගමකි. වොල්ට්‍රාන්ස් ස්පා හි අංක 9575777 දරන ගිණුමේ 2023 ජූලි 10 දිනට යුරෝ 993,924.53 ක අයිරා ශේෂයක් තිබූ අතර සමාගම 2023 මාර්තු 31 වන දින තම ව්‍යාපාරය නතර කර තිබුණි. සමාගම සමඟ දීර්ඝ කාලයක් තිස්සේ පවතින අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සුවිශේෂී සබඳතාව හඳුනා ගනිමින් සහ සමාගම සැලකිල්ලට ගනිමින්, අංක 9575777 දරන යුරෝ ගිණුම මත තාවකාලික අයිරා පොලියක් ලෙස එකතු කර ඇති යුරෝ 125,000 ක් ආපසු ගෙවීමට 2023 ජූලි 28 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සටහන් අංක 2023.07.28/2.18 මගින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැති ලබා දී තිබුණි. ඊට අමතරව, ව්‍යාපාර කඩාකප්පල් වීම් හා පද්ධති අසාර්ථකත්වයන් යටතේ වර්ගීකරණය කර ඇති මූලික බැංකුකරණ පද්ධති කාල ගතවීම (core banking system timeout) හේතුවෙන් අසාර්ථක වූ CEFT ගනුදෙනු සඳහා සලසා ඇති රු. මිලියන 10.549 ක ප්‍රතිපාදනය සහ පොට්ට(dud)/ ව්‍යාජ රන් භාණ්ඩ සඳහා සලසා රු. මිලියන 7.076 ක ප්‍රතිපාදන 2023 වර්ෂය තුළදී සිදු වූ අලාභ සිදුවීම් සඳහා දායක වී තිබුණි.

අයකර ගැනීමේ ක්‍රියාවලිය සිදු කරයි. ඊට අමතරව, බැංකුව තුළ වඩා හොඳ අභ්‍යන්තර පාලනයක් සහතික කිරීම සඳහා පාලනයන් පිහිටුවා ඇත.

<u>**වොල්ට්‍රාන්ස් ස්පා හි හිඟ මුදල් සඳහා සලසා ඇති ප්‍රතිපාදන**</u>

බැංකුව සමාගමට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් සිටී. නීතිමය කටයුතු ආරම්භ කිරීම සඳහා ඉතාලිය පදනම් කරගත් නීතිමය සමාගමක් තෝරාගෙන ඇත.

<u>**අසාර්ථක CEFT ගනුදෙනු සඳහා සලසා ඇති ප්‍රතිපාදන**</u>

- අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර මේ වන විට අයකර ගැනීම සඳහා ඉතිරිව ඇති ශේෂය රු.10,108,136.94 ක් දක්වා අඩු කර ඇත.
- හිඟ මුදල් අයකර ගැනීම සඳහා රක්ෂණ හිමිකම් ගොනු කර ඇති අතර එය සිදු කරමින් පවතී.
- 2023.04.28 දින මෙම ගැටලුව නිවැරදි කිරීමට විසඳුමක් ගෙන ඇති අතර ඉන් පසුව එවැනි ගනුදෙනුවක් සිදුවී නොමැත.

(ii) 2021 මූල්‍ය වර්ෂයේදී ව්‍යාජ චෙක්පත් සහ වංචා ගිණුම් (පොදු ලේජර අංක 22310122) මත වෙන්කිරීම් සඳහා අය කරන ලද සමහර පද්ධති අසාර්ථක වීම් හේතුවෙන් පොදු ලෙජර් ශේෂය සහ බැංකුවේ වෙළඳ මූල්‍ය පද්ධතියේ හිඟ ශේෂයන් අතර වූ රු.මිලියන

හිඟ පොලී පිළිබඳ තවදුරටත් සැසඳීමක් සිදු කෙරේ. 2024.09.30 දිනට

සැසඳූ ශේෂයන් නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

397.57 ක වෙනස සඳහා මුළු ප්‍රතිපාදන සලසා ඇතත්, 2023 වර්ෂය අවසානය දක්වා එම ශේෂයන් සැසඳීමට කටයුතු කර නොතිබුණි.

සැසඳීමේන සියයට 90 කට වඩා අවසන් කර ඇත. ඉතිරි සැසඳීම 2024.11.15 දිනට පෙර අවසන් කරනු ලබන අතර 2024.11.30 දිනට පෙර ප්‍රතිපාදනය ආපසු හැරවීමට කළමනාකාරීත්ව අනුමැතිය ලබාගනු ඇත.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**විගණන නිරීක්ෂණය**

**3.2.1 උකස බේරා ගත් (Foreclosed) දේපල**

නිරෝධායන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා 2020 සහ 2021 වසරවලදී පහත පවරා ගත් දේපළ 06 ක් ශ්‍රී ලංකා යුධ හමුදාවට තාවකාලිකව භාර දී තිබුණි. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සහ ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් කරන ලද ඉල්ලීමකට අනුව පිළිවෙළින් 2020 දෙසැම්බර් 03 දින (අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් අංක 2020.12.03/11.5.02) සහ 2021 මාර්තු 18 (අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් අංක 2021.03.18/9.8.01) යන දිනවලදී දේපළ හයක් තාවකාලිකව භාර දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආවරණ අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, දේපල නැවත අත්පත් කර ගැනීම හෝ පවරා ගත් දේපල සඳහා හිමිකම් පෑම සහ අදාළ අක්‍රීය පහසුකම්වල හිඟ ශේෂයන් පියවීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රමාදයන් හඳුනාගෙන තිබුණි.

| දේපලෙහි නම | භාර දුන් දිනය | අධ්‍යක්ෂම ණ්ඩලය අනුමත කරන දිනය | තක්සේරු වටිනාකම (රු. මිලියන) |
|---|---|---|---|
| ට්‍රයි-ස්ටාර්, අංක 30, මාලිගාව පාර, රත්මලාන | 2020.11.06 | 2020.12.03 | 441.6 |
| ට්‍රයි ස්ටාර්, අංක 154, කටුබැද්ද පාර, මොරටුව | 2021.02.16 | 2021.03.18 | 120.2 |
| ට්‍රයි ස්ටාර්, අංක 88, මාලිගාව පාර, රත්මලාන (කොටස් අංක 22) | 2020.12.14 | 2020.12.03 | 52.2 |
| ට්‍රයි ස්ටාර්, අංක 88, | 2020.12.14 | 2020.12.03 | 49.7 |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

නිරෝධායන මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාවට තාවකාලිකව භාර දී ඇති ට්‍රයි ස්ටාර් දේපල බැංකුව අත්පත් කර ගත්( devolved) ඒවා වේ.

මේ සම්බන්ධයෙන්, පාර්ලිමේන්තු කටයුතු සහ ප්‍රතිපත්ති අතිරේක ලේකම් විසින් සංනිවේදනය කරන ලද 2024 ජුලි 09 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම් සටහන් සමඟ අමාත්‍ය මණ්ඩල සංදේශය බැංකුව වෙත ලබා දී ඇත. අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශයේ දක්වා ඇති ප්‍රධාන නිර්දේශ පහත පරිදි වේ.

1. සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ විධිවිධානවලට අනුව, අදාළ දේපළවල අනු ඒකක පිහිටුවීමට ශ්‍රී ලංකා යුධ හමුදාවට පහසුකම් සැලසීම සඳහා එම ඉඩම් රජයට පවරා ගත හැකිය.
2. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට අනුකූලව මෙම දේපල තක්සේරු කිරීම රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් සපයනු ලබන තක්සේරුව මත පදනම් වනු ඇත.
3. අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා අයවැය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය විසින් සපයනු ලැබේ. පවතින මූල්‍ය තත්ත්වයන්

**නිර්දේශය**

බැංකුව සතු දේපළ සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ.

| | | | |
|---|---|---|---|
| මාලිගාව පාර, රත්මලාන (කොටස් අංක 23) | | | |
| ට්‍රයි ස්ටාර්, අංක 29/5, කන්දවල පාර, රත්මලාන | 2021.02.16 | 2021.03.18 | 80.7 |
| කමල් කේබල්ස්, අංක 56, කන්දවල මාවත, රත්මලාන. | 2020.11.06 | 2020.12.03 | 480.0 |

සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රතිපාදන වාරික වශයෙන් සිදු කර ඉදිරි වසර කිහිපය තුළ මුදා හැරීමට නියමිතය.

මීට අමතරව, පාර්ලිමේන්තු කටයුතු සහ ප්‍රතිපත්ති අතිරේක ලේකම්වරයාගෙන් අපට යාවත්කාලීන පණිවිඩයක් ලැබී ඇත. මෙම තත්ත්වය 2024.09.11 දින බැංකු සමූහය වෙත යාවත්කාලීන කරන ලද අතර, 2024.09.18 දින ට්‍රයි ස්ටාර් දේපළ ඇවරකරු වෙත යාවත්කාලීන කර ඇත. එමෙන්ම, 2024.09.30 දින ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ද යාවත්කාලීන කර ඇත.

**3.2.2** 2018 සිට 2023 දක්වා පසුගිය වර්ෂ හයක කාලය තුළදී කපා හරින ලද ණය මුදල් සහ කපා හරින ලද මුදල්වලින් අයකර ගැනීම් පිළිබඳ විශ්ලේෂණය පහත පරිදි වේ.

| වර්ෂය | කපා හරින ලද මුදල (රු. මිලියන) | වර්ෂය තුළ අයකරගත් මුදල (රු. මිලියන) |
|---|---|---|
| 2018 | 35.50 | 47.65 |
| 2019 | 710.30 | 36.50 |
| 2020 | 5.63 | 57.03 |
| 2021 | 73.73 | 1.66 |
| 2022 | 13.61 | 0.65 |
| 2023 | 17.17 | 25.54 |
| **එකතුව** | **855.94** | **169.02** |

- බැංකුවේ පසුගිය වසර හය සඳහා සමුච්චිත කපා හැරීම් රු. මිලියන 855.94 ක් ලෙස සටහන් වී තිබූ අතර, එයට 2019 වර්ෂය තුළදී ටැන්ඩොන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්ට අයත් වන රු. මිලියන 616.46 ක ඉහළම කපා හැරීමේ ශේෂය ඇතුළත් වේ. 2023 වර්ෂයේදී බැංකුව රු. මිලියන 17.17 ක ණය ශේෂයක් කපා හැර තිබූ අතර එයින් රු. මිලියන 5.71 ක් හෙවත් සියයට 33.25 ක් විදේශ ශාඛාවට අදාළ කපා හැරීම නියෝජනය කරයි.
- පසුගිය වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී කපා හරින ලද ශේෂවලින් අයකර ගැනීම් වැඩි වී ඇතත්, ආපසු අයකර නොගත් සමස්ත කපා හැරීමේ ශේෂය හා සසඳන විට සමස්ත අයකර ගැනීම් සතුටුදායක මට්ටමක නොතිබුණි.

බැංකුවේ අයකර ගැනීමේ ඒකක සාකච්ඡා, නඩු පැවරීම් සහ දේපල උපලබ්ධි කර ගැනීම හරහා අක්‍රීය මුදල් ප්‍රවාහයන් අයකර ගැනීමට සෑම උත්සාහයක්ම ගනී.

ගන්නා ලද සියලුම පියවර අසාර්ථක වුවහොත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව බැංකුව විසින් පහසුකම් කපා හරිනු ඇත.

ශාඛා බැංකු අංශයේ ණය ශේෂය බොල් ණය ලෙස කපා හැරීම, කපා හැරීමේ ප්‍රතිපත්තියට අනුව අනුගමනය කළ යුතු අවසාන විසඳුම වේ. ප්‍රතිව්‍යුහගත කිරීම, ප්‍රතලේඛණගත කිරීම, පුනර්ජීවනය හා ප්‍රතිස්ථාපන උත්සාහයන්, නීතිමය ක්‍රියාමාර්ග හෝ පරාටේ ක්‍රියාමාර්ග වැනි අයකර ගැනීමේ ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමෙන් පසුව එය ක්‍රියාත්මක කරයි. ශාඛා බැංකු අංශයේ කපා හැරීමේ පහසුකම් ලෙස සඳහන් කර ඇති මුළු මුදල ඉහත සඳහන් සියලු අයකර ගැනීමේ පියවර අනුගමනය කර ඇත. ශක්තිමත් සහ නිතිපතා කරනු ලබන පරිචයන් පවතින අතර 2023 දී බැංකුව විසින් රු. මිලියන 25.54 ක් ආපසු අයකර ගෙන ඇත.

කපා හරින ලද ණය ආපසු අයකර ගැනීමට හැකි සෑම පියවරක්ම ගැනීම අවශ්‍ය වේ.

**3.2.3 ක්‍රෙඩිට් කාඩ්පත් මෙහෙයුම්.**

(i) ක්‍රෙඩිට් කාඩ් භාවිතය පොදු ලේජරයේ සටහන් කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයක් පවතී.

පොදු ලේජරයේ සටහන් කිරීම් දැන් යාවත්කාලීන වේ.
Prime4 පද්ධතියේ පද්ධති දෝෂයක් නිසා පොදු ලේජර ශේෂය සහ කාඩ්පත් කළමනාකරණ පද්ධති ශේෂය අතර වෙනස ඇති විය. දැන් එය නිවැරදි කර ඇත.

පොදු ලේජරයේ සටහන් කිරීම් යාවත්කාලීන විය යුතුය.

(ii) ක්‍රෙඩිට් කාඩ් අයදුම්පත් අනුමත කිරීම, සීමා වැඩි කිරීම, කාඩ්පත් සෑදීම, මුද්‍රණය කිරීම සහ යැවීමේදී රාජකාරි වෙන් කිරීමක් නොතිබුණි. එක් අංශ ප්‍රධානියකු යටතේ එකම දෙපාර්තමේන්තුවේ සිටම එම කටයුතු සිදු කෙරේ. සම්බන්ධතා ගැටුම් හා වංචා සඳහා වන අවදානම වළක්වා ගැනීම සඳහා ක්‍රෙඩිට් කාඩ් අයදුම්පත් සහ සීමා වැඩි කිරීම් ස්වාධීන ඒකකයක් විසින් අනුමත ඉතා යෝග්‍ය වේ.

රාජකාරි වෙන් කිරීම ක්‍රියාත්මක කර ඇත.
කාඩ්පත් අනුමත කිරීම සහ සීමා වැඩි කිරීම, නිකුත් කිරීමේ ප්‍රධාන කළමනාකරු යටතේ පවරා ඇත.
කාඩ්පත් සෑදීම, මුද්‍රණය කිරීම සහ යැවීම, ප්‍රධාන කළමනාකරු කාඩ් මෙහෙයුම් යටතේ පවරා ඇත.

නිසි ලෙස රාජකාරි වෙන් කිරීම ක්‍රියාත්මක කළ යුතුය.

(iii) භෞතිකව කාඩ්පත විනාශ කිරීමට පෙර ක්‍රෙඩිට් කාඩ් කළමනාකරණ පද්ධතිය තුළ ආපසු ලබා දුන් ක්‍රෙඩිට් කාඩ්පත් අත්හිටුවීම හෝ අවලංගු කිරීම සිදු නොවේ. මෙය අභ්‍යන්තර වංචාවලට තුඩු දිය හැකි අතර අලුත් කරන දිනයේ දී එය අනවශ්‍ය ලෙස අලුත් කරනු ලැබේ.

නිකුත් කර ඇති ක්‍රෙඩිට් කාඩ්පත් බෙදාහරින විට සහ ආපසු ලැබෙන විට අක්‍රිය තත්ත්වයේ පවතී. ඒවා විනාශ කරන තුරු ද්විත්ව පාලනය යටතේ තබා ඇත.
ආපසු ලබා දුන් කාඩ්පත් මාස 6 කට පසු පද්ධතිය තුළ අවලංගු කරනු ලබව අතර මෙම කාල සීමාව තුළදී කාඩ්පත ලබා ගැනීමට ගනුදෙනුකරුට අවස්ථාව ලබා දේ.

භෞතිකව කාඩ්පත විනාශ කිරීමට පෙර ක්‍රෙඩිට් කාඩ් කළමනාකරණ පද්ධතිය තුළ ආපසු ලබා දුන් ක්‍රෙඩිට් කාඩ්පත් අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළ යුතුය.

3.2.4 පසුගිය වර්ෂ හතරක කාලය තුළදී බැංකුවේ III වන අදියර හානිකරණ ණය අනුපාත පහත වගුවේ දැක්වේ. පසුගිය වර්ෂ තුනක කාලය තුළදී දළ ණය සහ අත්තිකාරම්වලට III වන අදියර ණය අනුපාතය ක්‍රමයෙන් වැඩි වී තිබූ බවට මෙමගින් සාක්ෂි සපයයි.

| විස්තරය | දෙසැම්බර් 31 දිනට (රු. මිලියන) | | | |
|---|---|---|---|---|
| | **2023** | **2022** | **2021** | **2020** |
| දළ ණය සහ අත්තිකාරම් | 2,457,771.74 | 2,584,778.97 | 2,576,668.17 | 2,115,204.74 |
| III වන අදියර ණය සහ අත්තිකාරම් | 311,862.94 | 324,630.07 | 251,157.73 | 207,523.94 |
| දළ ණය සහ අත්තිකාරම්වලට III වන අදියර ණය % | 12.69 | 12.56 | 9.75 | 9.81 |

කෙසේ වෙතත්, පහත කරුණු හේතුවෙන් III වන අදියර ණය අනුපාතය 2020 සිට වැඩි වී ඇත.

- ඉහළ උද්ධමනය
- මුදල් අවප්‍රමාණය වීම
- රටේ දේශපාලන අස්ථාවරත්වය
- ආංශික ආතතිය (සංචාරක අංශය, ඉදිකිරීම් අංශය
- ඉහළ පොලී අනුපාත
- පරාටේ ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම

විභව ණය පැහැරහරින්නන් සමීපව පසු විපරම් කිරීම අවශ්‍ය වේ.
අක්‍රීය ණය ශේෂයන් පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

3.2.5 මාලදිවයිනේ ශාඛාවේ මාලදිවයින් රුපියල් වලින් නාමනය කරන ලද මුළු ස්ථාවර තැන්පතුවලින්, 2023 දෙසැම්බර් 31 දිනට තැන්පතුවලින් සියයට 53 ක් සහ සියයට 75 ක් පිළිවෙළින් ඉහළම තැන්පත්කරුවන් හතරදෙනෙකු (4) සහ ඉහළම තැන්පතුකරුවන් දසදෙනෙකු (10) අතර ව්‍යාප්ත විය. මේ අනුව, ශාඛාව

සටහන් කර ගන්නා ලදී.
නවීන අන්තර්ජාල බැංකුකරණ විසඳුමක් නොමැතිකම නිසා, ශාඛා බැංකු අංශයේ ගනුදෙනුකරුවන් සහ බොහෝ ආයතන පවා ආකර්ෂණය

එහි තැන්පතු පදනම විවිධාංගීකරණය කිරීම සඳහා කඩිනම් පියවර ගැනීම අවශ්‍ය

ඉහළ තැන්පතු වටිනාකමක් ඇති ගනුදෙනුකරුවන් කිහිප දෙනෙකු/සීමිත සංඛ්‍යාවක් මත රඳා පවතින බැවින් ඉහළ ද්‍රවශීලතා අවදානමකට නිරාවරණය විය හැකි පෙන්නුම් කරයි.

3.2.6 මාලදිවයිනේ ශාඛාවේ එ.ජ.ඩො වලින් නාමනය කරන ලද මුළු ස්ථාවර තැන්පතුවලින්, 2023 දෙසැම්බර් 31 වන විට තැන්පතුවලින් සියයට 59 ක් තැන්පත්කරුවන් දසදෙනෙකු (10) අතර ව්‍යාප්ත විය. මේ අනුව, ශාඛාව ඉහළ ද්‍රවශීලතා අවදානමකට නිරාවරණය විය හැකි ඉහළ තැන්පතු වටිනාකමක් ඇති ගනුදෙනුකරුවන් කිහිප දෙනෙකු/සීමිත සංඛ්‍යාවක් මත රඳා පවතින බව පෙන්නුම් කරයි.

කර ගත නොහැක. වෙළඳපොල ඔවුන්ගේ එදිනෙදා අවශ්‍යතා සඳහා ඩෙබිට් කාඩ්පත් මත දැඩි ලෙස රඳා පවතින විට බැංකුවේ ATM කාඩ්පත ඩෙබිට් කාඩ්පතක් ලෙස භාවිතා කළ නොහැක. මෙම සීමාව තැන්පතු ගනුදෙනුකරුවන් විශාල සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමේ උත්සාහයට ද බාධාවක් වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ආයතනික සහ ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති ගනුදෙනුකරුවන්ට ගැලපෙන පරිදි සාදන ලද සේවාවන් සැපයීම මත බැංකුව මූලික වශයෙන් රඳා පවතින අතර එය එහි තැන්පතු පදනමේ විවිධාංගීකරණයට බලපායි.

තවද, මාලදිවයිනේ සහ සීෂෙල්ස් හි විදේශීය මෙහෙයුම් ඇතුළත්ව සමස්ත බැංකුව සඳහාම නව අන්තර්ජාල බැංකුකරණ විසඳුමක් ලබා ගැනීමට බැංකුව කටයුතු කරමින් සිටී. මෙම ඩිජිටල් බැංකුකරණ වේදිකාවන් ක්‍රියාත්මක කිරීමත් සමඟ තැන්පතු පදනම විවිධාංගීකරණය කරමින් ශාඛා බැංකු ව්‍යාපාරය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට බැංකුව අපේක්ෂා කරයි.

සැප්තැම්බර් 30 දිනට, බැංකුවේ මාලදිවයින ශාඛාව සිය යෝජනාව සඳහා ඉල්ලීම (RFP) ලේඛන අවසන් කර ඇති අතර, අවශ්‍ය වෙනස් කිරීම් සමඟ විසඳුම් මිලදී ගැනීම සඳහා පාර්ශවකරුවන් වෙත බෙදා හැර ඇත.

වේ.

**3.2.7 (i)** **කාර්ය මණ්ඩල ණය**

2023 දෙසැම්බර් 31 දිනට පහත සඳහන් දීර්ඝ කාලීන හිඟ අක්‍රීය කාර්ය මණ්ඩල ණය (වසර 1කට වැඩි) ශේෂයන් හඳුනා ගෙන ඇත. එම දීර්ඝ කාලීන හිඟ ශේෂයන් කාර්ය මණ්ඩලයෙන් අයකර ගැනීමට බැංකුව සතුටුදායක මට්ටමේ ක්‍රියාමාර්ග ගෙන නොමැති අතර IFRS වර්ගීකරණයට පටහැනිව බැංකුව මෙම ණය අක්‍රීය කාණ්ඩයට මාරු කර නොමැති බැවින් මෙම සියලු ශේෂයන් අක්‍රීය ණය සහ අත්තිකාරම් යටතේ වර්ගීකරණය කර නොතිබුණි. තවද පෙබරවාරි, මාර්තු,

සියලුම ණය පහසුකම් පැවරීමට අවශ්‍ය අක්‍රිය ණය කාණ්ඩවලට මාරු කර ඇත. අවසර ලත් කල් දැමීමේ කාලය තුළදී අදාළ පොලී ලැබී ඇත. ප්‍රාග්ධන කොටස පමණක් කල් දමා ඇත. (මාර්තු මාසය සඳහා ප්‍රසාද දීමනාවලින් කල් දැමූ පොලී අයකර ගෙන ඇත.) පහත පරිදි අයකර ගෙන ඇත.

වර්ෂ 1 කට වැඩි - රු. 23,495,989.16

අයකර ගැනීමේ ක්‍රියාමාර්ග පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

| | | |
|---|---|---|
| අප්‍රේල්, මැයි, ජූනි, ජූලි, සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් යන මාස සඳහා කල්දැමීම් ලබා දී තිබූ අතරම එම කාලසීමාව තුළදී හිඟ පොලී හඳුනාගෙන නොතිබුණි. එමෙන්ම, උද්ධමන සහන ණය ලබා නොගත් කාර්ය මණ්ඩලයට 2023 අගෝස්තු මාසයේ දී ඒ සඳහා අවසර දී ඇත. එහි විස්තර පහත දැක්වේ. | වර්ෂ 2 කට වැඩි - රු. 6,047,711.19<br>වර්ෂ 3 කට වැඩි – රු. 13,439,676.49<br>එකතුව - රු. 42,983,376.84<br>තවද, නීතිමය ක්‍රියාමාර්ග ඇතුළත් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. | |

| ණය වර්ගය | 2023/12/31 දිනට ශේෂය (රු. මිලියන) | වයස් විශ්ලේෂණය | | |
|---|---|---|---|---|
| | | වර්ෂ 1 කට වැඩි (රු.මිලියන) | වර්ෂ 2 කට වැඩි (රු.මිලියන) | වර්ෂ 3 කට වැඩි (රු.මිලියන) |
| නිවාස ණය | 184.44 | 52.63 | 20.67 | 111.14 |
| PF ණය | 38.28 | 16.96 | 4.26 | 17.06 |
| ඒකාබද්ධ පොදු ණය | 32.09 | 11.32 | 5.58 | 15.20 |
| ආපදා ණය | 2.83 | 1.46 | 0.05 | 1.33 |
| පරිගණක ණය | 0.43 | 0.23 | - | 0.20 |
| විශේෂ ණය | 1.13 | 0.65 | 0.001 | 0.47 |
| **එකතුව** | **259.20** | **83.25** | **30.56** | **145.40** |

| | | | |
|---|---|---|---|
| (ii) | කාර්ය මණ්ඩල ණය පහසුකම් ICBS පද්ධතිය හරහා නඩත්තු නොකරන අතර HCM පද්ධතිය තුළ පවත්වාගෙන යයි. ඒ අනුව, ස්වයංක්‍රීයව හඳුනා ගැනීම සිදු නොවීම හේතුවෙන් HCM පද්ධතියේ නිත්‍ය අංශයෙන් කල් ඉකුත් වූ ණය අංශයට ණය වර්ගීකරණය කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | කාර්ය මණ්ඩල ණය අඩු කිරීම් සේවකයාගේ වැටුපට සෘජුවම බලපාන බැවින්, ICBS පද්ධතිය තුළ කාර්ය මණ්ඩල ණය පවත්වා ගැනීමට නොහැකි වේ. වැටුප් ක්‍රියාවලිය සෑම මසකම මසකට වරක් සිදු කරනු ලබන අතර, වැටුප් සැකසීමෙන් පසුව බැංකුව විසින් අක්‍රිය ණය, කල් ඉකුත් වූ ණය අංශය වෙත මාරු කර ඇත.<br>අක්‍රිය අත්තිකාරම් සම්බන්ධයෙන් ස්වයංක්‍රීය වාර්තා උත්පාදනය කිරීම සඳහා HCM පද්ධතිය සංවර්ධනය කිරීමට කටයුතු කරනු ඇත. එවැනි වාර්තා භාවිතා කරමින්, කාණ්ඩ අතර ණය මාරු කිරීම සඳහා සටහන් අතින් යෙදිය යුතුය. පොදු ලේජර ගිණුම් ICBS හි නඩත්තු වීම, HCM හි ණය පවත්වාගෙන යෑම සහ පද්ධති දෙකක අතර සම්බන්ධයක් නොමැති වීම නිසා අතින් සිදු කරන ක්‍රියාවලිය යෙදා ගනු ඇත. | අතින් සිදු කරනු ලබන මැදිහත්වීම තුළින් හැසිරවීම, දෝෂ යනාදී අවදානමක් ඇති කළ හැකි බැවින් කල් ඉකුත් වූ ණය අංශය දක්වා වර්ගීකරණය ස්වයංක්‍රීයව හඳුනා ගැනීම අවශ්‍ය වේ. |
| (iii) | යම් අභ්‍යන්තර ප්‍රතිපත්ති/තීරණයක් නොමැතිකම හේතුවෙන් විවිධ වංචා සහ අක්‍රමිකතා සම්බන්ධයෙන් වන විනය ක්‍රියාමාර්ග හේතුවෙන් සේවයෙන් පහ කරන ලද හෝ සේවයෙන් ඉවත් වූ සේවකයින් සඳහා කාර්ය මණ්ඩල ණය සඳහා වන පොලී අනුපාත (කාර්ය මණ්ඩල නිවාස ණය පහසුකම් හැර) නොවෙනස්ව පවතී. | සේවයෙන් පහ කරන ලද සේවකයින්ගේ ණය සඳහා පැහැදිලි මාර්ගෝපදේශ සහිතව චක්‍රලේඛ යාවත්කාලීන කරනු ඇත. | පැහැදිලි මාර්ගෝපදේශ සහිතව චක්‍රලේඛ යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2021 ඔක්තෝබර් 12 දින සිට බලපැවැත්වෙන ලංකා බැංකුවේ විනය සංග්‍රහයේ 23.2 (g) වගන්තියේ පහත සඳහන් කරුණු සඳහන් කර ඇත.<br>"*මූලික විමර්ශනය අවසන් වී දින 21ක් ඇතුළත, විමර්ශන නිලධාරියා විසින් කෙටුම්පත් චෝදනා පත්‍ර සමග ඔහුගේ වාර්තාව ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාට දැනුම් දීමක් සමග අදාළ සහකාර මහා කළමණාකරු වෙත යොමු කළ යුතුය*"<br>විනය සංග්‍රහයේ 25.2 වගන්තිය<br>"*බලයලත් නිලධාරියා විසින් මූලික විමර්ශන වාර්තාව ලැබුණු දින සිට දින 14ක් ඇතුළත චෝදනා පත්‍රයක් නිකුත් කිරීම*"<br>කෙසේ වෙතත්, නියැදි පරීක්ෂා කිරීමේදී බැංකුවේ සේවකයින් විසින් සිදු කරන ලද වංචා සහ අක්‍රමිකතා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමේ ක්‍රියාවලියේ සැලකිය යුතු ප්‍රමාදයන් හඳුනාගෙන තිබූ අතර, මෙම ප්‍රමාදය හේතුවෙන් ණය ශේෂයන් ආපසු අයකර ගැනීමෙන් තොරව දීර්ඝ කාලයක් තිස්සේ හිඟව පැවතුනි. | යම් සිද්ධියක් විමර්ශන ඒකකයට වාර්තා වූ විට බැංකුව ඒ පිළිබඳව විමර්ශනය කර නිර්දේශ සහිත විමර්ශන වාර්තාව නිකුත් කරයි. ඉන් අනතුරුව නීති දෙපාර්තමේන්තුවෙන් අදහස් ලබාගෙන විමර්ශන දෙපාර්තමේන්තුව විසින් අදාළ බලයලත් නිලධාරියා වෙත කෙටුම්පත් චෝදනා පත්‍රය නිකුත් කරයි. ඉන් අනතුරුව, විමර්ශන වාර්තාව සහ කෙටුම්පත් චෝදනා පත්‍රය මත පදනම්ව බලයලත් නිලධාරියා විසින් චෝදනා පත්‍රය නිකුත් කරයි. විධිමත් විනය පරීක්ෂණයක් පවත්වනු ලබන (අත්හිටුවනු ලැබුවහොත් හෝ කිසියම් විශේෂ ඉල්ලීමක් මත පදනම්ව) අතර විමර්ශන වාර්තාව විනය අධිකාරිය වෙත ඉදිරිපත් කරයි. චූදිත සේවකයා සේවයෙන් පහ කිරීම අවසාන තීරණය නම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය.<br>කොවිඩ්-19 වසංගතය, ගමන් සීමා කිරීම්, ඉන්ධන අර්බුදය, චූදිත සේවකයින් කිහිප දෙනෙකුගේ සහාය නොලැබීම සහ චූදිත සේවකයින් විසින් බැංකුවට එරෙහිව නඩු පැවරීම හේතුවෙන් 2020 - 2023 කාලය තුළදී ඉහත ක්‍රියාවලියේ ප්‍රමාදයක් සිදුවී ඇත.<br>සඳහන් කරන ලද විනය සංග්‍රහයේ 25.2 වගන්තිය වන<br>"*බලයලත් නිලධාරියා විසින් ප්‍රාථමික විමර්ශන වාර්තාව ලැබුණු දින සිට දින 14 ක් ඇතුළත චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට* " යන්න විනය සංග්‍රහයේ 59 වැනි වගන්තියට අනුව අනිවාර්ය නොවේ. කාල සීමාවන් අනිවාර්ය නොවේ. | දීර්ඝ කාලීන හිඟ ශේෂයන් අය කර ගැනීම සඳහා විනය ක්‍රියාමාර්ග කඩිනම් කිරීම අවශ්‍ය වේ. |
| (v) | නිසි සුරැකුම්පත් සලකා බලා නොතිබීම සහ දීර්ඝ කාලීන හිඟ ශේෂයන් අයකර ගැනීමට සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබීම නිසා සේවයෙන් පහ කළ, ඉල්ලා අස් වූ සහ මියගිය සේවකයන්ගේ දීර්ඝ කාලීන හිඟ ණය ශේෂ ආපසු අයකර ගැනීම දුර්වල මට්ටමක පවතී. | හිඟ ණය ශේෂය අතරින්, 2023.12.31 දිනට රු. මිලියන 42.9 ක් අයකර ගෙන ඇත. (සේවකයින් 5 දෙනෙකු සම්පූර්ණයෙන් පියවා ඇත) ආරම්භ කරන ලද අනෙකුත් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග පහත පරිදි වේ. | දීර්ඝ කාලීන හිඟ ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | | • සාමාජිකයන් 15 ක් නිත්‍ය අංශයට මාරු කිරීම.<br>• සාමාජිකයින් 29 දෙනෙකුගෙන් නිවාස ණය හැර අනෙකුත් ණය අයකර ගෙන ඇත.<br>• සාමාජිකයින් 10 දෙනෙකුගෙන් නිවාස සහ UGL ණය හැර අනෙකුත් ණය අයකර ගෙන ඇත.<br>• සාමාජිකයින් 18 දෙනෙකුගේ ණය අයකර ගැනීම සඳහා අර්ථසාධක අරමුදල් ශේෂයන් නිදහස් කර නොමැත.<br>• සාමාජිකයින් 3 දෙනෙකු 2024.12.31 දිනට පෙර ණය පියවීමට එකඟ විය.<br>• උසාවියේ ගොනු කර ඇති නඩු විභාග වෙමින් පවතින අතර සාමාජිකයින් 7 දෙනෙකුගේ ණය අර්ථසාධක අරමුදලේ ශේෂවලින් අයකර ගත හැක.<br>• එක් සාමාජිකයෙකු සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>• සාමාජිකයින් 11 දෙනෙකුට සිහි කැඳවීමේ ලිපි යවා ඇත.<br>• සාමාජිකයින් 12 දෙනෙකු සඳහා විනය තීරණ ලැබීමට නියමිතය.<br>දැනට ශ්‍රී ලංකාවේ පරාටේ ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇති අතර, රු.මිලියන 5 ට වැඩි නිවාස ණය ආපසු අයකර ගැනීමට අපට හැකියාවක් නොමැත. | |
| 3.2.8 | 2023 ජනවාරි 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, මුදල් අමාත්‍යාංශය (MOF) 2023 පෙබරවාරි 14 දිනැති ලිපිය මගින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට (CPC) සහ බැංකුවට එ.ජ.ඩො මිලියන 1,341 ක (2022 දෙසැම්බර් 31 වන විට) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි විදේශ මුදල් ණය ශ්‍රී ලංකා රජයට මාරු කිරීම පිළිබඳ දැනුම් දී තිබුණි. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලේකම්වරයා 2023 සැප්තැම්බර් 13 දිනැති ලිපිය මගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ණය මුදල් නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් (DST) වෙත පැවරීමට ගෙන ඇති කැබිනට් තීරණය පිළිබඳව රජයේ භාණ්ඩාගාර ලේකම්වරයාට දැනුම් දී තිබුණි. කෙසේ වෙතත්, තවමත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සමඟ කොන්දේසි | ලාසාර්ඩ් (ශ්‍රී ලංකා රජයේ උපදේශක), මුදල් අමාත්‍යාංශයේ (MOF) සහ මහ බැංකුවේ නිළධාරීන් සමඟ සාකච්ඡා, රැස්වීම්, කතිකාවන්වලින් පසු, බැංකුවට 2024.06.04 සහ 2024.06.07 දිනැති ලිපි මගින් භාණ්ඩාගාර ලේකම් විසින් නවතම ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවක් ලද අතර පැහැදිලි කර ගැනීම සඳහා 2024.06.06 දිනැති ලිපිය මගින් අපගේ පිළිතුරු ලබා දී ඇති අතර 2024.07.29 දිනැති වැඩබලන මහා කළමණාකරුගේ ලිපිය මගින් එම යෝජනාව සඳහා කැමැත්ත ප්‍රකාශ කර ඇත. | සාකච්ඡා පසු විපරම් කිරීම අවශ්‍ය වේ. |

සාකච්ඡා කිරීමේ ක්‍රියාවලියක පවතින අතර එම නිසා, ඒ පිළිබඳ ගිවිසුම අවසන් කර දෙපාර්ශවය විසින් අත්සන් කළ යුතුව ඇත.

2024.08.27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී පුනරාවර්තන වියදම් සඳහා රු. බිලියන 130 ක් (ලංකා බැංකුව සහ මහජන බැංකුව යන දෙකටම) ලබා දීම සඳහා පාර්ලිමේන්තු යෝජනාවක් ඉදිරිපත් කිරීමට යටත්ව අවසන් කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. තවද, කෙටුම්පත් ණය ගිවිසුම 2024.09.11 දින මහා භාණ්ඩාගාරය විසින් ලබා දුන් අතර බැංකුවේ අදහස්/අපේක්ෂිත සංශෝධන ආදිය සමඟ එය ශ්‍රී ලංකා රජයට ලබා දී ඇත.

තවද, 2024.09.13 දින ණය කමිටුවේ නිර්දේශය ඇතිව 2024.09.18 දින පැවති රැස්වීමේදී 2024.06.04 සහ 2024.06.07 දිනැති ලිපි මගින් භාණ්ඩාගාර ලේකම් විසින් ලබා දුන් ප්‍රතිව්‍යුහගත ණය පහසුකම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත.

3.2.9 2023 වසරේ තොරතුරු තාක්ෂණ පද්ධතිවල අක්‍රිය කාල වාර්තාවට අනුව පද්ධති 13 ට අදාළව එකතුව පැය 286 විනාඩි 29 ක (පාර්ශ්වික සහ සම්පූර්ණ පද්ධතිය යන දෙකම) පද්ධති අක්‍රිය වූ අවස්ථා 131 ක් වාර්තා වී ඇති බව නිරීක්ෂණය විය. සැලසුම් කර ඇති පද්ධති අක්‍රිය කාලයට වඩා සැලසුම් කර නොමැති පද්ධති අක්‍රිය කාලය වැඩි වූ අතර ඉහත වාර්තාවට අනුව වේලාවන් පිළිවෙලින් පැය 217 විනාඩි 20 ක් සහ පැය 69 විනාඩි 07 ක් විය. අන්තර්ජාල හා ජංගම බැංකු පද්ධතිය, BOC ස්මාර්ට් පාස්බුක් පද්ධතිය සහ SWIFT පද්ධතියේ ඉහළම පද්ධති අක්‍රිය කාලයන් වාර්තා වූ අතර පද්ධතියේ අක්‍රිය කාලයන් පිළිවෙලින් පැය 75 විනාඩි 3 ක්, පැය 71 විනාඩි 19 ක් සහ පැය 61 විනාඩි 45 ක් විය.

පද්ධති අක්‍රිය වූ අවස්ථා සහ මුළු පැය ගණන පිළිබඳ වාර්තා, විශේෂයෙන් සැලසුම් නොකළ අක්‍රිය කාලය පැය 217 කට වඩා වැඩි වීම සැලකිලිමත් විය යුතු කරුණකි. මෙය හොඳින් සටහන් කර ගෙන ඇති අතර පහත ක්‍රියාකාරී සැලැස්ම දැනටමත් ආරම්භ කර ඇත.

1. බැංකුව මේ වන විට අන්තර්ජාල හා ජංගම බැංකුකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

2. SWIFT පද්ධති දෘඩාංග වැඩිදියුණු කර ඇති අතර එතැන් සිට අපි කිසිදු අක්‍රිය කාලයක් දැක නොමැත.

3. COBIT-2019 අවශ්‍යතාවය හඳුන්වාදීමත් සමඟ ITSM/ITAM මෙවලම ලබා ගැනීම සඳහා දැනට බැංකුව විසින්

අනාගතයේදී පද්ධතියේ අක්‍රිය කාලය අඩු කිරීමට ඉක්මන් පියවර ගැනීම අවශ්‍ය වේ.

තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීම බොහෝ දුරට අවසන් කර ඇති අතර මෙය අපට ඇතිවිය හැකි ඕනෑම ගැටලුවකට ක්ෂණික ප්‍රතිචාර දැක්වීමට සහ පුනරාවර්තන ගැටළු අවම කර ගැනීමට ඉඩ සලසයි.

මෙම පියවරයන් අනාගතයේදී පද්ධති අක්‍රිය කාලය සැලකිය යුතු ලෙස අඩු කරනු ඇතැයි බැංකුව විශ්වාස කරයි.

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 3.3.1 | 2014 ලංකා බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතෙහි නිර්වචනයට අනුව, "සේවාව යනු උපදේශන සේවා හැර වෙනත් සේවාවන්ය". කෙසේ වෙතත්, බැංකුව සඳහා උපදේශන සේවා ප්‍රසම්පාදනය සඳහා කිසිදු අභ්‍යන්තර මාර්ගෝපදේශයක් සකස් කර නොතිබුණි. එමගින්, උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම සඳහා 2007 දී ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය (NPA) විසින් නිකුත් කරන ලද වෙනම මාර්ගෝපදේශය බැංකුව විසින් අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, බැංකුවට සිය මාර්ගෝපදේශක් නොත්බීම නිසාල බැංකුව එම මාර්ගෝපදේශය අනුගමනය කර නොතිබුණි. | උපදේශකයා තෝරා ගැනීමට ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ (NPA) මාර්ගෝපදේශය වර්තමානයේදී භාවිතා කරන අතර මූල්‍ය අනුමැතිය සඳහා ලංකා බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතෙහි අධිකාරී මට්ටම් භාවිත කරයි.<br>එසේම මෙය 2025 වර්ෂය සඳහා අලුත් කරන අවස්ථාවේදී ප්‍රසම්පාදන අත්පොතට ඇතුළත් කරනු ඇත. | බැංකුව සඳහා මාර්ගෝපදේශය ක් සකස් කිරීමට හෝ ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතාය තනයේ මාර්ගෝපදේශ යොදා ගැනීම අවශ්‍ය වේ. |
| 3.3.2 | **ලංකා බැංකුවේ ශාඛා 200 ක "පෝලිම් කළමනාකරණ විසඳුම" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.**<br>බැංකුවේ ශාඛා 200 ක "පෝලිම් කළමනාකරණ විසඳුම" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | තොරතුරු තාක්ෂණ සහකාර අධ්‍යක්ෂගේ (මෙහෙයුම් සහ තාක්ෂණික සහාය) 2016 අප්‍රේල් 05 දිනැති ලිපියට අනුව, ව්‍යාපෘතිය සාර්ථක වූ අතර ෆෙන්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ගෙවීම නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත්, පසුව මෙම පද්ධතියට අදාළ ගැටලු රැසක් මතු වූ අතර, ගෙවීම් තහවුරු කිරීමෙන් වසර දෙකකට වැඩි කාලයක් ගතවීමෙන් පසු 2018 දෙසැම්බර් 24 වන දින රු. 6,219,739.40 (බදු සහිතව) ක සම්පූර්ණ ගෙවීම සමාගම වෙත සිදු කර තිබුණි. ඒ අනුව, ගෙවීම් අඩු කිරීම සඳහා සාකච්ඡා කළ හැකි හෝ පද්ධතියේ දෝෂ නිවැරදි කිරීමට සමාගම සම්බන්ධ කර ගත හැකි තහවුරු කිරීමේ දිනයෙන් පසුව මතු වූ ගැටළු | ගෙවීමට පෙර, සාකච්ඡා කර ඇති අතර, ෆෙන්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් මිල සංශෝධනය කිරීමට එකඟ වී ඇත.<br>සංවිධාන පරිවර්තන ඒකකය (2018.11.15 දින) විසින් ඉදිරිපත් කරන ලද සංදේශයට අනුව, සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස එ.ජ.ඩො 35,628.00 (ඉන්වොයිස් දිනය 2016.01.20 වේ.) ක් වූ මුල් ඉන්වොයිසි වටිනාකම එ.ජ.ඩො 33,766.00 ක් දක්වා පහත දමා ඇත.<br>ශාඛා 04 ක් සඳහා ලබා ගත් | අනාගතයේදී මෑතකාලීන තහවුරු කිරීම මත ගෙවීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සැලකිල්ලට නොගෙන බැංකුව විසින් පැරණි තහවුරු කිරීම මත පදනම්ව සමාගමට ගෙවීම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. | පෝලිම් කළමනාකරණ විසඳුම් (QMS) ස්ථාපනය සහ සේවා සඳහා මෙම මුදල ගෙවා ඇත. | |
| (ii) | බැංකුව විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 6.22 ක් වැය කර තිබුණද, විගණන දිනය වන විට මෙම ව්‍යාපෘතිය ගම්පොළ, ඇඹිලිපිටිය සහ කුලියාපිටිය යන ශාඛාවල සම්පූර්ණයෙන්ම අක්‍රියව පැවතුණි. තවද, අලුත්කඩේ ශාඛාවේ ස්ථාපනය කර ඇති පද්ධතිය සතුටුදායක ලෙස ක්‍රියා නොකළ අතර තහවුරු වූ පරිදි සංකේත සංදර්ශකය කැඩී තිබුණි. සහකාර මහා කළමනාකරු (පළාත් විකුණුම් කළමනාකරණය) විසින් 2019 ඔක්තෝම්බර් 01 වන දින නියෝජ්‍ය මහා කළමනාකරු (සහාය සේවා) වෙත යවන ලද විද්‍යුත් තැපැලට අනුව, මෙම ව්‍යාපෘතිය අසාර්ථක වී තිබූ අතර ශාඛා මුහුණ දුන් ගැටළු සම්බන්ධයෙන් කිසිදු සහායක ප්‍රතිචාරයක් සමාගම ලබා දී නොතිබුණි. කෙසේ වෙතත්, සමාගම බැංකුවට නිසි ප්‍රතිචාර දක්වා නොතිබුණද, බැංකුව විසින් රු. 160,175.00 (එ.ජ.ඩො 1000 ක්) ක් පළමු වසර (2018/12/24-2019/12/24) නඩත්තු කටයුතු සඳහා සමාගමට ගෙවා තිබුණි. | නියමු ශාඛා 2015 දී සිය මෙහෙයුම් ආරම්භ කර 2019 දක්වා ක්‍රියාත්මක විය. පසුව ඇති වූ තාක්ෂණික ගැටලු සහ විකුණුම්කරුගේ සහාය නොමැතිකම නිසා නියමු ව්‍යාපෘතිය අතහැර දැමීමට බල කෙරුනි.<br>2018/12/24 සිට 2019/12/24 දක්වා කාලය සඳහා වන 1 වන වසරේ නඩත්තු ගාස්තු ලෙස එ.ජ.ඩො 1,000 ක් 2018.12.24 දින ගෙවා ඇත. සහකාර මහා කළමනාකරු (පළාත් විකුණුම් කළමනාකරණය) වෙත 2019/10/01 දින විද්‍යුත් තැපැල් පණිවිඩයක් එවා ඇති අතර ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති බවත් ශාඛා මුහුණ දෙන ගැටළු සම්බන්ධයෙන් සමාගම කිසිදු සහායක ප්‍රතිචාරයක් ලබා දී නොමැති බවත් සඳහන් කර ඇත. ඒ නිසා, වෙන කිසිදු ගෙවීමක් සිදු කර නොමැත. | පාඩු/වියදම් අයකර ගැනීමට සහ සැපයුම්කරු අසාදු ලේඛනගත කිරීමට ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |
| (iii) | 2020 ජනවාරි 23 දිනැති නිෂ්පාදන සහ බැංකු සංවර්ධන අංශයේ සංදේශයට අනුව, දේශීය හවුල්කරු (ෆෙන්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්) විසඳුම පිළිබඳ ප්‍රමාණවත් තාක්ෂණික දැනුමක් නොමැති අතර සෑම විටම විදේශීය හවුල්කරුවෙකු වන ප්‍රධාන විසඳුම් හිමිකරු "Wavetec" මත රඳා පවතින බව සඳහන් කර තිබුණි. නියමු ශාඛා වෙත දුර්වල ප්‍රතිචාර සහ විසඳුම පිළිබඳ අඛණ්ඩ නොසැලකිලිමත්කම මගින් දේශීය නියෝජිතයා වෙත අවශ්‍ය දැනුම හුවමාරුවී නොමැති බව සනාථ විය. ඒ අනුව, ලංසුකරුවන් නිසි ලෙස ඇගයීමට ලක් කර නොතිබුණු අතර හරස් ක්‍රියාකාරී කණ්ඩායම (CFT) සහ ආයතනික ප්‍රසම්පාදන කමිටුව (CPC) අදාළ රාජකාරි හා වගකීම් නිසි ලෙස ඉටු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තෝරා ගැනීමට පෙර, 2015 ජූනි 03 වන දින සමාගම සමඟ පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වුවද, පූර්ව ලංසු රැස්වීම් පැවැත්වීමේ අරමුණ ඉටු වී නොතිබුණි. | විශේෂ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ වෙනස ව්‍යාපෘතියට අදාළව මිලදී ගැනීම්/ව්‍යාපෘති ප්‍රසම්පාදනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.<br>ප්‍රසම්පාදන ක්‍රියාවලිය පුරාම හරස් ක්‍රියාකාරී කණ්ඩායම (CFT) සම්බන්ධ වී ඇත. එම ක්‍රියා පටිපාටියට අනුව ආයතනික ප්‍රසම්පාදන කමිටුව (CPC) සඳහා අවශ්‍යතාවයක් නොතිබුණි. | CFT/TEC සහ CPC ඔවුන්ගේ අදාළ වගකීම් සහ යුතුකම් ඉටු කිරීම සඳහා ලංසුකරුවන් නිසි ලෙස ඇගයීමට ලක් කළ යුතුය.<br>CFT/CPC සාමාජිකයින්ට එරෙහිව ඔවුන්ගේ රාජකාරි ඉටුකිරීමේ නොසැලකිලිමත් වීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | සහකාර මහා කළමනාකරු (පළාත් විකුණුම් කළමනාකරණය/ප්‍රධාන කාර්යාලය/ලංකා බැංකුව) විසින් 2019 ඔක්තෝබර් 01 දින නියෝජ්‍ය මහා කළමනාකරු (සහාය සේවා) වෙත යවන ලද විද්‍යුත් තැපෑලට අනුව, "කුලියාපිටිය, ගම්පොළ සහ අලුත්කඩේ ශාඛාවල ව්‍යාපෘතියේ දෝෂ පවතින බව සහ වෙනත් සැපයුම්කරුවෙකු වෙතින් මෙම ව්‍යාපෘතිය නැවත සිදු කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇති බව" සඳහන් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ ඇති වූ ගැටළු සම්බන්ධයෙන් සමාගම දැක්වූ දුර්වල ප්‍රතිචාර හේතුවෙන් 2020.01.29/9.4.03 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව හරහා සමාගම සමඟ ඇති ගිවිසුම අවලංගු කර නැවත නව ප්‍රසම්පාදනයක් ආරම්භ කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ බොහෝ අඩුපාඩු සිදුවී තිබූ අතර එමඟින් බැංකුව දරන ලද කාලය හා පිරිවැය අපතේ යැවීමෙන් ව්‍යාපෘතිය අසාර්ථක වූ බව නිරීක්ෂණය විය.<br>නැවතත්, රු. මිලියන 200 ක ඇස්තමේන්තුගත වියදමින් ශාඛා 200 ක් සඳහා නව පෝලිම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා මහජන ලංසු කැඳවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. ආයතනික ප්‍රසම්පාදන කමිටුව විසින් අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම තෝරාගෙන තිබූ අතර 2022 මාර්තු 03 දින එම තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය දුන් දින සිට වසරකට වැඩි කාලයක් සිට තෝරාගත් ලංසුකරුට ලංසුව පිරිනැමීමෙන් තොරව ලංසුකරුගේ ලංසු සුරැකුම වරින් වර දීර්ඝ කර තිබූ බව නිරීක්ෂණය විය. ඉන් අනතුරුව, විගණිත දිනයට රු. 236,744 ක තෝරා ගැනීමේ පිරිවැයක් දැරීමෙන් පසුව මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය රඳවා තබා ඇති බව නිරීක්ෂණය විය. මෙම ප්‍රසම්පාදනය නවතා දැමීම හේතුවෙන් දෙවන වරටත් ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. ඒ අනුව, බැංකු ශාඛා ජාලයේ පෝලිම් තදබදය අවම කිරීම, නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය සහ ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය වැඩි කරමින් පෝලිම් නිසි ලෙස කළමනාකරණය කිරීමේ ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගෙන නොතිබුණි. | ශාඛා 100 ක පෝලිම් කළමනාකරණ විසඳුම (QMS) ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ශාඛා 100 ක් සඳහා පෝලිම් කළමනාකරණ විසඳුම (QMS) ස්ථාපනය කිරීම සඳහා 2024.05.28 දින ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී වෙත ලංසුව ප්‍රදානය කර ඇත. | ලංසුකරුවන් ඇගයීමේදී තාක්ෂණික ඇගයීම වඩාත් ඵලදායී විය යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2023 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කාර්ය මණ්ඩල තහවුරු කිරීමට අනුව විධායක මට්ටමේ කාණ්ඩය යටතේ විධායක නිලධාරීන්ගේ 382 ක කාර්ය මණ්ඩල අතිරික්තයක් නිරීක්ෂණය විය. | සේවකයින් යම් තනතුරකට උසස් කිරීමේදී, බැංකුවේ ඉදිරි උසස්වීම් සහ විශ්‍රාම ගැන්වීම් බැංකුව විසින් සලකා බලා ඇත. අපි 2024.07.23 වන දින | ඉදිරි උසස්වීම් සහ විශ්‍රාම ගැන්වීම් හැර තථ්‍ය තත්ත්වය මත පදනම්ව කාර්ය මණ්ඩල තහවුරු |

| | | | |
|---|---|---|---|
| | | විධායක නිලධාරීන්ගෙන් සහකාර කළමනාකරු ශ්‍රේණියට සේවකයින් 408 දෙනෙකු උසස් කර ඇත. | කිරීම සකස් කළ යුතුය. |
| (ii) | බැංකුව 2023 දී සේවකයෙකු සඳහා රු. මිලියන 3.48 ක් වැය කර තිබූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 0.05 ක හෝ සියයට 1.42 ක සුළු අඩුවීමක් පෙන්නුම් කරයි. 2023 දී එක් සේවකයෙකු ලද ලාභය රු. මිලියන 3.11 ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 0.78 ක හෝ සියයට 20.05 ක තවදුරටත් අඩුවීමක් පෙන්නුම් කරයි. තවද, බැංකුවේ ශුද්ධ මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස පුද්ගලික වියදම් 2023 වර්ෂය සඳහා සියයට 28.33 ක් ලෙස සටහන් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 4.03 කින් අඩු වී තිබූ නමුත් එය පසුගිය වර්ෂවලට වඩා සහ අනෙකුත් තරගකාරී වාණිජ බැංකු සමඟ තවමත් ඉහළ අගයක් ගනී. | බැංකුව විසින් 2023 වර්ෂයේදී කළමනාකරණ අභ්‍යාසලාභීන් 250 ක් සහ අභ්‍යාසලාභී මාණ්ඩලික සහකාරවරුන් 453 ක් ඇතුළත්ව සේවකයින් 765 ක් බැංකුවට බඳවාගෙන ඇත. අභ්‍යාසලාභී මාණ්ඩලික සහකාරවරුන් 2023 දෙසැම්බර් මාසයේදී බඳවා ගත් බැවින්, එම සේවකයන් 2023.12.31 දිනට බැංකුවේ කාර්ය මණ්ඩල තනතුරුවලට ගණන් කරන ලද නමුත්, 2023 වර්ෂය සඳහා බැංකුවේ මෙහෙයුම් කටයුතුවලට සහභාගි නොවීය.<br>තවද, රටේ ඉහළ උද්ධමනය හේතුවෙන් මෑත වර්ෂවලදී වෛද්‍ය වියදම් සහ ජීවන වියදම ඉහළ ගිය අතර බැංකුවේ පුද්ගලික වියදම් වැඩි වීමට ද බලපා ඇත. | සේවකයින්ගේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා බැංකු අරමුදල් භාවිතා කිරීම අවශ්‍ය වේ. |
| (iii) | 2020 ඔක්තෝබර් 20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් අංක 4.1 මගින් අනුමත කරන ලද 2020 දෙසැම්බර් 06 දිනැති පුවත්පත් දැන්වීමට අනුව කළමනාකරණ අභ්‍යාසලාභී තනතුර සඳහා අයදුම්පත් වෘත්තීය ද්වාර වෙබ් අඩවිය (මාර්ගගතව) හරහා කැඳවා තිබුණද, බඳවා ගැනීමේ ක්‍රියාවලියේ විනිවිදභාවයට සහ සාධාරණත්වයට බාධාවක් වන පරිදි මාර්ගගත නොවන අයදුම්පත්‍රයකින් ඉහත තනතුර සඳහා එක් අපේක්ෂකයකු තෝරා ගෙන තිබුණි. | මාර්ගගත පද්ධති සීමාව හේතුවෙන්, වෙනත් ඕනෑම තනතුරක් (තනතුරු) සඳහා කලින් අයදුම් කර ඇති අපේක්ෂකයින්ට සහ දැනටමත් බැංකුවේ විවිධ මට්ටම්වල සේවය කරන පුද්ගලයින්ට මාර්ගගතව අයදුම් කිරීමට පද්ධතිය විසින් අවසර දී නොමැත.<br>එබැවින්, කළමනාකාරිත්වයේ අනුමැතිය ඇතිව, ඔවුන්ගේ අයදුම්පත් මාර්ගගත නොවන ක්‍රමයට ලබා ගැනීමට තීරණය කරන ලද අතර මානව සම්පත් අංශය ඔවුන්ගේ අයදුම්පත් වෘත්තීය ද්වාර පද්ධතියට අතින් ඇතුළත් කර ඇත. කෙසේ වෙතත්, මාර්ගගත නොවන පද්ධතිය සුදුසුකම් | අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලියක් විනිවිදභාවයක්න් යුතුව සිදු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නිර්ණායකවල වලංගුභාවය ද පරීක්ෂා කර ඇති අතර එබැවින්, නුසුදුසු අයදුම්පත් මාර්ගගත නොවන මාර්ගයෙන් ද ඉදිරිපත් කළ නොහැක.<br>පද්ධති දෝෂය සඳහා අයදුම්කරුවන්ට දඬුවම් නොකළ යුතු අතර, වගකිවයුතු රාජ්‍ය බැංකුවක් ලෙස සියලුම වින්දිත අපේක්ෂකයින්ට සාධාරණ අවස්ථාවක් ලබා දීම බැංකුවේ වගකීමක් වන බැවින්, වාර්තා වූ අයදුම්කරුවන්ට ඔවුන්ගේ අයදුම්පත් අතින් එවීමට අවසර දී ඇත.<br>අතින් අයදුම්පත් එවන ලද සියලුම අපේක්ෂකයින් 145 දෙනා නොව සුදුසුකම් සපුරා ඇති සුදුසුකම් ලත් අපේක්ෂකයින් 71 දෙනෙකුට පමණක් තොරා ගැනීමේ විභාගයට පෙනී සිටීමට අවසර ලද බව තවදුරටත් තහවුරු වේ. | |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

2023 - 2025 සඳහා සකස් කරන ලද සංයුක්ත සැලැස්මට අනුව බැංකුවේ තෝරාගත් ඉලක්ක ක්‍රියාකාරකම් සඳහා සාක්ෂාත් කර ගෙන ඇති ප්‍රගතිය පහත දැක්වේ.

| උපාය මාර්ගය | **2023.12.31 දිනට තත්ත්වය** | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| **ස්ථාවරත්වය, පාලනය සහ තිරසාර වර්ධනය** | | | | |
| පවතින වෙළඳපල කොටස වර්ධනය කර ගැනීම. | 2023 වර්ෂය තුළදී සියයට 21 සේවක ප්‍රේෂණ වාර්තා කර ඇත. | සාක්ෂාත් කර ගැනීම ඉලක්කයට වඩා අඩු විය. | 2025 වන විට ඉලක්කය කරා ළඟා වීමට නියමිතය.<br>පශ්චාත් කොවිඩ් - 19 වසංගතයෙන් පසු දේශීය බැංකු සියල්ලම මුදල් දිරිගැන්වීම්, ණය පහසුකම් ආදිය ලබා දෙමින් සේවක ප්‍රේෂණ සඳහා දැඩි තරඟයකට අවතීර්ණ වී ඇති බව නිරීක්ෂණය විය.<br>කෙසේ වෙතත්, ලද සේවක ප්රේෂණවල මාසික සාමාන්‍යය වාර්ෂිකව වැඩි වී ඇත.<br>අපගේ වෙළඳපල කොටස වැඩිදියුණු | ඉලක්ක සපුරා ගැනීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගැනීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කිරීමට හොඳ හැකියාවක් ඇති නව ප්‍රේෂණ හවුල්කරුවන් කිහිප දෙනෙකු අපි හඳුනාගෙන ඇති අතර ඔවුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලියේ යෙදී සිටී. | |
| ඵලදායී කළමනාකරණයක් හරහා බැංකුවේ පරිපාලිත සමාගම්වල සහ ආශ්‍රිත සමාගම්වල ලැබෙන දායකත්වය වැඩි කර ගැනීම. | ඉලක්ක කරගත් පරිදි සම්පූර්ණ කර නොමැත. | ඉලක්ක කරගත් පරිදි සම්පූර්ණ කර නොමැත. | • මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය (MOF) විසින් පිහිටුවන ලද සේලන්දිවා ඉන්වෙස්මන්ට් ලිමිටඩ් යටතේ ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම තුළ GOH ඇතුළත් විය. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති (SOERU) හි 2023 අගෝස්තු 04 දිනැති ලිපිය මගින් GOH හි ප්‍රතිව්‍යුහගත කිරීම නැවත දැනුම් දෙන තුරු රඳවා තබා ගත යුතු බව දන්වා ඇත.<br>GOH හි ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම සඳහා බැංකුව විසින් නව ප්‍රධාන විධායක නිලධාරියකු සහ මූල්‍ය කළමනාකරුවකු පත් කර ඇත.<br>• BOC ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (BCOT) හි පැවරුම ඉවත් කිරීමේ (divestment) ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත පැවරුම ඉවත් කිරීමේ සැලැස්මක් සමඟ සිදු කර ඇත. කෙසේ වෙතත්, පළමු ලංසු තැබීමේ ක්‍රියාවලියේදී සුදුසු ආයෝජකයෙකු හඳුනා ගැනීමට නොහැකි වී ඇත.<br>• MBSLI හි MBSL හිමිකම ඉවත් කිරීමට බැංකුව සිය එකඟතාව ලබා දී ඇත. MBSL අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත පැවරුම ඉවත් කිරීමේ සැලැස්මක් මත වැඩ කරයි.<br>• යෝජිත ඒකාබද්ධ කිරීම මත පැන නගින ඉහළ ප්‍රාග්ධන ලාභ බද්ද හේතුවෙන් PDML සහ PDL ඒකාබද්ධ කිරීම අත්හිටුවා ඇත. | ඉලක්ක සපුරා ගැනීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගැනීම අවශ්‍ය වේ. |
| ආදායමට පිරිවැය අනුපාතය සියයට 40 ට අඩු අගයක පවත්වා ගැනීම. | 2023.09.30 දිනට ආදායමට පිරිවැය අනුපාතය සියයට 55.7 ක් විය. | සාක්ෂාත් කර ගැනීම ඉලක්කයට වඩා අඩු විය. | ආදායමට පිරිවැය අනුපාතය 2024 අගෝස්තු වන විට සියයට 47.93 දක්වා අඩු වී ඇත.<br>පහත සඳහන් පරිදි බැංකුවේ මෙහෙයුම් පිරිවැය ඉහළ යාමට හේතු කිහිපයක් බලපා ඇත.<br>• කාර්ය මණ්ඩල පිරිවැය ඉහළ යාමට හේතු වූ ඉහළ ජීවන වියදම. | ඉලක්ක සපුරා ගැනීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගැනීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | • ශාඛා ජාලය අධික පරිපාලන පිරිවැයක් දැරීම.<br>• විශේෂ තැන්පතු නිෂ්පාදන සඳහා ඉහළ පොලියක් ගෙවා ඇත.<br>කෙසේ වෙතත්, පළාත් මට්ටමින් සහ ප්‍රධාන කාර්යාලය මට්ටමින් මෙහෙයුම් පිරිවැය සහ පොදු කාර්ය පිරිවැය අඩු කිරීමට බැංකුව අඛණ්ඩ ක්‍රියාමාර්ග ගෙන ඇත. | |
| **ගනුදෙනුකරුවන් සමඟ වන අත්දැකීම්වල විශිෂ්ටත්වය** | | | | |
| පුද්ගලික ප්‍රවේශය හරහා ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීම. | - නියමු ව්‍යාපෘතිය ශාඛා 3 කින් සිදු කර ඇත. (රාගම, බොරැල්ල අධි ශ්‍රේණි, රඹුක්කන)<br>- ටෙන්ඩර් ප්‍රදානය කරන ලද නමුත් ශ්‍රී ලංකා ටෙලිකොම් මෙය පිළි නොගත් අතර මිල සාකච්ඡාවක් ඉල්ලා ඇත. වෙනස් පිරිවිතරයක් සහිත QMS ශ්‍රී ලංකා ටෙලිකොම් විසින් යෝජනා කර තිබුණි.<br>- ශාඛා 25 බැගින් වසර 4 ක් තුළ ශාඛා 100 ක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට PMSC විසින් උපදෙස් දී ඇත.<br>- ඉදිරි ක්‍රියාමාර්ග සඳහා CPC රැස්වීම සංවිධානය කිරීමට නියමිතය.<br>- අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ නිර්දේශය ලැබෙන තෙක් රඳවා ගෙන ඇත.<br>- | සම්පූර්ණ කර නොමැත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පවතී.<br><br>2024.12.31 වන විට ශාඛා 25 ක සහ 2025.03.31 වන විට ඉතිරි ශාඛා 75 ක ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලසුම් කර ඇත. | ක්‍රියාත්මක කිරීමේ දැඩි ප්‍රමාදයන් නිසා ව්‍යාපෘතිය අවසන් කිරීම කඩිනම් කිරීම අවශ්‍ය වේ. |

**ප්‍රතිලාභ ලබා දෙන ණය සංස්කෘතිය සහ හිතකර ණය කළඹ**

| | | | | |
|---|---|---|---|---|
| අයවැයගත ණය වර්ධනය සාක්ෂාත් කර ගැනීම. | **ව්‍යාපාරික අංශය** / **වර්ධනය %**<br>**--------- ----------**<br>**ආයතනික** -9.1<br>BCR I -2.5<br>BRC II -4.9<br>**බැංකුව** -4.8 | සාක්ෂාත් කර ගෙන නොමැත. | 2023 දී ආර්ථික අභියෝගවලින් මන්දගාමීව යථා තත්ත්වයට පත්වීම බලපා ඇත. | ඉලක්ක සපුරා ගැනීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගැනීම අවශ්‍ය වේ. |
| ණය ඇගයීම් සහ අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම. | නව පහසුකම් අක්‍රීය ණය වෙත මාරු කර ඇත. (2022 දී ප්‍රදානය කර තිබූ) ආයතනික - රු. බිලියන 1.17 | සාක්ෂාත් කර ගෙන නොමැත. | ප්‍රදානය කළ දින සිට මාස 06 ක් ඇතුළත අක්‍රීය ණය වෙත මාරු කරන ලද පහසුකම් පිළිබඳව මාසික පදනමින් ණය කමිටුව වෙත සංදේශයක් ඉදිරිපත් කරනු ලබන අතර, ඊට හේතු විමසා අදාළ ශාඛා වෙත ලිපි යවනු ලැබේ. | ඉලක්ක සපුරා ගැනීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගැනීම අවශ්‍ය වේ. |
| ණය කළඹෙන් සියයට 85 ක් කාර්ය සාධන කාණ්ඩයේ පවත්වා ගැනීම. | සියයට 5 ඉක්මවීම | සාක්ෂාත් කර ගැනීම ඉලක්කයට වඩා අඩු විය. | මුහුණ දුන් අනපේක්ෂිත ආර්ථික සිදුවීම් හේතුවෙන් ආයතනික ගනුදෙනුකරුවන්ට බලපාන ලද මූල්‍ය ආතතිය හේතුවෙන් අදියර III අනුපාතය වැඩි වී ඇත. | ඉලක්ක සපුරා ගැනීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගැනීම අවශ්‍ය වේ. |